SriLankan Airlines

# ශ්‍රීලංකන් එයාර්ලයින්ස්

## වාර්ෂික වාර්තාව 2017/18



# පටුන

## සමාගම සහ වාර්තා දළ විශ්ලේෂණය


| | |
|---|---|
| අපගේ දැක්ම සහ මෙහෙවර | 2 |
| සුවිශේෂී කරුණු | 3 |


## කළමණාකරන වාර්තා


| | |
|---|---|
| සභාපතිතුමන්ගේ සමාලෝචනය | 4 |
| අධ්‍යක්ෂ මණ්ඩලය | 7 |
| කළමනාකරණයට අයත් ප්‍රධාන සාමාජික සාමාජිකාවෝ | 11 |
| ව්‍යාපාර අවදානම් කළමණාකරන රාමුව | 14 |
| කළමනාකරණ සාකච්ඡාව සහ විශ්ලේෂණය | 16 |


## මූල්‍ය ප්‍රකාශ


| | |
|---|---|
| අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව | 45 |
| අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේ වාර්තාව | 50 |
| අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් පිළිබඳ ප්‍රකාශය | 51 |
| ස්වාධීන විගණකවරුන්ගේ වාර්තාව | 52 |
| මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය | 54 |
| ලාභ හෝ අලාභ ප්‍රකාශනය | 55 |
| විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය | 56 |
| ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය | 57 |
| මුදල් ප්‍රවාහ ප්‍රකාශනය | 58 |
| මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් | 59 |


## ඇමුණුම්


| | |
|---|---|
| දස අවුරුදු සමාලෝචනය | 102 |
| ගුවන් මාර්ග සිතියම | 104 |
| විශේෂ කඩඉම් | 106 |
| පාරිභාෂික පද විවරණය | 108 |
| වාර්ෂික මහ සභා රැස්වීම් නිවේදනය | 109 |
| පෙරකලාසි පත්‍රය | 111 |
| සාංගමික තොරතුරු | ඇතුල් පසු පිට |

# අපගේ දැක්ම සහ මෙහෙවර

## අපගේ දැක්ම

ආසියාවේ ප්‍රියතම ගුවන් සේවය බවට පත්වීම

## අපගේ මෙහෙවර

අපි ගුවන් ප්‍රවාහන ව්‍යාපාර කාර්යයෙහි නිරතව සිටින්නෙමු. විශ්වාසදායක සහ සුපසන්න ප්‍රවාහන අත්දැකීමක් අපි අපගේ සේවාලාභීන් වෙත සපයන්නෙමු. අපි අපගේ ව්‍යාපාරික හවුල්කරුවන් වෙත නව්‍ය, වෘත්තීමය සහ අන්‍යෝන්‍ය වශයෙන් වාසිදායක වූ විවිධ සේවා සලසා දෙන්නෙමු. ශ්‍රී ලංකාව ලාභදායී වශයෙන් අලෙවිකරණය කිරීම සහ ශ්‍රී ලංකාවේ සමාජීය සුභසාධනය කෙරෙහි දායකවීම පිළිබඳ කොටස් හිමියන්ගේ අපේක්ෂා අපි විසින් සාක්ෂාත් කරන්නෙමු. අප ප්‍රවීණ, පෙරටුගාමී හා අනලස්ව ක්‍රියාත්මක වන කණ්ඩායමකි. අපගේ දායකත්ව මෙහෙවර ප්‍රසාදජනකවූ ද, ඵලදායීවූ ද එකකි.

# සුවිශේෂී කරුණු

| | | සමූහය 2018 | සමූහය 2017 | සමාගම 2018 | සමාගම 2017 |
|---|---|---|---|---|---|
| **මූල්‍ය** | | | | | |
| ආදායම | රු.මිලියන | 164,859.51 | 138,590.83 | 161,654.46 | 135,491.19 |
| මෙහෙයුම් වියදම් | රු.මිලියන | (175,254.73) | (146,080.65) | (176,104.44) | (146,760.81) |
| බදු පෙර අලාභය | රු.මිලියන | (18,579.23) | (28,314.26) | (17,213.57) | (28,929.99) |
| වර්ෂය සඳහා ශුද්ධ අලාභය | රු.මිලියන | (18,585.15) | (28,339.51) | (17,213.57) | (28,929.99) |
| මුළු වත්කම් | රු.මිලියන | 71,585.14 | 55,413.77 | 67,566.96 | 51,633.63 |
| කොටස් හිමියන්ගේ අරමුදල් | රු.මිලියන | (125,582.89) | (107,793.52) | (132,196.34) | (115,766.64) |
| **ප්‍රවාහනය** | | | | | |
| මගී ධාරිතාවය | ASK මිලියන | | | 18,487.54 | 15,608.10 |
| සමස්ත ධාරිතාවය | ATK කේ මිලියන | | | 2,549.88 | 2,167.92 |
| ප්‍රවාහනය කළ මගී සංඛ්‍යාව | RPK මිලියන | | | 15,280.78 | 12,455.05 |
| ප්‍රවාහනය කළ සමස්ථ පැටවුම | RTK මිලියන | | | 1,749.14 | 1,475.29 |
| මගී පැටවුම් සාධකය | % | | | 82.65 | 79.80 |
| සමස්ත පැටවුම් සාධකය | % | | | 68.60 | 68.05 |
| සමච්ඡේදක පැටවුම් සාධකය | % | | | 81.90 | 80.91 |
| **කාර්ය මණ්ඩල ඵලදායීතාවය** | | | | | |
| පිරිස් බලයේ සාමාන්‍ය | සංඛ්‍යාව | 8,090 | 8,029 | 7,019 | 7,021 |
| එක් සේවකයකුගේ ආදායම | රු.මිලියන | 20.38 | 17.26 | 23.03 | 19.30 |
| **ගුවන්යානා** | | | | | |
| A320-200 | සංඛ්‍යාව | | | 5 | 6 |
| A321-200 | සංඛ්‍යාව | | | 3 | 3 |
| A320neo | සංඛ්‍යාව | | | 2 | 2 |
| A321neo | සංඛ්‍යාව | | | 3 | - |
| A330-200 | සංඛ්‍යාව | | | 6 | 6 |
| A330-300 | සංඛ්‍යාව | | | 7 | 7 |
| වර්ෂය අවසානයේ සේවාවේ නියුතු ගුවන් යානා | සංඛ්‍යාව | | | 26 | 24 |

**ආදායම රු.බිලියන**




**අන්තර්ජාල ගමනාන්ත ගණන සහ ගුවන්යානා බලඇණිය**



# සභාපතිතුමන්ගේ සමාලෝචනය

**"දශකයකට වැඩි කාලයක් අඛණ්ඩව පැවති සෘණාත්මක ප්‍රවණතාවයන් නැවත හරවමින් 2016 වර්ෂය මැද භාගයේ සිට සියළුම ප්‍රධාන ආර්ථික වල වූ වර්ධනය සමඟ ගෝලීය ආර්ථිකය වේගවත්ව වර්ධනය විය."**

**"ගෝලීය වශයෙන් ඉහළ යෑමේ තත්ත්වය නොසලකා සත්‍ය දළ දේශීය නිෂ්පාදිතය මෑත ඉතිහාසයේ එහි අවම අගය වූ 3.1% ලෙස ශ්‍රී ලංකා ආර්ථිකය 2017 වර්ෂයේදී වාර්තා කරන ලදී."**

අධ්‍යක්ෂ මණ්ඩලයේ සේවය කිරීමට එකඟ වෙමින් තනි තනි වශයෙන් සහ සාමූහික වශයෙන් ඔවුන් දරනා බැරෑරුම් වගකීම් සහ ඔවුන් වෙත උරුම වූ අතීත ගැටළු පිළිබඳ නිසි සැලකිල්ලෙන් යුතුව 2018 අප්‍රේල් මස දී වර්තමාන අධ්‍යක්ෂ මණ්ඩලය රාජකාරී කටයුතු ආරම්භ කරන ලදී.

## ගෝලීය ආර්ථිකය

දශකයකට වැඩි කාලයක් අඛණ්ඩව පැවති සෘණාත්මක ප්‍රවණතාවයන් නැවත හරවමින් 2016 වර්ෂය මැද භාගයේ සිට සියළුම ප්‍රධාන ආර්ථික වල වූ වර්ධනය සමඟ ගෝලීය ආර්ථිකය වේගවත්ව වර්ධනය විය. පුළුල් වශයෙන් අනුග්‍රාහක සාර්ව ආර්ථික ප්‍රතිපත්ති මෙන්ම චක්‍රීය සාධක වල ආධාරයෙන් වැඩි දියුණු කළ මූල්‍ය තත්ත්වයන් සහ අඩු අවධමන පීඩනයන් සමඟ වෙළෙඳපොලවල් තුල ධනාත්මක අභිලාෂයන් අපට දැකගත හැකිවිය. ලෝකයේ තුනෙන් දෙකක් පමණ වූ උසස් ජාතීන් මෙන්ම නැඟී එන සහ කඩඉම් ආර්ථික වල ආයෝජන වියදම් ශක්තිමත් වීම සමඟ ගෝලීය වෙළෙඳාම යලි ශක්තිමත්ව යථා තත්ත්වයට පත්විය. බොරතෙල් සහ වෙනත් වෙළෙඳ භාණ්ඩ වල මිල ගණන් ඉහළ යෑමේ ප්‍රවනතාවයේ වාසියෙන් බොහෝ වෙළෙඳ භාණ්ඩ අපනයනය කරන රටවල් වල හිතකර තත්ත්වයන් පෙන්නුම් කරන ලදී.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට අනුව පසුගිය වර්ෂයේ පැවති 3.2% සිට 2017 වර්ෂයේදී 3.8% දක්වා ගෝලීය වර්ධනය සිදුවිය. 3.9% ක පුරෝකථනය කල වර්ධනයක් සමඟ 2018 සහ 2019 වර්ෂ සඳහා ධනාත්මක පසුබිමක් නිර්මාණය වනු ඇත. කෙසේ වෙතත් මධ්‍ය කාලීනව ධනාත්මක ගෝලීය ආර්ථික කාර්යසාධනය ආපසු හැරවිය හැකි වෙළෙඳ යුද්ධ, මූල්‍ය ක්ෂේත්‍ර දුබලතාවයන් සමඟ වූ භූ දේශපාලනික පීඩනයන් ඇතුලත් අවදානම්කාරී තත්ත්වයන් පිළිබඳ අප සැලකිල්ලෙන් සිටිය යුතුය.

## ශ්‍රී ලංකා ආර්ථිකය

ගෝලීය වශයෙන් ඉහළ යෑමේ තත්ත්වය නොසලකා සත්‍ය දළ දේශීය නිෂ්පාදිතය මෑත ඉතිහාසයේ එහි අවම අගය වූ 3.1% ලෙස ශ්‍රී ලංකා ආර්ථිකය 2017 වර්ෂයේදී වාර්තා කරන ලදී. විභව මට්ටම් වලට අඩුවෙන් කාර්යඵල නිරූපනය කරමින් කර්මාන්ත, සේවා සහ කෘෂිකර්මාන්ත යන ප්‍රධාන ක්ෂේත්‍ර තුනම මන්දගාමී වී ඇත. දැඩි මූල්‍ය ප්‍රතිපත්තියක්, වෙළෙඳපොළ මත පදනම් වූ විනිමය අනුපාත සමඟ ආදායම් මූලික කරගත් අයවැය ඒකාබද්ධකරණය වැනි සාර්ව ආර්ථික පසුබිමෙහි වැදගත් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග අපට දැකගත හැකි විය. මූල්‍ය ගිණුමට වූ ගලා ඒම් සහ හිතකර අපනයන ආදායම සමඟ බාහිර ක්ෂේත්‍ර වල කාර්යසාධනය ශක්තිමත් විය. පසුගිය වර්ෂ දෙකෙහි වාර්තා කළ හිඟයට සාපේක්ෂව ගෙවුම් ශේෂයෙහි අතිරික්තයක් වාර්තා කර ඇත.

විශේෂයෙන්ම මධ්‍ය කාලීනව ඉදිරි වර්ෂ වලදී ආර්ථිකය ඉහළ වර්ධන මට්ටම් වලට ළඟාවනු ඇතැයි අප දැඩිව බලාපොරොත්තු වේ.

දැනට සිදුවෙමින් පවතින සංවර්ධන ව්‍යාපෘති සමඟ සාර්ව ආර්ථික මූලධර්ම සමබර කිරීම සඳහා ක්‍රියාමාර්ග ගෙන ඇති අතර ජාත්‍යන්තර මූල්‍ය අරමුදල පුරෝකථනය කළ 4.7% ක දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය සමඟ ආර්ථික සමෘද්ධිය කරා යෑමේ අපගේ මාර්ගය සහතික කර ඇත. කෙසේ වෙතත් අපගේ අපේක්ෂිත සංවර්ධන අභිලාෂයන් කරා ළඟාවීමට අප උත්සාහ ගන්නා බැවින් වර්තමාන සමාජ දේශපාලනික තත්ත්වයන් කළමණාකරණය කර ගැනීමට ජාතියක් ලෙස එක්ව කටයුතු කිරීම තීරණාත්මක වනු ඇත.

## ගුවන් සේවා කර්මාන්තය

ඓතිහාසික වශයෙන් අඩු බලශක්ති මිලගණන් සහ පොළී අනුපාත සමඟ බද්ධ වූ පුළුල් ගෝලීය ආර්ථික වර්ධනයේ සහයෝගය ඇතිව අන්තර්ජාතික ගුවන් සේවා කර්මාන්තය 2017 වර්ෂයේදී ශක්තිමත් කාර්යසාධනයක් වර්තා කර ඇත. ගෝලීය දළ දේශීය නිෂ්පාදිතයට 1% ක ප්‍රමාණයකින් දායක වෙමින් ගුවන් සේවා කර්මාන්තය අවම ගුවන් ගාස්තු, වැඩි දියුණු කල පැටවුම් සාධක සහ ඉහළ මගීන් සහ ගුවන් භාණ්ඩ ප්‍රමාණයක් ලඟා කරගෙන ඇත්තේ ක්ෂේත්‍රය සාර්ථක ලෙස ක්‍රියාත්මක වීම සහ ලාභදායී මට්ටම් නිරූපනය කරමිනි.

අපේක්ෂිත ගෝලීය ආර්ථික වර්ධනයේ ප්‍රතිඵලයක් ලෙස 2018 වර්ෂයේදී ධාරිතා පුළුල් කිරීම් ඉක්මවා මඟීන් සංඛ්‍යාව පුරෝකතනය කර ඇති අතර එයින් සාමාන්‍ය පැටවුම් සාධකය වාර්තාගත මට්ටම් දක්වා ඉහළ යනු ඇත. කෙසේ වෙතත් ප්‍රමාණ වර්ධනයන් පැවතියද ගුවන් සමාගම් වලට ඵලදාවෙහි තිරසාර වර්ධනයක් ලඟා කරගත නොහැකි වනු ඇත. වර්ෂයෙන් වර්ෂය 50% කට වඩා ඉහළ ගොස් ඇති ඉන්ධන පිරිවැය කර්මාන්තය 2018 මුහුණ දෙන තවත් ප්‍රබල අභියෝගයකි. ගුවන් සමාගම් වල ඉන්ධන පිරිවැය තවදුරටත් ඉහළ යන තත්ත්වයක් හමුවේ නව ගුවන් යානා බලඇණියට ප්‍රතිස්ථාපනය කිරීම, හොඳ මෙහෙයුම් සහ අකාර්යක්ෂම ගුවන් තොටුපලවල් සහ ගුවන් සීමා ඉවත් කිරීම සඳහා රජයට ඒත්තු ගැන්වීම හරහා ඉන්ධන කාර්යක්ෂමතාවය ඉහළ දැමීමට කර්මාන්තය බලාපොරොත්තු වේ. ඒ අනුව නව ගුවන් යානා

ලබාගැනීම සමඟ පවතින ටොන් කිලෝමීටර් වැනි ධාරිතා භාවිතයන්ට අනුව ඉන්ධන කාර්යක්ෂමතාව ඉහළ යනු ඇත.

කර්මාන්තයේ පවතින ගැටළු වලට අමතරව, විශේෂයෙන් දකුණු ආසියාවේ දේශීය මුදල් ඒකක තියුණු ලෙස අවප්‍රමාණය වීම දැකගත හැකිය. වඩා සාධනීය කරුණ නම් පසුගිය වසර කිහිපය තුළ ගමනාග මන පිරිවැය අඩුවීම ආදායම් මගී කිලෝමීටර් වර්ධනයට යම් ප්‍රතිශත ඒකක ප්‍රමාණයක් එකතු කර ඇත. ඒ අනුව ගුවන් ප්‍රවාහනයෙහි සැලකිය යුතු වර්ධනය ලොවපුරා ආර්ථික සංවර්ධනයට දායක වී ඇත. භාණ්ඩ, මගීන්, ප්‍රාග්ධනය, තාක්ෂණය සහ අදහස් ගලනය සඳහා ඉඩකඩ ලැබීම සහ ගුවන් ප්‍රවාහන පිරිවැය අඩුවීම මගින් නගර අතර සම්බන්ධතා වැඩිදියුණු කිරීම මෙම පුළුල් ආර්ථික වාසි උත්පාදනය සඳහා හේතු විය.

පුරෝකථනය කළ ඉල්ලුමෙහි වර්ධනය කෙසේ වෙතත්, කර්මාන්තය සඳහා ධනාත්මක දිගුකාලීන අවස්ථාවක් සපයා ඇත. ඉල්ලුමෙහි වර්ධනය ධාරිතා ප්‍රසාරණයට වඩා වැඩිවීම හේතුවෙන් ඉන්ධන මිල ඉහළ යෑම නිසා ඇතිවන අපේක්ෂිත සෘණාත්මක බලපෑමෙහි කොටසක් හිලව් වනු ඇත. ඉන්ධන පිරිවැය ඉහළ යෑමේ බලපෑමෙන් සීමාවන ධාරිතා වර්ධනය වැඩිදියුණු වීමත් සමඟ වෙළෙඳපොළ තත්ත්වයන් ශක්තිමත් වීම අපේක්ෂා කරන පසුබිමක කර්මාන්තයේ සමස්ත ලාභයෙන් අඩක් නියෝජනය කරන උතුරු ඇමෙරිකානු ගුවන් සමාගම් ප්‍රමුඛතාවය ගෙන ඇත. ඉහළ නියාමන පිරිවැය සහ තරඟකාරී විවෘත ගුවන් සේවා ප්‍රදේශය හේතුවෙන් අඩු ඵලදාවන් කරණ කොට ගෙන යුරෝපය ඉහළ සමච්ඡේදක පැටවුම් සාධක පුරෝකථනය කර ඇත. ආසියා පැසිපික් කලාපය තුල ගුවන් භාණ්ඩ ප්‍රවාහනයේ චක්‍රීය ඉහළ යෑමක් මෙන්ම ධාරිතාව අභිබවා යන මගී ඉල්ලුම් වර්ධන තත්ත්වයක් අපේක්ෂා කරන අතර ඒ තුළින් ඉහළ ඉන්ධන පිරිවැයක් පැවතියද කලාපයේ ලාභදායීත්වයට සහාය වී ඇත. මන්දගාමීව වර්ධනය වන තත්ත්වයක් පමණක් පෙන්නුම් කරන අප්‍රිකාවේ දුර්වල කලාපීය ආර්ථික තත්ත්වය එහි ගුවන් සමාගම් සඳහා බලපෑම් කරන ලද අතර ධාරිතා වර්ධනය මන්දගාමී කරනු ලැබූ අඩු ඉන්ධන ආදායම් සහ කලාපීය අර්බුද වල බලපෑම මැද පෙරදිග කලාපයට අභියෝගයක් වී ඇත. මගීන් සංඛ්‍යාව ඉහළ ගියද පැටවුම් සාධක කර්මාන්තයේ සාමාන්‍ය අගයට වඩා පහළ මට්ටමකින් පැවතුනි.

## ගුවන් සමාගමේ මූල්‍ය ස්ථාවරත්වය

2008 වර්ෂයේදී ගුවන් සමාගම කළමණාකරණයෙන් එමිරේට්ස් ඉවත් වූ දා පටන් ගුවන් සමාගම මෙහෙයුම් අලාභයන් වාර්ථාකරමින් සිටි. 2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගමේ අලාභය රු.බිලියන 17.21 කි.

ගුවන් සමාගම විසින් උපයනු ලැබූ අඛණ්ඩ අලාභයන් රජය මගින් නිකුත් කළ පහසුකම් සපයන ලිපි වලින් සුරක්ෂිත බැංකු ණය හරහා මූල්‍යනය කරන ලදී. 2018 මාර්තු 31 දින වන විට එම ණය වල ගෙවිය යුතු ශේෂය ඇමෙරිකානු ඩොලර් මිලියන 704 කි. ශේෂ පත්‍රය තුළ රු.බිලියන 132 දක්වා සෘණ හිමිකමක් පවත්වාගනී. එම නිසා රජය සමාගමේ 90% කට වඩා කොටස් හිමිකාරීත්වයක් ඇති ප්‍රධාන කොටස්කරු වන තත්ත්වයක සමාගම් පනතේ 219 සහ 220 වගන්ති ප්‍රකාරව සමාගම ශක්‍යතාවයෙන් තොර නිසා නව අධ්‍යක්ෂ මණ්ඩලය පත්කරන ලදී.

එවැනි නිගමනයකට එරෙහිව සටන් වදින එකම සාධකය නම් ගුවන් සමාගම ප්‍රතිව්‍යුහගත කිරීම සදහා සහයෝගය ලබාදීමට රජයට ඇති උවමනාව සහ ප්‍රතිව්‍යුහගතකරණය අවසන් වනතුරු ගුවන් සමාගම සඳහා මූල්‍ය සහාය ලබාදීමට රජය විධිමත්ව ක්‍රියා කිරීමයි. සත්‍ය වශයෙන්ම නව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරී ඇති වගකීම වනුයේ ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය මෙහෙයවීම සහ කඩිනම් කිරීමයි.

## යහ පාලනය සඳහා ඇති බැඳීම

අධ්‍යක්ෂ මණ්ඩලය පත්වීමෙන් පසු එහි පළමු ප්‍රමුඛතාවය වූයේ සමාගම තුළ යහපාලන රාමුව ස්ථාපිත කිරීමයි. එය සියළුම පාර්ශවකරුවන් සමඟ විවෘත සංවාදයක් හරහා සහ ගුවන් කර්මාන්තයේ පලපුරුදු විශ්වාසනීය පුද්ගලයන් හදුනාගැනීමෙන් සහ බඳවාගැනීමෙන්.

## කළමණාකරන වෙනස්කම්

ඕනෑම අධ්‍යක්ෂ මණ්ඩලයක් ඔවුන් නායකත්වය ලබාදෙන සමාගමක් වෙනුවෙන් සිදුකරන ප්‍රධාන විධායක නිලධාරීවරයා සහ ඉහළ කළමණාකරනය පත්කිරීම වැදගත් තීරණයක් බව අධ්‍යක්ෂ මණ්ඩලයට වැටහී ඇත.

මෙම පුරප්පාඩු සඳහා සුදුසුකම් ලත් නිලධාරීන් ගෙන් පිරවීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය නිරන්තර අවධානයෙන් සිටී. පළමුවෙන්ම ප්‍රධාන මූල්‍ය නිලධාරී තනතුර පිරවීමට තිබිණි. පත්කරනු ලැබූ විපුල ගුණතිලක මහතා එමිරේට්ස් සමාගම විසින් ශ්‍රී ලංකන් ගුවන් සමාගම කළමණාකරනය කරනු ලැබූ සමයේ ශ්‍රී ලංකන් ගුවන් සමාගමේ ප්‍රධාන මූල්‍ය නිලධාරී ලෙස කටයුතු කරන ලදී. 2018 ජූලි මාසයේ අග ශ්‍රී ලංකන් ගුවන් සමාගමේ සමූහ ප්‍රධාන මෙහෙයුම් හා මූල්‍ය නිලධාරියා ලෙස සම්බන්ධ වන තෙක් ඔහු එමිරේට් සමාගම විසින් කළමණාකරනය කරනලද අප්‍රිකානු ජාතික ගුවන් සේවයේ විධායක අධ්‍යක්ෂක වරයෙක් ලෙස කටයුතු කල අතර ඔහු අප්‍රිකානු ජාතික ගුවන්සේවය ප්‍රතිව්‍යුහගත කිරීමේ වගකීම දැරූ කන්ඩායමේ සාමාජියෙකුද විය. අධ්‍යක්ෂක මණ්ඩලය විසින් ඔහුගේ කාර්යය සාධනයට පරික්ෂාකිරීමෙන් අනතුරුව ගුවන් සමාගමේ ප්‍රධාන විධායක නිලධාරීවරයා ලෙස පත්කරන ලදී. ඉජිනේරු අංශ ප්‍රධානී ලෙස කටයුතු කල ඩී ඒ ජී ජයසූරිය මහතා ප්‍රධාන තක්ෂනික නිලධාරී ලෙසත් පියාසර මෙහෙයුම් අංශ ප්‍රධානී ලෙස කටයුතු කල කපිතාන් රජින්ද් රණතුංග මහතා වැඩබලන ප්‍රධාන ගුවන්සේවා සැපයුම් නිලධාරී ලෙස පත්කරන ලදී. ඉහල කළමාණාකරීත්වය ශත්තිමත් කිරීමට ප්‍රධාන වානිජ නිළධාරී තනතුර සඳහා සුදුසු අයදුම්කරුවෙකු බඳවා ගැනීම සඳහා අධ්‍යක්ෂක මණ්ඩලය කටයුතු කරයි.

## නැවත හැරවීමට සමූහිකව දැරූ ප්‍රයත්නය

සියළුම පාර්ශවකරුවන්ගේ සාමූහික ප්‍රයත්නයක් ඇත්නම් මෙම පරිවර්තනය ලඟාකරගත හැකි බව වත්මන් අධ්‍යක්ෂ මණ්ඩලය රාජකාරි ආරම්භ කර කෙටිකාලයක් ගත වන විට තහවුරු කර ඇත. රාජ්‍ය ප්‍රතිව්‍යුහගත කිරීමේ ප්‍රතිපත්තිය යටතේ සමාගම ප්‍රතිව්‍යුහගත කිරීමේ ඉදිරි නිර්දේශයන් ඉදිරිපත් කරීම සඳහා අතිගරු ජනාධිපතිතුමන්ගේ පාලනයට යටත්ව විශේෂඥ කමිටුවක් පත්කිරීම පිළිබඳව අධ්‍යක්ෂක මණ්ඩලය සතුටු වෙයි. එම විශෙෂඥ කමිටුව දැනටමත් ඔවුන්ගේ වාර්තාව ඉදිරිපත් කර ඇති අතර එම නිර්දේශයන් ක්‍රියාතමක කිරීම සඳහා සුදුසු පියවරයන් නුදුරු අනාගතයේදී ගනු ඇතැයි අපි බලාපොරොත්තු වෙමු.

## සභාපතිතුමන්ගේ සමාලෝචනය ඉතිරි කොටස.

ශේෂ පත්‍රයද ප්‍රතිව්‍යුහගත කළ යුතු බවට කිසිදු සැකයක් නැත. ඓතිහාසික ණය ඉවත් කළයුතුව ඇත. නව ප්‍රාග්ධන අන්තර්ග්‍රහනයක් අත්‍යවශ්‍ය වේ.

ගුවන් සමාගම නැවත යථා තත්ත්වයට පත්කිරීමේදී ප්‍රග්ධන අන්තර්ග්‍රහණයක් කිරීම ප්‍රමාණවත් නොවන අතර ව්‍යාපාර අකෘතියේ නැවත නිපදවීමද වැදගත් වෙයි. එය අත්කරගැනීම සඳහා ප්‍රභල වෙනස්වීම අවශ්‍යවෙයි. මෙම වෙනස්කිරීම් තුළ වර්ථමාන මාර්ග සඳහා වෙනස්කම්, ප්‍රශස්ථ ලෙස ගුවන්යානා භාවිතය, පිරිවැය අවමකිරීම හා පිරිවැය අවමකිරීම සහ තරගකාරීත්වයේ රුදීසිටීම සඳහා අවශ්‍ය වූ උපරිම තාක්‍ෂණය ඇතුලත් වෙයි. වර්ථමාන ව්‍යාපාරික අකෘතියේ පවතින අඩුපාඩුකම් සඳහා විසදුම් සැපයීමේ මූලාරම්භයන් ක්‍රියාත්මක කිරීම සහ අනාගත දැක්ම ක්‍රියාත්මක කිරීම සඳහා වූ උපාය සම්භන්දී සැලසුම් ව්‍යායාමයක් පිළිබඳ අධ්‍යක්‍ෂ මණ්ඩලය සහ කළමණාකරනය මෑතකදී නිගමනයකට එන ලදී.

සියළු පාර්ශවයන්ගේ කැපවීම නොමැතිව ගුවන් සමාගම ප්‍රතිව්‍යුහගත කල නොහැක. ගුවන් සමාගම මෙහෙයුම් ලාභයක් උපයන තෙක් තම සේවයට අදාළව ස්වේච්ඡාවෙන් කිසිඳු වැටුපක් හෝ දීමනාවක් නොගනිමින් අධ්‍යක්‍ෂ මණ්ඩලය දුන් ආදර්ශය එයට කදිම නිදසුනකි. ඊට සමානවම ජ්‍යෙෂ්ඨ කළමණාකරණයද වර්ෂයේ වැටුප් වර්ධකය ස්වේච්ඡාවෙන් කැප කර තිබුණි. මූල්‍යමය වශයෙන් සිදුකරන එම කැපකිරීම් අවසාන ලාභදායීත්වට සැලකිය යුතු බලපෑමක් නොකලද එය වෙනසක් සිදුකිරීම සඳහා සංවිධානය තුළ වූ අධිෂ්ඨානයේ සංඥාවකි.

අප ගෝලීය වශයෙන් තරඟකාරී කර්මාන්තයකි. සාර්ථක වීමට නම් අප අපගේ තරඟකරුවන්ට වඩා හොඳ විය යුතුය. අපගේ මෙහෙයුම් පිරිවැය කර්මාන්තයේ පිරිවැය සමඟ අනුකූල විය යුතුය. දුර්වල කළමණාකරනය, අධ්‍යක්‍ෂ මණ්ඩලය සහ එහි සාමාජිකයින් සමාගමේ දෛනික මෙහෙයුම් කටයුතු වලට මැදිහත් වීම, සමාගමේ ශුභසිද්ධිය ඉක්මවා පෞද්ගලික ශුභසිද්ධියට ප්‍රමුඛතාවය දීම වැනි හේතු නිසා අනෙකුත් ගුවන් සමාගම් වල සේවකයන් නොලබන ප්‍රතිලාභ සේවක මණ්ඩලයේ කොටසක් පමණක් ප්‍රතිලාභ ලබයි. මෙම පිරිවැයන් නිසා සමාගමේ මෙහෙයුම් වඩා සාර්ථක නොවේ.

ගුවන්සමාගම ප්‍රතිව්‍යුහ ගත කිරීම සඳහා අවශ්‍ය වෙනස්කම් රුගෙන ඒමට උපායමාර්ගික මූලාරම්භයන් දියත්කිරීම සඳහා කළමණාකරනයට, වර්තමාන අධ්‍යක්‍ෂ මණ්ඩලයේ සහයෝගය සහ කැමැත්ත සපයනු ලබන බවට මම විශ්වාස කරමි.

**නිගමනය**

අප රාජකාරි කරනු ලැබූ කෙටි කාලය තුළ මා හට සහ අධ්‍යක්‍ෂ මණ්ඩලයට ලබාදුන් විශිෂ්ඨ සහයෝගය වෙනුවෙන් සෑම මට්ටමකම සේවක මණ්ඩලය මා ස්තුති කරමි. ඔවුන් විසින් ශක්තිමත් ලැදිකමක් සහ ආසියාවේ හොඳම මෙන්ම කාර්යක්‍ෂම හා ලාභදායී ජාතික ගුවන් ප්‍රවාහකයා හි කොටසක් වන අභිලාෂයක් පෙන්නුම් කර ඇත. ඉදිරියේදීද ඔවුන්ගේ සහයෝගය සහ කැපවීම මා බලාපොරොත්තු වේ. ආදර්ශමත් වීම වෙනුවෙන් ප්‍රධාන විධායක නිලධාරී මහතාට සහ ජ්‍යෙෂ්ඨ කළමණාකරණයට මා ස්තුතිවන්ත වෙමි. අවසාන වශයෙන් ජාතියේ ගුවන් සේවයේ අනාගත සුභසිද්ධිය තම පෞද්ගලික වගකීමක් ලෙස සැලකීම පිළිබඳව අතිගරු ජනාධිපතිතුමන් හට විශේෂ ස්තුතිය පුදකරමි.

**ජී. එස්. විතානගේ**
*සභාපති*

*2019 පෙබරවාරි 28 වන දින.*

# අධ්‍යක්ෂ මණ්ඩලය

## ජී. එස්. විතානගේ මහතා (සභාපති)

2018 නොවැම්බර් 13 වන දින ශ්‍රී ලංකන් ගුවන් සමාගමේ අධ්‍යක්‍ෂ මණ්ඩලයට පත්වුන ජී එස් විතානගේ මහතා පසුව ශ්‍රී ලංකන් කේටරින් සමාගමේ අධ්‍යක්‍ෂ ධූරයට පත්කරන ලදී.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ කීර්තිමත් නිලධාරියකු වන ජී. එස්. විතානගේ මහතා ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය ලබා ගැනීමෙන් අනතුරුව, 1984 දී ශ්‍රී ලංකා පරිපාලනය සේවයට එක් විය. හෙතෙම කොළඹ විශ්ව විද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනවේදී උපාධිධරයකු ද වේ.

ඔහු රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ සහකාර අධ්‍යක්ෂකවරයකු වශයෙන් සිය වෘත්තීය ජීවිතය ඇරඹීය පසුව ඔහු ශ්‍රී ලංකා සීනි සංස්ථාවේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී තනතුරට පත් කෙරුනු අතර ඉන් අනතුරුව හෙතෙම ආරක්ෂක අමාත්‍යාංශයේ සහකාර ලේකම් ධූරයට පත් විය.

වසර 1995 දී ජී එස් විතානගේ මහතා මාධ්‍ය සංචාරක හා ගුවන්සේවා අමාත්‍යාංශයේ සහකාර ලේකම්වරයා වශයෙන් පත් කෙරුනු අතර, එම ධූරයේ කෙටි කලක් සේවය කළ හෙතෙම සංචාරක හා ගුවන්සේවා අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් තනතුරට උසස් කරන ලදී. ඉන් අනතුරුව වසර 2002 දී විතානගේ මහතා හට ප්‍රවාහන මහාමාර්ග හා සිවිල් ගුවන්සේවා අමාත්‍යාංශයේ අතිරේක ලේකම් ධූරයට උසස්වීමක් හිමි විය. එම තනතුරෙහි වසර 2012 දක්වා සේවය කළ හෙතෙම විදේශ රැකියා අමාත්‍යාංශ ලේකම්වරයා වශයෙන් උසස් කරන ලද අතර ජී එස් විතානගේ මහතා වර්තමාන තනතුරෙහි වැඩ භාරගන්නා තෙක් එම ධූරය හෙබවීය.

ඉහත සඳහන් තනතුරු හොබවන අතරතුර ජී. එස්. විතානගේ මහතා විදේශයෙන්හිදී විවිධ ශ්‍රී ලංකා දූත පිරිස් වෙත නායකත්වය ලබාදීම සඳහා පත් කෙරුනු අතර, හෙතෙම 2006 මැයි මස කොළඹදී පැවති සාක් කළාපීය බහුආකෘතික ප්‍රවාහන සමුළුවේ සභාපතිවරයා වශයෙන්ද පත් කෙරිණි. එයට අමතරව හෙතෙම 2016 අගෝස්තු මස 25 වැනි දින 5 වැනි කොළඹ ක්‍රියාදාම අමාත්‍යාංශික උපදේශන සමුළුව (ශ්‍රමය සපයනු ලබන රටවල් අතර කළාපීය උපදේශන ක්‍රියාදාමය) සංවිධානය කරමින් 2003 සිට දෙවන වරටත් ශ්‍රී ලංකාවට එහි සභාපතිත්වය හිමිකර ගැනීමට කටයුතු කලේය. තවද විතානගේ මහතා 2017 ජනවාරි 24 වැනි දින කොළඹදී පැවති අබුඩාබි සංවාදයේ සිව්වන අමාත්‍යාංශික උපදේශන සමුළුවද සංවිධානය කරමින් ශ්‍රී ලංකාවට එහි සභාපතිත්වය ලබාදීමට පෙරමුණ ගෙන කටයුතු කලේය.

2018 සැප්තැම්බර් 18 වැනි දින සිට ජී. එස්. විතානගේ මහතා ප්‍රවාහන හා සිවිල් ගුවන්සේවා අමාත්‍යාංශයේ ලේකම් ධූරයේ වැඩ භාර ගත්තේය.

## එයාර් මාෂල් කපිල ජයම්පති මහතා

**ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ අණ දෙන නිලධාරී** - (WWV, RWP, RSP & three Bars, VSV, USP, MSc(IntRel), MMSc(Strat Stu-China), MIM(SL), fndu(China), qhi)

2018 මාර්තු 29 වන දින ශ්‍රී ලංකන් ගුවන් සමාගමේ අධ්‍යක්‍ෂ මණ්ඩලයට පත්වුන එයාර් මාෂල් කපිල ජයම්පති මහතා පසුව ශ්‍රී ලංකන් කේටරින් සමාගමේ අධ්‍යක්‍ෂ ධූරයට පත්කරන ලදී.

කපිල වීදිය බණ්ඩාර ජයම්පති, 1982 මාර්තු මස 05 වෙනි දින 10 වැනි නිලධාරි ශිෂ්‍ය හට ප්‍රවේශයේ දී සාමාන්‍ය රාජකාරි ගුවන් නියමු අංශයේ නිලධාරියකු ලෙස ශ්‍රී ලංකා ගුවන් හමුදාවට බැඳුනේය. මූලික හා උසස් හෙලිකොප්ටර් පියාසර පුහුණුව අවසන් කිරීමෙන් පසු ඔහු ගුවන් හමුදා ඉතිහාසයේ ලාබාලතම, සුදුසුකම් ලත් හෙලිකොප්ටර් උපදේශකවරයා බවට පත්විය. ඔහු තනතුරු වලින් ඉහළ යමින් එල්ටීටීඊ ත්‍රස්තවාදීන් පරාජය කිරීමෙහිලා සටන් වදින සමයේ දී මහඟු මෙහෙයක් ඉටු කළ පුද්ගලයෙකු බවට පත් වීමට ඔහුට හැකි විය. පසුකාලීනව විශේෂ හමුදා රෙජිමේන්තුවක් බවට පත්වූ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ගුවන් නැව් කඳවුර හා ආරක්ෂණ යුධනැව් හඳුන්වා දීමේ හා පිහිටුවීමේ ගෞරවය ඔහු විසින් හිමි කර ගන්නා ලදි. එයාර් මාෂල් ජයම්පති 1989 සටනේදී අනතුරට පත් වූ අතර ඉන් ඔහු ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ පළමු යුධ තුවාලකරු බවට පත්විය. ඒ හේතුවෙන් ජීවිත හා වත්කම් සුරැකීමෙහිලා දැක්වූ විධිතරභාවයට කෘතඥතාව පළ කෙරෙන දේශ පුත්‍ර සම්මානය පැළඳවීමෙන් ඔහු ගෞරවයට පාත්‍ර කරන ලදි. සතුරා අභිමුවෙහිදී පරාර්ථකාමීව තම නිර්භීත බව විදහා දැක්වීම වෙනුවෙන් ඔහු රණශූර පදක්කමින් සිව්වරක්ද, රණ වික්‍රම පදක්කම සහ වීර වික්‍රම විභූෂණයෙන්ද පිදුම් ලත් රණවිරුවෙකි.

වසර 37කට අධික හමුදාමය වෘත්තීය කාලසීමාවක් සමඟින් විවිධ පියාසර කණ්ඩායම්වලට ඔහු විසින් අණ දී ඇත; මාණ්ඩලික නිලධාරියෙකු ලෙස ද ඔහු සේවය කර ඇත. ඔහු අණ දෙන නිලධාරියෙකු ලෙසත්, ත්‍රිකුණාමල චීන වරායේ පිහිටි ශ්‍රී ලංකා ගුවන් හමුදා අධ්‍යයන ආයතනයේ අණ දෙන නිලධාරි ලෙසත් තනතුරු දරා ඇත; තවද එයාර් මාෂල් කපිල ජයම්පති ගුවන් හමුදා කලමනාකරණ මණ්ඩලයේ අධ්‍යක්ෂ (ලොජිස්ටික්ස්) ලෙසත් පසුව ගුවන් මෙහෙයුම් අධ්‍යක්ෂ ලෙසත් කටයුතු කරමින් ගුවන් හමුදාවේ උන්නතියට හා නවීකරණයට මහත් සේ දායක විය. ශ්‍රී ලංකා ගුවන් හමුදාව ඔහු වෙත තබා ඇති මෙම විශ්වාසය සන්නද්ධ හමුදාවන්ගේ වෘත්තීමය හමුදා නිලධාරියෙකු ලෙස ඔහුගේ අණ දීම, නායකත්වය සහ බුද්ධි මහිමය පිළිබඳ නිසැක සහතිකයකි.

ගුවන් හමුදාවේ අණ දෙන නිලධාරි තනතුර දැරීම සඳහා ඔහු පත් කර ගැනීමත්, 2016 සැප්තැම්බර් මස 11 වෙනි දින අතිගරු ජනාධිපති, මෛත්‍රීපාල සිරිසේන මැතිඳුන් අතින් එයාර් මාෂල් තනතුරට උසස්වීමත් සමඟින් පරිපාලනය හිමි වීමත් සමඟ ඔහු ගුවන් හමුදා වෘත්තියේ හිනි පෙත්තටම නැග්ගේය. ආසියාවේ නවීනතම වූත්, වැඩි දියුණුවූත් ගුවන් හමුදාවක් බවට පත්වීමේ අභිලාෂයෙන් ඒ සඳහා මාර්ගෝපදේශකත්වය දක්වමින්, එහි නිපුණතාවන් තහවුරු කරමින්, ප්‍රධාන අණ දෙන නිලධාරි වශයෙන් එයාර් මාෂල් ජයම්පති විසින් ශ්‍රී ලංකා ගුවන් හමුදාව සඳහා ඉදිරි මාර්ගය ලෙස "2025 දර්ශනය" සකසන ලදි.

## අධ්‍යක්ෂ මණ්ඩලය ඉතිරි කොටස.

ජාතියට සිදු කරන ලද නිකැලැල් ශ්‍රේෂ්ඨ සේවාව උදෙසා 2018 වසරේ දී උත්තම සේවා පදක්කම සහ විශිෂ්ඨ සේවා විභූෂණය සමගින් තවත් සේවා පදක්කම් රාශියකින් ඔහු අගයනු ලැබීය. හමුදා වෘත්තිය මෙන්ම එයාර් මාෂල් කපිල ජයම්පති පකිස්තානයේ ප්‍රෙස්ටන් විශ්ව විද්‍යාලයෙන් ජාත්‍යන්තර සබඳතා පිළිබඳ විද්‍යාපති උපාධියද, චීනයේ ජාතික ආරක්ෂක විශ්ව විද්‍යාලයෙන් යුද්ධෝපාය අධ්‍යයනයන් පිළිබඳ MMSc උපාධියද ලබමින් හාවඩ් විශ්ව විද්‍යාලයේත්, ඇමෙරිකා එක්සත් ජනපදයේ ජාතික ආරක්ෂක විද්‍යාලයේත් උපාධිධාරියෙකු බවටද පත් වූ, යුද්ධෝපාය අධ්‍යයන, යුධ ශිල්ප හා ජාත්‍යන්තර සබඳතා සම්බන්ධයෙන් බහුශ්‍රැත වූ පුද්ගලයෙකි. ජාතියට ඔහු විසින් සිදු කරන ලද ආදර්ශවත් සේවාව සහ තිරසාර සංවර්ධනයෙහිලා ජාතික දැක්ම ඉසිලීමෙහිලා වූ ඔහුගේ පොරොන්දුව අගයමින් අතිගරු ජනාධිපතිතුමා විසින් එයාර් මාෂල් කපිල ජයම්පති 2018 මාර්තු මස 29 වෙනි දින සීමාසහිත ශ්‍රී ලංකා එයාර් ලයින්ස් හි අධ්‍යක්ෂක මණ්ඩල සාමාජිකයකු ලෙස පත් කරන ලදි.

### ආචාර්ය රෝෂන් පෙරේරා මහත්මිය

2018 මාර්තු 29 වන දින ශ්‍රී ලංකන් ගුවන් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයට පත්වුන ආචාර්ය රෝෂන් පෙරේරා මහත්මිය පසුව ශ්‍රී ලංකන් කේටරින් සමාගමේ අධ්‍යක්ෂ ධූරයට පත්කරන ලදී.

ඇය ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු සුපරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂවරියකි. මීට පෙර ජ්‍යේෂ්ඨ ආර්ථිකඥ, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවෙහි නියෝජ්‍ය අධ්‍යක්ෂ සහ ප්‍රතිපත්ති සමාලෝචන සහ නිරීක්ෂණ දෙපාර්තමේන්තුවෙහි අතිරේක අධ්‍යක්ෂ වැනි විවිධ වෙනත් තනතුරු දරමින් ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවය කර ඇත. 2015 සිට 2017 දක්වා පොදු ව්‍යවසාය සංවර්ධන අමාත්‍යංශයට ද්විතීයික පදනමින් සේවයට බැඳුනි. එහිදී රාජ්‍ය හිමිකාරිත්වය සහිත ව්‍යාපාර ප්‍රතිව්‍යුහගත කිරීමට ඇය සම්බන්ධ වූ අතර පොදු ව්‍යාපාර වල අධ්‍යක්ෂවරුන් සහ සභාපතිවරුන් සඳහා යහපාලනය සම්බන්ධයෙන් අත්පොතක් පිළියෙල කිරීම සඳහා සහ පොදු ව්‍යාපාර වල යහපාලනය සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරු සහ ජ්‍යේෂ්ඨ කළමණාකරනය පුහුණු කිරීම සඳහා වූ ධාරිතා ගොඩනැගීම් රාමුවක් සංවර්ධනය කිරීම සඳහා ඇය සහාය වන ලදී.

ලෝක බැංකුවේ සහ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැංඩසටනෙහි උපදේශකවරියක් වන ඇය මෙල්බර්න් විශ්ව විද්‍යාලයේ සහ ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ පර්යේෂකයෙකි. ඇයට දැනට ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සේවය කරයි.

ඇය කොළඹ විශ්ව විද්‍යාලයේ ආර්ථික විද්‍යාව ගෞරව උපාධිධාරියෙක් වන අතර මෙල්බර්න් විශ්ව විද්‍යාලයේ ආර්ථික විද්‍යාව පිළිබඳ ආචාර්ය උපාධිධාරියෙකි. ඇය එක්සත් රාජධානියේ කළමණාකරණ ගණකාධිකරුවන්ගේ වරලත් ආයතනයේ සියළු විභාගයන් සමත් වී ඇත.

### සුසන්ත කටුගම්පල මහතා

2018 මාර්තු 29 වන දින ශ්‍රී ලංකන් ගුවන් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයට පත්වුන ආචාර්ය සුසන්ත කටුගම්පල මහතා පසුව ශ්‍රී ලංකන් කේටරින් සමාගමේ අධ්‍යක්ෂ ධූරයට පත්කරන ලදී.

ශ්‍රී ලාංකේය සම්භවයක් ඇති ඕස්ට්‍රේලියාවේ ප්‍රසිද්ධ නීතිඥයකු වන දොන් සුසන්ත කටුගම්පල මහතා වසර 29 කට පෙර ඕස්ට්‍රේලියාවට ගොස් මෙල්බර්න්හි සුප්‍රසිද්ධ මොනාෂ් විශ්ව විද්‍යාලයෙන් තම නීතිවේදී උපාධිය සම්පූර්ණ කරනු ලැබීය. දකුණු ඕස්ට්‍රේලියාවේ ශ්‍රේෂ්ඨාධිකරණයටත්, වික්ටෝරියා හි ශ්‍රේෂ්ඨාධිකරණයටත් ඇතුලත් වූ ඔහු ඇඩෙලෙයිඩා සහ මෙල්බර්න් හිදී පුහුණුව ලැබුවේය. 1838 වසරේදී පිහිටුවන ලද, දකුණු ඕස්ට්‍රේලියාවේ පැරණිතම නීති සමාග මක් වන ඇඩෙලයිඩා හි නොක්ස් ඇන්ඩ් හාග්‍රේව් නමැති නීති සමාගමේ ආගමනය හා වාණිජ නීතිය පිළිබඳ පුහුණුව ඔහු 1998 දී ඇරඹුවේය. මුලදී ඔහු ඇඩෙලයිඩා හි නොක්ස් ඇන්ඩ් හාග්‍රේව් නමැති නීති සමාගම වෙනුවෙන් වාණිජ්‍යමය නීතිය පිළිබඳ පුහුණුවේ යෙදී සිටි අතර ඉන්පසුව 1999 දී ඔහු විසින් මෙල්බර්න්හි ෆෙයාර් ෆීල්ඩ්ස් නීති සමාගම පිහිටුවන ලදි.

කටුගම්පල මහතා ඕස්ට්‍රේලියාවේ නීති සභාවේ, වික්ටෝරියාහි පිහිටි නීති ආයතනයේ, ආසියාතික නීති සංගමයේ සහ ඇමෙරිකානු නීතිඥ සංගමයේ ජාත්‍යන්තර අංශයේත් සාමාජිකයෙකි.

1999 දී ඕස්ට්‍රේලියානු ආගමන හා වාණිජ්‍ය නීති උපදේශාත්මක සේවය ලෙස දේශීයව හා විදේශීයව ප්‍රසිද්ධියට පත් ඕස්ට්‍රේලියාවේ මෙල්බර්න්හි ෆෙයාෆීල්ඩ් නීතිඥ සමාගම පිහිටුවන ලදි. ඕස්ට්‍රේලියානු පාර්ශ්වකරුවන් අතර හවුල් ව්‍යාපාර ගිවිසුම්, සමාගම් අතර ගිවිසුම් අත්සන් කිරීමට පෙර පරීක්ෂාව, ඕස්ට්‍රේලියානු රජයේ අනුමැතීන්, ඕස්ට්‍රේලියානු බැංකු සමඟ මූල්‍ය ගිවිසුම් සහ වීසා පිළිබද ගැටළු ආදී සේවාවන් ඇතුලත්ව ඕස්ට්‍රේලියාවේ ආයෝජන සුරක්ෂිත කිරීම සහ ඕස්ට්‍රේලියාවේ සමාගම් ව්‍යුහ පිහිටුවන මෙන් චීනය, ජපානය, ඇමෙරිකානු එක්සත් ජනපදය, එක්සත් රාජධානිය, සිංගප්පූරුව, ඉන්දියාව, තායිලන්තය, ඉන්දුනීසියාව, ඩුබායි හා ශ්‍රී ලංකාව යන රටවල බොහෝ සමාගම් සහ ආයෝජකයින් වෙත උපදෙස් දෙන ලදි.

ශ්‍රී ලාංකේය සම්භයකින් යුතුව, ඕස්ට්‍රේලියාවේ ජාත්‍යන්තර නීතීඥයෙකු වශයෙන් ජාත්‍යන්තර සේවාදායකයින් සමඟ කටයුතු කිරීමේ අත්දැකීම ඔහු සතුවේ.

අප්‍රමාණ ශ්‍රී ලාංකිකයන් සංඛ්‍යාවකට නීතිමය වශයෙන් ඕස්ට්‍රේලියාවේ පදිංචිවීම සදහා කටුගම්පල මහතා උපකාර කර ඇත. ඔහු ශ්‍රී ලංකාවේ මහජනතාවට වෛද්‍ය ආධාර වශයෙන් ඩොලර් මිලියන ගණනාවකින් අනුග්‍රහය දක්වන ලද ඕස්ට්‍රේලියානු - ශ්‍රී ලාංකීය වෛද්‍ය ආධාර කණ්ඩායමේ ආරම්භක සාමාජිකයෙකි.

තම මව්බිමින් බැහැරව සිටින්නකු වශයෙන්, ඕස්ට්‍රේලියාවේ සිටින ශ්‍රී ලාංකීය නීතීඥවරයකු ලෙස වසර ගණනාවක් ඕස්ට්‍රේලියානු ජනතාවගේ පිළිගැනීමටත්, ගෞරවාදරයටත් පාත්‍ර වූ ඔහු ජාතීන් දෙක අතර බැඳීම් වැඩි දියුණු කිරීම සඳහා වැදගත් දායකත්වයක් දක්වා ඇත. වසර තුනක් අඛණ්ඩව සෙරන්ඩිබ් ශ්‍රී ලංකන් කම්යුනිටි අවෝඩ්ස් උළෙලේ දී හොඳම නීතීඥවරයාට හිමි සම්මානය කටුගම්පල මහතා විසින් හිමි කර ගත්තේය. ශ්‍රී ලාංකික විශේෂඥයින් නැවත ශ්‍රී ලංකාවට ගෙන්වා ගැනීම සඳහාත්, වර්තමානයේ අත්‍යාවශ්‍ය වී ඇති පරිදි ශ්‍රී ලංකාවේ සංවර්ධන කාර්යයයෙහිලා ඔවුන් දායක කර ගැනීම සඳහාත් ඔහු අඛණ්ඩව කටයුතු කර ගෙන යනු ලබයි.

## එස්. ජී. සේනාරත්න මහතා

**(CPFA(UK), FCA, FCMA, FPFA, MAAT, වාණිජවේදී විශේෂ උපාධිය, HNDC, DPFM, PGD)**

2018 මාර්තු 21 වන දින ශ්‍රී ලංකන් ගුවන් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයට මහා භාණ්ඩාගාර නියෝජිතයෙකු ලෙස පත්වුන එස්. ජී. සේනාරත්න මහතා පසුව ශ්‍රී ලංකන් කේටරින් සමාගමේ අධ්‍යක්ෂ ධුරයට පත්කරන ලදී.

එස්. ජී. සේනාරත්න මහතා මහා භාණ්ඩාගාරයේ, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ හිටපු අධ්‍යක්ෂ ජනරාල්වරයා වන අතර වර්තමානයේ එම දෙපාර්තමේන්තුවේම උපදේශකයෙකු වශයෙන් සේවය කරමින් සිටියි. ගිණුම්කරණය, වාර්තාකරණය, මූල්‍ය කළමනාකරණය, ව්‍යාපෘති කළමනාකරණය, රාජ්‍ය ව්‍යවසාය අධීක්ෂණය කිරීම පිළිබඳ අත්දැකීමෙන් යුතුව වසර 41 කට අධික කාලයක් රාජ්‍ය සේවයට ඔහු සිය හැකියාවන් කැප කර ඇත. සේනාරත්න මහතා එක්සත් රාජධානියේ වරලත් රාජ්‍ය මුදල් හා ගිණුම්කරණ ආයතනයේ, රාජ්‍ය මුදල් පිළිබඳ වරලත් ගණකාධිකාරීවරයෙකි. ඔහු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ, ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ, ශ්‍රී ලංකා රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරීවරුන්ගේ සංගමයේ සහ ශ්‍රී ලංකා ගණකාධිකරණ තාක්ෂණික ශිල්පීන්ගේ සංගමයේ අධි සාමාජිකයෙකි.

ඔහු ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් වාණිජවේදී (විශේෂ) උපාධියත්, පොලි ටෙක්නිකල් ආයතනයෙන් වාණිජ්‍යය පිළිබද උසස් ජාතික ඩිප්ලෝමාවත්, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයෙන් රාජ්‍ය මුදල් කළමනාකරණය පිළිබද ඩිප්ලෝමාවත්, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනයෙන් ව්‍යාපාර හා මුදල් පරිපාලනය පිළිබද පශ්චාත් උපාධි ඩිප්ලෝමාවත් ලබා ගෙන ඇත.

සේනාරත්න මහතා තම වෘත්තීය දිවිය අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ගුරුවරයෙකු වශයෙන් අරඹා ඇත. ගුරු වෘත්තියේ වසර 7 ක් සම්පූර්ණ කිරීමෙන් අනතුරුව ඔහු ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයට බැඳී ගණකාධිකාරීවරයකු, අධ්‍යක්ෂ, ප්‍රධාන මූල්‍ය නිලධාරී, අධ්‍යක්ෂ ජනරාල් සහ වර්තමානයේ උපදේශකවරයකු ලෙස විවිධ තනතුරු දරමින් දෙපාර්තමේන්තු, අමාත්‍යාංශ, රාජ්‍ය ව්‍යවසායකත්වයන්ගේ සහ විදේශ අරමුදල් යටතේ පවත්නා ව්‍යාපෘතිවල සේවය කරන ලදී. එපමණක් නොව ඔහු විශ්ව විද්‍යාල කිහිපයක, ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ, බැංකු සහ රාජ්‍ය අංශයේ හැකියා වර්ධන ආයතන වල බාහිර කතිකාචාර්යවරයකු ලෙසද සේවය කරයි.

සේනාරත්න මහතා තම සේවය රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ, සීමාසහිත පුත්තලමේ ලුනු සමාගමේ, සීමාසහිත ලංකා ඛණිජවැලි සමාගමේ, සීමාසහිත මන්තායි ලුනු සමාගමේ, සීමාසහිත ගල් ඔය වැවිලි සමාගමේ, සීමාසහිත ආගරපතන වැවිලි සමාගමේ සහ රාජ්‍ය නිලධාරීන්ගේ යහසාධක සංගමයේ, ශ්‍රී ලංකා රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරීවරුන්ගේ සංගමයේ, වාහන වායු විමෝචන භාරකාර අරමුදලේ, නීති යටිතල නඩත්තු කිරීමේ භාරකාර අරමුදලේ සේවය කර ඇති අතර වර්තමානයේ ශ්‍රී ලංකා එයාර් ලයින් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයකු ලෙස සේවය කරයි.

## ජොහාන් විජේසිංහ මහතා

2018 මැයි මස 08 වන දින ශ්‍රී ලංකන් ගුවන් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයට පත්වුන ජොහාන් විජේසිංහ මහතා පසුව ශ්‍රී ලංකන් කේටරින් සමාගමේ අධ්‍යක්ෂ ධුරයට පත්කරන ලදී.

වර්තමානයේදී විජේසිංහ මහතා හේලීස් ඒවියේෂන් සහ ප්‍රොජෙක්ට්ස් හි කළමණාකාර අධ්‍යක්ෂවරයා වන අතර හේලීස් සමූහයෙහි පරිපාලිත සමාගමක් වන අලුෆැබ් පී එල් සී හි කළමණාකාර අධ්‍යක්ෂවරයා වේ. තවද හේලීස් සමූහයෙහි බද්ධ සමාගමක් වන එස් ඇන්ඩ් ටී ඉන්ටීරියර් ප්‍රයිවට් ලිමිටඩ් හි විධායක අධ්‍යක්ෂවරයෙක් ලෙසද එතුමන් කටයුතු කරයි. එතුමන් හේලීස් සමූහයෙහි කළමණාකරන කමිටුවෙහි සාමාජිකයකුද වේ. සමූහයේ ගුවන් සේවා අංශය, හෝටල් සංවර්ධන, ඉදිකිරීම් කළමණාකරන, ඇලුමිනියම් පිරිසැකසුම් සහ ඇතුලත සැකසීම් ව්‍යාපාර සඳහා වගකීම් දරන්නේද එතුමන් විසිනි. ශ්‍රී ලංකන් ගුවන් සේවයට අමතරව එතුමන් වර්තමානයේදී හේලීස් සමූහයට සහ වැලිබල් වන් සමාගමට අයත් සමාගම් 17 ක අධ්‍යක්ෂ මණ්ඩලයේ කටයුතු කරයි.

හේලීස් සමූහයට සම්බන්ධ වීමට පෙර ශ්‍රී ලංකන් ගුවන් සේවයේ ඈත පෙරදිග, යුරෝපය, මැද පෙරදිග සහ කොළඹ ප්‍රධාන කාර්යාලයෙහි ජ්‍යේෂ්ඨ තනතුරු කිහිපයක් දරා ඇති විජේසිංහ මහතා ගුවන් සේවයෙහි සමූහ ජ්‍යේෂ්ඨ කළමනාකරණ කණ්ඩායමෙහි සාමාජිකයෙකු ලෙස කටයුතු කර ඇත. ශ්‍රී ලංකන් ගුවන් සේවය සමඟ ජොහාන් මහතාගේ සබඳතාවය 1983 දී ඔහු පුහුණු අලෙවි විධායකයකු ලෙස පත්වුණ දින දක්වා විහිදෙයි. පසුව ඔහු වර්ෂ 14 ක් පුරා ශ්‍රී ලංකන් ගුවන් සේවයේ ජ්‍යේෂ්ඨ තනතුරු කිහිපයක් දරා ඇත. ශ්‍රී ලංකන් ගුවන් සේවයෙන් ඉවත් වී වසර 05 කට පසුව 2003 වර්ෂයේදීගුවන් භාණ්ඩ ප්‍රධානී ලෙස දෙවන වරටත් ශ්‍රී ලංකන් ගුවන් සමාගමේ සේවයට බැඳුනි. ගුවන් ගමන් සහ ආගන්තුක සත්කාර ක්ෂේත්‍රයේ වර්ෂ 35 පමණ පළපුරුද්දක් ජොහාන් මහතා සතුවේ.

එක්සත් රාජධානියේ ලියර්සෙස්ටර් විශ්ව විද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනපති උපාධියක් හිමි එතුමන් එක්සත් රාජධානියේ අලෙවිකරණය පිළිබඳ වරලත් ආයතනයේ සාමාජිකයෙකි.

# අධ්‍යක්ෂ මණ්ඩලය ඉතිරි කොටස.

## ජ්‍යෙෂ්ඨ මහාචාර්ය අර්ජුන පී ද සිල්වා මහතා

2018 මැයි මස 21 වෙනි දින සීමාසහිත ශ්‍රී ලංකන් ගුවන් සමාගමේ අධ්‍යක්‍ෂ මණ්ඩලයට පත් විශේෂඥ වෛද්‍ය, ජ්‍යෙෂ්ඨ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය අර්ජුන පී ද සිල්වා මහතා (MBBS, MD, MSc(Oxon), FRCP(Lond), FCCP, AGAF, FNASSL) පසුව ශ්‍රී ලංකන් කේටරින් සමාග මේ අධ්‍යක්‍ෂ ධුරයට පත්කරන ලදී.

වර්තමානයේ ඔහු ජ්‍යෙෂ්ඨ මහාචාර්යයවරයකු වශයෙන් කැළණිය විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨයට අනුයුක්තව සිටින අතර සීමාසහිත නවලෝක පුද්ගලික රෝහලේ විශේෂඥ වෛද්‍යවරයෙකුද වේ. එසේම, ඔහු ශ්‍රී ලංකා උත්තේජක මර්දන ආයතනයේ (SLADA) සහ දකුණු ආසියා කලාපීය උත්තේජක මර්දන සංවිධානයේ (SARADO) හිත් සභාපතිවරයා වශයෙන්ද කටයුතු කරයි. SLADA පිහිටුවීමෙහිලාත්, තහනම් සංයෝග ජාවාරම සාපරාධයක් බවට නව නීති හඳුන්වා දීමෙහිලාත් ඔහු දායක වී ඇත. ඔහු ජාතික විද්‍යා හා තාක්ෂණික කොමිෂන් සභාවේ සාමාජිකයෙක් වන අතර කොළඹ වෛද්‍ය පශ්චාත් උපාධි ආයතනයේ මණ්ඩල සාමාජිකයෙක්ද, ජඨර ආන්ත්‍රික විද්‍යාව පිළිබඳ ලෝක සඟරාවේ සහාය කතෘවරයාද, ජාත්‍යන්තර සඟරා බොහෝමයක සමාලෝචකයෙක්ද වේ.

මහාචාර්යය ද සිල්වා මහතා කැළණිය විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨයේ අධ්‍යනාංශ ප්‍රධානියා ද, ජඨර ආන්ත්‍රික විද්‍යා අධ්‍යයන මණ්ඩලයේ සභාපති ද, ශ්‍රී ලංකා ජඨර ආන්ත්‍රික විද්‍යා හා ජීර්ණ පද්ධති විකිරණ පරීක්ෂණ සංගමයේ ලේකම් ද, ක්‍රීඩා පිළිබඳ වෛද්‍ය විද්‍යා ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් ද, සීමාසහිත ජෝර්ජ් ස්ටුඅර්ට් මූල්‍ය ආයතනයේ සභාපති ද, ජාතික අධ්‍යාපන ආයතනයේ කමිටු සාමාජිකයෙකු ද, ලන්ඩන් ඔලිම්පික් සංගමයේ කණ්ඩායම් වෛද්‍යවරයෙකු ද, ජාතික ක්‍රිකට් කණ්ඩායමේ වෛද්‍ය මණ්ඩලයේ සාමාජිකයෙකු ද විය.

ඔහු ගල්කිස්ස ශාන්ත තෝමස් විද්‍යාලයෙන් අධ්‍යාපනය ලබා උතුරු කොළඹ වෛද්‍ය විද්‍යාලයෙන් වෛද්‍ය විද්‍යා උපාධියත්, ශල්‍යකර්ම පිළිබඳ උපාධියත් ලබා ගැනීමෙන් අනතුරුව කොළඹ විශ්ව විද්‍යාලයේ වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයෙන් පළමු විශිෂ්ඨ ගණයේ වෛද්‍ය විද්‍යාපති පශ්චාත් උපාධියක් ලබා ගත්තේය. ඔක්ස්ෆර්ඩ් විශ්ව විද්‍යාලයෙන් විද්‍යාපති උපාධියක් ද ඔහු විසින් ලබා ගෙන ඇත. එක්සත් රාජධානියේ ඔක්ස්ෆර්ඩ්හි රැඩ්ක්ලිෆ් ඉන්ෆර්මරි ආයතනයේ ජඨර ආන්ත්‍රික විද්‍යාවේ රෙජිස්ට්‍රාර්වරයකු ලෙසද, පර්යේෂණ අධි සාමාජිකයෙකු ප්‍රායෝගිකව කටයුතු කළේය. ඔහුට ලන්ඩනයේ කායික රෝග විශේෂඥයින්ගේ රාජකීය විද්‍යාලයෙන් MRCP පිරිනමන ලදි. ඔහු ජඨර ආන්ත්‍රික විද්‍යාව පිළිබඳ මණ්ඩලයෙන් (AGAF) සහතික කරන ලද පුහුණුකරුවකු වන අතර ඔහුට FCCP පිරි නමන ලදී. එසේම ඔහු කායික රෝග විශේෂඥයින්ගේ රාජකීය විද්‍යාලයෙන් අධි සමාජිකත්වය ලබාගෙන ඇත. ඇමෙරිකන් ගැස්ට්‍රොඑන්ටෙරොලොජිකල් ඇසෝෂිඒෂන් ෆෙලෝහි අධි සාමාජිකයෙකි. ශ්‍රී ලංකා ජාතික විද්වත් පර්ෂදයේ සාමාජිකයෙකුද වේ. ඔහු 2001, 2006, 2008, 2010, 2012 සහ 2013 දී ජනාධිපති පර්යේෂණ සම්මානද ඇතුලත්ව පර්යේෂණ සම්මාන රැසක් දිනා ගෙන ඇත.

# කළමනාකරණයට අයත් ප්‍රධාන සාමාජික සාමාජිකාවෝ

**විපුල ගුණතිලක මහතා**
*ප්‍රධාන විධායක නිලධාරී*

විපුල ගුණතිලක මහතා ප්‍රධාන විධායක නිලධාරීවරයා ලෙස 2018 අගෝස්තු මස 24 වන දින සිට බලපැවැත්වෙන පරිදි පත්කරන ලදී.

ශ්‍රී ලංකන් ගුවන් සමාගමට සම්බන්ධ වීමට පෙර ගුණතිලක මහතා ටී ඒ ඒ ජී ඇන්ගෝලා එයාර්ලයින් හි අධ්‍යක්ෂවරයෙක් හා ප්‍රධාන මූල්‍ය නිලධාරීවරයා ලෙස කටයුතු කර ඇත. එමිරේට්ස් ගුවන් සමාගම විසින් ටී ඒ ඒ ජී හි කළමණාකරනය අත්පත් කරගත් පසු එමිරේට්ස් ගුවන් සමාගම මගින් මුලික වශයෙන් ටී ඒ ඒ ජී හි අධ්‍යක්ෂවරයෙක් ලෙස එතුමා නම් කරන ලදී. 2017 ජූලි මාසයේදී එමිරේට්ස් ගුවන් සමාගම හවුල්කාරීත්වය අවසන් වූ පසු ඇන්ගෝලා රජය විසින් ගුණතිලක මහතා නැවත අධ්‍යක්ෂ මණ්ඩලයට පත්කරන ලදී. ඇන්ගෝලා ජාතික ගුවන් සමාගම ප්‍රතිව්‍යුහගතකරණය කිරීම සඳහා විපුල මහතා නායකත්වය සැපයූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස කෙටි කාලයක් තුළ ගුවන් සමාගමට ලාභ සමච්ඡේදක තත්ත්වය ලඟාකරගැනීමට සහ ශක්තිමත් මුදල් ප්‍රවාහ තත්ත්වයක් ලඟාකරගැනීමට හැකිවිය. එමිරේට්ස් ගුවන් සමාගම විසින් ශ්‍රී ලංකන් ගුවන් සමාගම කළමණාකරනය කරන විට විපුල මහතා ශ්‍රී ලංකන් ගුවන් සමාගමේ ප්‍රධාන මූල්‍ය නිලධාරීවරයා ලෙස කටයුතු කළ අතර එමිරේට්ස් ගුවන් සමාගමෙන් ශ්‍රී ලංකා රජයට කළමණාකරනය හුවමාරු වන විට වැදගත් භූමිකාවක් හොබවන ලදී. ශ්‍රී ලංකාව, සිංගප්පූරුව සහ ඔස්ට්‍රේලියාව යන රටවල් සමාගම්හි ජ්‍යෙෂ්ඨ නායකත්ව තනතුරු ගණනාවක් ඒ මහතා විසින් දරා ඇත. කළමණාකරණ ගණකාධිකරුවන්ගේ වරලත් ආයතනයේ ශ්‍රී ලංකා කලාපීය මණ්ඩලයේ හිටපු සභාපතිවරයෙකු සහ ශ්‍රී ලංකා විගණන සහ ගිණුම්කරණ ප්‍රමිත නිරීක්ෂණ මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයකු ලෙස කටයුතු කල ඒ මහතා අධ්‍යක්ෂ මණ්ඩල තනතුරු ගණනාවක කටයුතු කර ඇත. එක්සත් රාජධානියේ කළමණාකරණ ගණකාධිකරුවන්ගේ වරලත් ආයතනයේ, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරුවන්ගේ ආයතනයේ සහ ඔස්ට්‍රේලියාවේ සහතික ලත් ගණකාධිකරුවන්ගේ ආයතනයේ අධි සාමාජිකයෙක් වූ විපුල මහතා කොළඹ විශ්ව විද්‍යාලයේ ව්‍යාපාර පරිපාලනපති උපාධිධාරියෙකි.

**ඩී ඒ. ජී. ජයසූරිය මහතා**
*ප්‍රධාන තාක්ෂණික නිලධාරී*

ඩී ඒ ජී ජයසූරිය මහතා 2018 සැප්තැම්බර් මස 01 දින ශ්‍රී ලංකන් ගුවන් සමාගමේ සේවයට බඳුනු අතර ප්‍රධාන තාක්ෂණික නිලධාරී වශයෙන් පත්විය.

පළමුවෙන්ම එතුමන් එවකට එයාර්ලංකා ලෙස හඳුන්වනු ලැබූ ශ්‍රී ලංකන් ගුවන් සමාගමට 1982 වර්ෂයේදී ජ්‍යෙෂ්ඨ බලපත්‍රලාභී ඉංජිනේරුවරයෙක් ලෙස සේවයට බැඳී පසුව 2009 වර්ෂය තෙක් විවිධ කළමණාකරන තනතුරු ගණනාවක් හොබවා ඇත. පසුව ඕමාන් එයාර් හි ජ්‍යෙෂ්ඨ කළමණාකරු (තාක්‍ෂණික කොන්ත්‍රාත්) තනතුර දැරිය. 2016 වර්ෂයේදී ඔහු ගුවන් යෝග්‍යතා අධ්‍යක්ෂ ලෙස ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියට සම්බන්ධ විය.

ජයසූරිය මහතා සතුව එක්සත් රාජධානියේ සිවිල් ගුවන්සේවා අධිකාරියේ ගුවන්යානා නඩත්තු ඉංජිනේරු බලපත්‍රයක් ඇති අතර පකිස්ථානු සිවිල් ගුවන්සේවා අධිකාරියේ ගුවන්යානා නඩත්තු ඉංජිනේරු බලපත්‍රයක් හා ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියේ ගුවන්යානා නඩත්තු බලපත්‍රයක් සතුව ඇත.

**කපිතාන් රජින්ද් රණතුංග මහතා**
*වැඩබලන ප්‍රධාන ගුවන් සේවා සැපයුම් සේවා නිලධාරී*

වැඩබලන ප්‍රධාන ගුවන් සේවා සැපයුම් සේවා නිලධාරී කපිතාන් රජින්ද් රණතුංග මහතා 1987 දී ආධුනික ගුවන් නියමුවකු ලෙස සමාගමට එක් විය. එයාර්බස් ගුවන්යානා බලඇණියෙහි මෙහෙයුම්වල නිරත වීමට පෙර L1011 වර්ගයේ ගුවන් යානා වල දෙවන නිලධාරී හා පළමු නිලධාරී ලෙසද කටයුතු කරමින් රණසිංහ මහතා සිය වෘත්තීය කටයුතු සිදුකර ඇත. තම උසස් කළමණාකරන භූමිකාවට අතිරේකව කපිතාන් රණතුංග මහතා A330 වර්ගයේ ගුවන් යානා වල පත්කළ පිරික්සුම් ගුවන් නියමුවකු ලෙසද කටයුතු කරයි.

**ඩැල්රීන් තිරුකුමාර් මහත්මිය.**
*සමාගම් ලේකම්/ සාංගමික ලේකම් කටයුතු ප්‍රධානී*

ඩැල්රීන් තිරුකුමාර් මහත්මිය 2013 දී සමාගමේ සේවයට බැඳෙන ලදී. ඇය සමාගම් ලේකම් හා සාංගමික ලේකම් කටයුතු ප්‍රධානී වේ. මෙම අංශය විසින් ශ්‍රී ලංකන් ගුවන් සමාගමට සහ ශ්‍රී ලංකන් කේටරින් සමාගමට ලේකම් කටයුතු සේවා සපයනු ලබන අතර ඊට අමතරව ජ්‍යෙෂ්ඨ කළමණාකරනයේ වැටුප් සැකසීමේ කටයුත්තෙහිද නිරත වේ. ඇය ශ්‍රී ලංකන් කෙයාර්ස් භාරකාර අරමුදලේ භාරකරුවෙකුද වෙයි.

වසර 20 කට අධික පශ්චාත් සුදුසුකම් පළපුරුද්දක් ඇය සතුවේ. ඇයගේ සේවා කාලය තුළ ශ්‍රී ලංකාවේ මහා පරිමාණ ලැයිස්තුගත සමාගම් ගණනාවක ජ්‍යෙෂ්ඨ සහ වගකීම් දරන තනතුරු දරා ඇත.

එක්සත් රාජධානියේ වරලත් ලේකම්වරුන්ගේ හා පරිපාලකවරුන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකාවක වන තිරුකුමාර් මහත්මියට ඔස්ට්‍රේලියාවේ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධියක්ද සතුවේ. ඇය ශ්‍රී ලංකා අධ්‍යක්ෂක වරුන්ගේ ආයතනයෙහි සමාජිකාවක වෙයි.

**යසන්ත දිසානායක මහතා**
*මූල්‍ය කළමණාකරන ප්‍රධානී*

2004 වර්ෂයේදී සමාගමේ සේවයට බැඳුනු යසන්ත දිසානායක මහතා මේ වන විට මූල්‍ය කළමණාකරන ප්‍රධානී ලෙස කටයුතු කරයි. සමාගමේ මූල්‍ය හා වාණිජ ප්‍රසම්පාදන කටයුතු ඔහුට වාර්තා කරනු ලැබේ.

ආසියාතික කලාපයේ සම්මාන දෙකකින් පිදුම් ලැබීමට හේතු වූ ප්‍රථම ජාත්‍යන්තර බැඳුම්කර නිකුතුව සහ ඉස්ලාමීය මූල්‍යකරණය ඇතුලත් සමාගමේ බොහොමයක් පුරෝගාමී මූල්‍ය ගණුදෙනු ගණනාවක් සඳහා දිසානායක මහතා මූලිකත්වය ගෙන කටයුතු කර ඇත.

නව A330 -300 වර්ගයේ ගුවන් යානා සඳහා පූර්ව බෙදාහැරීමේ මූල්‍යකරණය සැකසීමේලාද දිසානායක මහතාගෙන් ඉහළ දායකත්වයක් ලැබුණු අතර එම ගණුදෙනුව "එයාර් ෆිනෑන්ස් ජර්නල් " සඟරාව විසින් 2014 වසරේ "හොඳම ගුවන්යානා පූර්ව බෙදාහැරීම් ගණුදෙනුව" ලෙස නම් කර ඇත. සමාගමේ සේවයට පැමිණීමට පෙර එම මහතා ආයෝජන බැංකුකරණ සහ විදුලි සංදේශ ක්ෂේත්‍ර තුළ ජ්‍යෙෂ්ඨ තනතුරු දරා ඇත. වෘත්තියෙන් ගණකාධිකාරීවරයෙකු (එක්සත් රාජධානියේ කළමණාකරන ගණකාධිකරුවන්ගේ වරලත් ආයතනයේ අධි සාමාජික) වන එම මහතා කාඩිෆ්හි වේල්ස් විශ්ව විද්‍යාලයේ ව්‍යාපාර පරිපාලනපති උපාධියක්ද ලබා ඇත.

## කළමනාකරණයට අයත් ප්‍රධාන සාමාජික සාමාජිකාවෝ ඉතිරි කොටස.

**ශ්‍රීමන්තක සේනානායක මහතා**
*වැඩබලන මානව සම්පත් වැඩබලන ප්‍රධානි*

ජාත්‍යන්තර සබඳතා සහ ආශ්‍රිත නිල නෛතික කටයුතු පිළිබද ගුවන් සේවා ක්ෂේත්‍රයේ දශක ගණනාවක අත්දැකීම් සපිරි පරිණත නීති වෘත්තිකයෙකි. ද්විපාර්ශ්වීය ගුවන්සේවා ගිවිසුම්/වාණිජමය සම්මුතීන්, ද්විපාර්ශ්වීය වෙළඳ ගිවිසුම් සහ ජාත්‍යන්තර බහුපාර්ශ්වීය ආකෘතික රාමු පිළිබද නීති විශාරදයෙකි.

ඔහු විසින් සහකාර ගුවන්සේවා සමග වාණිජමය කේත හුවමාරු කරගැනීමේ කටයුතු සහ රාජ්‍ය නිලධාරී කණ්ඩායම් සමග එක්ව ශ්‍රී ලංකන් ගුවන්සේවය වෙනුවෙන් ගමන්මාර්ග අයිතීන් පිළිබද සම්මුතීන්ට එළඹීම සම්බන්ධයෙන් ප්‍රමුඛ වගකීමක් උසුලනු ලබන, ජාත්‍යන්තර සබඳතා පිළිබද ජ්‍යෙෂ්ට කළමනාකරු වශයෙන් කටයුතු කිරීමට අමතරව හෙතෙම වර්තමානයේදී මානව සම්පත් ප්‍රධානි (වැඩබලන) නිලය ද හොබවයි.

හෙතෙම පහත දැක්වෙන ආයතනයන්හිදී ශ්‍රී ලංකාව නියෝජනය කොට ඇති අතර තවදුරටත් නියෝජනය කරමින් ද සිටී.

ශ්‍රී ලංකා ජාතික සිවිල් ගුවන්සේවා ප්‍රතිපත්ති සැකසුම් කමිටු සාමාජික (NCAP 2016). ශ්‍රී ලංකන් එයාර්ලයින්ස් නියෝජනය කරමින් වන් වර්ල්ඩ් එලායන්ස් කළමනාකරණ මණ්ඩලයේ (oMB) සාමාජිකයකු වශයෙන් කටයතු කලේය. IATA ගුවන් මගී ඒජන්සි සම්මන්ත්‍රණයේදී (PAConf) ශ්‍රී ලංකා එයාර්ලයින්ස් නියෝජනය කලේය ඒ මහතා විසින් මෙයට පෙරද 2011 ජනවාරි මස සිට ජූනි මස දක්වා වැඩබලන මානව සම්පත් ප්‍රධානි තනතුර දරන ලදී.

**ප්‍රදීප් කැකුලාවල මහතා**
*දේපළ සහ සැපයුම් ප්‍රධානී*

2011 අගෝසතු මස සිට 2019 ජනවාරි මස දක්වා මානව සම්පත් ප්‍රධානී ලෙස සේවය කරනලද ප්‍රදීප් කැකුලාවල මහතා දේපළ සහ සැපයුම් ප්‍රධානී ලෙස වර්තමානයේ සේවය කරනු ලබයි.

ප්‍රදීප් කැකුලාවල මහතා දශක දෙකකට අධික කළමණාකරණ පලපුරුද්දක් සහිත ජ්‍යේෂ්ඨ මානව සම්පත් සංවර්ධන වෘත්තිකයෙකි. වසර 20 ක් වූ කාල පරිච්ඡේදයක් පුරා මානව සම්පත් සංවර්ධනය විෂය කෙරෙහි අවධානය යොමුකිරීමට පෙර ව්‍යාපෘති කළමණාකරනය, කළමණාකරණය, අලෙවි හා ව්‍යාපාර සංවර්ධනය යනාදී ක්ෂේත්‍ර වල ප්‍රධාන කළමණාකරන තනතුරු ගණනාවක් කැකුලාවල මහතා විසින් දරා ඇත. ප්‍රදීප මහතා මීට වසර 08 කට පෙර ශ්‍රී ලංකන් ගුවන් සමාග මේ මානව සම්පත් ප්‍රධානී ලෙස සේවයට බැඳීමට පෙර අධ්‍යාපන, කාර්යාල ස්වයංක්‍රීයකරණය, ඉංජිනේරු හා ඇගළුම් අංශවලට අයත් ප්‍රධාන පෙළේ සමාගම් බොහොමයක සාමන්‍යාධිකාරී, අධ්‍යක්‍ෂක හා මානව සම්පත් ප්‍රධානියා ලෙස ක්‍රියාකර ඇත.

කොමන්වෙල්ත් ඔෆ් ලර්නිං විද්‍යායතනයේ ව්‍යාපාර පරිපාලනපති උපාධිය හා ශ්‍රී ලංකා තොරතුරු තාක්‍ෂණ වෙතින් ලබාගත් තොරතුරු තාක්‍ෂණ කළමණාකරණය පිළිබඳ දැනුම කළමණාකරණය විශේෂ විද්‍යාපති උපාධියද ඇතුළුව කළමණාකරණය, මානව සම්පත් සහ තොරතුරු තාක්‍ෂණය පිළිබඳ පශ්චාත් උපාධි සුදුසුකම් කැකුලාවල මහතා සතු වේ.

ඔහු සිංගප්පූරුවේ ජාතික විශ්ව විද්‍යාලයෙන් සහ ශ්‍රී ලංකාවේ කළමණාකරන පශ්චාත් උපාධි ආයතනයෙන් මානව සම්පත් කළමණාකරණය පිළිබඳ විධායක පුහුණුව ලබාගෙන ඇත.

**මයුක රණසිංහ මහතා**
*සමූහ නීති කටයුතු ප්‍රධානී*

2009 වසරේදී සමාගමේ සේවයට බැඳුනු මයුක රණසිංහ මහතා දැනට සමූහයේ නීති කටයුතු ප්‍රධානී තනතුර දරයි. සිය වෘත්තීය නීති කෘත්‍ය වලින් ආරම්භ කළ ඒ මහතා ශ්‍රී ලංකන් ගුවන් සමාගමට සම්බන්ධ විමට පෙර විදුලි සංදේශ ක්ෂේත්‍රයට සම්බන්ධ වී කටයුතු කර ඇත. විවිධ මට්ටම්වල වූ සංකීර්ණ, ව්‍යුහාත්මක හා දේශ සීමාන්තර වාණිජමය ගිවිසුම් කටයුතු මෙහෙයවීම, බහු බල සීමා ආශ්‍රිත නීති කෘත්‍ය හා ආරවුල් නිරාකරණය, නියාමන කටයුතු, බුද්ධිමය දේපළ හා විවිධ බලසීමා ආශ්‍රිත සේවා නියුක්ති ගැටළු යනාදී ක්ෂේත්‍ර පිළිබඳ අත්දැකීම් සම්භාරයක් එතුමන් සතු වේ. වෘත්තීයෙන් නීතිඥයකු වන මයුක රණසිංහ මහතා කොළඹ විශ්ව විද්‍යාලයේ නීතිවේදී උපාධිධාරියෙකි. එමෙන්ම කොළඹ විශ්ව විද්‍යාලයේ නීතිපති උපාධිය සහ වේල්ස් විශ්ව විද්‍යාලයේ ව්‍යාපාර පරිපාලනපති උපාධියද එතුමන් සතු වේ.

**චාමර පෙරේරා මහතා**
*තොරතුරු තාක්‍ෂණ ප්‍රධානී*

1999 වර්ෂයේදී දී ශ්‍රී ලංකන් ගුවන් සමාගමේ සේවයට එක් වූ චාමර පෙරේරා මහතා 2012 වසරේ සිට එහි තොරතුරු තාක්‍ෂණ ප්‍රධානි තනතුර දරයි. සමාගමට හා සමූහයට අයත් ලොව පුරා පිහිටි කාර්යාල හා උපාය මාර්ගික ව්‍යාපාර ඒකක සහ ගුවන් තොටුපලවල් ආවරණය කරමින් ගොඩබිම් සේවා මෙහෙයුම්වල සිට යානාතුළ සම්බන්ධතාවයන් දක්වා වන සමාගමේ ගුවන් සේවා තොරතුරු සන්නිවේදන තාක්‍ෂණ කටයුතු ඔහු අධීක්‍ෂණය කරයි.

ගුවන් ප්‍රවාහනයෙහිලා වේගවත් ගුවන් ගමන් නවෝත්පාදක විසඳුම් අන්තර්ගත ජාත්‍යන්තර ගුවන් ප්‍රවාහන සංගමයට අයත් ව්‍යාපාර සරල කිරීමේ වැඩසටහන ස්ථාපිත කිරීම සඳහා චාමර මහතා මූලිකත්වය ගෙන ක්‍රියා කරන ලදී. ගුවන් සමාගම් ආශ්‍රිත තොරතුරු තාක්‍ෂණ පාලන වේදිකාවක් සහතික කරමින් ජාත්‍යන්තර වශයෙන් පිළිගත් තොරතුරු තාක්‍ෂණ ප්‍රමිතීන් හා අනුකූලව කටයුතු කිරීම සඳහා චාමර මහතා කටයුතු කර ඇත. තොරතුරු ආරක්‍ෂණ කළමණාකරනය සඳහා ISO/IEC270001:2013 සහතිකකරණයද, මෘදුකාංග තත්ත්ව කළමණාකරණය සඳහා ISO 9001:2008 සහතිකකරණය, තොරතුරු තාක්‍ෂණ සේවා කළමණාකරනය සඳහා ISO/IEC270000:2011 සහතිකකරණය වැනි ප්‍රමිත තුළින් ශ්‍රී ලංකන් තොරතුරු තාක්‍ෂණය සහතික කර ඇත. මනාව ඒකාබද්ධ වූ ගුවන් සේවා තොරතුරු තාක්‍ෂණ පාරිසරික පද්ධති ගණනාවක් සහිතව සමාගමේ ව්‍යාපාර හා මෙහෙයුම් කටයුතු පිළිබඳ ඩිජිටල් පරිණාමණයට චාමර මහතා නායකත්වය සලසයි.

මොරටුව විශ්ව විද්‍යාලයේ ඉලෙක්ට්‍රොනික හා විදුලි සංදේශ විද්‍යාවේදී උපාධියක් සහිත චාමර මහතා වෘත්තියෙන් ඉංජිනේරුවෙකි. තවද එක්සත් රාජධානියේ ලිසෙස්ටර් විශ්ව විද්‍යාලයෙන් තොරතුරු තාක්‍ෂණ කළමණාකරණ විශේෂ ව්‍යාපාර පරිපාලනපති උපාධියද ලබා ගෙන ඇත.

**චාමර රණසිංහ මහතා**
*ගුවන් භාණ්ඩ ප්‍රධානී*

චාමර රණසිංහ මහතා සමාගමේ ගුවන් භාණ්ඩ ප්‍රධානියා වශයෙන් 2013 වර්ෂයේදී සේවයට බැඳෙන ලදී.

ගුවන් සේවා කර්මාන්තයෙහි ගණුදෙනුකාර සේවා, ගුවන් භාණ්ඩ වෙන්කරවා ගැනීම්, ගුවන් භාණ්ඩ විකුණුම් හා අලෙවිය සහ ගුවන් තොටුපළ ගුවන් භාණ්ඩ මෙහෙයුම් යනාදී ක්ෂේත්‍රයන් සහ ගුවන් සමාග ම්හි ගුවන් භාණ්ඩ ආශ්‍රිතව වසර 16 කට වැඩි පළපුරුද්දක් ඒ මහතා සතුවේ.

රණසිංහ මහතා සමාගමේ සේවයට පැමිණීමට පෙර ශ්‍රී ලංකා තුල මෙහෙයුම් කටයුතු කරන පිළිගත් ජාත්‍යන්තර ගුවන් සමාගම්වල ජ්‍යේෂ්ඨ කළමණාකරන තනතුරු දරා ඇත.

**සුමුදු උපතිස්ස මහතා**
*ආදායම් කළමණාකරන, සැලසුම් හා වාණිජ උපකාරක ප්‍රධානි*

සමාගමේ පුහුණු විධායක නිලධාරියෙකු ලෙස 2000 වර්ෂයේදී සේවයට බැඳුනු උපතිස්ස මහතා එම පුහුණු වැඩසටහන සාර්ථක ලෙස නිමකර 2001 වසරේදී සමාගමේ වාණිජ අංශයට බැඳෙන ලදී. ජාත්‍යන්තර සබඳතා, කාල සටහන් ලේඛන සැලසුම් කිරීම, ජාල හා ආදායම් සැලසුම්කරණය සහ ආදායම් කළමණාකරනය යන ක්ෂේත්‍රයන් ආවරණය වන වසර 12 කට අධික කළමණාකරන අත්දැකීම් සහිතව වසර 17 ක කර්මාන්තයේ පළපුරුද්දක් ඇති ඒ මහතා 2017 දී සමාග මේ ආදායම් කළමණාකරනය, සැලසුම් හා වාණිජ උපකාරක ප්‍රධානී තනතුරුට පත්වන ලදී.

ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ උපාධිධාරියකු වන උපතිස්ස මහතා, එහි අලෙවි කළමණාකරනය පිළිබඳ විද්‍යාවේදී උපාධිය දරන අතර ජාත්‍යන්තර ගුවන් ප්‍රවාහන සංගමයේ ගුවන් සමාගම් අධ්‍යයනය පිළිබඳ (මොන්ට්‍රියල්) ඩිප්ලෝමාව සහ එක්සත් රාජධානියේ වරලත් අලෙවිකරණ ආයතනයේ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව සතු කරගෙන ඇත. එසේම ඔහු එක්සත් රාජධානියේ වරලත් අලෙවිකරණ ආයතනයේ ආශ්‍රිත සාමාජිකයකුද වේ.

**දිමුතු තෙන්නකොන් මහතා**
*ලොව්පුරා අලෙවි හා බෙදාහැරීම් ප්‍රධානී*

දිමුතු තෙන්නකෝන් මහතා සතුව ශ්‍රී ලංකන් ගුවන් සමාගමේ මූල්‍ය, අලෙවිකරන හා විකුණුම් යන ක්ෂේත්‍රවල වසර 25 කට ආසන්න පළපුරුද්දක් ඇත. සමස්ත ඈත පෙරදිග කලාපයටම අයත් කටයුතු නිරීක්ෂණය කරමින් එක්සත් අරාබි එමීර් රාජ්‍යය, කැනඩාව, ඉන්දියාව හා චීනය වැනි ලොව පුරා පිහිටි රටවල නේවාසිකවද සිට ඇත. 2017 වර්ෂයේ දී ලොව පුරා අලෙවි හා බෙදාහැරීම් ප්‍රධානී තනතුරට පත්වීමට පෙර ඔහු ශ්‍රී ලංකන් ගුවන් සමාගමේ වාණිජ මෙහෙයුම් සාමාන්‍යාධිකාරීවරයා ලෙස කටයුතු කරන ලදී. ඕමාන් එයාර් ගුවන් සමාගමෙහි උතුරු ඉන්දියාවේ කළමණාකරු ලෙස මුම්බායි නගරයේ නේවාසිකව කටයුතු කර ඇත. ඔහු විසින් කොළඹ විශ්ව විද්‍යාලයේ නීති උපාධිය ලබාගෙන ඇත.

**බුද්ධිකා මානගේ මහත්මිය**
*ගුවන් මැදිරි සේවා ප්‍රධානී*

2003 වර්ෂයේදී කළමණාකරන පුහුණු සේවකයෙක් ලෙස සමාගමට සම්බන්ධ වූ බුද්ධිකා මානගේ මිය 2004 වර්ෂයේදී වාණිජ ප්‍රසම්පාදන විධායක නිලධාරිනියක් ලෙස වෘත්තිය ආරම්භ කරන ලදී. ජ්‍යේෂ්ඨ යානාස්ථ සේවා විධායක (පරිපාලන සහ ගුවන් මැදිරි සේවක සේවා), යානාස්ථ සේවා කළමණාකරු (පරිපාලන සහ ගුවන් මැදිරි සේවක යෙදවීම්), මානව සම්පත් සංවර්ධන හා ව්‍යාපාර හවුල්කාරිත්ව කළමණාකරු, මානව සම්පත් සංවර්ධන හා ව්‍යාපාර හවුල්කාරිත්ව ජ්‍යේෂ්ඨ කළමණාකරු සහ අවසාන වශයෙන් ගුවන් මැදිරි සේවා ප්‍රධානී ලෙස වසර 15 පමණ ගුවන් සේවයේ පළපුරුද්දක් ඇය සතුවේ.

කොළඹ විශ්ව විද්‍යාලයේ සංඛ්‍යානය විශේෂ විද්‍යාවේදී උපාධිධාරිනියක් වන ඇය මොරටුව විශ්ව විද්‍යාලයේ කළමණාකරන විද්‍යාපති උපාධිධාරියෙක් සහ මානව කළමණාකරන ආයතනයේ වෘත්තීය සුදුසුකම් ලාභියෙකි. තවද ඇය කම්කරු නීති, සැපයුම් දාම කළමණාකරන සහ තොරතුරු තාක්ෂණ යන ක්ෂේත්‍රයන්හිද සුදුසුකම් සපුරා ඇත.

**ප්‍රිමාල් ද සිල්වා මහතා**
*සාමාන්‍යාධිකාරී, ශ්‍රී ලංකන් ගුවන් සේවා විද්‍යාතනය*

1988 දී සමාගමේ ගුවන් මැදිරි සේවක මණ්ඩලයේ සාමාජිකයකු ලෙස සේවයට එක්වූ සිල්වා මහතා 2006 වන තුරු ජ්‍යෙෂ්ඨ ගුවන් කාර්යය මණ්ඩල සමාජිකයෙකු ලෙස කටයුතු කර ඇත. දැනට ශ්‍රී ලංකන් ගුවන් සේවා විද්‍යාතනයෙහි සාමාන්‍යාධිකාරී තනතුර දරන අතර වගකීම් කළමණාකරු (147 කොටස), ගුවන් යානා නඩත්තු සහ පුහුණු සංවිධානය සඳහා වගකීම් දරනු ලැබේ. මෙම පත්වීමට පෙර ගුවන් මැදිරි ආරක්ෂක කළමණාකරු සහ යානාවන් තුළ මෙහෙයුම් හා පුහුණු කටයුතු කළමණාකරු යන පදවියන්ද සිල්වා මහතා දරන ලදී.

**ලුතිනන් කර්නල් බන්දුල වේරගම මහතා**
*සාමාන්‍යාධිකාරී ගුවන් තොටුපල හා ගොඩබිම් සේවා*

ශ්‍රී ලංකා යුද හමුදාවේ වසර 23 ක සේවා කාලයකින් පසුව වර්ෂ 2012 දී වේරගම මහතා සමාගමේ සේවයට එක් විය. ත්‍රිවිධ හමුදා පරිසරය ආශ්‍රිත පුහුණුව සහ අණ දීමේ පළපුරුද්දට අමතරව ඒ මහතා එක්සත් ජාතීන්ගේ සාම සාධක මෙහෙයුම් දෙපාර්තමේන්තුවෙහි ද සේවය කර ඇත. සමාගමේ මානව සම්පත්, ගුවන් යානාස්ථ හා ආරක්ෂක අංශවලට සේවා සැපයූ වේරගම මහතා ගුවන් තොටුපල හා ගොඩබිම් සේවා අංශයේ ප්‍රධානියා ලෙස 2016 පෙබරවාරි මාසයේදී පත් කරන ලදී.

කැළණිය විශ්ව විද්‍යාලයේ ආරක්ෂක අධ්‍යයන පිළිබඳ පශ්චාත් උපාධිය හිමි බන්දුල වේරගම මහතා පකිස්ථානයේ ක්වෙට්ටා විශ්ව විද්‍යාලයේ විද්‍යාපති උපාධියක්ද ලබාගෙන ඇත.

# ව්‍යාපාර අවදානම් කළමණාකරන රාමුව

### ක්‍රියාවලිය සමාලෝචනය

ශ්‍රී ලංකන් ගුවන් සමාගමේ ව්‍යාපාර අවදානම් කළමණාකරන රාමුව එහි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන අතර සහතිකකිරීම් හා උපදේශන සේවා අංශය විසින් මධ්‍යගතව පහසුකම් සලසනු ලැබේ. ව්‍යාපාර අවදානම් හඳුනාගැනීමේ සහ එම අවදානම් මත ශ්‍රී ලංකන් ගුවන් සමාගමට ඇතිවන බලපෑම් අවම කිරීම සඳහා ක්‍රියාකාරී සැලසුම් සැකසීම යන කාර්යයන් සඳහා වූ කර්මාන්ත නියාමන සහ මනා පරිචය අවශ්‍යතාවයන් ඉෂ්ඨ කිරීම සඳහා ශ්‍රී ලංකන් ගුවන් සමාගමේ ව්‍යාපාර අවදානම් කළමණාකරන රාමුව ස්ථාපිත කරන ලදී. මූල්‍ය, මෙහෙයුම්, තොරතුරු තාක්ෂණය, ආරක්ෂාව, අලෙවිකරණය, මානව සම්පත්, සාර්ව පාරිසරික අවදානම් ඇතුලත් උපායමාර්ගික, ක්‍රියාවලි සහ ව්‍යාපෘති මට්ටම් වලදී අවදානම් හඳුනාගැනේ. ශ්‍රී ලංකන් ගුවන් සමාගම තුළ ව්‍යාපාර අවදානම් කළමණාකරනය ක්‍රියාත්මක කිරීමේ වගකීම ඇත්තේ අවදානම් කළමණාකරන හැසිරවීමේ කමිටුව (ජ්‍යෙෂ්ඨ කළමණාකරන කණ්ඩායම), අවදානම් කළමණාකරන සම්බන්ධීකාරකයන් සහ ශ්‍රිතීය කළමණාකරණය (අවදානම් හිමිකරුවන්) යන පාර්ශව මතය.

### ව්‍යාපාර අවදානම් කළමණාකරන ව්‍යුහය




යහ පාලනයේ ප්‍රමුඛ අංගයක් ලෙස ඵලදායී ව්‍යාපාර අවදානම් කළමණාකරනය සඳහා ශ්‍රී ලංකන් ගුවන් සමාගම බැඳී සිටින අතර ශ්‍රී ලංකන් ගුවන් සමාගමේ අවදානම් සංස්කෘතිය විසින් අවදානම් මත පාදක වූ තීරණවලට එළඹීම සඳහා සියළුම සේවක සේවිකාවන් දිරිගන්වනු ලබයි.

### අවදානම් කළමණාකරන ක්‍රියාවලිය

ශ්‍රී ලංකන් ගුවන් සමාගමේ අවදානම් කළමණාකරන ක්‍රියාවලිය අවදානම් හඳුනාගැනීම, අවදානම් විශ්ලේෂණය, අවදානම් සඳහා පිළියම් යෙදීම සහ අවදානම් වාර්තාකරණය හා නිරීක්ෂණය යන ප්‍රධාන අංග හතරකින් සමන්විත වේ.




### අවදානම් හඳුනාගැනීම

ශ්‍රිතීය හා සාංගමික අරමුණු අත්පත් කරගැනීම සඳහා බාධාකාරී විය හැකි අභ්‍යන්තර හා බාහිර සාධක ශ්‍රී ලංකන් ගුවන් සමාගම විසින් හඳුනාගනු ලබයි. සහතිකකිරීම් හා උපදේශන සේවා අංශයේ මාර්ගෝපදේශකත්වය ඇතිව ශ්‍රිතීය මට්ටමේදී ද බුද්ධි කලම්බන සැසි, සම්මුඛ පරීක්ෂණ හා ප්‍රශ්නාවලි හරහා අවදානම් හඳුනාගනු ලබයි. අවදානම් ලේඛනයන් යාවත්කාලීන කිරීමට අවශ්‍ය සියලු තොරතුරු ශ්‍රිතීය කළමණාකරනය විසින් ආංශික/දෙපාර්තමේන්තු සම්බන්ධීකාරකයන් වෙත සපයා දෙයි. හඳුනාගන්නා ලද අවදානම්, අවදානම් කළමණාකරන හැසිරවීමේ කමිටුව විසින් කාර්තුමය වශයෙන් සමාලෝචනය කර අර්ධ වාර්ෂිකව අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව වෙත වාර්තා කරනු ලබයි.

### අවදානම් විශ්ලේෂණය

හඳුනාගන්නා ලද අවදානම් සිදුවිය හැකි සම්භාවිතාව හා එම අවදානම් හි බලපෑම මත පදනම්ව විශ්ලේෂණය කරන අතර අවදානම් සාධකය මත පදනම්ව සැලකිය යුතු, ඉහළ, මධ්‍ය හා පහළ යනුවෙන් ශ්‍රේණිගත කරනු ලබයි. සිදුවිය හැකි සම්භාවිතා අනුපාතය සමඟ බලපෑම් අනුපාතය ගුණ කිරීමෙන් අවදානම් සාධකය ගණනය කරනු ලැබේ.

## අවදානම් සඳහා පිළියම් යෙදීම

අවදානම් ශ්‍රේණීන් මත පදනම් ව ක්‍රියාකාරී සැලසුම් සැකසීමෙහිලා වගකීම ශ්‍රිතීය කළමණාකරනය විසින් දරනු ලබයි. අවදානම් සඳහා පිළියම් යෙදීම වෙනුවෙන් ශ්‍රී ලංකන් ගුවන් සමාගම විසින් හඳුනාගත් අවදානම් ප්‍රතිචාර තුළ අවම කිරීම, මාරු කිරීම, වැලැක්වීම සහ පිළිග ැනීම යන කාරණා ඇතුලත් වේ. හඳුනාගත් අවදානම් කළමණාකරනය කිරීම සඳහා වගකීම් ශ්‍රිතීය කළමණාකරනය දරන අතර අවදානම් කළමණාකරන හැසිරවීමේ කමිටුව විසින් ක්‍රියාකාරී සැලසුම් කාර්තුමය වශයෙන් සමාලෝචනය කරනු ලබයි. සැලකිය යුතු අවදානම් සඳහා පිළියම් යෙදීම පිළිබඳ ක්‍රියාමාර්ග ප්‍රධාන විධායක නිලධාරි/අදාළ ජ්‍යේෂ්ඨ කළමණාකරන කණ්ඩායම විසින් සමාලෝචනය කර අනුමත කරනු ලබයි. ඉහළ අවදානම් සඳහා පිළියම් යෙදීම පිළිබඳ ක්‍රියාමාර්ග ජ්‍යේෂ්ඨ කළමණාකරන කණ්ඩායම විසින් අනුමත කරනු ලබයි. මධ්‍ය අවදානම් සඳහා පිළියම් යෙදීම පිළිබඳ ක්‍රියාමාර්ග දෙපාර්තමේන්තු කළමණාකරුවන් විසින් අනුමත කරනු ලබයි. පහළ මට්ටමේ අවදානම් පවතින පාලන ක්‍රම මගින් කළමණාකරනය කෙරෙන අතර අවදානම් ශ්‍රේණීන් වල වෙනස්කම් සමීපව නිරීක්ෂණය කරයි.

## අවදානම් වාර්තාකරණය සහ නිරීක්ෂණය

ක්‍රියාමාර්ග අයිතමයන් නිසි කලට ක්‍රියාත්මක වන්නේදැයි නිරීක්ෂණය කිරීම සඳහා ආංශික/ දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් කාර්තුමය වශයෙන් අවදානම් කළමණාකරන ලේඛන සමාලෝචනයට කරනු ලැබේ. අවදානම් කළමණාකරන හැසිරවීමේ කමිටුව විසින් ප්‍රධාන අවදානම් සමාලෝචනය කර අර්ධ වාර්ෂිකව විගණන කමිටුව වෙත වාර්තා කරයි. අධ්‍යක්ෂ මණ්ඩලයේ අවධානය සැනෙකින් යොමු කළ යුතු අවස්ථාවන්හිදී හැර අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව විසින් ප්‍රධාන සාංගමික අවදානම් අර්ධ වාර්ෂිකව සමාලෝචනය කරන අතර අර්ධ වාර්ෂික පදනමක් මත අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කරයි.

# කළමනාකරණ සාකච්ඡාව සහ විශ්ලේෂණය



## මෙහෙයුම් පරිසරය

### ගෝලීය මුහුණුවර

2017 වර්ෂයේ දී, ජගත් ගුවන් සේවා කර්මාන්තය, ලෝක ආර්ථිකය තුල එහි වර්ධනය මනා ලෙස විදහා දක්වමින්, පෙර නොවූ විරූ කාර්යසාධන මට්ටමක් වර්තා කරන ලදි. වර්ධනය වූ සමස්ථ ජගත් ආර්ථික තත්ත්වයන්, වර්ෂයේ ගුවන් සේවා කර්මාන්තයේ වර්ධනයට මහත් පිටුවහලක් විය. ගුවන් සේවා ඉතිහාසයේ වර්තා වූ වැඩිම වාර්ෂික මඟීන් ප්‍රමාණය වන, ආසන්න වශයෙන් බිලියන 4.1 මඟින්ගණන සංඛ්‍යාවක් ගුවන් සේවා මඟින් ප්‍රවාහනය කරන ලදී. ගුවන් භාණ්ඩ ප්‍රවාහන ව්‍යාපාරය, කර්මාන්තය තුල ප්‍රවාහනයටොන් කිලෝමීටර් ප්‍රමාණය 9.7% ක වර්ධනයක්සමඟින්, ධනාත්මක ප්‍රගතියකින් ඉදිරියට ගමන් කර ඇත.

2016 හා සාපේක්ෂව 7% කට අධික, වැඩිවීමක් සහිතව, අනන්‍ය වූ නගර යුගල 20,000කට වැඩි ප්‍රමාණයක් දක්වා,ගුවන් සේවා ජාලය පුළුල් වී ඇත. ගුවන් සේවා ගාස්තු 1995 වර්ෂයේ ගාස්තු වලට වඩා දළ වශයෙන් අර්ධයක ප්‍රමාණයකට අඩු වීමෙන් (මූර්ත අගය), ගුවන් ගමන් සඳහා වැඩි පිවිසුමක් ඇති විය.

2016 වර්ෂයේ ලාභ මට්ටම වූ ඇමරිකන් ඩොලර් බිලියන 3.0 ඉහළ සීමාව ද අභිබවා යමින් , දළ ලාභය ඇමරිකන් ඩොලර් බිලියන 38 ක් ලෙස වාර්තා කරමින්, 2017 වර්ෂයේ දී, ජගත් ගුවන් සේවා කර්මාන්තය ලාභදායක වූවක් විය. ගුවන් ගමන් සඳහා ඉහළ යන ඉල්ලුම සහ ධනාත්මක ලෝක ආර්ථික තත්ත්වයන්, පසුගිය වර්ෂයේ දී කර්මාන්තයේ මූල්‍ය සාර්ථකත්වය සඳහා වූ ප්‍රධාන සාධකයන් විය. සමස්ථගෝලීය ලාභයෙන් 50%කට ආසන්න ප්‍රමාණයකට වගකීම දරමින්, උතුරු අමෙරිකානු ගුවන් සේවා, ගෝලීය ගුවන් සේවා ලාභදායීත්වයේ ආධිපත්‍ය දරන ලදී. ඓතිහාසික ඉහළ මට්ටමක් වූ, 2017 වර්ෂයේ දී ඇස්තමේන්තුගත මෙහෙයුම් ලාභ ආන්තිකය 7.5% වුව ද, වෙනත් කර්මාන්ත හා සංසන්දනය කිරීමේ දී ලාභ ආන්තිකය අඛණ්ඩව අඩු විය. රටේ අනාගත වර්ධනය සඳහා ආයෝජකයින් ආකර්ෂණය කර ගැනීමේ තීරණාත්මක අවශ්‍යතාවයක් වන ආයෝජිත ප්‍රාග්ධනය මත ලාභය, අඛණ්ඩව 3 වන වසරටත්, 9%කින් ප්‍රාග්ධන වියදම ඉක්මවීම සිදු විය.



ජගත් ගුවන් මඟී ප්‍රවාහන සේවා සඳහා ඉල්ලුම-කර්මාන්තය-පුරා ආදායම්ලාභී මඟී කිලෝමීටර් ප්‍රමාණය-2005 වර්ෂයේ සිට වේගවත්ම වර්ධනය වූ, 8.1%කින් වර්ධනය විය.කෙසේ නමුදු, සමස්ථ ගෝලීය ධාරිතාවයෙහි වර්ධනය-පවතින ආසන කිලෝමීටර් ගණන- වර්ධනය 6.7%ක තරම් පහළ විය.භාණ්ඩ මෙහෙයුම් තුල, පවතින භාණ්ඩ ටොන් කිලෝමීටර් ගණන, 2013 සිට පහළම ප්‍රමාණය වූ වසරින් වසර වර්ධනය 4.8% ක් විය. ධාරිතා හිඟයෙහි ප්‍රතිඵලයක් ලෙස, මඟී සහ භාණ්ඩ බර සාධක 2017 වර්ෂයේ දී ඉහළ යන ලදී.

### දේශීය මුහුණුවර

ශ්‍රී ලංකන් ගුවන් සේවය, එහි තිරසාර වර්ධන මූලෝපාය සමඟින් අඛණ්ඩව ඉදිරියට ගමන් කරයි. ගුවන් සේවය, වෙළඳපොලට ඉහළ වර්ධන ශක්තියක් සහිතව එම වෙළඳපොලට ධාරිතාවය එක් කිරීම සහ එමඟින් අපගේ අනන්‍ය තරඟකාරී ප්‍රතිලාභයට ඉඩ සැලසීම මඟින් ජාලය සඳහා පුරෝගාමී වෙළඳපොල නිර්මාණය කරන ලදී. ඒ අනුව, නව ගමනාන්ත හතරකට මෙහෙයුම් දියත් කිරීම"ඉන්දියාවේ කොයිම්බටෝ, හයිද්‍රාබාද් සහ විශාකාපත්නම් සහ ඔස්ට්‍රේලියාවේ මෙල්බර්න් - 2017 වර්ෂයේ දී හඳුන්වාදෙන ලදී.

2017 වර්ෂයේ දී සාර්ව ආර්ථික ක්‍රියාකාරීත්වය සැලකිය යුතු ලෙස පහළ වැටීමත් සමඟ ශ්‍රී ලංකා ආර්ථිකයට අභියෝගාත්මක වසරක් විය. දළ දේශීය නිෂ්පාදනයේ වර්ධනය, වසර 16කින් අවම ප්‍රමාණය වූ 3.1% ක් විය. කෘෂිකාර්මික අංශයට බලපෑ ගංවතුර සහ කල්පවතින නියඟය වැනි දැඩි කාලගුණික තත්ත්වයන් දළ දේශීය නිෂ්පාදනය වර්ධනය පහළ මට්ටමක පැවතීමට මූලික වශයෙන් හේතු වූ අතර අවසානයේ දී ඍණාත්මක වර්ධනයකට හේතු විය.

2017 වර්ෂයේ දී, සංචාරක කර්මාන්තය අඛණ්ඩව වර්ධනය විය. පෙර වර්ෂයට සාපේක්ෂව 3.2%ක වර්ධනයක් දක්වමින්, 2017 වර්ෂයේ මුළු සංචාරක පැමිණීම, මිලියන 2.1 වූ අතර, මෙතෙක් රටේ වාර්තා වූ ඉහළතම සංචාරක පැමිණීම බවට පත්විය. සංචාරක පැමිණීම් 384,628 (7.8% වැඩි වීමක්) සහිත ඉහළතම මූලාශ්‍ර වෙළඳපොල ලෙස ඉන්දියාව පවතින අතර, දෙවනුව පැමිණීම් 268,952 (1% අඩු වීමක්) චීනයෙන් ද, එක්සත් රාජධානියේ පැමිණීම් 201,879 (7.3% වැඩිවීමක්) ද වාර්තා වේ. සංචාරක කර්මාන්තය මඟින් දළ දේශීය නිෂ්පාදනය වෙත සෘජු දායකත්වය, ඇමරිකන් ඩොලර් බිලියන 4.5 විය.

ශ්‍රී ලංකාවෙන් සහ ශ්‍රී ලංකාවට ඇති, තරඟකාර ධාරිතාවය 2017/18 දී වසරින් වසර, 8%කට වැඩි ප්‍රමාණයකින් වර්ධනය විය. ශ්‍රී ලංකන්මඟින් මෙහෙයුම් සිදු කරනු ලබන, ප්‍රධාන වෙළඳපොල තුල සමහර ගුවන් සේවා ඇතුළු, නව ගුවන් සේවා ගනනාවක් මෙම වර්ෂයේ දී කොළඹට සේවා සැපයීම අරම්භ කරන ලදී.පසුගිය මූල්‍ය වර්ෂ පහ තුල, 7% ක සංයුක්ත වාර්ෂික වර්ධන අනුපාතයක් දක්වා ඇති තරඟකාරධාරිතා වර්ධනය, ඉල්ලුම උත්තේජනය කිරීම සඳහා අඩු ගාස්තු යොදා ගන්නා තරඟකරුවන්ගේ ඉල්ලුම, ධාරිතා වර්ධනය මඟින් අභිබවා යැම හේතුවෙන් වෙළඳපොල ගාස්තු සැලකිය යුතු ලෙස පහළ වැටීමකට හේතු වී ඇත.

## මූල්‍ය සමාලෝචනය

අඛණ්ඩව, ආදායම් මත සැලකිය යුතු පීඩනයක් එල්ල කරනු ලබන වෙළඳපොල අතිධාරිතාවය, දැඩි තරඟය සහ ඉන්ධන මිල ඉහළ යෑම මඟින් බලපෑමට ලක්වන, දිගින් දිගටම අභියෝගතාවය ඉහළ යන මෙහෙයුම් පරිසරයකට ගුවන් සේවාවට මුහුණ දීමට සිදු වී ඇත.

වර්ධන අවස්ථා මඟින් ජගත් ආර්ථිකය ශක්තිමත් වුව ද, 2017 දෙවන භාගයේ සිට 2018 වර්ෂය දක්වා, ජෙට් ඉන්ධන මිල ඉහළ නඟින ලදී. ගුවන් යානා සමූහයට, එයාර්බස් neo හඳුන්වා දීමේ දී ඉන්ධන කාර්යක්ෂමතාවයේ සැලකියයුතු ප්‍රගතියක් දක්නට ලැබිණි. ඉහළ ධාරිතාවය හේතුවෙන් පරිභෝජනය කරනු ලබන ඉන්ධන ප්‍රමාණය හදිසි ඉහළ යාම ගුවන් සේවයේ පිරිවැය ඉහළ යාමට ද හේතු විය. කෙසේනමුදු, දැඩි තරඟය මධ්‍යයේ ඉල්ලුම උත්ප්‍රේරණය කිරීම සඳහා සිදු කරනු ලබන ගාස්තු අඩු කිරීම් සහ උපායමාර්ගික ප්‍රවර්ධනයන් හේතුවෙන්, ඉහළ ඉන්ධන පිරිවැය, ඉහළ ගුවන් ගාස්තු සඳහා හේතු වන බවට ඇත්තේ සුළු සාධකය. සමහර ගුවන්යානා බදු ගිවිසුම් දීර්ඝ කිරීමේ ප්‍රතිඵලයක් ලෙස, වසර තුල, ගුවන්යානා නඩත්තු කිරීමේ සහ පිරිවැඩියා කිරීමේ පිරිවැය ද, වැඩිවීමක් දක්නට ඇත.

# කළමනාකරණ සාකච්ඡාව සහ විශ්ලේෂණය ඉතිරි කොටස.

පෙර මූල්‍ය වර්ෂයෙහි හිඟය වන රු. මිලියන 7,489.82 ට සාපේක්ෂව 2018 මාර්තු 31න් අවසන් වන මූල්‍ය වර්ෂය සඳහා මෙහෙයුම් පාඩුව රු. මිලියන 10,395.22 ක වැඩි වූ අගයක් සමූහය විසින් වාර්තා කරන ලදී.

තවද, ප්‍රධාන ආදායම් උපයන විනිමයට (ප්‍රධාන වශයෙන් ඇමරිකානු ඩොලරය) සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණ වීම සහ වැඩිවූ මූල්‍ය පිරිවැය, ශුද්ධ ඉපැයුම් කෙරෙහි දැඩි බලපෑමක් ඇති කරමින් සමූහයට අභියෝගයක්ව පවතී.

කෙසේ නමුදු, ප්‍රතිව්‍යුගතකරණ සැලසුමේ ප්‍රධාන අංගයක් ලෙස, යෝග්‍ය ලෙස යොදා ගනු ලබන උපායමාර්ගික මූලාරම්භයන් මඟින් ලැබෙන අධාරක මත, ගුවන් සේවය මූල්‍ය ප්‍රතිසාධනය සහ අනාගත ස්ථාවරත්වය පවත්වා ගැනීම සඳහා කටයුතු කරමින් පවතී. පුළුල් පදනමක් සහිත සැලසුමක කොටසක් ලෙස, එහි පිරිවැය කළමනාකරණය, එහි ආදායම් ප්‍රශස්තිකරණ උපායමාර්ග සහ වෙළඳපොළෙහි තරඟකාරී ස්ථානය ස්ථාවර කර ගැනීම සඳහා වඩාත් යෝග්‍ය විකල්පයන් හඳුනාගැනීම සඳහා වර්තමාන තත්වයට අභියෝග කිරීම කෙරෙහි, ආයතන සමූහය එහි අවධානය තීව්‍ර කරයි.

## බාහිර පරිසරයේ බලපෑම

### ඉන්ධන මිල

ඉන්ධන මිල විචලනය (එ.ජ.ස/එ.ජ.ගැ.)




### විචලනය

ජගත් ආර්ථික වර්ධනය මඟින් උත්ප්‍රේරිත ගුවන් ගමන් සඳහා ඉහළ යන ඉල්ලුම මත, වසර කිහිපයකට පෙර පහළ බැසීමේ ප්‍රවණතාවයට ප්‍රතිවිරුද්ධව, 2017 වර්ෂය ආරම්භයේ සිට, ගුවන්යානා ඉන්ධන මිල ඉහළ යෑමේ ප්‍රවණතාවයක් ඇති වී ඇත. 2018 වර්ෂය සඳහා ජෙට් ඉන්ධන මිලෙහි සාමාන්‍යය, පෙර වර්ෂයට සාපේක්ෂව 12.5%ක ඉහළ යාමක් ලෙස, ගැලුමක මිල ඇ.ඩො. 176ක් වනු ඇති බවට, IATA විසින් පුරෝකථනය කර ඇත. තවදුරටත්, වර්ෂ 2025 තෙක්, සෑම වර්ෂයකම, ඉන්ධන සඳහා ඉල්ලුම 1.9% සිට 2.6% දක්වා ප්‍රමාණයකින් ඉහළ යනු ඇති බවට තක්සේරු කර ඇත.

### ශ්‍රී ලංකන් එයාලයින් සඳහා බලපෑම

ජෙට් ඉන්ධන මිල ඉහළ යාමෙන් සහ ධාරිතාවය වැඩි වීමෙන් ප්‍රධාන වශයෙන් ඇති වන පරිභෝජනය කරනු ලබන ඉන්ධන ප්‍රමාණය ඉහළ යාම, අපගේ යානා සමූහයට වඩාත් ඉන්ධන-කාර්යක්ෂම ගුවන් යානා එක් කිරීමෙන් ලැබෙන ප්‍රතිලාභයට හිලව් වේ. එහි ප්‍රතිඵලයක් ලෙස, සමාලෝචනය කරනු ලබන වර්ෂය තුල 42%කින් ඉහළ යන ලද, ගුවන් සේවයේ මෙහෙයුම් පිරිවැයෙන් 27%ක් සමස්ථ ඉන්ධන පිරිවැය සමන්විත වේ.

### විනිමය අනුපාතය




### විනිමය විචලනය

ශ්‍රී ලංකා රුපියල, ආරම්භයේ දී රු. 151.81 සිට 2%ක අවකරණයක් දක්වමින්, සමාලෝචනය කරනු ලබන වර්ෂය අවසානයේ දී, ඇමෙරිකානු ඩොලරයට සාපේක්ෂව රු. 154.775 ක් වැනි අඩු අගයක් වාර්තා කරන ලදී. ඉහළ යන ඉන්ධන ආනයන පිරිවැය සහ අධික රාජ්‍ය ණය ගැනීම් සමඟින්, 2018 වර්ෂයේ දී, පෙර වර්ෂයට වඩා බෑස්මක් සහිතව තවදුරටත් අවකරණය වනු ඇතැයි අපේක්ෂා කෙරේ. තවද, වෙනත් ප්‍රධාන ආදායම් උපයන විනිමයන්ට සාපේක්ෂව ද ශ්‍රී ලංකා රුපියල අඛණ්ඩව අවකරණය විය.

### ශ්‍රී ලංකන් එයාලයින් සඳහා බලපෑම

සමාගමේ ආදායම් උත්පාදනය 80%ක් ම විදේශ විනිමයෙන් සිදු වීමේ ප්‍රතිඵලයක් ලෙස, ප්‍රධාන ආදායම් උපයන විනිමය හා සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල දුර්වල වීම, සමාගමට ආදායම් වැඩිවීමක් සඳහා හේතු වී ඇත. පෙර වර්ෂයට වඩා මෙම වර්ෂය තුල විනිමය අහිමිවීම අඩු වුව ද, සමාගමේ මෙහෙයුම් පිරිවැයෙන් සැලකිය යුතු ප්‍රමාණයක් විදේශ විනිමය (ප්‍රධාන වශයෙන් ඇමරිකන් ඩොලර්) මඟින් සිදු වන බැවින් ශුද්ධ ඉපැයුම් කෙරෙහි විනිමයෙහි බලපෑම ඇතිවිය.

### ආදායම

අභියෝගාත්මක මෙහෙයුම් පරිසරය කෙබඳු වුවද, සැලකියයුතු ලෙස වසරින් වසර වැඩි වන මඟී සංඛ්‍යාවේ වර්ධනයේ ප්‍රතිඵලයක් ලෙස, සමූහයට 19.0% ක වැඩි වීමක් වන රු. මිලියන 164,859.51 ආදායමක් දැකිය හැකිවිය. කෙසේ නමුදු, ගුවන් පර්යන්තයේ සහ වෙනත් සේවාවන්හි වාර්තාගත ආදායම පහත වැටීම හේතුවෙන් මෙම වැඩිවීමෙන් කොටසක් ඒ සඳහා හිලව් වන ලදී.

එසේම, මඟී ප්‍රවාහනයේ ඉල්ලුම සැලකිය යුතු වර්ධනයවීම සහ භාණ්ඩ ප්‍රවාහනයේ වර්ධනය තුලින්, සමාගමේ ආදායම ශ්‍රී ලංකා රුපියල් වලින්, 19.3%ක ප්‍රමාණයකින් එනම් රු. මිලියන 161,654.46 කින්, වැඩි විය. ඵලදායී ධාරිතා භාවිතය මඟින් කලාපීය ජාලය පුළුල් කර ගැනීම සඳහා වූ ඉලක්කගත උත්සාහයන් සහ යානා සමූහය පුළුල් කර ගැනීමේ ක්‍රියාවලිය මඟින් නව මාර්ග විවෘත වීමත් මෙම ආදායම් වර්ධනයට දායක විය.

කෙසේ නමුදු, ප්‍රධාන අදායම් උත්පාදන විනිමයන්ට සාපේක්ෂව ශ්‍රී ලාංකික රුපියල අවප්‍රමාණ වීමේ තත්ත්වය මත ආදායම් අහිමි වීම හේතුවෙන් සහ යම් ප්‍රධාන වෙළඳපොලහි දැඩි තරඟය හා අතිධාරිතාවය තුල ආදායම් සංකෝචනයවීම හේතුවෙන්, මෙම ආදායම් වර්ධනය යම් තරමකට අඩු විය. කෙසේ නමුදු, ඉහළතම ආදායම් සහ යානා මැළිරි සාධක අත්කර ගැනීම සම්බන්ධයෙන් සමාලෝචනය කරනු ලබන වර්ෂය ඉතිහාසයේ නව සටහනක් තබා ඇත.

### සමස්ථ සමූහයේ ආදායම (රු. බිලි.)




### සමස්ථ සමාගම් අදායම (රු.බිලි.)




### සමූහයේ ආයතනයේ ආදායම් සංයුතිය







ප්‍රශස්ත යානා සමූහයක් සහ පාඩු අවම කිරීම මඟින් අනාගත ස්ථාවරත්වය ඇති කර ගැනීමේ අරමුණින්, සමාගම එහි ජාලය ප්‍රතිව්‍යුහගත කිරීම වෙත අඛණ්ඩව පියවර නඟමින් සිටී. ඒ අනුව, ශ්‍රී ලංකන් ජාලයට ආසියාවේ නව ගමනාන්ත තුනක් සහ ඕස්ට්‍රලේියාවේ එක් ගමනාන්තයක් එක් කර ගන්නා ලදී.

2017 ජූලි මාසයේ දී, විශාකාපට්නම්, හයිද්‍රාබාද් සහ කොයිම්බටෝ දක්වා නව සේවා දියත් කිරීමත් සමඟ, ගුවන් සේවය, ඉන්දියානු වෙළඳපොලෙහි දිගුකාලීන පැවැත්ම ශක්තිමත් කරගන්නා ලද අතර, කලාපීය ප්‍රවාහකයකු ලෙස එහි බලය තහවුරු කර ගන්නා ලදී. මෙය ඉන්දියාවේ මුළු ගමනාන්ත සංඛ්‍යාව නගර 14 දක්වා වැඩි කරන ලදී.

කොළඹ සහ මෙල්බර්න් අතර දිනපතා පියාසර කිරීම ආරම්භ කිරීම මඟින් 2017 ඔක්තෝබරයේ දී ගුවන් සේවය තම ගමන් මගේ නව සැතපුමක් සනිටුහන් කිරීමත් සමඟ, මාර්ග ප්‍රශස්තිකරණ මූලෝපාය තවදුරටත් ශක්තිමත් විය.ශ්‍රී ලංකාව සහ ඕස්ට්‍රේලියාව  අතර එහි මඟීන්ට නොනවතින සේවාවක් ලබා දීම මඟින්, ගුවන් සේවය, ප්‍රභේදනය තුලින් තරඟකාරී ප්‍රතිලාභ අත්කර ගැනීම සඳහා වඩාත් හොඳින් ස්ථානගත වී ඇත.

# කළමනාකරණ සාකච්ඡාව සහ විශ්ලේෂණය ඉතිරි කොටස.

## සමූහයේ ආදායම් සංයුතිය




| | |
|---|---|
| ශ්‍රී ලංකාව | 25.97% |
| ආසියාව (ශ්‍රී ලංකාව හැර) | 38.85% |
| යුරෝපය සහ අප්‍රිකාව | 10.79% |
| මැද පෙරදිග | 18.67% |
| උතුරු සහ දකුනු ඇමරිකාව | 3.0% |
| නිරිතදිග පැසිෆික් | 2.72% |




| | |
|---|---|
| ශ්‍රී ලංකාව | 31.69% |
| ආසියාව (ශ්‍රී ලංකාව හැර) | 33.95% |
| යුරෝපය සහ අප්‍රිකාව | 13.77% |
| මැද පෙරදිග | 16.65% |
| උතුරු සහ දකුණු අමෙරිකාව | 3.05% |
| නිරිතදිග පැසිෆික් | 0.89% |

අමතර ගමන් මළු සහ සැලසුම්-නොකළ සේවා හැර මඟී ආදායමෙහි වැඩිවීම වූ රු.මිලියන 26,686.54ක ආදායම පහත පරිදි දැක්විය හැකිය:

| | රුපියල් මිලි. |
|---|---:|
| 2.24% ක මඟී ආදායම ඉහළයෑමරුපියල් | 2,543.95 |
| 18.45% ක ආසන ධාරිතාවය ඉහළ යෑම | 20,906.27 |
| 2.88% ප්‍රමාණයක මඟී බර සාධකය ඉහළයෑම | 3,236.32 |
| | 26,686.54 |

මඟී ආදායම ශ්‍රී ලංකා රුපියල් මඟින් 2.24%ක වර්ධනය වීමක් ලෙස දැක්වුව ද, සමාගමේ ආදායමෙන් 80%ක ප්‍රමාණයක් විදේශ විනිමය මඟින් ඉපයීම යනකරුණ හේතුවෙන්, එය ඇ.ඩොලර් මඟින් දැක්වීමේ දී අඩු වී ඇත.

| | 2018 | 2017 | වෙනස % |
|---|---:|---:|---:|
| මඟී ආදායම් රුපියල් මඟින් | 8.62 | 8.43 | +2.24 |
| මඟී ආදායම එ. ජ. සත (USC) | 5.63 | 5.72 | -1.50 |

මඟී බර සාධකයෙහි 1%ක ප්‍රමාණයක, ආසන ධාරිතාවයෙහි 1%ක් සහ මඟී එලදාවේ 1%ක වෙනස, මඟී ආදායමේ සංවේදීතාවයට බලපාන ආකාරය පහත පරිදි වේ

| | රුපියල් මිලි. |
|---|---:|
| මඟී එලදාව සහ ආසන ධාරිතාවය නිශ්චිතව පවතී නම්, මඟී බර සාධකයේ 1%ක් වෙනස් වීම | 1,593.56 |
| මඟී එලදා සාධකය නිශ්චිතව පවතී නම්, ආසන ධාරිතාවය 1%ක් වෙනස් වීම | 1,051.09 |
| මඟී ප්‍රවාහනය නිශ්චිතව පවතී නම්, මඟී එලදාවෙහි 1% ක් වෙනස් වීම | 1,317.15 |

## වියදම

2017 වර්ෂයේ ලං.රු. මිලි. 167,496.56 ට සාපේක්ෂව 10%ක වැඩි වීමක් සහිතව 2018 වර්ෂයේ දී සමූහයේ සමස්ථ වියදම ලං.රු. මිලි. 184,209.49 විය. සමූහයේ වියදම් අනුබණ්ඩනය පහත පරිදි සකසා ඇත.:

| | 2018 | | 2017 | | විචලනය | |
|---|---:|---:|---:|---:|---:|---:|
| | රුපියල් මිලි. | % | රුපියල් මිලි. | % | රුපියල් මිලි. | % |
| ගුවන් යානා ඉන්ධන පිරිවැය | 47,037.86 | 26% | 33,129.60 | 20% | 13,908.26 | 42% |
| සේවක පිරිවැය | 20,897.26 | 11% | 20,012.56 | 12% | 884.70 | 4% |
| ගුවන් තොටුපල, මාර්ගස්ථ සහ ගුවන් මඟී වියදම් | 25,248.56 | 14% | 21,302.32 | 13% | 3,946.24 | 19% |
| කල්බදු ගුවන්යානා මත වාරිකය | 25,726.29 | 14% | 22,789.22 | 14% | 2,937.07 | 13% |
| ගුවන් යානා නඩත්තු සහ පිරිවැඩියා පිරිවැය | 22,829.07 | 12% | 17,644.09 | 11% | 5,184.98 | 29% |
| ක්ෂය කිරීම්/ක්‍රමක්ෂය කිරීම් | 1,976.04 | 1% | 2,326.30 | 1% | (350.26 ) | (15%) |
| විකුණුම්, අලෙවි සහ ප්‍රචාරණ වියදම් | 15,814.59 | 9% | 12,737.28 | 8% | 3,077.31 | 24% |
| ගුවන් සේවක පිරිස් වියදම් | 6,035.58 | 3% | 5,435.73 | 3% | 599.84 | 11% |
| විනිමය පාඩුව | 1,815.64 | 1% | 2,835.07 | 2% | (1,019.43) | (36%) |
| වෙනත් වියදම් | 7,873.84 | 4% | 7,868.48 | 5% | 5.36 | 0% |
| මූල්‍ය පිරිවැය | 8,954.77 | 5% | 7,053.10 | 4% | 1,901.67 | 27% |
| ගුවන්යානා කල්බදු ගිවිසුම් අවලංගු කිරීම සඳහා වන්දි | - | 0% | 14,362.81 | 9% | (14,362.81) | (100%) |
| සමූහයේ මුළු වියදම | 184,209.50 | 100% | 167,496.56 | 100% | 16,712.94 | |

සෘජු මෙහෙයුම් පිරිවැය වැඩි වීම හේතුවෙන්, සමූහයේ මුළු වියදම්, 2017ට සාපේක්ෂව 2018දී ලං.රු. මිලියන 16,712.94කින් ඉහළ යන ලදී. පෙර වසර හා සංසන්දනයේ දී, යානා සමූහය නව ගුවන් යානා තුනකින් වැඩිවීම, පවතින ආසන කිලෝමීටර් ගණනට අදාලව මඟී ධාරිතාවය 18%කින් වැඩි වීමට දායක වූ, සතියකට අමතර පියාසර 67 ක් හඳුන්වා දීමට හැකිවීම, ප්‍රතිඵලයක් බවට පත්විය.

සමූහයේ මුළු පිරිවැයේන් 26% කින් වූ ගුවන්යානා ඉන්ධන පිරිවැය, පසුගිය වසරට වඩා ලං.රු. මිලියන 13,908.26 කින් වැඩිවිය. මෙය ජගත් ඉන්ධන මිල ගණන් සහ පරිමාව නැංවීම යන සාධක දෙකෙහි ඉහළ යැමෙන් සිදු විය.

2017 වසරේ USC 161 ඉන්ධන මිල 2018 වසරේදී USC 191 දක්වා ඉහළ යන ලදී. ඉන්දියාවට අමතර ගමන් මාර්ග පිහිටුවීම සහ මෙල්බර්න් මෙහෙයුම් ආරම්භ කිරීම, දැඩි විචලනයකට හේතු වූ ඉන්ධන පරිමා වැඩිවීමට ප්‍රධාන ලෙස දායක විය.

අමෙරිකානු ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල දුර්වල වීම මඟින් විදේශ විනිමය සඳහා ඇති වූ දැඩි බලපෑම, ලං.රු. මිලියන 1,398.68ක පාඩුවක් සඳහා හේතු විය.(ඇ.ඩො/ලං.රු දළ අනුපාතය 2018 දී ලං.රු. 153 ක් වූ අතර, 2017 දී රු. 147ක් විය).

| | ලං.රු. මිලි. |
|---|---|
| 18.21% ක ඉන්ධන මිල වැඩිවීමෙන් | (7,194.84) |
| 16.23% ක පරිමාව ඉහළ නැංවීමෙන් | (5,314.74) |
| 3.80% ඇ.ඩොලරයට සාපේක්ෂව රුපියල අවප්‍රමාණය වීමෙන් | (1,398.68) |
| | (13,908.26) |

ඉන්ධන ඵලදායීතාවය, කිලෝමීටරයට ආදායම් ටොන් (revenue tonne) - අමෙරිකානු ගැලුම් (RTK/USG) මැනීමේ දී, එය පෙර වර්ෂයේ RTK/USG සාපේක්ෂව 0.22 RTK/USG ප්‍රමාණයකින් 10.93 දක්වා වැඩි විය.

ඇ.ඩොලර් විනිමය අනුපාතය සහ ඉන්ධන පරිභෝජනය ස්ථාවරව පවතින්නේ නම්, ඇ. ගැලුමට (USG) ඇ.ඩොලර් ශතයකින් ඉන්ධන මිල වෙනස් වීම, සමූහයේ වාර්ෂික පිරිවැයට දළ වශයෙන් ලං.රු. මිලියන 246.81ක බලපෑමක් සිදු කරයි.

එසේම ඇ.ඩොලර් විනිමය අනුපාතය සහ ඉන්ධන මිල ස්ථාවරව පවතින්නේ නම් ඉන්ධන ඵලදායීතාවයේ 1% ක වෙනස් වීමක් සමූහයේ වාර්ෂික ඉන්ධන පිරිවැයට දළ වශයෙන් ලං.රු. මිලියන 470.38 ක බලපෑමක් සිදු කළ හැකිය.

ගුවන්යානා කල්බදු පිරිවැය 2017 වර්ෂයට සාපේක්ෂව 2018 වර්ෂයේ දී 13% කින් එනම් ලං.රු. මිලියන 25,726.29 දක්වා වැඩි විය. මෙය ගුවන් සේවයේ නව A320neo යානා මෙහෙයුම් ආරම්භ කළ පළමු පූර්ණ මුදල් වර්ෂය වීම සහ එම මුදල් වර්ෂය තුල නව A321neo යානා තුන නිල වශයෙන් ආරම්භ කිරීම යන සාධක හේතු විය.

පෙර වර්ෂයට සාපේක්ෂව ගුවන් යානා නඩත්තු සහ පිරිවැඩියා පිරිවැය 2018 වර්ෂයේ දී 29%ක වැඩි වීමක් එනම් ලං.රු. මිලියන 5,184.98 ක වාර්තාගත වැඩි වීමක් වාර්තා කරන ලදී. මෙය neo ගුවන් යානා සමූහය තුනකින් වැඩි වීම සහ සමහර A330-200 ගුවන් යානාවන්හි කල් බදු දීර්ඝ කිරීම හේතුවෙන් සිදු කළ යුතු දැඩි නඩත්තු පරීක්ෂාවන් සඳහා ප්‍රතිපාදන ඉහළ යාම යන සාධක තුලින් සිදු විය.

ජගත් බෙදාහැරීමේ පද්ධතියේ (GDS) පිරිවැය ඉහළයාම, අධි කොමිස් (pax) සහ ශ්‍රී ලංකන් එයාර්ලයින් නියෝජිතයින්ට ගෙවනු ලබන විශේෂ දිරිදීමනා ඉහළ යෑම හේතුවෙන් විකිණීම අලෙවිකරණය සහ වෙළඳ දැන්වීම් සඳහා පිරිවැය 24% කින් ඉහලයාම පෙර වර්ෂයට සාපේක්ෂව රැගෙන යනු ලැබූ මඟී සංඛ්‍යාවේ වැඩිවූ 31%ක වැඩි වීම සමඟ අනුගත වෙයි.

2017/18 වර්ෂවල මෙහෙයුම් සිදු කරන ගුවන් යානා ගණන 30%කින් ඉහළ යෑමට සාපේක්ෂව, ගුවන්තොටුපල, මාර්ගස්ථ හා මඟී කාර්ය මණ්ඩලය සහ වෙනත් වියදම් වැඩි වීම, යම් ආන්තික ප්‍රමාණයකට වැඩිවීම දක්වා පාලනය කර ගැනීමට සමාගම සාර්ථක වී ඇත.

සාමූහික කේවල ගිවිසුම් මත පදනම් වූ වැටුප් සංශෝධනයන් හා ආශ්‍රිත විශ්‍රාම පිරිවැය වර්ෂය තුල සේවා නියුක්තික පිරිවැය 4%කින් ඉහළ යෑමට හේතු විය.

## මෙහෙයුම් සමාලෝචනය

### වාණිජ මෙහෙයුම්

#### *මාර්ග ජාල සහ යානා සමූහය*

ශ්‍රී ලංකන් ගුවන් සේවය, වර්තමානයේ ලෝකයේ රටවල් 20 ක ගමනාන්ත 40 ක්කරා පියාසර කරනු ලබයි. ඒකාබද්ධ මෙහෙයුම් තුලින්, උතුරු අමෙරිකාව, යුරෝපය, මධ්‍යම ආසියාව, අප්‍රිකාව, කැනඩාව සහ ඕස්ට්‍රේලියාව වැනි රටවල් 27 ක ගමනාන්ත 64ක් කරා, ගුවන් සේවය මඟීන්ට තම සේවය සපයයි.

2017/18 මුදල් වර්ෂ තුල, ශ්‍රී ලංකන් ගුවන් සේවය, ඔස්ට්‍රලේසියා කලාපයේ සහ ආසියාවේ ඈත දුර කලාපයන්හි අමතර නව ගුවන් මාර්ග රාශියක් කරා, දැනට මෙහෙයුම් සිදු කරන ක්වන්ටාස් සහ ජපන් ගුවන් සේවය වැනි ගුවන් සහකරුවන් සමඟින් තම සහයෝගීතාවය පුළුල් කර ඇත. ශ්‍රී ලංකන්, මියන්මාර් එයාර්වේස් ඉන්ටර්නැෂනල් සමඟින් එහි සිංගප්පූරුවේ සහ බැංකොක් හි පිහිටි මධ්‍යස්ථාන තුලින් යන්ගොන් වෙත ගුවන් මඟීන්ට තම ප්‍රවාහන පහසුකම සලසාලීම සඳහා, අන්‍යෝන්‍ය ඒකාබද්ධ හවුල්කාරීත්වයක් ද දියත් කරන ලදී. මෙම ඒකාබද්ධ සහයෝගීතාවය මඟින් මියන්මාර් එයාර්වේස් ඉන්ටර්නැෂනල් ගුවන් සේවයට, කොළඹට පැමිණෙන මඟීන්ට ශ්‍රී ලංකන් සේවාවන් ප්‍රවර්ධනය කිරීමට ද අවස්ථාව සැලසේ. වර්තමානයේ දී ශ්‍රී ලංකන් ගුවන් සේවය, එතිහැඩ් එයාර්වේස්, මැලේසියන් එයාර්ලයින්ස්, එයාර් කැනඩා, අලිතාලියා, ඕමාන් එයාර්, ෆින්එයාර්, ජැපෑන් එයාර්ලයින්ස්, ක්වන්ටාස් එයාර්වේස්, ජෙට්ස්ටාර් ඒසියා එයාර්වේස්, කටාර් එයාර්වේස් සහ මියන්මාර් එයාර්වේස් ඉන්ටර්නැෂනල් හා ඒකාබද්ධ සහෝගීතාවයෙන් කටයුතු කරයි.

## කළමනාකරණ සාකච්ඡාව සහ විශ්ලේෂණය ඉතිරි කොටස.

2018 මාර්තු 31 වන විට ශ්‍රී ලංකන්, සෑම සතියකම ගුවන් මාර්ග 38ක් සඳහා කොළඹ සිට කාලසටහන් පියාසර කිරීම් 350කට අධික සංඛ්‍යාවක් මෙහෙයවන ලදී. මෙම ගුවන් මාර්ගයන්ගෙන් 10ක් ගිණිකොන දිග ආසියාවට ද, 17ක් කලාපීය මාර්ගයන්ට ද, 10ක් මැද පෙරදිග මාර්ගයන්ට ද, එකක් යුරෝපයට ද ක්‍රියාත්මක විය.

### ජාල ප්‍රශස්තීකරණය සහ ආදායම

බහාළුම් මෙහෙයුම් ඉල්ලුම සහ වෙළඳපොල ඵලදාව යන අංශ දෙකෙහිම සැලකිය යුතු වර්ධනයක් අත්කරගන්නා අතර, 2017 වර්ෂයේ දී ශ්‍රී ලංකන් අපේක්ෂිත මඟී ඵලදා මට්ටම බලවත් කලාපීය තරඟකාරී වාතාවරණය හේතුවෙන් පහළ තත්ත්වයක් වාර්තා කරන ලදී. 2018 මාර්තු 31න් අවසන් වන මූල්‍ය වර්ෂය සඳහා මඟී ඵලදාව පහළ වැටීම කෙබඳු වුව ද, කාර්යක්ෂම වාණිජ ධාරිතා උපයෝගීතාවය සහ ආදායම් කළමනාකරණ පරිචයන් තුළින් සමාගමේ වැඩිම ආදායම සහ සමාගම් ඉතිහාසයේ රැගෙන යන ලද විශාලතම මඟී සංඛ්‍යාව වාර්තා කිරීමට හැකි විය. සමස්ථ යානා මැදිරි සාධකය 82.7%ක් එනම් මිලියන 5.8 මඟින් සංඛ්‍යාවක් ගුවන් සේවය මඟින් ප්‍රවාහනය කර ඇත. මෙය ගුවන් සේවය ආරම්භයේ සිට වාර්තා කරන ලද ඉහළතම මඟී විහර සාධකය වූ අතර, මඟී ආදායම ඇ.ඩොලර් මිලියන 860.38 (ලං.රු. බිලියන 131.72) ලෙස වාර්තා විය. භාණ්ඩ ප්‍රවාහන ආදායම ඇ.ඩොලර් මිලියන 95.51 (ලං.රු. බිලියන 14.62) ලෙස වාර්තා විය. 2016/17 වර්ෂව වල 18.5% ක පහළ මෙහෙයුම් ධාරිතාවයට සාපේක්ෂව 28% ක වර්ධනයක් එනම් ඇ.ඩොලර් 963.93 ක (ලං.රු. බිලියන 147.56) සමස්ථ ගුවන් ප්‍රවාහන ආදායමක් උපයා ඇත.

ඉන්දියාවට (කොයිම්බටෝ, හයිද්‍රාබාද්, විශාකාපත්නම්) සහ ඕස්ට්‍රේලියාවේ මෙල්බර්න් නව ගමනාන්ත හඳුන්වා දීම 2017/18 වර්ෂ වල ශ්‍රී ලන්කන් හි ඵලදායිතා ධාරිතා වර්ධනයෙහි වැඩි ප්‍රමාණයකට වගකීම දරයි.

මෙම වර්ෂය තුල ශ්‍රී ලංකාව පාදක වූ ගුවන් සේවයක ඉතිහාසයේ වැඩිම ගුවන් යානා සමූහය දක්වා ගුවන් සේවය සාර්ථකව පුළුල් වූ අතර, ජාතියේ ගුවන් සේවා ඉතිහාසයේ ප්‍රධාන සංදිස්ථානයකට පැමිණ ඇත. මෙය මූලික වශයෙන්, Airbus A321neo තුනක් සහ Airbus A320neo එකක් යානා සමූහයටඑක්වීමත් සමඟ සිදු විය. neo පවුලේ ගුවන් යානා එක් කිරීමත් සමඟ ශ්‍රී ලංකන් ගුවන් සේවයට කලාපීය ගුවන් මාර්ගයන් හි, වාර පදනම් වූ කාලසටහනක් ක්‍රියාත්මක කිරීමේ සමාගමේ අපේක්ෂිත මූලෝපාය කරා ළඟා වීමට හැකි විය. 2017/18 මූල්‍ය වර්ෂ අවසානයේ දී ශ්‍රී ලංකන් ගුවන් යානා 26ක සමූහයක් මෙහෙයුම් කටයුතු සිදු කරනු ලැබිය.

### ලොවපුරා විකුණුම් සහ බෙදාහැරීම්

සමාලෝචනය කරනු ලබන මූල්‍ය වර්ෂය තුල, ගුවන්සේවා කර්මාන්තයට අභියෝගාත්මක හූ පිහිටුම අපගේ විකිණුම් සහ බෙදාහැරීම් කටයුතු සඳහා අඛණ්ඩව සැලකිය යුතු බලපෑමක් ඇති කරනු ලබයි. වඩාත් දැඩි බලපෑමක් ඇති වූයේ අඩුපිරිවැය හෝ දෙමුහුන් ප්‍රවාහනය යන සංක්‍රාන්ති ව්‍යාපාරික අකෘති සහිත කළාපීය ප්‍රවාහකයන්ගෙනි.

මේ සඳහා පිළිතුරක් ලෙස, අපගේ මාර්ග ගත සහ මාර්ග ගත නොවන විකුණුම් සහ බෙදාහැරීම් උපාය මාර්ග මාර්ගගත සහ මාර්ගගත නොවන ආකාරයේ විකුණු ලෙස වෙනස් කිරීමට අප නැවත අදහස් කළෙමු. වර්ෂය තුල අප පවත්වාගෙන යන ලද දැඩි විකුණුම් මූලෝපාය විදහා දක්වමින් - අපගේ ශුද්ධ ගමනාගමන ආදායම අයවැය මට්ටමට 2.83%ක් ඉහළින් පවතින විට අපගේ මඟී අදායම අය වැය මට්ටමට 1.69% ඉහළින් පැවතිණි.ගුවන් සේවා ඉතිහාසයේ ඉහළතම ආදායම් ඉලක්කය ද වූ මෙම ආදායම් ජයග්‍රහණය, අප සමරන්නේ වසර 10කට පසු පළමු වතාවටය. 2016/17 මූල්‍ය වර්ෂ වලට සාපේක්ෂව, අපගේ ධාරිතාවය ද 18.45%කින් වැඩි විය. වැඩි කරන ලද නියෝජිත කොමිස් මට්ටම් සහ ගුවන් මාර්ග අනුව ආදායම සමීපව නිරීක්ෂණය කිරීම ද, සමාලෝචනය කරනු ලබන වර්ෂයේ අත්කර ගන්නා ලද ආදායම සඳහා අනුපූරණය විය.

ඉන්දියාවේ විශාකාපට්නම්, හයිද්‍රාබාද්, කොයිම්බටෝ සහ ඕස්ට්‍රේලියාවේ මෙල්බර්න් හි අප අලුතින් දියත් කරන ලද මධ්‍යස්ථාන හතර, අපගේ ජගත් සහභාගීත්වය සහ නව වෙළඳපොල අංශයන්ට පිවිසීම ව්‍යාප්ත කිරීම සඳහා මඟ සලසන ලද අතර, එහි ප්‍රතිඵලයක් ලෙස එය අපගේ ආදායම් එකතුව සඳහා සැලකිය යුතු ලෙස දායක විය.මෙය අපගේ සැලසුම් අනුව, දෝහා-කටාර්, ඩුබායි, බැංකොක්, නව දිල්ලිය, බොම්බාය සහ බැංගලෝර් යන දැනට පවතින ගමනාන්ත වල වාර ගණන වැඩි කිරීමට ද, අපගේ සේවා පථය සහ ආදායම් වැඩිදියුණු වීමට ද බලපානු ලැබිණි. තවද, අතරමැදි-ස්ථාන තුලින් මෙහෙයුම් සිදු කරනු ලබන සියලු සාම්ප්‍රදායික ගුවන් යානා - කොළඹ-කැන්ටන් බැංකොක් හරහා සහ කොළඹ-හොංකොං බැංකොක් හරහා - මඟීන්ගේ ඉල්ලුමට වඩාත් හොඳ සේවයක් සැපයීම සඳහා වර්තමානයේ දී, සෘජු පියාසර කිරීම් සිදු කරනු ලබයි.

ඉදිරි මූල්‍ය වර්ෂයේ දී, අපගේ ජගත් බෙදාහැරීමේ පද්ධතිය, නියෝජිත කොමිස් වැඩසටහන් සහ සෘජු මාර්ග ප්‍රශස්තිකරණය සම්බන්ධයෙන් ව්‍යුහාත්මක සහ මෙහෙයුම්හි වෙනස්කම් සිදු කිරීමට අපේක්ෂා කරමු. දැඩි තරඟකාරී ව්‍යාපාරික පසුබිම කෙබඳු වුව ද, ඊළඟ මූල්‍ය වර්ෂයේ දී, මෙම වෙනස්කම් තුලින්, දර්ශක වෙළඳපොල ප්‍රතිලාභයක් අත්කර ගැනීමට අපේක්ෂා කරමු.

### ජගත් ඇමතුම් මධ්‍යස්ථානය

ජගත් ඇමතුම් මධ්‍යස්ථානය, සුප්‍රකට මැලේසියාව පදනම් වූ ඇමතුම් මධ්‍යස්ථාන ක්‍රියාකරුවකු වන සයිකොම් (Scicom) විසින් ක්‍රියාත්මක කරයි.ඇමතුම් මධ්‍යස්ථානය තුලින්, ලොවපුරා පාර්භෝගිකයන් සහ ෆලයිස්මයිල්ස් (FlySmiLes) සාමාජිකයන්ට, නව වෙන්කිරීම්, දින වෙනස් කිරීම්, අනුබද්ධ සහ වෙනත් සේවා ඇතුළු බොහෝ සේවාවන් ගනනාවක් ලැබේ. ඇමෙක්ස්, වීසා, මාස්ටර් සහ දේශීය බැංකු තැන්පතු මඟින් ගෙවීම් සිදු කිරීම, ඊමේල්, ස්කයිප් වැනි විස්තීර්ණ ගෙවීම් සිදු කිරීමේ හැකියාව සහ 24x7 දුරකථන ඇමතුම් සඳහා පිළිතුරු සැපයීම සඳහා ඇමතුම් මධ්‍යස්ථානය, සූදානම් කර ඇත. ප්‍රංශය, ජර්මනිය, සිංගපූරුව, එක්සත් ජනපදය, හොංකොං, ඉන්දියාව, ජපානය, කුවේට්, මැලේසියාව, පකිස්ථානය, තායිලන්තය සහ චීනය වැනි රටවල් වල සිට පාර්භෝගියන්ට තම දේශීය අංක මඟින් ඇමතුම් මධ්‍යස්ථානය ඇමතීමේ පහසුකම සපයා ඇත. මෙම පහසුකම අපගේ සියලු මාර්ගගත ගමනාන්තයන් වෙත ලබා දීමට විධිමත් සැලසුම් සකසා ඇත.දැනට, ඉංග්‍රීසි, සිංහල, දෙමළ සහ චීන යන භාෂා ගනනාවකින් මධ්‍යස්ථානය විසින් සේවා සපයන අතර, අවශ්‍ය විට වෙනත් භාෂාවන් සඳහා පුළුල් කිරීමට ද හැකියාව ඇත. 2018/19 මූල්‍ය වර්ෂ වල දෙවන අර්ධය වන විට, ඩිජිටල් තාක්ෂණය හා ශ්‍රී ලංකන් ගුවන් සේවය සම්බන්ධ වීමේ අරමුණින්, පාර්භෝගිකයන්ට ෆෙස්බුක්, ට්විටර් වැනි

සමාජ මාධ්‍ය ජාලා තුලින් 27x7 ඔස්සේ පාරිභෝගික සහාය ලබා දීම සඳහා ඇමතුම් මධ්‍යස්ථානය තම කටයුතු පුළුල් කරනු ඇත.

### ෆ්ලයිස්මයිල්ස් (FlySmiLes)

විශිෂ්ඨත්වයේ දශකයට අවතීර්ණ වෙමින්, සාමාජිකයන් බඳවා ගැනීම වැඩි කිරීම, හමුවීම සහ අපගේ සේවා ප්‍රමිතීන් ඇගයීම සඳහා ප්‍රවර්ධන ව්‍යාපාර හතරක් දියත් කරමින්, ෆ්ලයිස්මයිල්ස් විසින් 2018 අප්‍රේල් 01 වැනිදා එහි 10 වන සංවත්සරය සැමරීය.

පෙර වර්ෂයට සහ සාපේක්ෂව, 12%ක සැලකිය යුතු සාමාජිකත්ව වර්ධනයක් සහිතව, වන්වර්ල්ඩ් එයාර්ලයින් අලයන්ස් (oneworld airline alliance) හි මෑතකාලීන සාමාජිකයකු වන ෆ්ලයිස්මයිල්ස් ජගත් වශයෙන් මිලියන භාගයක් වන මඟින්ට සේවා සපයයි.ශ්‍රී ලංකාව, ඉන්දියාව සහ එක්සත් අරාබි එමීර් රාජ්‍යය, 57% ක් දක්වා වන සමස්ථ සාමාජිකත්ව වර්ධනය සඳහා ඉහළතම දායකත්වය සපයන්නන් බවට පත් ව ඇත.

වන්වර්ල්ඩ් සාමාජික ගුවන් සේවා 13ක්, ෆ්ලයිස්මයිල්ස් හවුල්කාරිත්වගුවන් සේවා දෙකක් සහ දේශීය හා අන්තර්ජාතික ගුවන්සේවා-නොවන හවුල්කරුවන් 28 දෙනෙකු අතර, ෆ්ලයිස්මයිල්, තම ගෞරවනීය සාමාජිකයන්ට විශාල පරාසයක උපචිත සහ ගෙවීම් විකල්පයන් රාශියක් පිරිනමයි. 2017/18 මූල්‍ය වර්ෂ සඳහා උපයන-වියදම් අනුපාතය (earn burn ratio), කර්මාන්තයේ මිණුම් දණ්ඩට වඩා ඉහළින් එනම් 58% ප්‍රතිශතයකින් පවතී. පසුගිය මූල්‍ය වර්ෂයට සංසන්දනාත්මකව, ගුවන්සේවා-නොවන හවුල්කාරිත්ව ආදායම් වර්ධනය වූ 29% ප්‍රතිශතය ද ඇතුලත්ව, ෆ්ලයිස්මයිල්ස් මඟින් ගෞරවනීය සාමාජික වැඩසටහන තුලින් උපයා ගන්නා ලද සමස්ථ ආදායමෙහි වර්ධනය, 11% ක විය.

ගුවන් සේවය සහ ඉතා වටිනා මඟින් අතර බැඳීම ශක්තිමත් කිරීමෙහි ලා, ෆ්ලයිස්මයිල් අඛණ්ඩව ඉතාමත් වැදගත් අංශයක් බවට පත් වී ඇත. 2017/18 වර්ෂ වල, අපගේ ගෞරවනීය සාමාජිකයන්ට වැඩිදියුණු කරන ලද නිරන්තර පියාසර අත්දැකීමක් ලබා දීමේ අපගේ පරිශ්‍රමය සම්බන්ධයෙන් අප ස්ථාවරව සිටියෙමු. මෙයට කොළඹ 03, අයිස්ලන්ඩ් බිස්නස් සෙන්ටර් හි ෆ්ලයිස්මයිල්ස් සේවා මධ්‍යස්ථානය නැවත පිහිටුවීම; ෆ්ලයිස්මයිල්ස් කැපකරන ලද වෙබ් පිටුව දියත් කිරීම; සහ "රතු පලස (Red Carpet)" ප්‍රවර්ධන වැඩසටහන අදියර 01 ආරම්භ කිරීම යන කාර්යයන් ඇතුලත් වේ.

තවදුරටත්, ෆ්ලයිස්මයිල්ස් ගෞරවනීය වැඩසටහනෙහි ලාභදායීත්වය සහ වර්ධනය වැඩිදියුණු කිරීම සඳහා, උපචිත වගුවක් සහ අමතර බඩුමළු ගෙවීම් අනුපාත ප්‍රතිශෝධනය කරන ලද අතර, ශ්‍රී ලංකන් ගුවන් සේවයේ සහ වන්වර්ල්ඩ් හවුල්කරුවන්ට තිළිණ ටිකට්පත් ලබා ගැනීම සඳහා එක් ගෙවීමේ වගුවක් ක්‍රියාත්මක කරන ලදී.

2018/19 ඊළඟ වර්ෂයේ දී, අපගේ වටිනා සාමාජිකයන් සඳහා අමතර උපචිත සහ ගෙවීම් විකල්පයන් පිරිනැමීම සඳහා ගුවන්සේවා-නොවන හවුල්කාරිත්ව කණ්ඩායම වැඩි කර ගැනීම සහ අනුබද්ධ නිෂ්පාදන සහ සේවා මත ගෙවීම් විකල්පයන් සඳහා පහසුකම් සැලසීම සඳහා අප සැලසුම් කර ඇත. එසේම, මාර්ගගත ගනුදෙනු සඳහා අනන්‍ය ප්‍රතිලාභ ලබා දීම තුලින් එම ගනුදෙනු දිරිමත් කිරීමට ද අපේක්ෂා කරමු.

### ශ්‍රී ලංකන් හොලිඩේස්

ශ්‍රී ලංකන්හි ව්‍යාපාරික සමූහය, ගුවන් ගමන් සහ ප්‍රවාහනයට පමණක් සීමා නොවී ඇති අතර, සමස්ථ චාරිකා සහ ප්‍රවාහන සේවාවන් ද ආවරණය කරනු ලබයි. ගුවන් සේවයේ විවේකය හා සම්බන්ධ අංශය වන ශ්‍රී ලංකන් හොලිඩේස් විසින් දේශීය සහ විදේශීය මඟින් දෙකොටසටම පුළුල් පරාසයක සේවා සපයනු ලබයි. දිවයිනේ විවිධ ආකර්ශනීය ස්ථාන වලට ඉතා කෙටි කාලයකින් ළඟා විය හැකි වීම හේතුවෙන්, විශාල වශයෙන් සංචාරක ආකර්ෂණයක් ඇත.

ශ්‍රී ලංකන් හොලිඩේස්, මෙම වාසියෙන් උපරිම ප්‍රයෝජන ලබා ගැනීම සඳහා ප්‍රධාන පෙළේ හෝටල්, සංචාර මෙහෙයවන්නන් සහ වෙනත් සංචාරක ව්‍යාපාරය හා සම්බන්ධ ආයතන ගනනාවක් හා හවුල්කාරිත්වයක් ඇති කර ගෙන ඇත. ශ්‍රී ලංකන් බලයලත් මෙහෙයුම්කරුවන් 24කින් සමන්විත දේශීය ශාඛා ජාලය අපගේ සියලුම ගමනාන්ත වල සිට ක්‍රියාත්මක වේ. මේ ආකාරයෙන් ශ්‍රී ලංකන් හොලිඩේස් වර්ධන වෙළඳපොල කෙරෙහි ඉලක්ක වූ අපගේ සමස්ථ ආයතනික මූලෝපාය ප්‍රතිමූර්තිමත් කරයි.

මීට අමතරව, ශ්‍රී ලංකන් හොලිඩේස් විදේශීය ශාඛාව, ශ්‍රී ලංකාවෙන් සංචාරය කරන්නන්ට සහ සංචාරක නියෝජිතයන් මෙන්ම ආයතන මඟින් සම්බන්ධ වන සහ සෘජු මඟින් සඳහා අපගේ ජාලය තුල සංචාරක සේවා සපයයි. වර්ෂය තුල තවදුරටත් දිවයිනේ සියලු ප්‍රදේශ වල ශ්‍රී ලංකන් හොලිඩේස් සන්නාමය තහවුරු කිරීමේ අරමුණ සහිතව, ශ්‍රී ලංකාවේ දුරස්ථ වෙළඳපොල තුලට ද අප පිවිසී සිටින්නෙමු.

පිරිවැය කළමනාකරණය සම්බන්ධයෙන් සමාගමට සැලකියයුතු ඉතිරිකිරීමක් අත් කර දුන් ස්ථාන සම්බන්ධකිරීමේ වැඩසටහන සඳහා පිරිවැය ඉතිරිකිරීමේ මූලාරම්භයන් ද හඳුන්වා දෙන ලදී. සංචාරකයින්ට ඔවුන්ගේ ජාතිය, සම්භවය හෝ ගමනාන්තය කුමක් වුව ද, ඔවුන්ගේ රුචියට සහ අයවැයට සරිලන පරිදි තෝරාගත හැකි විනෝදාත්මක නිවාඩු අවස්ථාවන් පරාසයක් ශ්‍රී ලංකන් හොලිඩේස් පිරිනමනු ලබයි.

### අනුබද්ධ සේවා

වසරින් වසර 36% ක වර්ධනයක් සහිතව, 2017/18 මූල්‍ය වර්ෂය සඳහා අනුබද්ධ සේවාවන් සැලකිය යුතු සාර්ථකත්වයක් වාර්තා කර ඇත. එවැනි සේවාවන් සඳහා පාරිභෝගික පිළිගැනීම පිළිබඳ සාර්ථකත්වය විදහා දක්වමින් මෙය වාර්ෂික ධාරිතා වර්ධනය ඉක්මවන ලදී. මෙම කාලය තුල ගුවන් සේවයේ ධාවන මූලධර්මය වූයේ, පාරිභෝගික අවශ්‍යතා හඳුනාගෙන අගය එකතු කිරීමක් ලෙස එවැනි අනුබද්ධ සේවා සැපයීමයි. දැනට සපයනු ලබන ආසන ඉහළ පන්තියට දැමීම, පෙරගෙවුම් ගමන්මළු දීමනාවන්, අමතර දෙපා නිදහස් ආසන සහ කාර් කුලී සේවාවන් වැනි අනුබද්ධ සේවාවන් වලට අමතරව, 2018/2019 මූල්‍ය වර්ෂ සඳහා ගුවන් සේවය මඟීන්ට තමන් අභිමත ආසන කලින් වෙන් කරවා ගැනීමට සහ සකසුරුවම් පන්තියේ මඟීන් සඳහා විශේෂ ආහාර වේලක් ඇණවුම් කිරීමේ පහසුකම් සැලසීම වැනි අනුබද්ධ සේවා දියත් කිරීමට අපේක්ෂා කරයි.

කර්මාන්තය සම්බන්ධයෙන් අනුබද්ධ ආදායමේ වැදගත්කම වර්ධනය වීම තවදුරටත් සලකා බලා, ගුවන් සේවය මඟින් පිරිනමනු ලබන අනුබද්ධ සේවා පිළිබඳව පාරිභෝගික දැනුවත්භාවය තවදුරටත් ඇති කිරීම සඳහා නව සන්නාම ව්‍යාපාරයක් දියත් කිරීමට ශ්‍රී ලංකන් පියවර ගෙන ඇත.

# කළමනාකරණ සාකච්ඡාව සහ විශ්ලේෂණය ඉතිරි කොටස.

## ශ්‍රී ලංකන් ගුවන් භාණ්ඩ

2010 වසරේ දී, භාණ්ඩ ලැයිස්තු නැවත පිරවීමේ චක්‍රයේවිශාල වශයෙන් ඇතිවූ හදිසි තත්ත්වය නිසාවෙන් ඇතිවූ ජගත් මූල්‍ය අර්බුදය හේතුවෙන් ප්‍රබල කාර්ය සාධනයත් අත් කරගනිමින්, 2017 වසර, ගුවන් භාණ්ඩ ප්‍රවාහන කර්මාන්තය සඳහා විශේෂිත වර්ෂයක් විය.ජාත්‍යන්තර ගුවන් ප්‍රවාහන සංගමයට (IATA) අනුව, 2016 වර්ෂයේ මනින ලද වාර්ෂික වර්ධනය වූ 3.6% මෙන් දෙගුණයකට වඩා, එනම් 9.0%කින් වර්ධනය වූ, භාණ්ඩ ටොන් කිලෝමීටර ප්‍රමාණයෙන් ඉල්ලුම මනින ලදී. වෙළඳපොල පවතින ධාරිතාවය 3.0%කින් වැඩි වූ අතර, ධාරිතාවයේ වර්ධනය තුන් ගුණයක වේගයෙන් වැඩි වූ, ඉල්ලුම් වර්ධනය සමඟින්, එය 2012 වර්ෂයේ සිට ඇති වූ වඩාත් මන්දගාමී වාර්ෂික ධාරිතා වර්ධනය විය. මෙම වර්ධනයේ ප්‍රධාන ධාවකයින් ලෙස, ඊ-කොමස් සහ ඖෂධ ප්‍රවාහනය කෙරෙහි මහත් විශ්වාසයක් පාරිභෝගිකයා තුල තිබීම දැකිය හැකිය. සියලු ජගත් වෙළඳපොල, මඟී ඵලදාවේ සැලකිය යුතු වැඩි වීමක් අත් විඳි අතර, එමඟින් හිතකර මෙහෙයුම් ආන්තිකයන් වාර්තා කරන ලදී.

ප්‍රබල ගෝලීය වෙළඳපොල ගතිකයන් මත ප්‍රතිලාභ අත්කර ගැනීමට ශ්‍රී ලංකන් කාගෝ ආයතනයට හැකි වූ අතර, පෙර වර්ෂයේ කාර්ය සාධනයට සාපේක්ෂව 18%ක වර්ධනයක් දක්වමින්, සමාලෝචනය කරනු ලබන මූල්‍ය වර්ෂයෙහි දී ඇ.ඩොලර් මිලියන 96.2ක ආදායමක් උපයා ගන්නා ලදී. මෙය මෙම කාලය සඳහා වාර්තාගත සමස්ථ ගුවන් ප්‍රවාහන ආදායමෙන් 10% ක වගකීම දරනු ලබයි. පෙර මූල්‍ය වර්ෂයට සාපේක්ෂව 14%ක වැඩි වීමක් දක්වමින්, ගුවන් සේවය, මෙම කාලය සඳහා මෙට්‍රික් ටොන් 132,958 ක භාණ්ඩ ප්‍රවාහනයක් වාර්තා කර ඇති අතර,ටොන් කිලෝමීටර ආදායමට, භාණ්ඩ ඵලදාව 10%ක වර්ධනයක් අත්කර ගනිමින් ඇ.ඩොලර් 0.23 ලෙස වාර්තා කරන ලදී.

මූලික මධ්‍යස්ථානය වන, ශ්‍රී ලංකාව, ආදායමෙන් 24%ක් සඳහා වගකීම දරන අතර, පෙර වර්ෂයේ ඉහළ නැඟි සමස්ථ පරිමාවෙන් 5.0% ක වැඩි වීමකි. සමස්ථ ගුවන් භාණ්ඩ ආදායමෙන් 21%ක් සඳහා ඉන්දියාව වගකීම දරනු ලබන අතර, එයින් 10%ක් සඳහා චෙන්නායි වගකීම දරයි. ප්‍රධාන පෙළේ ගුවන් භාණ්ඩ වෙළඳපොලක් වන චීනය ගුවන් භාණ්ඩ ආදායමෙන් 19% සඳහා වගකීම දරන නමුදු, ගුවන්ෂොවු සහ හොංකොං ගුවන් මාර්ග වල ධාරිතාවය අඩු කිරීම හේතුවෙන් පෙර වර්ෂයට වඩා 10%ක අඩු වීමක් දක්වයි. ශ්‍රී ලංකන් ජාලය තුල, සමස්ථ භාණ්ඩ ආදායම් විභවයන් උපරිමකරණය සඳහා ප්‍රධාන නිෂ්පාදන වෙළඳපොලෙන් ඓතිහාසික ජාල ව්‍යාප්තීන් ප්‍රතිව්‍යුහගත කිරීම මඟින් ප්‍රධාන වශයෙන් එක් වූ, පෙර වර්ෂයට සාපේක්ෂව, මෙම කාලය තුල 67%ක ඉහළතම වර්ධනයක් දක්වන,සාම්ප්‍රදායිකව ගුවන් භාණ්ඩ ක්ෂේත්‍රයට දුර්වල දායකත්වයක් දක්වන මැදපෙරදිග වෙළඳපොල ඉහළතම වර්ධනයක් දැක්වීය. එක්සත් රාජධානිය පෙර වර්ෂයමෙන් 107%ක වෙළඳපොල ප්‍රමාණයක් අත් කරගන්නා විට, යුරෝපය සමස්ථ ආදායමෙන් 6% ක් සඳහා වගකීම දරයි.එක්සත් රාජධානියේ ප්‍රගතිය අත්කර ගන්නා ලද්දේ, කලාපයෙන් ඉහළ ඵලදාවක් සහිත ඊ-කොමර්ස් කටයුතු මත ප්‍රතිලාභ ලබා ගැනීමට ශ්‍රී ලංකන් සමාගමට අවස්ථාව සලසමින් 2017 ඔක්තෝබර් මාසයේ මෙල්බර්න් දක්වා මෙහෙයුම් ආරම්භ කිරීම තුලින්ය. මෙල්බර්න් ගුවන් මාර්ගය, ගුවන් භාණ්ඩ සඳහා වාසිදායක මෙහෙයුමක් ලෙස තහවුරු වී ඇති අතර, අනාගතයේ දී, යුරෝපය සඳහා ප්‍රධාන පිවිසුම් මාර්ගයක් බවට පත් වනු ඇත.

2014 වර්ෂයේ සිට ACMI (ගුවන් යානය, කර්ය මණ්ඩලය, නඩත්තුව, රක්ෂණය) පදනම මත නඩත්තු කරන ලද තුන්වන-පාර්ශව භාණ්ඩ මෙහෙයුම් නවතා දැමීම සඳහා ශ්‍රී ලංකන් කාගෝ, 2017 දෙසැම්බර් 31 දින මූලෝපායික තීරණයක් ගන්නා ලදී. ඉල්ලුම මත පදනම්ව , මුම්බායි සහ ඩකා වෙත මෙහෙයුම් සිදු කරන අතර, භාණ්ඩ ප්‍රවාහන යානා ප්‍රධාන වශයෙන් බැංගලෝර් වෙත මෙහෙයුම් සිදු කරන ලදී. ජාල ධාරිතාවය අඩු වීම සහ එමඟින්, අපේක්ෂිත ඵලදා භාණ්ඩ සඳහා වූ දුර්වල සම්බන්ධතා විකල්පයන් හේතුවෙන් මෙහෙයුම ප්‍රායෝගික නොවන බව සලකනු ලැබීය.බැංගලෝර් ප්‍රධාන වෙළඳපොල සඳහා භාණ්ඩ ප්‍රවාහන යානා අහිමි වීම ඌනපූර්ණය කිරීම සඳහා, ශ්‍රී ලංකන් කාගෝ, චෙන්නායි සහ කොචින් ගුවන් මාර්ගයන් හි පුළුල් ධාරිතාවය ප්‍රතිලෝම වශයෙන් භාවිතයට ගනිමන් ගුවන් භාණ්ඩ සම්බන්ධ කිරීමේ උපාය මාර්ගික භාණ්ඩ හුවමාරු කිරීමේ ගිවිසුම් වලට එළඹෙන ලදී.

හවුල් භාණ්ඩ ප්‍රවාහකයින් සමඟ විශේෂ ප්‍රතීතන ගිවිසුම් (SPA's) පාරිභෝගික සබඳතාවය සඳහා අඛණ්ඩ ප්‍රධාන මාර්ගය බවට පත් වී ඇති අතර, ප්‍රධාන ගුවන් භාණ්ඩ මධ්‍යස්ථානයන්ගෙන් පුරෝකථනය කරන ලද ගුවන් මාර්ග වලංගුකරණය සහිත ශ්‍රී ලංකන් කාගෝහි වැදගත්කම ඉහළ යනු ඇත. හොංකො ගුවන් මාර්ගයෙන් අඩු වූ ධාරිතාවය SPA මඟින් ඌණපූර්ණය කර ගැනීමට සහ ක්වාලාලම්පූර් හා මාලදිවයින හරහා සම්බන්ධතාවය සැපයීමට මෙන්ම, වර්ධනය වන ඊ-කොමර්ස් වෙළඳපොලෙහි ශ්‍රී ලංකන් කාගෝ කොටස වැඩි කර ගැනීමට සහාය වූ, චීනයෙන් පැන නඟින ඉහළ ඉල්ලුම සහිත අංශයන් සඳහා අමතර ධාරිතාවයක් සැපයීමට ද හැකි විය.

සමාලෝචනය කරනු ලබන මූල්‍ය වර්ෂය තුල තැපැල් සේවයේ ආදායම ඇ.ඩොලර් මිලියන 1.2 විය. ගුවන් භාණ්ඩ ප්‍රවාහන ලාභදායීතාවයේ හඳුනාගත් ධාවකයකු වන ඊ-කොමර්ස්, මෙම ව්‍යාපාරයට ප්‍රධාන වශයෙන් දායක විය. 2018 වර්ෂයේ දී ලොව වෙළඳාම පුළුල් වීමේ ප්‍රමාණයෙන් ඔබ්බට, ගුවන් භාණ්ඩ ඉල්ලුම සඳහා, එහි ගම්‍යතාවයමඟින් අනුග්‍රහය ලැබෙනු ඇතැයි පුරෝකථනය කරනු ලබයි. ඊ-කොමර්ස් අංශය, 2017/18 වර්ෂයේ, ශ්‍රී ලංකන් කාගෝ අවධානය යොමු කළ ප්‍රබල අංශයක් වූ අතර, අනාගතයේ දීත් එය එසේම වනු ඇත.

2017 වර්ෂයේ ගුවන් භාණ්ඩ ප්‍රවාහනය සම්බන්ධයෙන් පෙර නොවූ විරූ වර්ෂයක් වුව ද ස්ථායීතාවය, ලාභදායීතාවය සහ පාරිභෝගික තෘප්තිය සම්බන්ධයෙන් කර්මාන්තය අඛණ්ඩව අභියෝග වලට මුහුණ දුන්නේය. නාවික හා දුම්රිය අංශ මඟින් පිරිනමනු ලබන නව නිෂ්පාදන සහ පාරිභෝගිකයන් පිරිවැය අඩු කර ගැනීමට සහ වැඩි වේගය සඳහා මිශ්‍ර ප්‍රවාහන විකල්පයන් සොයා යෑම වැනි අදේශක මඟින් ඇති වී තිබෙන තර්ජනය ඉහළ මට්ටමක පවතී.එබැවින් කාර්යක්ෂමතාවය වැඩි කර ගැනීම සහ ගුවන් භාණ්ඩ ප්‍රවාහනයේ සේවා තත්ත්වය ඉහළ නංවා ගැනීම සම්බන්ධයෙන් කර්මාන්ත අභියෝගයට ලක්ව ඇත. භාණ්ඩ ප්‍රවාහකයා, ගුවන් භාණ්ඩ ප්‍රවාහන කර්මාන්තයේ පමණක් නොව ආදේශකයන්ගෙන් ද ඉහළ මට්ටමක රැඳී සිටීම සඳහා වනසේවා සැපයීමේ අවශ්‍ය මට්ටමට පැමිණ සිටින බැවින් ඉදිරි වර්ෂය ගුවන් භාණ්ඩ ප්‍රවාහනයේ තවත් ප්‍රශස්ථ වර්ෂයක් බවට පත් වන බව දක්නට ලැබේ. ශ්‍රී ලංකන් කාගෝ, ප්‍රධාන භාණ්ඩ ප්‍රවාහන මාර්ගයන් යථාර්ථකරණය මඟින් ඉදිරි අභියෝගාත්මක වර්ෂයට මුහුණ දෙනු ඇති

අතර, වේගය හා සම්බන්ධතාවය සම්බන්ධ පාරිභෝගික අපේක්ෂාවන් තහවුරු කරනු ලබන ගතික මූලෝපායන් ඒ සඳහා අවශ්‍ය වනු ඇත.

## පියාසර මෙහෙයුම්

ජගත් කර්මාන්තයේ අනිවාර්ය ප්‍රමිතීන් අවතක්සේරු කිරීම සඳහා කිසිදු ඉඩක් නොමැති, ගුවන් සේවයේ ආරක්ෂාව යන්න පූර්ණ අවශ්‍යතාවයකි. මේ සම්බන්ධයෙන්, ස්ථාවරව සහ කාර්යසාධන කේන්ද්‍රිකව කටයුතු කිරීම සඳහා, අප, අනුකූලතාවය, ප්‍රමිතීන්, පුහුණුව සහ ගුවන්යානා ක්‍රියාකාරීත්ව කාර්යයන්, පියාසර මෙහෙයුම් ප්‍රධානි විසින් නායකත්වය ලබා දෙනු ලබන ප්‍රධාන ගුවන් නියමුවන් තුන්දෙනෙකුගේ විෂය පථය යටතට පවරා ඇත. අපගේ ගුවන් සේවය සාර්ථකව සහ අඛණ්ඩව ආරක්ෂාව පිළිබඳ නොකැලැල් වාර්තාව තබාගෙන ඇති අතර, ඒ සම්බන්ධ ඇගයීමේ දී, ජගත් කර්මාන්තයේ සංසන්දනයන් තුල කිසිම ගුවන් සේවයකට නොදෙවෙනි වේ. ගුවන් සේවය, රටවල් 20ක ගමනාන්ත 41 ක පියාසර පරාසයකින් සමන්විතව ඉහළ නිපුණතාවයක් සහ පුහුණුවක් සහිත ගුවන් නියමුවන් 320ක කාර්ය මණ්ඩලයක් සහිතව,සමාලෝචනය කරනු ලබන කාලය තුල, පියාසැරියන් 34,477ක් සිදු කර ඇත.

## ගුවන්සේවා මෙහෙයුම් පාලන මධ්‍යස්ථානය (AOCC)

ගුවන් සේවයේ ස්නායු කේන්ද්‍රස්ථානය වන AOCC, ගැටළුකාරී අනපේක්ෂිත සිදුවීම් පාලනය, පියාසර කාලසටහන වේගවත්ව ප්‍රකෘති තත්වයට පත් කරගැනීම සඳහා සක්‍රීය සහ ක්ෂණික මෙහෙයුම් තීරණ ගැනීම සිදු කරන අතර ප්‍රකාශිත කාලසටහන අනුව කටයුතු කරගෙන යාමේ රාජකාරිය පවරා ඇත. '24x7' කාලය තුල මෙහෙයුම් නිරීක්ෂණය කිරීම, සියලු පාර්ශව කරුවන් හා සමීප සම්බන්ධතාවයෙන් කටයුතු කිරීම හා සමස්ථ ජාල මෙහෙයුම පිළිබඳවම පුළුල් දැක්මක් සහිත වීම AOCC හි වගකීම වේ.ජාලය පිළිබඳව සැලසුම්කරණය, නිරීක්ෂණය සහ ගැටළුකාරී බලපෑම් ඇගයීම, පාරිභෝගික පහසුව, ක්‍රියාවලි කාර්යක්ෂමතාවයන් සහ පිරිවැය-ඵලදායීතා තීරණගැනීම තහවුරු කරනු ලබන ඉතා වැදගත් දෛනික කාර්යන් වේ. ගුවන්යානයක් පිටත්වීම සඳහා සූදානම් වීම සඳහා වන නිශ්චිත අවම පොළව මතුපිට තිබෙන කාලය සමඟ අනුරූපව පියාසැරියන්හි කාලානුරූපීභාවය තහවුරු කරමින් ප්‍රමාද-නොවන-ක්‍රියාකාරීත්වය (OTP) සම්බන්ධයෙන් පුරෝගාමියකු ලෙස AOCC කටයුතු කරනු ලබයි. කාලානුගතිකත්වය (punctuality) නිරීක්ෂණය කරන ලබන අංශය, AOCC සහ කර්මාන්තයේ ප්‍රධාන ක්‍රියාකාරීත්ව සාධකය වන OTP හි ස්ථායිතාවය නිරීක්ෂණය කිරීම සඳහා වන සියලු පාර්ශවකරුවන් සමඟින් සමස්ථ ජාල මධ්‍යස්ථාන සමඟින් සහක්‍රියාකාරී සම්බන්ධීකරණයක් සිදු කරනු ලබයි. OTP හි කර්මාන්තයේ මිනුම් දණ්ඩ වන 85% <15 ප්‍රමාණයට සාපේක්ෂව, ගුවන් සේවය සාමාන්‍ය OTP අගය 80% <15 (විනාඩි 15ක් තුල පිටත්වීම) සහ 82% <15 (විනාඩි 15ක් තුල පැමිණීම), ලෙස පවත්වාගෙන යයි.

AOCC හි විෂය පථය යටතේ පවතින ගුවන්ප්‍රවාහන මධ්‍යස්ථානය (FDC) හි මූලික කාර්යභාරය වන්නේ, පියාසර සැලසුම් සකස් කිරීම, සියලු අන්තර්ජාතික රෙගුලාසි වලට අනුකූල වීම, ගුවන් ගමන් මාර්ග පැහැදිලි කර ගැනීම සහ එකිනෙක පියාසැරිය සඳහා උපරිම ගුවන් භාණ්ඩ එසවීමක් සඳහා අවස්ථාව සැලසීම වැනි කටයුතුය. FDC ගෝලීය ඉන්ධන මිල පිළිබඳව සමීප අධ්‍යයනයක් සිදු කරන අතර, ගුවන් සේවයේ ඉන්ධන පරිභෝජනය ප්‍රශස්තභාවයට පත් කිරීම සඳහා සිදු කරනු ලබන ව්‍යායාමයක් වන 'ඉන්ධන පරිවහනය' මත රඳා පවතී. සමාලෝචනය කරනු ලබන වර්ෂය තුල, මෙම ව්‍යායාමයේ ප්‍රතිඵලයක් ලෙස, ඉන්ධන සම්බන්ධයෙන් සැලකිය යුතු ඉතිරියක් ලබා ගැනීමට ගුවන් සේවයට හැකි වී තිබේ. තවද, විදේශ ගුවන් සේවාවන් කළමනාකරණය කිරීම, FDC හි අනුබද්ධ ආදායම් ස්ථාවර කිරීම වැනි සේවාවන් ද ඉටු කරන ලබයි.

## ගුවන්යානා ඉන්ධන සුපරීක්ෂණය

විශේෂයෙන්ම, ගෝලීය මිල අස්ථාවර පසුබිම තුල, ඉන්ධන යනු ගුවන් සේවයේ පිරිවැය ව්‍යුහයෙහි ඉතා වැදගත් අංගයකි. පියාසර මෙහෙයුම් දෙපාර්තමේන්තුව යටතේ, ගුවන්සේවා ඉන්ධන (ජෙට් ඒ-1) භාවිතය නිරීක්ෂණය, ප්‍රශස්ත ඉන්ධන භාවිතය සහ පිරිවැය ඵලදායීතාවය සහතික කිරීම සඳහා වන ඉතා වැදගත් කාර්යයන්ය. මෙම ගුවන්සේවා ඉන්ධන නිරීක්ෂණය කිරීමේ දැඩි ක්‍රියාවලිය, ප්‍රශස්ත ක්‍රියාකාරීත්වයක් සඳහා දක්ෂ ගුවන් නියමුවන්ගේ පියාසර ශිල්පක්‍රම සමඟ ඉන්ධන දහනය වීම නිශ්චය කරන සාධක-බර ගණනය, බෙදාහැරීම හා සැලසුම්කිරීම පිළිබඳව පරීක්ෂාකාරී සහ නිවැරදිවීම සඳහා සියලු පාර්ශවකරුවන් අතර දැනුවත්භාවයක් ඇතිකර ඇත.

අපගේ ගුවන් සේවය පිලිවෙලින් 2015 සහ 2016 වර්ෂ තුල, සමාන ව්‍යාපාරික ආකෘති ප්‍රභේදයේ ඉන්ධන භාවිතය සහ කාර්යක්ෂමතාවය සඳහා ජගත් ශ්‍රේණිගත කිරීම් තුල 15 වන සහ 8 වන ස්ථාන දිනා ගැනීමට සමත්ව ඇත. 2017 වර්ෂය සඳහා ප්‍රතිඵල අදාල ආයතනය මඟින් නිකුත් කිරීමට නියමිතය.

## හදිසි ප්‍රතිචාර සැලසුම (ERP)

හදිසි අවස්ථාවක දී වේගවත්ව ක්‍රියා කිරීමට ඇති සූදානම සහ හැකියාව, ශ්‍රී ලංකන් ගුවන් සේවය පවත්වාගෙන යන ආකාරයට, පූර්ණ වශයෙන්ම 'ඉතා වැදගත් කොන්දේසියකි'. යෝග්‍ය පරිදි සකසා ඇති, ආයතනික හදිසි ප්‍රතිචාර සැලසුම, අනපේක්ෂිත සිදුවීම් පාලනය කිරීමෙහි නිරත සියලු පාර්ශවකරුවන් සඳහා හොඳින් පැහැදිලි කරන ලද සැලසුමකි. හදිසි අවස්ථාවකට මුහුණ දීම සඳහා, දැනුවත්භාවයේ ස්ථාවර මට්ටම පවත්වාගැනීම, දැනුම් හැකියාව සහ ප්‍රතිචාර කාලය සියුම් සකසා ගැනීම වර්ධනය කර ගැනීම සඳහා කලින් කල පුහුණුවීම් සහ සමාකරණ අභ්‍යාස සිදු කරන ලබයි. පියාසර මෙහෙයුම් ප්‍රධානී විසින් ERP සඳහා නායකත්වය සපයයි.

## යානාස්ථ සේවාවන්

### *යානාස්ථ පරිපාලනය*

ශ්‍රී ලංකන් සන්නාම වටිනාකම් වලට අනුකූලව, අපගේ අගනා ආගන්තුක සත්කාර සම්ප්‍රදායක් අඛණ්ඩව පවත්වාගෙන යන්නෙමු. ඉතා සමබර සහ හොඳින් පුහුණු කරන ලද ගුවන්යානා මැදිරි කාර්ය මණ්ඩලය, යානාස්ථ සේවාවන්හි විශිෂ්ඨත්වය කරා ලඟා වීමට වෙහෙසවී කටයුතු කරන අතර ඒ සඳහා ප්‍රමුඛස්ථානය ලබා දෙයි. අපගේ කැපවීම විදහා දක්වමින්, වර්ෂය තුල පවත්වන ලද ගුවන් මඟී සමීක්ෂණයන්හි දී, ව්‍යාපාරික පන්තියේ යානාස්ථ අත්දැකීම පිළිබඳ 90%ක ඇගයුමක් අනාවරණය විය.

# කළමනාකරණ සාකච්ඡාව සහ විශ්ලේෂණය ඉතිරි කොටස.

සමාලෝචනය කරනු ලබන මූල්‍ය වර්ෂය තුල සිදු කරන ලද ප්‍රධාන මූලාරම්භයන් පහත පරිදි දැක්වේ:

- ජ්‍යෙෂ්ඨ ගුවන් කර්යය මණ්ඩල සේවකයින් යෙදවීම: ශ්‍රී ලංකන් සන්නාම වටිනාකම් ප්‍රචලිත කිරීම පිළිබඳ සොයා බැලීම සඳහා, අන්තර් ක්‍රියාකාරී සාකච්ඡාවක් මඟින් ගුවන් කර්යය මණ්ඩල සේවකයින් යෙදවීම පිළිබඳවයානාස්ථ සේවාවන්හි කළමණාකරණ කණ්ඩායමක් තීරණය කරන ලදී. සාකච්ඡාවේ දී, කළමනාකරණය විසින්, අදාල යානා මැදිරි කාර්ය මණ්ඩලයේ සහාය ඇතිව යානාවේ දී සන්නාමය තුලින් ලැබෙන පහසුකම් පිළිබඳව මගීන්ට පැහැදිලි කිරීමේ, ඔවුන්ගේ රැකියා කාර්යභාරයෙහි වැදගත්කම පිළිබඳව අවධාරණය කරන ලදී. සාකච්ඡාවේ වෙනත් කරුණු අතර, නෞගණකයින්ගේ හා ඔවුන්ගේ කණ්ඩායමේ කැපවීම සහ බැඳීම, පාරිභෝගික සේවය, නිෂ්පාදන වැඩි දියුණු කිරීම, කාර්ය මණ්ඩලයේ අනුකූලතාවය, යානය තුල ආහාර හා පාන බෙදාහැරීම පිළිබඳ ඉංජිනේරුමය අවධානයන් පිළිබඳව අවධානය යොමු කරන ලදී.
- ගුවන් කාර්ය මණ්ඩල දිනය: ගුවන් කාර්ය මණ්ඩලයට සමීපව සම්බන්ධ වීම සඳහා, පෙ.ව. 5 ත් ප.ව. 5ත් අතර පියාසැරි රාජකාරි අවසන්ව පසු නැවත පැමිණෙන කාර්ය මණ්ඩලය යානාස්ථ කළමනාකරණ විසින් හමුවන මාසික පදනමින් යුත් ගුවන් කාර්ය මණ්ඩල දිනයක් යානාස්ථ සේවාවන් විසින් ආරම්භ කරන ලදී.මෙම මූලාරම්භය, කාර්ය මණ්ඩලය සහ කළමනාකරණය අතර සන්නිවේදනය වැඩි දියුණු කිරීමට සහ ඵලදායී ලෙස ඔවුන්ගේ දුක්ගැනවිලි අවසන් කිරීමට හා සහන සැලසීමට මඟ සලසනු ඇතැයි අපේක්ෂා කෙරේ.
- ගුවන් කාර්‍ය මණ්ඩල නිවාඩු නිරීක්ෂණය: කාර්‍ය මණ්ඩල නිවාඩු ගැනීම් දැඩි නිරීක්ෂන යටතේ අසනීප නිවාඩු වාර්ථාවන් 30% දක්වා අඩුකර ගැනීමට යානාස්ථ පර්පාලනය සමත්ව ඇත.
- සේවා පුනරාවර්ථන පුහුණුව: සේවා පුනරාවර්ථන පුහුණු වැඩසටහන් හඳුන්වා දීම යටතේ කාර්‍ය මණ්ඩල සේවා සැපයීමේ ස්ථාවර බව සහ ප්‍රමිතිය සහතික කරණු ලබයි.
- ව්‍යාපාර පන්ති සේවය: ව්‍යාපාර පන්තිය සඳහා කැපවූ කර්‍යය මණ්ඩල සේවා හඳුන්වා දීම ව්‍යාපාර පන්තියේ ගමන් ගන්නා මගීන් සඳහා විශිෂ්ට සේවාවක් තහවුරු කරණු ලබයි.

### *යානාස්ථ සහාය සේවා*

සමාලෝචනය කරනු ලබන වර්ෂය තුල සහාය සේවා අංශය සකසුරුවම් වීම, කාර්යක්ෂමතාවය වර්ධනය සහ පිරිවැය ඉතිරි කිරීම සඳහා කටයුතු කිරීම කෙරෙහි අඛණ්ඩව අවධානය යොමු කරමින් සිටී. මෙම අංශය යානාස්ථ ප්‍රකාශනයන්, ගුවන්යානා ලොන්ඩරිය, යානාස්ථ සුවපහසුකම් සහ කෑමබීම සැපයීමේ උපකරණ සඳහා ඇ.ඩොලර් 389,000ක ඉතිරියක් අත් කරගෙන ඇත.ආහාර සහ පාන සම්බන්ධයෙන් තත්ත්වය හා ප්‍රමිතිය මෙන්ම මගීන්ගේ ඇගයීම අඩු නොකරගෙන, පද්ධතිය පුරා ආහාර පිරිවැය සැලකිය යුතු ලෙස අඩු කර ගැනීමක් අත් කර ගැනීමට හැකි විය. විදේශ මධ්‍යස්ථාන සම්බන්ධයෙන් ආහාර පිරිවැය අඩු කර ගැනීම දළ වශයෙන් ඇ.ඩොලර් 106,000 කට ආසන්න වූ අතර, කොළඹ එය ඇ.ඩොලර් 255,000 විය. මෙම වර්ෂයේ සහාය සේවා ආදායම තවදුරටත් වර්ධනය කර ගැනීම සඳහා සකසුරුවම් පන්තියේ මගීන්ට ගුවන් යානය තුලී ආහාර මිල දී ගැනීමට ඇති හැකියාව ද අප හඳුන්වා දුන්නෙමු. වර්ෂය තුළ මෙම අංශය විශේෂයෙන්ම වසා දමන ලද මධ්‍යස්ථාන වලින් නැවත එවන ලද ආහාර රිය අලුත්වැඩියා කර නැවත සකස් කර නැවත භාවිතයට ගත්තෙමු. මෙමඟින් සහාය සේවාවන්ට නව ආහාර මිලදී නොගෙන සැලකිය යුතු මුදලක් ඉතිරි කර ගැනීමට හැකි විය.

### *යානාස්ථ තීරුබදු රහිත මිලදී ගැනීම*

යානය තුලදීම තීරුබදු රහිත භාණ්ඩ විකිණීමේ මෙහෙයුම් පළමු වටය, 2017 ජුනි 28 දින ආරම්භ 2018 ජූලි 02 දින අවසන් කරන ලදී. යානය තුල තීරුබදු රහිත වෙළඳාමේ මාසික සාමාන්‍ය ලාභය ඇ.ඩොලර් 210,000 ක් වූ අතර, දෛනිකව එහි සාමාන්‍ය ආදායම ඇ.ඩොලර් 15,000 විය.

### *යානාස්ථ පුහුණුව*

සේවා ප්‍රමිතීන් තුල විශිෂ්ඨත්වය කරා යන ගමනේ සමාලෝචනය කරන වර්ෂය තුළ අප අපගේ ගුවන් යානා මැදිරි කාර්ය මණ්ඩලය සඳහා පුළුල් යානාස්ථ පුහුණු අවස්ථාවන් සඳහා යොමු වුණෙමු.යානය තුල විශිෂ්ඨ මගී අත්දැකීමක් ලබා දීම සඳහා, කාර්ය මණ්ඩලයේ ස්ථාවරත්වය සහ ප්‍රමිතිය තහවුරු කිරීම උදෙසා සේවා පුනරාවර්තන පාඨමාලා ලබාදීම අප නිර්දේශ කළෙමු. මෙම පුහුණුව මඟින් සකසුරුවම් සහ ව්‍යාපාරික පන්ති සේවා අවශ්‍යතා, සම්මත මෙහෙයුම් කර්ය පටිපාටි, පාරිභෝගික ප්‍රතිචාරය සහ මගී අන්තර් ක්‍රියාකාරීත්වය වැනි අංශ ආවරණය කරන ලදී.ව්‍යාපාරික පන්තියේ මගීන්ගේ විචක්ෂණශීලී අවශ්‍යතාවන් අනුව ආහාරපාන සැපයීම සඳහා කැපවූ මගී සේවිකාවන්ට සම්පූර්ණ-මනා ගැලපෙන පුහුණුවක් ලබා දීමට ද අප කටයුතු කළෙමු. මගී සේවිකාවන් තෝරා ගනු ලැබුවේ ඔවුන්ගේ ජ්‍යෙෂ්ඨත්ව පදනම, ශරීර ස්කන්ධ දර්ශකය (BMI) පැමිණීමේ වාර්තාව සහ කාර්යසාධනය මතය.

### *යානාස්ථ පුවත්*

යානාස්ථ දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය, කටයුතු, නිවේදන, විශේෂ කාර්ය මණ්ඩල ජයග්‍රහණයන් සහ කර්මාන්තයේ පුවත් පිළිබඳව තොරතුරු ප්‍රචාරණය කිරීම සඳහා, මාසික කාර්යමණ්ඩල පුවත්ලිපියක් දියත්කරන ලදී. මෙම පුවත්ලිපිය, 1300 ක් වන යානාස්ථ කාර්ය මණ්ඩල සමාජිකයන් හොඳින් දැනුවත් කිරීම සහ යාවත්කාලීන කිරීම ඉලක්ක කර සකසන ලදී.

### *යානාස්ථ අංශයේ අනාගත පසුබිම*

ඊළඟ මූල්‍ය වර්ෂයේ දී, ශ්‍රී ලංකන් සන්නාමයට අනුරූපව අසාමාන්‍ය ගුවන් යානා මැදිරි සේවයක් දක්වා පුළුල් කිරීම සඳහා, මූලෝපායික ප්‍රමුඛතාවයක් ලබා දීමට, යානාස්ථ සේවාවන් අඛණ්ඩව කටයුතු කරනු ඇත. මෙම ඉලක්කයේ දී අප නිෂ්පාදන මෙන්ම සේවා ගුණාත්මය සම්බන්ධයෙන්, ගුවන් යානා මැදිරි කාර්ය මණ්ඩල පුහුණුව මත අඛණ්ඩව ආයෝජනය කරන්නෙමු. සේවා ප්‍රමිති වලට අමතරව, යානාස්ථ දෙපර්තමේන්තුව පිරිවැය ප්‍රශස්තීකරණය කෙරෙහි අවධානය යොමු කර සිටියි. ගුවන් මැදිරි කාර්යමණ්ඩල ගමන් වාර්තාව ඇතුළු ක්‍රියාවලීන් තවදුරටත් ස්වයංක්‍රියකරණය කිරීමට සහ ඉන්ධන කාර්යක්ෂමතාවය පිළිබඳව සොයා බැලීම විශේෂයෙන්ම ගුවන් යානය තුල වන සියලු අයිතමයන්ගේ බර අඩු කිරීම සඳහා කටයුතු කිරීම සහ නැවත ඇගයීම සඳහා යෝග්‍ය සැලසුම් සකසා ඇත.

## ව්‍යාපාරික ඒකක සමාලෝචනය

### ශ්‍රී ලංකන් ගුවන්තොටුපල සහ ගොඩබිම් සේවා

**කාර්ය සාධනය**

'ආරක්ෂාව, නිවැරදිතාවය සහ සේවය අත් කර ගැනීම සඳහා අපගේ පරිශ්‍රමයන්ට කැපවූ, අපගේ ගුවන්තොටුපොල සහ ගොඩබිම් සේවා, 2017/2018 වර්ෂය අද්විතීය මූල්‍ය වර්ෂයක් ලෙස සටහන් කර ඇත.මෙම අංශය, පසුගිය වර්ෂයට සාපේක්ෂව, කාර්ය පරිමාවේ සහ දළ ඉපැයීම්හි පිළිවෙලින් 13% ක සහ 21%ක වර්ධනයක් අත්කර ගත්තේය.




ජාතික ප්‍රවාහකයා වන ශ්‍රී ලංකන් ගුවන් සේවයෙහි කාර්ය පරිමාවේ සැලකිය යුතු වැඩිවීමක් සිදු වීමට හේතු වූයේ, වැඩි වූ ගමනාන්ත සංඛ්‍යාව සහ බණ්ඩාරනායක අන්තර් ජාතික ගුවන්තොටුපොලෙහි හසුරුවන ලද පියාසර වාර ගණන,සමස්ථ පියාසර සංඛ්‍යාවෙන් 53%කට වගකීම දැරීමත්ය.පෙර මූල්‍ය වර්ෂයට සාපේක්ෂව, ගුවන් තොටුපොල සහ ගුවන් භාණ්ඩ හැසිරවීමෙන්, ආදායමෙහි 14%ක වර්ධනයක් වාර්තා කරන ලදී; එනම් ගුවන් තොටුපොල හා ගොඩබිම් සේවාවන්හි සමස්ථ ඉපැයීම් සඳහා ඇ.ඩොලර් මිලියන 103.98 ක දායකත්වයකි. මෙය එදා මෙදාතුර දළ ඉපැයීම් වල වාර්තා වූ ඉහළතම අගය වූ ඇ.ඩොලර් මිලියන 61.55ක අගය ඉහළ නැංවීමකි.

**හසුරුවන ලද ගුවන් භාණ්ඩ ටොන් ගනන**




ඉන්ඩිගෝ, සිල්ක් එයාර්, චයිනා සදර්න්, ගල්ෆ් සහ වින්ටර් එයාර්ලයින් ඔපරේටර්ස් වැනි ප්‍රධාන පෙළේ පාරිභෝගිකයන් සමඟ නව ගිවිසුම් අත්සන් කිරීම මඟින්, ගුවන්තොටුපොල සේවාවන්ට වැඩිවූ ව්‍යාපාරික ධාරිතාවයන් අත්විඳීමට හැකිවිය. ගුවන් තොටුපොල සහ ගොඩබිම් සේවාවන් විසින් හසුරුවන ලද ගුවන් යානා මෙහෙයුම් සංඛ්‍යාව 65,090ක් විය. ගුවන් තොටුපොල සේවාවන් එම අංශයේ සමස්ථ ආදායමට ඇ.ඩොලර් මිලියන 79 ක දායකත්වය සපයන විට, හසුරුවන ලද සමස්ථ මඟී සංඛ්‍යාව මිලියන 10.6ට ආසන්න විය.

ගුවන් භාණ්ඩ මෙහෙයුම් පිළිබඳව වර්තමානය දක්වා මෙට්‍රික් ටොන් 277,000ක ඉහළතම ටොන් ගණන වාර්තා කර ඇති අතර, මූල්‍ය වර්ෂය පුරා 99.95% හැසිරවීම පිළිබඳ විශ්වසනීයත්වයක් පවත්වාගෙන යන ලදී. ගුවන් භාණ්ඩ මෙහෙයුම් වල සමස්ථ ආදායම, ඇ.ඩොලර් මිලියන 25ක් විය. ගුවන් භාණ්ඩ හැසිරවීමේ කර්මාන්තය තුල සිදු වන ඩිජිටල්කරණය හා උරෙන් උර ගැටීමේ වැදගත්කම හඳුනාග නිමින්, ඊ-ගුවන්-සේවා-බිල් වෙත පරිශීලක සංක්‍රමණය දිරිමත් කිරීම සඳහා ප්‍රධාන මූලාරම්භයන් සිදු කරන ලදී. කොළඹ වෙළඳපොල තුල, ඩිජිටල්කරණය වූ කාර්යාවලීන් තුලට 70% ප්‍රමාණයක් ඇතුළු වීමට හැකි වීම මෙහි ප්‍රතිඵලයකි.

**ප්‍රධාන වැඩි දියුණු කිරීම්**

සමාලෝචනය කරනු ලබන වර්ෂය තුල, ගුවන්තොටුපොල සහ ගොඩබිම් සේවා අංශය, සේවාවන් හා මෙහෙයුම් ප්‍රමිතීන් වැඩි දියුණු කිරීමේ මඟී සහ ගමන් මළු හා ගුවන් භාණ්ඩ හැසිරවීමේ මෙහෙයුම් සඳහා වන යටිතල පහසුකම් හා කාර්යක්ෂමතාවයන් වැඩි දියුණු කිරීම සඳහා වූ පහත දක්වා ඇති පරිදි ප්‍රධාන මූලාරම්භයන් ගණනාවක් අරම්භ කරන ලදී.

- සේවා ප්‍රමිතීන් වැඩි දියුණු කිරීම සඳහා, කර්මාන්තයේ විශේෂඥයින්ගේ උපදේශනය තුලින් සේවා වැඩි දියුණු කිරීම් සිදු කරන ලදී.
- අමතර ගමන්මළු පරිලෝකනය (scanning) කිරීමේ පහසුකම සම්බන්ධයෙන් ගුවන් තොටුපොල ක්‍රියාකරු එයාර්පෝර්ට් ඇන්ඩ් ඒවියේෂන් සර්විසර්ස් ශ්‍රී ලංකා හා හවුල්කාරිත්වයෙන්, යටිතලපහසුකම් හැසිරවීමෙහි අවශ්‍ය වැඩිදියුණු කිරීම් සිදු කරන ලදී.
- ගොඩබිම් සහායක උපකරණ නැවත රැස් කර ගැනීම සඳහා නිසි ආයෝජනයන් සිදු කරන ලදී.
- ගුවන් සේවය වෙනුවෙන් කාර්ය මණ්ඩලයේ බැඳීම සහ කැපකිරීම වෙනුවෙන් කාර්ය මණ්ඩලයට ද දීර්ඝ කළ අමතර දිරි දීමනා ලබා දීම.
- මෙහෙයුම් ඉල්ලුම් වලට වඩාත් සර්ලන පරිදි විවිධ වැඩ වාර සටහන් හඳුන්වා දෙන ලදී.
- නිෂ්පාදන දැනුම සහ කුසලතාවයන් වැඩි දියුණු කිරීම සඳහා, කාර්ය මණ්ඩලයට දීර්ඝ කළ පුහුණු අවස්ථා ලබා දෙන ලදී.
- දැනුම බෙදාගැනීමේ වැඩමුළු, අනුකූලතා විගණනයන් සහ දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීම මඟින්, ආරක්ෂාව සම්බන්ධයෙන් විශේෂ අවධාරණයක් සිදු කිරීම.
- 'ග්‍රීන් චැලේන්ජ්' නමින් ආයතනය පුරා පාරිසරික වැඩසටහනකට සහභාගී වීම. එහිදී ගුවන් භාණ්ඩ මෙහෙයුම් කණ්ඩායම ඉදිරිපත් කරන ලද, මෙහෙයුම් තුල පොලිතීන් නිෂ්පාදන අඩු කිරීම සඳහා වන යෝජනාව ජය ගන්නා ලදී.

**අනුකූලතාවය සහ පිළිගැනීම**

ජාත්‍යන්තර ගුවන් ප්‍රවාහන සංගමයෙහි ගොඩබිම් මෙහෙයුම් කවුන්සිලයෙහි අන්තර්ජාතික ගුවන්සේවා ආයතනවල නියාමන ප්‍රමිතීන්, ජාත්‍යන්තර ගුවන් ප්‍රවාහන සංගමයෙහි ගොඩබිම් මෙහෙයුම්

# කළමනාකරණ සාකච්ඡාව සහ විශ්ලේෂණය ඉතිරි කොටස.

සඳහා වන ආරක්ෂණ විගණනය (ISAGO) සහ ජාත්‍යන්තර ගුවන් ප්‍රවාහන සංගමයෙහි මෙහෙයුම් ආරක්ෂණ විගණනය (IOSA) සමඟින් ගුවන්තොටුපළ සහ ගොඩබිම් සේවාවන් අනුකූල වේ. ඊළඟ මූල්‍ය වර්ෂයේ දී, සිදු කිරීමට යෝජිත, මෙම අන්තර්ජාතික ආයතන විසින් සිදු කරනු ලබන ඊළඟ විගණන චක්‍රය සඳහා මුහුණ දීමට කණ්ඩායම සන්නද්ධව ඇත. මෙම වර්ෂය තුල, කොරියන් එයාර් ගුවන් සේවය, අඛණ්ඩ සහයෝගීතාවයෙන් කටයුතු කිරීම සඳහා ගුවන්තොටුපොල සහ ගොඩබිම් සේවා හඳුනා ගනිමින්, ඔවුන්ගේ සේවා තත්ත්ව අභ්‍යන්තර ඇගයීමේ කාලය තුල සහාය සපයන ලද අතර, ගිණිකොනදිග ආසියාවේ, ගොඩබිම් හැසිරවීමේ සමාගම් අතර ඉහළතම ගුණාත්මයෙන් යුතු සේවා සපයන සැයුම්කරු ලෙස මෙම අංශය නම් කරන ලදී. 2017 වර්ෂයේ 100% ක ගුවන් අරක්ෂාව සලසාලීමට සහාය වීමට දැක්වූ අසාමාන්‍ය උනන්දුව සහ කැපවීම සම්බන්ධයෙන්, මැලේසියා එයර්ලයින් විසින් ද ගුවන් තොටුපොල සහ ගොඩබිම් සේවාව හඳුනාගන්නා ලදී.

### අනාගත මුහුණුවර

ගුවන්තොටුපොල සහ ගොඩබිම් සේවා දෙපාර්තමේන්තුව, ප්‍රතිව්‍යුහගතකරණය කිරීමේ එහි ඉහළ අපේක්ෂා සහිත සැලසුම් ඉදිරියට සිදු කරගෙන යාමට කැපවී සිටී. වඩාත් සියුම් සහ කාර්යක්ෂම වැඩ පරිසරයක් ඇති කිරීම පිළිබඳව සොයා බැලීමත්, එමඟින් තරඟය තුලින් ඉදිරියට ගමන් කිරීමට දෙපාර්තමේන්තුවට හැකවිය. අපගේ අගනා පාරිභෝගිකයන් සඳහා වන යුතුකම් ඉටු කිරීමේ දී ආරක්ෂාව, නිවැරදිතාවය සහ සේවය යන සංකල්පය කණ්ඩායම විසින් තහවුරු කරන ලදී.

### ශ්‍රී ලංකන් ඉංජිනේරු අංශය

ශ්‍රී ලංකන් ඉංජිනේරු අංශයේ, ගෘහස්ථ ගුවන්යානා නඩත්තු අංශය, 2017/18 වර්ෂයේ දී ඉතා වැදගත් සැතපුම් කණුවක් පසු කළේය. සමගාමී නඩත්තු පරීක්ෂාවන් සිදු කිරීම සඳහා, කැපකල නිෂ්පාදන අංගන සහිත, 'නවීන නඩත්තු, අලුත්වැඩියා සහ නවීකරණ (MRO) ආකෘතිය සඳහා සංක්‍රමණය වීම අංශය විසින් සාර්ථකව අවසන් කරන ලදී. ඒ අනුව, 4C/6Y පිරික්සුම් දක්වා නඩත්තු කටයුතු සිදු කිරීමේ හැකියාව සහිත, වෙන් වෙන් 'A' පිරික්සුම් සහ 'C' පිරික්සුම් අංගන වලින්, වර්තමානයේ අපගේ මෙහෙයුම් සන්නද්ධ වී ඇත. මෙම සංක්‍රමණය, නඩත්තු ක්‍රියාවලිය නව්‍යකරණය කිරීමට හැකියාව ලබා දී ඇති අතර, එමඟින් කාර්යක්ෂමතාවය වර්ධනය කර සහ ගුවන්යානා නඩත්තුව සඳහා ගතවන කාලය අඩු කර ගත හැකිය.අපගේ තුන්වන පාර්ශව ආදායම පුළුල් කර ගැනීමේ අපේක්ෂාවෙන්, අංගන නඩත්තු අංශයෙහි අපගේ මෙහෙයුම් ද අප නව්‍යකරණය කළෙමු. මෙම ශක්‍යතාවයන් ප්‍රශස්තීකරණය කිරීම සඳහා කළමනාකරණ ව්‍යුහයන් සඳහා අවශ්‍ය සංශෝධනයන් සහිතව, ගුවන් යෝග්‍යතා කළමනාකරණය අඛණ්ඩව පවත්වාගෙන යාම සම්බන්ධ නව පාර්ට් එම් නියාමන (CAASL-IS Part M) මාර්ගෝපදේශනයන්ට වඩා හොඳින් අනුකූලව, විවිධ අභ්‍යන්තර කාර්ය පරිපාටිමය වෙනස්කම් ආරම්භ කරන ලදී. අප සමාලෝචනය කරනු ලබන වර්ෂය තුල 12Y පිරික්සුම් දෙකක් අතුළුව, ගුවන් යානා සමූහය සම්බන්ධයෙන් දැඩි නඩත්තු පිරික්සුම් නවයක් සිදු කළෙමු. A320neo පවුලේ නව එයාර්බස් ගුවන්යානා තුනක් අපට ලැබිණි.

ගෝලීය A320neo පවුලේ යානාවන්ට බලපානු ලැබූ එන්ජින් ආශ්‍රිත ගැටළු වලින්, ගුවන් සේවයට ඇතිවිය හැකි බලපෑම අවම කර ගැනීම සඳහා, ගුවන් යානා, එහි එන්ජින් නිෂ්පාදකයන් සහ ගුවන් යානා කල්බදු කරු සමඟ ඵලදායී ලෙස සම්බන්ධීකරණය සිදු කිරීමේ සහ ගුවන් යානාවන්හි තාක්ෂණික ප්‍රතිග්‍රහණය කිරීමේ ප්‍රධාන භූමිකාව ඉංජිනේරු කණ්ඩායම මඟින් සිදු කරන ලදී. ETOPS මෙහෙයුම් සඳහා බලපානු ලැබූ ගැටළු නිරාකරණය කර ගැනීම සඳහා අදාල පාර්ශවයන් සමඟ සමීපව කටයුතු කර, එන්ජින් නිෂ්පාදකයා සමඟ සහයෝගීතාවයෙන් එන්ජින් තත්ත්ව සුපරීක්ෂණ ක්‍රියාවලියට සහාය වීම සඳහා අවශ්‍ය පියවර ගන්නා ලදී. ගුවන්යානා නිෂ්පාදකයාගේ දත්ත අනුව ශ්‍රී ලංකන් A320neo පවුලේ එයාර්බස් ගුවන් යානාවන්හි විශ්වසනීයත්වය මෙන්ම උපයෝජනය මෙම මූලාරම්භයන් වල ප්‍රතිඵලයක් ලෙස මෙම කාලය සඳහා වන ගෝලීය සාමාන්‍යයට වඩා ඉහළ තත්ත්වයක ඇත.

සමාලෝචනය කරනු ලබන කාලය තුල, අප නූතන අන්තර්ජාතික ප්‍රමිතීන් හා අනුරූප වන ලෙස, පටු ඉඩකඩක් සහිත ගුවන්යානා අංගනයෙහි වැඩිදියුණු කිරීම් ගණනාවක් සිදු කිරීම ඇතුළු, යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම් සහ යාවත්කාලීන කිරීම් ද සිදු කළෙමු. පුළුල් ඉඩකඩක් සහිත ගුවන්යානා අංගනයෙහි නවීකරණ කටයුතු, වර්තමානයේ සිදු කෙරෙමින් පවතින අතර, ඉදිරි 2018/19 මූල්‍ය වර්ෂය තුල එම කටයුතු සම්පූර්ණ කර දියත් කිරීමට නියමිතය.

ඊළඟ මූල්‍ය වර්ෂය තුල, ඉංජිනේරු අංශය, ගුවන්යානා සහතිකකරණ අනුමැති පුළුල් කිරීමේ මෙන්ම අමතර උපාංග අලුත්වැඩියා සඳහා අනුමැතිය ලබා ගැනීමේසැලසුම් සමඟින්, තුන්වන පාර්ශව කටයුතු සඳහා කර්යන්හි විෂය පථය පුළුල් කිරීමක් අපේක්ෂා කරනු ලබයි.

### ශ්‍රී ලංකන් ගුවන් සේවා විද්‍යායතනය (SLAC)




**2018 වර්ෂයේ දකුණු ආසියානු කලාපයේ ඉහළ කාර්ය සාධනයක් සහිත පුහුණු මධ්‍යස්ථානය**
2018 අප්‍රේල් 16-18 දින වල, තුර්කියේ, ඉස්තාම්බුල් නුවර පැවති, 'IATA' ගෝලීය, කලාපීය පුහුණු සහකරුවන්ගේ සමුළුවේ දී, SLAC පිළිගැනීමට ලක්විය.

ශ්‍රී ලංකන් ගුවන් සේවයේ පුහුණු අංශය වන, ශ්‍රී ලංකන් ගුවන් සේවා විද්‍යායතනය, සමාලෝචනය කරනු ලබන වර්ෂය තුල, ඉතා වැදගත් ජයග්‍රහණයන් සහිතව සැලකිය යුතු කාර්ය සාධනයක් සනිටුහන් කළේය.විද්‍යායතනය සුප්‍රකට පුහුණු සහ අධ්‍යයන ආයතන හා සහයෝගීතාවයෙන්, ශිෂ්‍යයින්ට මෙන්ම රැකියාවෙහි නිරත වෘත්තිකයන්ට විස්තීර්ණ පුළුල් ගුවන් සේවා අධ්‍යයන විකල්පයන් රාශියක් පිරිනමයි. තුර්කියේ පැවති 'IATA' ගෝලීය, කලාපීය පුහුණු සහකරුවන්ගේ සමුළුවේ දී අත් කර ගන්නා පිළිගැනීම, මේ හා සම්බන්ධ වැදගත් සහතිකයකි. මූල වර්ෂය තුල සිදුවූ වැදගත් මූලාරම්භයන් පහත පරිදි දැක්විය හැකිය:

- ඉංජිනේරු උපාධිය: විද්‍යායතනය, ශ්‍රී ලංකාවේ ගුවන්යානා ඉංජිනේරු විද්‍යාවේ ඉහළතම ඉංජිනේරු ගෞරව උපාධිය දක්වා දීර්ඝ කිරීම සඳහා ලන්ඩනයේ කිංස්ටන් විශ්ව විද්‍යාලය සමඟ අවබෝධාත්මක ගිවිසුමක් අත්සන් කර සාර්ථක සහයෝගීතාවයක් ඇති කරගෙන ඇත. එක්සත් රාජධානියේ 2001 සිට ආරම්භ කරන ලද මෙම වැඩසටහන මඟින් රාජකීය ගගනගාමී සංගමය මඟින් බලයලත් ගෞරව උපාධියක් ලබා ගැනීම සඳහා වන 'EASA B බලපත්‍ර පුහුණු සහතිකයක්ලබා ගැනීම දක්වා සුදුසුකම් ලබන සිසුන්ට හැකියාව ලබා දීම අපේක්ෂා කරයි. EASA Part 66/CAASL IS 66 බලපත්‍රය ලබාගත් හෝ බී ඝනයේ ගුවන්යානා නඩත්තු ඉංජිනේරු පාඨමාලාව හැදෑරූ රැකියාවේ නිරත වෘත්තිකයන් අර්ධ කාලීන පදනම මත මෙම ඉහළතම උපාධියට ඉල්ලුම් කිරීම සඳහා සුදුසුකම් ලබයි. ගුවන් සේවයේ රැකියාවෙහි නිරත සේවා නියුක්තිකයන්ට වඩාත් සුදුසු පරිදි සකසන ලද පහසු පාඨමාලා කාලසටහන් සහිත මෙම වැඩසටහනට, කිංස්ටන් පළපුරුදු විශ්ව විද්‍යාලයේ කථිකාචාර්යවරුන්ගේ මණ්ඩලයකින් සහාය ලැබේ.
- විද්‍යා උපාධිය: සමාලෝචනය කරනු ලබන වර්ෂයේ දී, SLAC සර් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය (KDU) සමඟ ද සහයෝගීතාවය ඇති කර ගත් අතර, ගුවන් යානා නඩත්තු ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යා උපාධිය සඳහා නව වැඩසටහනක් ඒකාබද්ධව දියත් කරන ලදී.පළමු කණ්ඩායම, ඔවුන්ගේ අධ්‍යයන කටයුතු 2018 වසරේ අප්‍රේල් මාසයේ දී ආරම්භ කළහ. උපාධි අපේක්ෂකයින් නිපුණතාවයෙන් හා විශ්වාසයෙන් යුතුව ගුවන් යානා නඩත්තු ඉංජිනේරුවන් ලෙස තම අනාගත භූමිකාව බාර ගැනීම සඳහා සූදානම් කිරීම, වසර හතරක උපාධි වැඩසටහනෙහි අරමුණයි.
- ප්‍රයෝගික පුහුණුව: තාක්ෂණික පුහුණුශිෂ්‍යයින් සඳහා ප්‍රායෝගික පුහුණු ඒකකයක් පිහිටුවීම සඳහා අවශ්‍ය ක්‍රියාවලීන් ද, විද්‍යායතනය විසින් ආරම්භ කර වර්ධනය කරන ලදී. වටිනාකමක් නොමැති ගුවන් යානා දෙකක් අත්පත් කර ගැනීමේ යෝජනාව, පුහුණු ඒකකයට තවදුරටත් වටිනාකමක් එක් කර එහි කටයුතු වලට සහායක් වනු ඇත. SLAC, පූර්ණ කාලීන සහ අර්ධ කාලීන පාඨමාලා විකල්පයන් සහිත පුහුණු පහසුකම් වලින් පූර්ණව සන්නද්ධ මෙහෙයුම් කොළඹ දී ද ආරම්භ කරන ලදී.
- විවිධාංගීකරණය සහ ප්‍රති වෙළඳනාමකරණය: ගුවන්සේවා පාඨමාලාවන්ට අමතරව,බාහිර සහ අභ්‍යන්තර පහසුකම් සහිත ගුවන්සේවා-නොවන අංශ ආශ්‍රිත පාඨමාලා හඳුන්වා දීමට ද විද්‍යායතනය අපේක්ෂා කරයි.
- ප්‍රති වෙළඳනාමකරණය: විද්‍යායතනය ප්‍රති වෙළඳනාමකරනය කර ශක්තිමත් කිරීමට සහ ආයතනය ප්‍රවර්ධනය කිරීම සඳහා ස්ථාවර සැලසුම් යෝග්‍ය පරිදි යොදාගෙන ඇත. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසමෙහි විෂය පථය යටතේ, විශ්ව විද්‍යාලයේ තත්ත්වය වලංගු කර ගැනීමේ අපේක්ෂාවෙන් සියලු අධ්‍යයන කාර්යයන් සුපරීක්ෂණය කිරීම සඳහා අධ්‍යයන උපදේශකවරයෙන් පත් කිරීම SLAC යෝජනා කරනු ලබයි.
- පරිසර හිතකාමී පුහුණුව: විද්‍යායතනය, පුහුණුවේ දී වගකීම් සහිත පාරිසරික පරිචයන් අඛණ්ඩව ප්‍රවර්ධනය කරන අතර, පුහුණු මාධ්‍යයන් භාවිතයේ දී, අත්පොත් සැකසීමේ දී, සහ විභාග පැවැත්වීමේ දී 'කඩදාසි රහිත' වීම සඳහා අවධානය යොමු කර සිටී. SLAC කාර්ය මණ්ඩලය පොලිතීන් ලන්ච්ෂීට් භාවිතා නොකිරීම වැනි පරිසර හිතකාමී පුරුදු අනුහුරු කිරීම සඳහා දිරිමත් කරන ලද අතර, කඩදාසි, ජලය සහ ශක්තිය වැනි සම්පත් වගකීමෙන් පරිභෝජනය කිරීම සම්බන්ධව දැනුවත්භාවයක් ඇති කිරීම සිදු කරන ලදී.

## ශ්‍රී ලංකන් කේටරින් ලිමිටඩ්

### කාර්යසාධනය

ශ්‍රී ලංකන් කේටරින් ලිමිටඩ් යනු, ශ්‍රී ලංකන් ගුවන් සේවයට පූර්ණ හිමිකාරිත්වය සහිත අනුබද්ධ ආයතනයක් වන අතර, බණ්ඩාරනායක අන්තර්ජාතික ගුවන්තොටුපොළෙහි, යානාස්ථ ආහාර පාන සපයන එකම සැපයුම් කරුවාය. ශ්‍රී ලංකන් කේටරින්, තම කාර්ය සාධනයේ සැලකිය යුතු වර්ධනයක් දක්වමින් තවත් සාර්ථක වර්ෂයක් වර්තා කරන ලද අතර, ගුවන් සේවයේ කාර්ය සාධනය සඳහා සැලකිය යුතු දායකත්වයක් සපයන ලදී.

ශ්‍රී ලංකන් කේටරින් හි කාර්ය සාධනය පසුගිය 10 වසරක, එහි ශක්තිය සහ හැකියාව පිළිබඳ පැහැදිළි පිළිබිඹුවකි. අහිතකර ව්‍යාපාරික තත්ත්වයන් මැද වුවද සමාගම එහි කොටස්කරුවන්ට ආකර්ෂණීය ප්‍රතිලාභ අත්කර දීමට ඇති හැකියාව සනාථ කර ඇත.

යානාස්ථ ආහාරපාන සැපයීමේ එහි ප්‍රධාන මෙහෙයුමට අමතරව, සමාගම, කටුනායක/කොළඹ සහ මත්තල අන්තර්ජාතික ගුවන්තොටුපොළෙහි (MRIA) මාර්ගස්ථ මඟින් සඳහා ආපානශාලා සහ විවේකාගාර පවත්වාගෙන යාම සහ කළමනාකරණය ද සිදු කරයි.එහි අනුබද්ධ කාර්යන්හි කොටසක් ලෙස, සෙරන්දිවා මාර්ගස්ථ හෝටලය (Serenediva Transit Hotel), කාර්මික ලොන්ඩරිය, වැනිලා පොඩ් ආපනශාලාව (vanilla pod outlet) සහ කොටුවේ ලන්දේසි රෝහලේ පිහිටි සෙමන්ඩු ආපාන ශාලාව ද කළමනාකරණය කරමින් පවත්වාගෙන යයි.

### ආදායම

පෙර වර්ෂය තුල උපයන ලද ලං.රු. මිලයන 7,2160 සාපේක්ෂව, මෙම වර්ෂය තුල 19.14%ක වැඩි වීමක් සහිත ලං.රු. මිලියන 8,598 ක ආදායමක් උපයමින්, ශ්‍රී ලංකන් කේටරින් එහි ඉහළ තත්ත්වය අඛණ්ඩව පවත්වාගෙන ඇත. ආදායම 2013/2014 මූල්‍ය වර්ෂයේ සිට 2017/18 මූල්‍ය වර්ෂය දක්වා 5 වසරක සංයුක්ත වාර්ෂික වර්ධන වේගය (CAGR) 11.93%ක ප්‍රමාණයකින් වර්ධනය විය.

**ආදායමට සාපේක්ෂ ආදායම් වර්ධනය**



## කළමනාකරණ සාකච්ඡාව සහ විශ්ලේෂණය ඉතිරි කොටස.

පෙර මූල්‍ය වර්ෂයට සාපේක්ෂව, සමාලෝචනය කරනු ලබන වර්ෂය තුල, ආදයම් සංයුතියේ සැලකියයුතු වෙනසක් සිදු නොවීය. මෙම වර්ෂය තුල, පෙර වර්ෂයේ 76.59% ක ප්‍රමාණයට මඳක් වැඩි, එනම් සමස්ථ ආදායමෙන් 78.57% ක ප්‍රමාණයක් යානාස්ථ ආහාර පාන සැපයීමෙන් දායක කරන ලදී. යානාස්ථ ආහාරපාන සැපයීමේ අංශයේ ආකර්ෂණීය කාර්යසාධනය, 2016/17 වර්ෂයේ ලං.රු. මිලියන 5.5270 සාපේක්ෂව, 2017/2018 වර්ෂයේ දී ලං.රු. 6,755ක එනම් 22.23% ක ආදායම් වැඩි වීමක් අත්කර ගෙන ඇත.මෙය ප්‍රධාන වශයෙන් පෙර වර්ෂයේ වර්තා කරන ලද ආහාර වේල් 6,270,457 ප්‍රමාණයට සාපේක්ෂව ආහාර වේල් ගණන 22.61% වැඩි වීම හේතුවෙන් සිදු විය.




| | |
|---|---|
| ගුවන්යානා මුළුතැන්ගෙය | 78.57% |
| ලොන්ඩරිය | 2.60% |
| බණ්.ජා.ගු.තො. අවන්හල | 14.08 % |
| මත්තල - අවන්හල | 0.11% |
| ට්‍රාන්සිට් අවන්හල | 1.74 % |
| එමිරේට්ස් විවේකාගාරය | 1.55 % |
| වැනිලා පොඩ් ආපනශාලාව | 0.29% |
| සෙමොන්ඩු අවන්හල | 1.06% |




| | |
|---|---|
| ගුවන්යානා මුළුතැන්ගෙය | 76.59% |
| ලොන්ඩරිය | 2.75% |
| බණ්.ජා.ගු.තො. අවන්හල | 15.31% |
| මත්තල - අවන්හල | 0.40% |
| ට්‍රාන්සිට් අවන්හල | 1.58% |
| එමිරේට්ස් විවේකාගාරය | 1.99% |
| වැනිලා පොඩ් ආපනශාලාව | 0.31% |
| සෙමොන්ඩු අවන්හල | 1.09% |

චයිනා සදර්න් සහ ගල්ෆ් එයාර් ගුවන් සේවාවන් දෙක ශ්‍රී ලංකන් කේටරින් සැපයුම් ලැයිස්තුවට එක් වීම තුලින් මෙම කාලය තුල එහි පාරිභෝගික පදනම පුළුල් කර ගැනීමට ද හැකියාව ලැබිණි. කෙසේ නමුදු, සමාලෝචනය කරනු ලබන කාලය තුල ශ්‍රී ලංකන් කේටරින්, සවුදියා එයාර්ලයින් සමඟ තිබූ ව්‍යාපාරික සබඳතා නවතා දමන ලදී.

සමස්ථ යානාස්ථ ආදායමෙන් 65.59%ක් නියෝජනය කරන ශ්‍රී ලංකන් ගුවන්සේවය, යානාස්ථ ආහාරපාන සපයන ප්‍රධාන දායකයා වන අතර 2016/17 වර්ෂයේ 69.86%ට සාපේක්ෂව සමස්ථ අහාර වේල් නිෂ්පාදනය 75.56%ක් විය. මෙම කාලය තුල ශ්‍රී ලංකන් ගුවන් සේවය මිලදී ගන්නා ලද අහාර වේල් ගණන, පෙර වර්ෂයේ ආහාර වේල් ගණන වූ 4,380,690ට සාපේක්ෂව 32.6%ක වැඩි වීමක් එනම් ආහාර වේල් 5,808,805ක් විය.

බීඅයිඒ හි ගුවන්තොටුපොල ආපාන ශාලාවේ දායකත්වය, සමස්ථ ආදායමෙන් 14.08% ක් විය. ගුවන්තොටුපොල ආපාන ශාලාවේ ආදායම පෙර වර්ෂයේ ලං.රු. මිලියන 1,1040 සාපේක්ෂව 9.58% ක, එනම් ලං.රු. මිලියන 1,210 ක් වැඩිවීමක් වාර්තා කරන ලදී. මීට අමතරව වෙනත් අනුබද්ධ ව්‍යාපාරයන්හි අදායම ද 8.04% කින් වැඩි විය.




| | |
|---|---|
| ශ්‍රී ලංකන් එයාර්ලයින්ස් | 76% |
| එමිරේට්ස් එයාර්ලයින්ස් | 6% |
| කටාර් එයාර්වේස් | 5% |
| මිහින් ලංකා | 0% |
| තුර්කි එයාර්ලයින්ස් | 3% |
| කොරියන් එයාර්ලයිනස් | 1% |
| ඕමන් එයාර් | 1% |
| අනිකුත් ගුවන්සේවා | 8% |




| | |
|---|---|
| ශ්‍රී ලංකන් එයාර්ලයින්ස් | 70% |
| එමිරේට්ස් එයාර්ලයින්ස් | 6% |
| කටාර් එයාර්වේස් | 6% |
| මිහින් ලංකා | 4% |
| තුර්කි එයාර්ලයින්ස් | 4% |
| කොරියන් එයාර්ලයිනස් | 2% |
| ඕමන් එයාර් | 1% |
| අනිකුත් ගුවන්සේවා | 7% |

### මෙහෙයුම් වියදම්

පසුගිය වර්ෂයට සාපේක්ෂව පරිපාලන වියදම් 7.00%කින් සහ වෙනත් මෙහෙයුම් වියදම්12.36%කින් ඉහළ යෑම හේතුවෙන්, 2016/17 වර්ෂයේ, ලං.රු. මිලියන 2.5860 සාපේක්ෂව මෙම වර්ෂය තුල, සමස්ථ මෙහෙයුම් වියදම්, ලං.රු. මිලියන 2,823කින් එනම් 9.18%කින් ඉහළ යන ලදී.

### ලාභදායීතාවය

2016/17 - 77.74% සිට 2017/18 - 77.05% දක්වා වසර වල, 0.46% කින් දළ ලාභ සීමාව හීන වන අතර සමාලෝචනය කරනු ලබන වර්ෂය තුල දළ ලාභය 18.60%කින් එනම් ලං.රු. මිලියන 6,624 තෙක් වැඩි විය. ආදායමෙහි වැඩි වීමට වඩා විකුණුම් පිරිවැය වැඩි වීම හේතුවෙන් මෙසේ සිදු විය. කෙසේ නමුදු ශ්‍රී ලංකන් කේටරින් අංශයට පසුගිය වසර 5 තුල 75% සහ 77% අතර ස්ථාවර දළ ලාභ සීමාවක් පවත්වාගෙන යාමට හැකිවී ඇත.

**ලාභදායීතාවය (රු. මිලි.)**




අදාළ කාලය තුල, ඉහල තලයේ ස්ථාවර වර්ධනයේ ප්‍රතිඵලයක් ලෙස සමාලෝචනය කරනු ලබන වර්ෂයේ දී මෙහෙයුම් ලාභය 25.75%කින් එනම් ලං.රු. මිලියන 3,809 දක්වා වර්ධනය වූ අතර, මෙහෙයුම් ලාභ සීමාව 5.4%ක් එනම්, 2016/17 වර්ෂයේ 41.98% සිට 44.31% දක්වා වැඩි වීමක් වාර්තා කරන ලදී. පෙර වර්ෂයට සාපේක්ෂව ශුද්ධ ලාභය 4.12% කින් එනම් ලං.රු. මිලියන 3,890 දක්වා වැඩි වී ඇත. කෙසේ නමුදු, සමාලෝචනය කරනු ලබන වර්ෂය තුල ප්‍රධාන වශයෙන් විනිමය ලාභයන් අඩු ප්‍රමාණ වීමේ ප්‍රතිඵලයක් ලෙස ශුද්ධ ලාභ සීමාව 51.78% සිට 45.25% දක්වා අඩු වී ඇත.

ශ්‍රී ලංකන් කේටරින්, පෙර වර්ෂයේ වාර්තා වූ, කොටසකට ආදායම ලං.රු. 3.97 ට සාපේක්ෂව, මෙම වර්ෂයේ දී, කොටසකට ආදායම ලං.රු. 4.14 ලෙස වාර්තා කරන ලදී. වර්ෂය තුළ, නිකුත් කරන ලද කොටස් ගණනෙහි වෙනසක් සිදු නොවීය. එබැවින්,කොටසක ආදායමෙහි වැඩි වීම වන 4.12%ක ප්‍රමාණය, වාර්තා කරන ලද, මූලධන (equity) කොටස් කරුවන් වෙත ලබා දිය හැකි ආරෝපිත ශුද්ධ ලාභයෙහි වැඩි වීමට සමාන වේ.

## ප්‍රධාන වර්ධනයන්

සමාලෝචනය කරනු ලබන වර්ෂය තුල, ශ්‍රී ලංකන් කේටරින්, නව පුළුල්කරණ ව්‍යාපෘති රාශිකයක දළ වශයෙන්, ලං.රු. මිලියන 284ක් ආයෝජනය කර ඇත. මෙයට, ICAO ආරක්ෂණ ප්‍රමිතීන්ගේ අවශ්‍යතාවය සපුරාලන ආරක්ෂක ව්‍යාපෘතිය වැඩි දියුණු කිරීම ඇතුලත් වේ; පළමු පියවර සම්පූර්ණයෙන්ම අවසන් වී ඇති අතර, සමාලෝචනය කරනු ලබන වර්ෂය තුල, 2වන පියවරෙහි 95%ක් අවසන් විය. ශ්‍රී ලංකන් කේටරින්, වැඩිවන ඉල්ලුම සපුරාලීම සඳහා, බීඅයිඒ ගුවන්තොටුපොලේ ආපන ශාලාවෙහි ධාරිතාවය වැඩි කරමින් නවීකරණය කිරීමේ කාර්යයෙහි ආයෝජනය කර ඇත. සමාලෝචනය කරනු ලබන මූල්‍ය වර්ෂය අවසානයේ දී, ප්‍රතිසංස්කරණ කටයුතු වලින් 90%ක් අවසන් විය. මීට අමතරව පුහුණු ව්‍යාපෘතියක් සහ උපකොන්ත්‍රාත් කාර්ය මණ්ඩලය සඳහා සුහසාධන පහසුකම් මධ්‍යස්ථානයක් ගොඩනැඟීමට සඳහා ශ්‍රී ලංකන් කේටරින් විසින් ආයෝජනය කරන ලදී. සමාගම සෙරන්දිවා මාර්ගස්ථ හෝටලයේ, කාමර ගණන වැඩි කිරීමෙන් පවතින ධාරිතාවය පුළුල් කිරීම සඳහා ආයෝජනයක් ද සිදු කරන ලදී. මෙම ආයෝජනයෙන් මාර්ගස්ථ හෝටලයේ ආදායම වැඩි කිරීම අපේක්ෂා කෙරේ.

# සහායක සේවා

## තොරතුරු තාක්ෂණය

### *ශ්‍රී ලංකන් තොරතුරු තාක්ෂණ පද්ධති*

'ශ්‍රී ලංකන් තොරතුරු තාක්ෂණ පද්ධති' ලෙස සන්නාමලත්, ශ්‍රී ලංකන් තොරතුරු තාක්ෂණය,නවීන තොරතුරු සන්නිවේදන තාක්ෂණ ගුවන් සේවයේ කොඳු නාරටිය සහ ශ්‍රී ලංකන් සමූහය පුරා දිවෙන ඩිජිටල් මූලාරම්භයන් සමඟින්, ගුවන්සේවා ව්‍යාපාරයේ හා මෙහෙයුම් වල ඩිජිටල් පරිණාමය සඳහා පහසුකම් සැලසීම සිදු කරයි.

මගීන්ට විශ්වාසනීය සහ විනෝදජනක ගමන් අත්දැකීමක් ලබා දීම සම්බන්ධ, ගුවන් සේවයේ මූලෝපායික ප්‍රමුඛතාවයන්ට මඟ සලසමින් ශ්‍රී ලංකන් තොරතුරු තාක්ෂණ පද්ධතීන් 2017/18 වර්ෂය තුල නව පාරිභෝගයා කේන්ද්‍රික ඩිජිටල් පහසුකම් හඳුන්වා දීම සහ ඊ-ව්‍යාපාරික නිෂ්පාදන ප්‍රතිස්ථාපනය කිරීම සිදු කරන ලදී. මෙයට ප්‍රධාන වශයෙන්, ආයතනික වෙබ් අඩවිය, මාර්ගගත විකුණුම් මාර්ග, FlySmile වෙබ් අඩවිය, ගුවන් සේවයේ නිරන්තර පියාසර වැඩසටහන්, ජංගම දුරකථන යෙදවුම් වැඩිදියුණු කිරීම, ශ්‍රී ලංකන්හි නිවාඩු අංශය වන ශ්‍රී ලංකන් හොල්ඩේස් සඳහා ඊ-වවුචර පහසුකම ලබා දීම සහ ගුවන් සේවයේ මගී සේවා පද්ධතිය තුලින් නව අනුබද්ධිත සේවා රාශියක් සහිත ෂොපිං බාස්කට් පහසුකම සක්‍රීය කිරීම වැනි පහසුකම් ස්ථාපනය කිරීම ඇතුලත් වේ.

### *නව FlySmile වෙබ් අඩවිය*

නිරන්තර පියාසර කරන්නන්ගේ මාර්ගගත අත්දැකීම වැඩිදියුණු කිරීම සඳහා නව පෙනුමකින් හා වැඩි ක්‍රියාකාරීත්වයකින් යුත් FlySmile වෙබ් අඩවිය ශ්‍රී ලංකන් තොරතුරු තාක්ෂණය මඟින් නවීකරණය කරන ලදී. ප්‍රතිස්ථාපනය කරන ලද වෙබ් අඩවිය සියලුම ශ්‍රී ලංකන් ආයතනික වෙබ් අඩවි තුල පවතින අනුරූපතාවය පවත්වා ගනිමින් සරල පරිශීලක කේන්ද්‍රික විශේෂාංග සහිතව, පාරිභෝගික තෘප්තිය වැඩි දියුණු කිරීමත්, ගුවන් සේවා නියාමනයේ අවශ්‍ය අනුකූලතාවයන් සහ ප්‍රමිතීන් සපුරාලීමත් විදහා දක්වා ඇත. අපේක්ෂිත කාල රාමුවක් තුල, FlySmile සාමාජියකන් සඳහා ප්‍රවර්ධනයන් පිරිනැමීම සඳහා ද මෙම නවීකරණය තුලින් පහසුකම් සැලසී ඇත.වෙබ් අඩවියේ පරිශීලක අතුරුමුහුණත සහ පරිශීලක අත්දැකීම් යන අංශයන් මත සිදු වූ සැලකිය යුතු වැඩිදියුණු කිරීම් මෙම වෙබ් අඩවියෙහි අන්තර්ගත විය. නව වෙබ් අඩවිය, ජංගම තාක්ෂණය තුලින්, පාරිභෝගිකයාට ලඟාවීමේ හැකියා වැඩිදියුණු කරන ලද අලුත් සහ සරල කරන ලද පරිශීලක ලියාපදිංචි පිටුව මඟින් පාරිභෝගිකයන්ට පහසුකම් සපයන වහා ප්‍රතිචාර දක්වන වෙබ් අතුරු මුහුණතක් සහිත ජංගම දුරකථන හිතකාමී වෙබ් අඩවියකි.

### *ඩිජිටල්කරණය/වැඩිදියුණු කරන ලද කාර්යක්ෂමතාවය*

ගුවන් සේවයේ ක්‍රියාවලි කාර්යක්ෂමතාවයන් වැඩිදියුණු කිරීම පිළිබඳව සොයා බලමින් ශ්‍රී ලංකන් තොරතුරු තාක්ෂණය, ගුවන් සේවයේ අභ්‍යන්තර සහ බාහිර පාර්ශවකරුවන් සඳහා ඩිජිටල්කරණ විසඳුම් ක්‍රියාත්මක කරන ලදී. පෙර වර්ෂයේ ආරම්භ කරන ලද, යානාස්ථ තීරු බදු රහිත පද්ධතිය, කඩදාසිමත -පදනම් වූ ක්‍රියාවලිය ඉවත් කර මාර්ගගත, තථ්‍ය-කාල ගෙවීමේ හැකියාව සහිත යානාස්ථ සිල්ලර මිලදී ගැනීමේ පසුබිමක් ලෙස ඩිජිටල්කරණය කිරීම ක්‍රියාත්මක කර ඇත.

## කළමනාකරණ සාකච්ඡාව සහ විශ්ලේෂණය ඉතිරි කොටස.

ඒ හා සමානව ගෝලීය ඇමතුම් මධ්‍යස්ථානයෙහි අන්තර් ක්‍රියාකාරී හඬ ප්‍රතිචාර සංකලනය (IVR) පද්ධතිය තුලින්, වැඩිදියුණු කරන ලද කාර්ය කාර්යක්ෂමතාවයක් සහිතව ක්‍රියාවලිය ස්වයංක්‍රීයකරණය වීම ප්‍රතිඵලයක් වී ඇත. වැඩිදියුණු කරන ලද කාර්යක්ෂමතාවයක් සහ ඩිජිටල් පාරිභෝගික අත්දැකීමක් ලබා දෙනු ලබන සාමාන්‍ය වවුචරය වෙනුවට ඊ-වවුචරයක් භාවිතා කිරීමේ වරප්‍රසාදය ශ්‍රී ලංකන් හොලිඩේස් පාරිභෝගිකයන්ට ලැබී ඇත. තවද, ඉලෙක්ට්‍රොනික විවිධ ලේඛන (EMD) සංසන්දනය කිරීමේ ක්‍රියාවලිය ස්වයංක්‍රීයකරණය කිරීම මඟින් තවත් අවසන් ඵලයක් ලෙස ඉහළ ගිය පාරිභෝගික තෘප්තියක් සහතික කිරීම මඟින් විවිධ දෙපාර්තමේන්තු තුල කාර්ය කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීමේ ප්‍රතිලාභය අත් විය.

### නවෝත්පාදනය/Cloud තාක්ෂණය (Cloud Technology)

උපරිම මාර්ගගත සහභාගීත්වයක් සහ ඉහළ පාරිභෝගික පිවිසුම් හැකියාවක් අත් කර ගැනීම සඳහා, Cloud තාක්ෂණය තුලින් ශ්‍රී ලංකන් තොරතුරු තාක්ෂණය ආයතනය එහි ඊ-ව්‍යාපාරික නිෂ්පාදන ව්‍යාප්ත කර ඇත. ලොව පුරා විවිධ භූමි ප්‍රදේශයන් වල සිට www.srilankan.com සහ ආශ්‍රිත වෙබ් අඩවි හා වෙබ් පෝටල් වලට පිවිසිය හැකි පරිදි Word Wide Content Delivery Network (CDN) පිහිටුවා ඇත. වැඩි කරන ලද පිවිසීමක් සහිත වැඩිදියුණු වෙබ් ස්වරූපය මහත් පාරිභෝගික තෘප්තියක් අත් කරගෙන ඇත. ජගත් ගුවන් මඟීන්ට මෘදු වෙබ් අත්දැකීමක් සඳහා, කර්මාන්තයේ ප්‍රධානපෙළේ තාක්ෂණික පසුබිමක් මඟින් බලාත්මක වූ Cloud පාදක තාක්ෂණය දැන් යෝග්‍ය පරිදි පිහිටුවා ඇත.

### කළමනාකරණ තොරතුරු පද්ධතිය (MIS)

ගුවන්සේවා ව්‍යාපාරික සහ මෙහෙයුම් කටයුතු සඳහා, ශ්‍රී ලංකන් තොරතුරු තාක්ෂණ පද්ධති මඟින් දත්ත-ධාවක, තථ්‍ය-කාල කළමනාකරණ තොරතුරු පද්ධති (MIS) පසුබිමක් සකසා ඇත. මෙහි පුරෝකත්‍ය විශ්ලේෂක සහ තත්ත්ව සමාකරණයන් මඟින් සහාය වන ස්වයං-සේවා ව්‍යාපාරික බුද්ධි තොරතුරු (BI) පසුබිමක් අඩංගු වේ. යන්ත්‍ර අධ්‍යයනය (ML)සහ කෘතීම බුද්ධිය (AI) තාක්ෂණ මඟින් තවදුරටත් වැඩිදියුණු වන ප්‍රධාන තීරණ සහායක පද්ධතියක් ලෙස බොහෝ ව්‍යාපාරික ඒකක තුළ, වර්තමානයේ ගුවන් සේවයේ දැක්ම ප්‍රචලිත වෙමින් පවතී. මෙම පසුබිම ජංගම උපකරණ කට්ටලයක් සහ ව්‍යාපාරයට අවශ්‍ය වන වැදගත් දත්ත කට්ටල නිරූපණය කරනු ලබන මෙහෙයුම් සංඛ්‍යාලේඛන මඟින් ක්‍රියාත්මක වන තථ්‍ය-කාල තොරතුරු ඇතුලත් කිරීම මත පූර්ණ වශයෙන් අන්තර්ගෘහිත වී ඇත. පිරිවැය ඵලදායී MIS විසඳුම් තුලින් වැඩිදුර නවෝත්පාදනය සිදු කිරීම මඟින් ගුවන් සේවය වැඩි ප්‍රතිලාභ අත් කර දීම අපේක්ෂා කරයි.

### ප්‍රමිතීන්, අනුකූලතාවය සහ තොරතුරු තාක්ෂණ පාලනය

ගුවන් ප්‍රවාහන කර්මාන්තයේ අනුකූලතාවය සඳහා වන ගුවන් සේවා තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ ප්‍රමිතීන් පිළිගැනීම සඳහා, ශ්‍රී ලංකන් තොරතුරු තාක්ෂණ පද්ධතීන්, කාලානුරූපව, අවශ්‍ය තොරතුරු තාක්ෂණ නියාමන සහ පාලන වැඩසටහන් අඛණ්ඩව පවත්වාගෙන යනු ලබයි. ව්‍යවසාය සම්පත් සැලසුම් පද්ධතිය (ERP) ස්ථර යාවත්කාලීන කිරීම මඟින් වැඩිදියුණු කර ඇත. AIRMAN A320 පුළුල්කරණ සහ MEL සම්බන්ධ කිරීමේ වැඩසටහන් මේ ආකාරයටම සාර්ථක ලෙස ආරම්භ කරන ලදී.අවශ්‍ය, ගුවන් මඟී සැකසුම් දත්ත ප්‍රමිතීන්, තොරතුරු හුවමාරු කිරීම් සහ ගමනාන්ත සහිත සජීවී දත්ත ඇතුලත් කිරීම් සාර්ථකව පාලනය කර ඇත.මානව සම්පත් සහ තොරතුරු තාක්ෂණ පද්ධතීන් තුල ඇති සේවා නියුක්තික දත්ත ව්‍යුහයන් තථ්‍ය-කාලීනවයාවත්කාලීන කිරීමට පහසුකම් සැලසීම සඳහා සමාගමේ නාමාවලි සේවා බලාත්මක කිරීම සඳහා වන, අනන්‍යතා කළමනාකරණ වැඩසටහන් හඳුන්වා දී ඇත. තොරතුරු තාක්ෂණ සේවා තුල ඉහළ ආරක්ෂාවක් පවත්වා ගැනීම සඳහා, ජාල ආරක්ෂණ අනුකූලතාවය සහ තර්ජන කළමනාකරණ විසඳුම් ක්‍රියාත්මක කරන ලද අතර, ආරක්ෂණ තොරතුරු සහ සිද්ධි කළමනාකරණය (SIEM) විසඳුම්, යොදා ගනු ලැබිණි. 2017/18 මූල්‍ය වර්ෂය තුල, ශ්‍රී ලංකන් සමූහ තොරතුරු තාක්ෂණ අංශය සඳහා, ISO/IEC 27001:2013 තොරතුරු ආරක්ෂණ කළමනාකරණ පද්ධති (ISMS) සහතිකය ශ්‍රී ලංකන් ගුවන් සේවය විසින් දිනාගෙන ඇත. ශ්‍රී ලංකන් තොරතුරු තාක්ෂණ අංශය, සේවා කළමනාකරණ පද්ධති සඳහා ISO/IEC 20000:2011 සහතිකකරණය ද, තත්ත්ව කළමනාකරණ ප්‍රමිතීන් සඳහා ISO 9001:2015 සහතිකකරණය ද දිනාගෙන ඇත.

### ඉහළ භාවිතයක් සහිත ගුවන්සේවා තොරතුරු සන්නිවේදන තාක්ෂණය

24x7 අඛණ්ඩ තොරතුරු සන්නිවේදන තාක්ෂණ සේවාවන් සමඟින්, ශ්‍රී ලංකන් ගුවන් සේවයේ, ව්‍යාපාර සහ මෙහෙයුම් අඛණ්ඩතාවය, ශ්‍රී ලංකන් තොරතුරු තාක්ෂණ පද්ධතීන්වල වැදගත් අරමුනක් වේ. පෙර මූල්‍ය වර්ෂය තුල, ලොව පුරා ගුවන්සේවා මෙහෙයුම් අවාරණය කරමින්, නිරෝගිමත්

තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ සේවයක් සමඟින් අඛණ්ඩ ව්‍යාපාරික කටයුතු තුලින් විශිෂ්ඨ සේවා වාර්තාවක් පවත්වාගෙන යාමට ශ්‍රී ලංකන් ගුවන් සේවය සමත් වී ඇත. අගින් අග (end to end) පද්ධති මෙහෙයුම් මඟින්, ගෝලීය සන්නිවේදන සහ ව්‍යාපාරික පද්ධති ආවරණය සඳහා අවශ්‍ය තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ සේවා, අලුතින් දියත් කරන ලද ඕස්ට්‍රේලියාවේ මෙල්බර්න් ගමනාන්තයෙහි ද පිහිටුවා ඇත. ශ්‍රී ලංකන් සමූහයේ ආයතන සහ කොළඹ ගුවන් තොටුපොලේ සියලුම ගුවන් සේවා මෙහෙයුම් සඳහා, ශ්‍රී ලංකන් තොරතුරු තාක්ෂණය පද්ධති, දවසේ පැය විසිහතර පුරා (24x7) හුවමාරු සේවා සපයයි.

## මානව සම්පත් කළමනාකරණය




ගුවන් සේවා කර්මාන්තය තුල මෙහෙයුම් සිදු කිරීමේ දී සහ අප සතු අභියෝග සලකා බැලීමේ දී, අප, සුවිශේෂතාවය හඳුනාගෙන, ආයතනයට නායකත්වය සැපයීම සඳහා ප්‍රබල කණ්ඩායමක් ගොඩනඟා ගැනීම සහ අපගේ මූලෝපායික ඉලක්කයන් සපුරා ගැනීම, සඳහා ඉහළ පුමුඛතාවයක් ලබා දෙන්නෙමු. මානව සම්පත් කෙරෙහි අපගේ කළමනාකරණ පිවිසුම, මූලෝපායික අංශ හතරක් ආවරණය කරයි. එය මානව සම්පත්කරණය ප්‍රශස්තීකරණය, සේවා නියුක්තිකයන් සමීපව ඇසුරු කිරීම, කුසලතා වර්ධනය සහ නිපුණතාවයන් පෝෂණය, සහ කාර්යසාධනය-පාදක ආයතන සංස්කෘතියක් කරා ගමන් කිරීම වෙයි. මෙම අංශ හතරට අනුරූපව, අප නිවැරදි-සුදුසුකම් සහිත පුද්ගලයන් බඳවා ගැනීම, අපගේ කණ්ඩායමට ඉගෙනීමට සහ ඔවුන්ගේ කුසලතා සංවර්ධනය කර ගැනීමට හැකි සේවා ස්ථානයක් ඇති කිරීම, ඔවුන්ගේ කැපවීමට සහ කාර්යසාධනයට හඳුනාගැනීමක් සහ සම්මාන ලැබීම එහි ප්‍රතිඵලයක් ලෙස, සේවා නියුක්තිකයන්ගේ චිත්ත ධෛර්ය ඉහළ යෑම හා එමඟින් ඉහළ මට්ටමක ඵලදායීතාවයක් (අපගේ මෙහෙයුම් වල ස්වශක්තතාවය සහතික කිරීමටත් මෙහෙයුම් සම්පූර්ණ කිරීමටත් අත්‍යවශ්‍ය වන)අත් කර ගැනීමට හැකිවීම, සඳහා නිසි පුමුඛතාවය ලබා දෙන්නෙමු.

### මානව සම්පත්කරණය

ශ්‍රී ලංකන්හි අපගේ කණ්ඩායම, අපගේ ඉතා වටිනා වත්කම වන අතර, මෙම වත්කම වඩාත් ඵලදායී සහ තෘප්තිමත් ආකාරයට යොදා ගැනීමට අප පූර්ණ වශයෙන් කැපවී, වගකීමෙන් කටයුතු කරන්නෙමු. අප අපගේ කාර්ය මණ්ඩල ව්‍යුහය වැඩිදියුණු කිරීමට අවධානය යොමු කර ඇති අතර, එමඟින්, සියුම්ව සහ කාර්යක්ෂමව මෙහෙයුම් සිදු කිරීම සඳහා මඟ සලසන්නෙමු. මේ සම්බන්ධයෙන් වාර්තා කරනු ලබන වර්ෂය තුල සිදු කරන ලද මූලාරම්භයන් පහත පරිදි වේ:

- ප්‍රතිව්‍යුහගත කිරීමේ කණ්ඩායම්: අප, අපගේ ජ්‍යේෂ්ඨ කළමනාකරුවන් යොදවා, රැකියා භූමිකාවන් නැවත සැකසීමට කටයුතු කිරීම, වැඩ ද්විගුණ වීම වැළැක්වීම සඳහා රැකියා කාර්යයන් ඒකාබද්ධ කිරීම, වැඩි ස්වයංක්‍රීයකරණයක් සඳහා වන තාක්ෂණයෙහි මූලෝපායිකව ආයෝජනය කිරීම සහ අපගේ කාර්ය මණ්ඩලයේ සංඛ්‍යාව ප්‍රශස්තීකරණය කිරීම සඳහා නව සේවා රටා හඳුන්වා දීම සිදු කරන ලදී.
- බඳවා ගැනීමේ ක්‍රියාවලිය ශක්තිමත් කිරීම: අප අපගේ බඳවාගැනීමේ මූලෝපාය පිළිබඳව නැවත සොයා බලා, නිවැරදි-සුදුසුකම් සහිත පුද්ගලයන් ආකර්ෂණය කර ගැනීම සම්බන්ධයෙන්, විශේෂයෙන්ම,රැකියාවන් සොයන්නන්ගේ අපේක්ෂාවන් වෙනස්වීම හා නිවැරදි නිපුණතාවය සහිත පුද්ගලයන් සඳහා ඉහළයන ලද තරඟය සහිත, වඩාත් අභියෝගාත්මක රැකියා වෙළඳපොලක සුවිශේෂී නිපුණතා සහිත පුද්ගලයන් බඳවා ගැනීමට කටයුතු කිරීම. සමාජ මාධ්‍ය තුලින්, සීමිත වෙළඳපොල තුල නිවැරදි නිපුණතාවය සහිත පුද්ගලයන් සොයා ගැනීම සඳහා, සමාජ බඳවාගැනීම් ක්‍රමවේදය වෙත ක්‍රමක්‍රමයෙන් ගමන් කරමින්, මෙම වසරේ දී අප මාර්ගගත රැකියා වෙබ් අඩවියක් දියත් කළෙමු. රැකියා සඳහා සූදානම් නිපුණතා හෙබි තරුණ එකතුවෙන් බඳවාගැනීම තහවුරු කිරීම සඳහා, අප විශ්ව විද්‍යාලවල රැකියා මාර්ගෝපදේශන ඒකක හා එක්වී ජාලයක් ද ගොඩනඟා ගත්තෙමු. අප, විශේෂයෙන්ම, හැකියාවන් සහිත දක්ෂ තරුණයන් ආකර්ෂණය කර ගැනීමේ අරමුණින් සහ අපගේ රැකියා අවශ්‍යතාවන්ට වඩාත් ගැලපෙන අවශ්‍ය කුසලතාවයන් වර්ධනය කර ගැනීමට, ඔවුන්ට අවශ්‍ය වෘත්තීය සුදුසුකම් ලබා ගැනීම සඳහා, සහාය වීමට' උපයන විට ගෙවන්නී යනුවෙන් නව ව්‍යාපෘතියක් හඳුන්වා දුන්නෙමු.

### සේවා නියුක්තිකයන් හා සම්බන්ධ වීම

අනර්ඝ සේවා යෝජකයන් ලෙස අපගේ තත්ත්වය පවත්වාගෙන යාම සඳහා, ආයතනය පුරා සියලු සේවා නියුක්තිකයන්ට සමාන අවස්ථා ලැබෙන අවබෝධාත්මක සේවා ස්ථානයක් නිර්මාණය කිරීමේ අපගේ පරිශ්‍රමය අප අඛණ්ඩව පවත්වාගෙන යන්නෙමු.අප ඔවුන් හා සමීපව සම්බන්ධ වී, ඔවුන්ගේ කාර්යන් බැඳීමෙන් හා කැපවීමෙන් සිදු කිරීම සම්බන්ධයෙන්දිරිමත් කිරීමත්, එසේම, මෙහෙයුම් කාර්ය සාධනය ඌනපූර්ණය කරමින් සහ ආයතනික මූලෝපාය ක්‍රියාත්මක කිරීමේ අපගේ වෑයමට සහාය දැක්වීමට, ඔවුන් දිරිමත් කරන්නෙමු. සමාලෝචනය කරනු ලබන වර්ෂය තුල, සේවා නියුක්තිකයන් හා සම්බන්ධ වීම සඳහා සිදු කරන ලද ප්‍රධාන ක්‍රියාකාරකම් පහත පරිදි දැක්විය හැකිය:

## කළමනාකරණ සාකච්ඡාව සහ විශ්ලේෂණය ඉතිරි කොටස.

- UL 1st වැඩසටහන: අපගේ ආයතනික ඉලක්කයන් සපුරා ගැනීම සඳහා සේවා නියුක්තිකයන් එකට එක්වී වැඩ කිරීම දිරිමත් කිරීම සඳහා, සහභාගීත්ව තේමාවක් සැකසීම සිදු කරන ලදී. ආත්මාර්ථකාමී චේතනාවෙන් තොරව ශ්‍රී ලංකන් වෙත ප්‍රමුඛස්ථානය දීමට සෑම දෙනාටම ආරධනා කිරීම සහ කණ්ඩායම තම අවධානය යොමු කර ආයතනයේ පොදු යහපත වෙනුවෙන් වැඩ කිරීමට පෙළඹවීම, මෙම වසරේ තේමාවෙන් සිදු කරන ලදී. අපගේ ආයතනික අරමුණු මුදුන්පමුණුවා ගැනීම වෙත ධනාත්මක පියවර තැබීමට, නිර්මාණශීලීත්වය, උනන්දුව, නායකත්වය, කඩිසරකම සහ වගවීම වැනි ශ්‍රී ලංකන් වටිනාකම්, තම සේවා ස්ථානය තුල පෝෂණය කිරීමට අප දිරිමත් කළෙමු.
- UL 1st කණ්ඩායම් අභියෝගය: UL 1st මගින් ඉහත සාකච්ඡා කරන ලද ආකාරයට, මෙම වසරේ සේවා නියුක්තික තේමාව මඟින් ප්‍රවර්ධනය කරනු ලබන වටිනාකම් හා හොඳින් අනුරූප වෙමින්, අපගේ ගුවන් සේවය පුරා සිටින සේවා නියුක්තියන් සඳහා අධ්‍යයන සැසියක් ද සහිතව, ක්‍රිකට් තරගයක් අප සංවිධානය කළෙමු. 'සිතන්න, ඉගෙනගෙන දිනන්න' යන ක්‍රීඩාවේ තේමාව පිළිබඳව සේවා නියුක්තිකයන් දැනුවත් කිරීම සහ එම ඉගෙනගත් දෑ තම සේවා ස්ථානයේ දී යොදා ගැනීමටත්, සේවා ස්ථානයේ දී ඉගනීම ප්‍රචලිත කිරීමටත්, මෙම වැඩසටහන සකසන ලදී. "ක්‍රිකට් යනු ජීවිතය සඳහා අමතර උපමාවකි" යන්න හඳුනාගෙන, සියලු සහභාගීවූවන්ට, බුද්ධිකලම්බනය, උපායශීලීත්වය, කණ්ඩායමක් ලෙස එකට වැඩ කිරීම, පීඩනය යටතේ කටයුතු කිරීම, සහ ඉලක්කයන් ජය ගැනීමට කැපවීම යන ගුණාංග පුහුණු වීම සඳහා හොඳ පුහුණු අවස්ථාවක් වැඩසටහනින් ලබා දෙන ලදී. කණ්ඩායම විසින් පිළිගන්නා ලදුව, මෙම වැඩසටහන, කර්ය මණ්ඩල අන්තර් ක්‍රියාකාරීත්වය ඉහළ නැංවීමට, සේවා නියුක්තිකයන් අතර බැඳීම් ශක්තිමත් කිරීමට. ජීවන කුසලතා වැඩිදියුණු කිරීමට සහ කණ්ඩායම් කේන්ද්‍රික වැඩ පරිසරයක් නිර්මාණය කිරීමට මඟ සලසන ලදී.

### කුසලතා වර්ධනය සහ නිපුණතා පෝෂණය

ගුවන්සේවා කර්මාන්තයේ පසුබිමට අභියෝග කිරීමේ දී, විවිධ කුසලතාවයන් පිළිබඳ විශේෂඥතාවයක් ගොඩනඟා ගැනීම පිළිබඳ අවධානය යොමු කිරීම, මෙහෙයුම් සහ ව්‍යාපාරික අඛණ්ඩත්වයේ ස්වශක්තතාවය සහතික කිරීම තීරණාත්මක වේ. ආයතනය පුරා මානව නිපුණතා වර්ධනය කිරීම සහ සන්නද්ධ කිරීම සඳහා අප දරන පරිශ්‍රමයන් සහ ආයෝජනයන්, මෙමඟින් අවධාරණය කෙරේ. මෙම අන්තය සඳහා, පුළුල් සහ හොඳින්-සැලසුම් කරන ලද කුසලතා පුහුණු අවස්ථා, උපදේශනය, මඟපෙන්වීම සහ රැකියාවෙහි නිරත පුහුණුව වැනි අවස්ථා අප පිරිනමන අතර, එමඟින් තාක්ෂණික මෙන්ම මෘදු කුසලතාවයන් සම්බන්ධයෙන් අත්‍යවශ්‍ය ප්‍රවීණතාවයන් ගොඩනැගීම අපේක්ෂා කරයි

- අනුප්‍රාප්තික සැලසුම්කරණය: අපගේ නිපුණතා කළමනාකරණ වැඩසටහනට, ආයතනයේ සියලුම දෙපාර්තමේන්තු වල ජ්‍යෙෂ්ඨ කළමනාකරණ තනතුරු මෙන්ම, මධ්‍යම කළමනාකරණය සහ විධායක ශ්‍රේණි වල නිලධාරීන් ඇතුලත් වේ. වැදගත් සේවා නියුක්තියන් අහිමි වීමේ බලපෑම අවමකිරීම සහ සිදුවිය හැකි අනපේක්ෂිත ගැටීම් සඳහා ආයතනය සූදානම්ව තැබීම සඳහා අවිනිශ්චිතතා සැලසුමක් සකස් කිරීම පිළිබඳ විශාල අවධාරණයක් යොමු කර ඇත.අපගේ නිපුණතා කළමනාකරණ ප්‍රතිපත්තිය, ආයතනය තුලම ගොඩනැඟුනු නිපුණතා පරිපූර්ණ කර්ය මණ්ඩලය මඟින් කළමනාකරණ ඇබෑර්තු වලින් 80%ක් පිරවීමට අපේක්ෂා කරනු ලබන අතර, එමඟින්, කාලය හා පිරිවැය සැලකිය යුතු ලෙස ඉතිරි කර ගැනීමට හැකි වන අතර, දැනට සේවයේ නියුතු සේවා නියුක්තිකයන්ට වෘත්තීය ප්‍රගතියක් අත් කර ගැනීමට අවස්ථාව ලැබේ.

- රටේ/ප්‍රදේශයේ කළමනාකරුවන්ගේ හැකියා සංචිතය: ජනතාවගේ වැදගත්කම පිළිබඳ පැහැදිලි අවබෝධයක් සහිත සේවායෝජකයෙක් ලෙස, අනාගතයේදී නායකත්වයේ ආවරණය ලබාගැනීමට ඊලඟ පරම්පරාවසංවර්ධනය කිරීම සඳහා අඛණ්ඩව සක්‍රීයව අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමු. රටේ/ප්‍රදේශයේ කළමනාකරුවන්ගේ ඊලග පරම්පරාවේ දක්ෂතාවන්ට මඟපෑදීම සහ සංවර්ධය කිරීමේ අරමුණ ඇතිව, රටේ/ප්‍රදේශයේ කළමනාකරුවන් ලෙස ගුවන් සමාගම නියෝජනය කිරීමට අවශ්‍ය දක්ෂතාව, ප්‍රවීනත්වය, පළපුරුද්ද, නිපුණතාව සහ පෞරුෂ ලක්ෂණ සහිත විභව සේවක කණ්ඩායමක් ලැයිස්තුගත කිරීම මඟින් කළමනාකරුවන්ගේ හැකියා සංචිතය අපි ආරම්භ කළෙමු.

### කාර්යසාධනය පදනම් වැටුප් ගෙවීම සහ සම්මාන

කාර්යසාධනය පදනම් සේවා සංස්කෘතියක් පෝෂණය කිරීමට ගුවන් සේවා මානව සම්පත් උපායමාර්ගය තුළ ඉහළම ප්‍රමුඛතාව ලබාදේ. අපගේ ආයතනය ප්‍රතිඵල අරමුණු කළ සේවා ස්ථානයක් බවට පරිවර්තනය කිරීමට අපි අඛණ්ඩව කටයුතු කරමින් කාර්යසාධනය සඳහා විධිමත්ව සම්මාන ලබාදෙමු. මේනිසා, සමාගම තුළ සාධාරණ කාර්යසාධන තක්සේරු කිරීමක් පවත්වා ගැනීම පිළිබඳ අපි දැඩිව අවධානය යොමු කරන අතර මෙම ක්‍රියාවලිය තුළින් නිශ්චය කළ ප්‍රතිඵල සමඟ වැටුප් ගෙවීම හා සම්මාන ගැලපීම සිදුකරමු.

වාර්තාකරණ වසර තුළ, අපගේ කාර්යසාධන ඇගයීමේ ක්‍රමය වර්ධනය කර පිරිසිදු කිරීමේ උත්සාහයන් අපි අඛණ්ඩව ගනු ලැබුවෙමු. කාර්යසාධන රටාව තුළ එක් එක් අදියර ඉදිරියට ගෙනයාමට අපි කාර්යසාධන සමාලෝචන කමිටු පිහිට වූ අතර, එලදායි ඉලක්ක සැලසුම් කිරීම සහ කාර්යාසාධන කළමනාකරණය පිළිබඳ ආයතනයේ සියලුම කළමනාකරුවන් දැනුවත් කරන ලදී. කාර්යසාධනය සඳහා ගෙවීම් ගැලපීමට කාර්යසාධනය පදනම් ගෙවීමක් අපි ආරම්භ කළ අතර විශේෂිත ජයග්‍රහන සඳහා නිසි පිළිගැනීම ලබාදීම සඳහා අපගේ සම්මාන යෝජනා ක්‍රම සකස් කළෙමු.

**වයස් කණ්ඩායම**



**ස්ත්‍රී පුරුෂභාවය**




**සේවා වසර ගනන**




| තනතුරු | සේවක සංඛ්‍යාව |
|---|---|
| යානාකුටි සේවක පිරිස | 1208 |
| ඉංජිනේරු | 181 |
| විධායක | 525 |
| පියාසැරි සේවක පිරිස | 328 |
| විධායක නොවන | 3996 |
| කළමනාකරුවන් | 257 |
| ජ්‍යේෂ්ඨ කළමනාකරුවන් | 39 |
| තාක්ෂණික ශිල්පීන් | 463 |
| ආධුණිකයින් | 22 |
| මුළු ගණන | 7019 |

## ප්‍රජා සහභාගිත්වය




ශ්‍රී ලංකා ගුවන් සේවාවේ ප්‍රජා වගකීම, විශේෂයෙන් අප සමාජය තුළ වරප්‍රසාද නොලත් ප්‍රජාවන්ට සහය වී ඔවුන් ශක්තිමත් කිරීමේ වැඩසටහනක් සහිත 'ශ්‍රී ලංකන් කෙයාර්ස්' එනම් අපගේ විශේෂිත ආයතනික සමාජීය වගකීම් ඒකකයට පැවරේ. සිදුකරන ලද ව්‍යාපෘතිවලින් අරමුණු කරන්නේ අධ්‍යාපනය, සෞඛ්‍ය සහ ආරක්ෂාව යන ත්‍රිත්ව ක්ෂේත්‍ර ආවරණය කරමින් ළමුන් හා තරුණයින් පිළිබඳ විශේෂ අවධානයක් සහිතව අර්ථවත් සමාජීය බලපෑමක් ඇති කිරීමයි. ළමුන් හා තරුණයින් කෙරෙහි අවධානය යොමුකළ වැඩසටහන් හැර, ආපදා සහන, වැඩිහිටි ආරක්ෂාව සහ වෙනත් පුණ්‍ය කටයුතු ඇතුළු වෙනත් සමාජ සත්කාර වැඩසටහන්වල අපි කටයුතු කරමු.

මෙම වැඩසටහන් ගුවන් සේවා ව්‍යාපාරික හවුල්කරුවන් සහ ස්වේච්ඡා සේවකයින්ගේ සහයෝගිත්වයෙන් සක්‍රීය වැඩසටහන් තුළින් කරගෙන යනු ලැබේ. වාර්තාකරන කාලය තුළ ප්‍රධාන ව්‍යාපෘති හා කටයුතු පහත ඉදිරිපත් කරමු.

## කළමනාකරණ සාකච්ඡාව සහ විශ්ලේෂණය ඉතිරි කොටස.

### අධ්‍යාපනය





ලෝක ළමා දිනය



ජාතියේ සංවර්ධන සැලසුම්වලට අනුව, අපගේ ප්‍රජා වගකීම් න්‍යාය පත්‍රය තුළ අපි අධ්‍යාපනයට ප්‍රමුඛත්වය දී ඇත. අපගේ වැඩසටහන්වලින් ළමුන් හා තරුණයින්ට අධ්‍යාපනය ලබා ගැනීම සඳහා ඉගෙනුම් අවස්ථා ලබාදීමට, ඔවුන්ගේ දක්ෂතා සංවර්ධනය කිරීමට, ජාතික වැදගත්කම පිළිබඳ ප්‍රධාන සහ අදාළ ගැටළු පිළිබඳ දැනුවත්කම ඇති කිරීම, යහපත් පුරුදු ඇති කිරීම සහ වරප්‍රසාද නොලත් පාසල් හා ළමා ආයතන උසස් කරලීම සඳහා සහය සහ මනා පහසුකම් ලබාදීමට උත්සාහ දරයි.

සමාලෝචිත වසර තුළ, පහත සඳහන් ප්‍රධාන ව්‍යාපෘති හා කාර්යයන් මේ සම්බන්ධයෙන් සිදුකරනු ලබ ඇත

### ලෝක ළමා දිනය

ව්‍යාපෘතියේ අරමුණ: *ළමුන්ට අවස්ථාව ලබාදීම සහ ඔවුන්ගේ සමාජීය දක්ෂතා සංවර්ධනය කොට විශ්වාසය ගොඩ නැංවීම.*

'ශ්‍රී ලංකන් කෙයාර්ස්' මඟින් ගොල් ෆේස් හොටෙල් සහ ඊබට් සිල්වා හොලිඩේස් සමඟ සහයෝගීත්වයෙන් 2017 ඔක්තෝබර් 1 දින ලෝක ළමා දිනය සැමරීම සඳහා ළමුන් වෙනුවෙන් විශේෂ වැඩසටහනක් සංවිධානය කරන ලදි. මෙම වැඩසටහනින් කිරිල්ලවල සෙනෙහස දිරි සෙවන ළමා සංවර්ධන මධ්‍යස්ථානය, සෙනරත් ගුණවර්ධන ළමා සංවර්ධන මධ්‍යස්ථානය සහ ගංගොඩවිල ළමා සංවර්ධන මධ්‍යස්ථානයෙන් ළමුන් 62ක් සඳහා පර්යේෂණාත්මක ඉගෙනුම් අවස්ථාවක් පිරිනැමීමට අපේක්ෂා කරන ලදී.

මෙම වැඩසටහනට ගෝල්ෆේස් හොටලයේ උදෑසන ආහාරය, තට්ටු දෙකේ බස් රථයකින් කොළඹ නගරයේ සවාරියක් සහ '330 ගුවන් යානයක් ගවේෂණය කිරීමට සහ ගුවන්යානය තුළ සංග්‍රහ සත්කාර විඳීමට අවස්ථාව ළමුන්ට ලබාදුන් බණ්ඩාරණායක ගුවන් තොටුපල නැරඹීම ඇතුළත් විය. එමෙන්ම එම වැඩසටහනට දිවා ආහාරය, සංගීතය, නැටුම් සහ සියලූම ළමුන්ට ත්‍යාග සමඟ මැජික් සංදර්ශනයක්ද ඇතුළත් විය.

### පොතක් පරිත්‍යාග කිරීම - ළමා අධ්‍යාපනයට සහයවීම

ව්‍යාපෘතියේ අරමුණ: *එස් ඕඑස් ගම්මානය තුළ ළමුන් සඳහා අධ්‍යාපනය ලබාදීම*

පිළියන්දල එස්ඕඑස් ගම්මානයේදී ළමුන්ගේ අධ්‍යාපන අවශ්‍යතාවන්ට සහය වෙමින්, 'ශ්‍රී ලංකන් කෙයාර්ස්' විසින් 2017 දෙසැම්බර් 8 දින පොත් පරිත්‍යාග වැඩසටහනක් සංවිධානය කරන ලදී. ශ්‍රී ලංකන්හි සියලූම දෙපාර්තමේන්තුවල කාර්ය මණ්ඩල සාමාජිකයින් මෙම පුණ්‍ය වැඩසටහන ක්‍රියාත්මක කිරීමට හා ශක්තිමත් කිරීම සඳහා පොත් පරිත්‍යාග කරමින් පොත් එකතු කිරීමටද සහභාගි වූහ. ශ්‍රී ලංකන් කෙයාර්ස් ලෙස කාර්ය මණ්ඩලයේ දිරිමත් ප්‍රතිචාරය තුළින් අභ්‍යාස පොත් 2000කට වැඩිපුර රැස්කර ගැනීමට හැකි වූ අතර, එම පොත් එස්ඕඑස් ළමුන් අතර විධිමත් පරිදි බෙදා දෙන ලදී.

### විලේජ් හාට් බීට් මධ්‍යස්ථානය

ව්‍යාපෘතියේ අරමුණ: *වෘත්තිය පුහුණුව තුළින් තරුණයින් බලගැන්වීම.*

ශ්‍රී ලංකන් කෙයාර්ස් සත්පුරුෂ පදනම සමඟ සහයෝගීත්වයෙන් උතුරු පළාතේ ඔඩ්ඩුසුඩාන් සහ මුලතිව්වල විලේජ් හාට්බීට් මධ්‍යස්ථාන අටක් පිහිටුවීමට නියමිතය. අංග සම්පූර්ණ පහසුකම්වලින් යුත් මෙම මධ්‍යස්ථානවලින් අධ්‍යාපනික නිපුණතා පුහුණු සහ සවිබලගැන්වීමේ වැඩසටහන් තුළින් බිම් මට්ටමේදී ළමුන් හා තරුණයින් සවිබලගැන්වීම කෙරෙහි අවධානය යොමු කරයි.






වෛද්‍ය කඳවුර
දෙහිගහලන්ද මහා
විද්‍යාලය
අම්බලන්තොට



තරුණයින් 600-700ක් අතර ප්‍රමාණයකට වෘත්තීය පුහුණු ලබාදීම සඳහා මෙම මධ්‍යස්ථානයට හැකියාව ඇත. දැනට තරුණ පිරිමින් සහ කාන්තාවන් 400ක් පමණ මෙම මධ්‍යස්ථානයේ ඉගෙන ගනිමින් පුහුණුව ලබමින් සිටිති.

## සෞඛ්‍යාරක්ෂාව

පහත දක්වා ඇති අපගේ සෞඛ්‍යාරක්ෂාව හා බැඳුණු වැඩසටහන්වලින් විශේෂයෙන් අපගේ සමාජය තුළ වරප්‍රසාද නොලත් ළමුන්ගේ කායික හා මානසික යහපැවැත්ම සහතික කිරීමට උත්සාහ දරයි.

## වෛද්‍ය කඳවුර

ව්‍යාපෘතියේ අරමුණ: *වරප්‍රසාද නොලත් පාසලක සිසුන් හා ගුරුවරුන්ගේ යහපැවැත්ම සහතික කිරීම.*

ලෝක ළමා දිනය සමරමින්, 'ශ්‍රී ලංකන් කෙයාර්ස්' විසින් 2017 ඔක්තෝබර් 5 දින අම්බලන්ගොඩ දෙහිගහලන්ද මහා විද්‍යාලයේ දී ළමුන් සඳහා වෛද්‍ය කඳවුරක් සංවිධානය කරන ලදී. වෛද්‍ය කඳවුර විශේෂඥ වෛද්‍යවරුන් තිදෙනෙක්, අක්ෂි වෛද්‍යවරයෙක් සහ හෙදියන් දෙදෙනෙකුගේ සහයෝගයෙන් පවත්වන ලදී. මෙම කඳවුරේදී පාසලේ ගුරුවරුන්ට හා ළමුන්ට නොමිලේ උපදෙස්, වෛද්‍ය උපදෙස් සහ ඖෂධ ලබාදෙන ලදී. මෙම ව්‍යාපෘතිය මත්තල ජාත්‍යන්තර ගුවන් තොටුපළ ශ්‍රී ලංකන් කාර්ය මණ්ඩලයේ සහය ඇතිව ෂැංග්‍රීලා හොටෙල් ඇන්ඩ් රිසෝර්ට්ස් හි සහයෝගයෙන් සංවිධානය කරන ලදී.

## නගරයේ නත්තල්

ව්‍යාපෘතියේ අරමුණ: *පිළිකා නිවාසයේ ළමුන් වෙත නත්තල් සතුට ලබාදීම.*

නත්තල උදාව වෙනුවෙන්,'ශ්‍රී ලංකන් කෙයාර්ස්' විසින් මහරගම ජාතික පිළිකා රෝහලට අනුබද්ධ 'CCC නිවාසයේ ළමුන් 30ක් සහ ඔවුන්ගේ දෙමව්පියන් වෙනුවෙන් සතුට පිරුණු දිනයක් සංවිධානය කරන ලදී. මෙම වැඩසටහනින් නත්තල් සියා සමඟ විනෝදය සඳහා කැලිප්සෝ සංගීතය සහිතව තට්ටු දෙකේ බස් රථයකින් කොළඹ නගරයේ සවාරියක් පිරිනමන ලදී. ඔවුන්ට ගොල් ෆේස් හොටලයෙන් රාත්‍රී ආහාරය පිරිනමන ලද අතර මැජික් ප්‍රදර්ශනයක් පෙන්වන ලදි. සියලූම සහභාගිකයින්ට නත්තල වෙනුවෙන් ඔවුන්ගේ අපේක්ෂාවන් ඉටුකරමින් පුද්ගල ත්‍යාග පිරිනමන ලදී. මෙම උත්සවය ගෝල්ෆේස් හොටෙල් සහ ඊබට් සිල්වා හොලිඩේස් හි සහයෝගයෙන් පවත්වන ලදි.

## ලිටිල් හාට් ව්‍යාපෘතිය

ව්‍යාපෘතියේ අරමුණ: *ලේඩි රිජ්වේ රෝහලේ දරුණු රෝගීන් සඳහා සහයවීමට අරමුදල් රැස් කිරීම.*

වැලන්ටයින් කාලය සමරමින්, 'ශ්‍රී ලංකන් කෙයාර්ස්' විසින් ලේඩි රිජ්වේ රෝහලේ හෘද හා වැදගත් ආරක්ෂාව සඳහා සංකීර්ණයක් පිහිටුවීමේ වැඩසටහනක් වන, ලිටිල් හාට් ව්‍යාපෘතියට සහය ලබාදිම පිණිස කාර්ය මණ්ඩල සාමාජිකයින් අතර අරමුදල් රැස්කිරීමේ වැඩසටහනක් සංවිධානය කරන ලදී. මෙම වැඩසටහනේ තේමාව වූයේ 'ඔබගේ ආදරය සැබැවින්ම සුදුසු හදවතකට ලබාදෙන්නීයන්නයි. ආයතනයේ සියලූම කාර්ය මණ්ඩලය මෙම වැඩසටහනට සහයවීමට ඒකරාශි වූ අතර වැලන්ටයින් දිනයේදී රුපියල් 374,583ක් සාර්ථකව රැස්කරන ලදි.

## කළමනාකරණ සාකච්ඡාව සහ විශ්ලේෂණය ඉතිරි කොටස.

### ළමා ආරක්ෂාව සහ සුරක්ෂිතතාව

ව්‍යාපෘතියේ අරමුණ: *ළමුන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ ළමුන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැලැක්වීම.*

ළමුන්ගේ සුභසාධනය ආරක්ෂාකොට සහතික කිරීම සඳහා කැපවෙමින්, සමාලෝචිත වසර තුළ කොළඹ මෙට්‍රොපොලිටන් හී රොටරි සමාජය සමඟ හවුල් වී 'ශ්‍රී ලංකන් කෙයාර්ස්' විසින් මෙතෙක් පළමු 'ළමා හිතකාමී පොලිස් ස්ථානයී රාගම දී පිහිටුවීම ආරම්භ කරන ලදී. විශේෂ පොලිස් ස්ථානයක් වන මෙය, උවදුරට පත් ළමුන්ට ළමා අපචාර පැමිණිලි සිදු කිරීමට පහසු සහ ආරක්ෂිත ස්ථානයක් වන අතර, මෙහිදී ඔවුන්ගේ මැසිවිලිවලට සහායක් සහ අස්වැසිල්ලක් ලබාගත හැකිය. මෙම නියමු ව්‍යාපෘතිය තුළ ආපදාවන්හී දී ළමුන් හසුරුවන ආකාරය පිළිබඳ පොලිස් නිලධාරීන්ට විස්තීර්ණ පුහුණුව ලබා දේ. නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යංශය හා රාගම පොලිසිය මෙම ව්‍යාපෘතිය දියත් කිරීමට ඔවුන්ගේ සහයෝගය ලබාදුන්හ.

### අනෙකුත් සමාජ සත්කාරක වැඩසටහන්

#### ආපදා සහන

ව්‍යාපෘතියේ අරමුණ: *ගංවතුරින් පීඩාවට පත්වූවන්ට  සහය හා සහන ලබාදීම.*

නිරිත දිග මෝසම් වර්ෂාවේ ගංවතුර නිසා ඇති වූ විනාශයට ප්‍රතිචාර දක්වමින්, 'ශ්‍රී ලංකන් කෙයාර්ස්' විසින් දකුණු හා සබරගමුව පළාත් තුළ ගංවතුරින් පීඩාවට පත්වූවන්ට සහයවීම සඳහා සහය වැඩසටහනක් ආරම්භ කරන ලදී.  ශ්‍රී ලංකන් කණ්ඩායම විසින් රුපියල් මිලියන 14.6ක් වූ වියලි සලාක, ලිනන්, ඖෂධ, සබන්වර්ග, ඇඳුම් සහ වෙනත් අත්‍යවශ්‍ය ද්‍රව්‍ය රැස්කර රත්මලාන ගුවන් හමුදා ගංවතුර සහන පදනම වෙත භාර දෙන ලදී. 'ශ්‍රී ලංකන් කෙයාර්ස්' වෙතින් ද  ගුවන් හමුදා රෝහල වෙත රුපියල් 133,000ක් වටිනා ඖෂධීය අයිතම ලබාදෙන ලදී.

#### අල්සෙයිමර් පා ගමන

ව්‍යාපෘතියේ අරමුණ: *ඩිමෙන්සියා සහ අල්සෙයිමර් රෝගය පිළිබඳ දැනුවත්කම ඇති කිරීම සහ අරමුදල් රැස්කිරීමට සහයවීම.*

ලෝක අල්සෙයිමර් පා ගමන් දිනය සලකුණු කරමින්, ශ්‍රී ලංකන් ගුවන් සේවය 2017 සැප්තැම්බර් 30 දින වාර්ෂික පා ගමන වන" රිමෙන්බර් මී" වෙත සහය ලබාදීම සඳහා ලංකා අල්සෙයිමර් පදනම හා අත්වැල් බැඳ ගත්හ. මෙම උත්සවය තුළින් සංජානන දුෂ්කරතා සහ ඩිමෙන්සියා පිළිබඳ දැනුවත් කිරීම හා එම රෝග සමඟ ජීවත්වන ජනතාවට සහයවීම පිණිස අරමුදල් රැස්කිරීම අරමුණු කරන ලදී.  ශ්‍රී ලංකන් කාර්ය මණ්ඩලයේ විශාල පිරිසක් මෙම පාගමනේ දී  සමාගම නියෝජනය කරන ලදී.

#### 'රැකවරණ ලබාදීමේ දින'

ව්‍යාපෘතියේ අරමුණ: *රැකවරණය  සහ සානුකම්පිතවීම සඳහා ගුවන් යානා කාර්ය මණ්ඩලයට ක්‍රමෝපායික පුහුණුව ලබාදීම.*

'රැකවරණය ලබාදීමේ දින' වැඩසටහන යනු ගුවන්යානය  තුළ වැඩිහිටියන්, ළමුන් සහ විවිධ ආබාධිත පුද්ගලයින් රැකබලා ගන්නා ආකාරය පිළිබඳ ගුවන් යානා කාර්ය මණ්ඩලය පුහුණු කිරීමට සංවිධානය කළ විශේෂ වැඩසටහනකි. මෙම වාර්තාකරණ වසර තුළ, ශ්‍රී ලංකන් කෙයාර්ස් විසින් මොරටුව, ජනාදර වැඩිහිටි නිවාසය, දෙව්සිරි සෙවන වැඩිහිටි නිවාසය, සලානි ළමා නිවාසය සහ සරණ සෙවන ළමා නිවාසය තුළ රැකවරණ ලබාදීමේ දින වැඩසටහන් අටක් සංවිධානය කරන ලදී. මෙම පුහුණු වැඩසටහන්වල කොටසක් ලෙස, ගුවන් යානා කාර්ය මණ්ඩල සාමාජිකයින් නිවාස පිරිසිදු කිරීම සහ වැඩිහිටියන් හා ළමුන් හා මැදිහත්වී විනෝදවත් කිරීමට සහය විය.

## පාරිසරික කළමනාකරණය




ශ්‍රී ලංකන්හි, අපි අපගේ දෛනික මෙහෙයුම්වලදී උපරිම පාරිසරික ව්‍යවහාර එකතු කර ගැනීම සඳහා කැපවී සිටින අතර, අපගේ ගුවන් සේවා පා සටහන අඩුකිරීමට උත්සාහ ගනිමු. 2009 දි ආරම්භ කළ 'මිහිතලයට හිතකාමී ශ්‍රී ලංකාවක් කිරීමේ මෙහෙවර සමඟ, සහ අපගේ පාරිසරික ප්‍රතිපත්තිය තුළ දක්වා ඇති පරිදි, අපගේ සම්පත් අප භාවිතා කරන ආකාරය තුළ කාර්යක්ෂම වීම සඳහා උපරිම විසඳුම් යොදා ගැනීමට, ඝන අපද්‍රව්‍ය කළමනාකරණය කිරීමට, හරිතාගාර වායු විමෝචන පාලනය කිරීමට හා දැඩි පාරිසරික ගැටළු ආමන්ත්‍රණය කිරීම සඳහා හඬක් නැගීමට, ඒ පිළිබඳ දැනුවත් කිරීමට සහ වැඩසටහන් පතුරුවා හැරීමට අපි කැපවී සිටින අතර, ඒ තුළින් ගෝලීය අනතුරු හැඟවීමට හා කාලගුණික වෙනස අවම කිරීමට අපගේ පාර්ශ්වයෙන් කටයුතු කිරීමට අපිට හැකිවේ.

අපගේ පාරිසරික වැඩසටහන්වලට සහයවීම සඳහා විශේෂිත කණ්ඩායමක් එනම් පාරිසරික ක්‍රමෝපායික සහ අනුකූලතා ඒකකයක් අපි ක්‍රියාත්මක කර ඇති අතර, අපි ජාත්‍යන්තර ගුවන් ප්‍රවාහන සංගමය සහ ජෛව විවිධත්ව ශ්‍රී ලංකා ඇතුළුව රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන සමඟ අපි සහයෝගයෙන් කටයුතු කරමු. එමෙන්ම අපි දේශීය මෙන්ම විදේශීය යන දෙඅංශයේම සියලුම අදාළ පාරිසරික නීති හා රෙගුලාසි සපුරාලමින් හා ඒවාට අනුකූල වෙමින් හෘදසාක්ෂියට අනුව කටයුතු කර ඇත.

### බලශක්ති කළමනාකරණය

ගුවන් සේවා කර්මාන්තය තුළ,බලශක්ති කළමනාකරණය මෙහෙයුම් වාතාවරණය මෙන්ම පාරිසරික තිරසාරත්වය සම්බන්ධයෙන් තීරණාත්මක අංගයකි. එමනිසා, අපගේ මෙහෙයුම් තුළ අප භාවිතා කරන බලශක්තිය ඉතා අවම කිරීමේ උත්සාහයන් වෙත අපි අවධානය යොමු කරමු. අපගේ බලශක්ති කළමනාකරණ ක්‍රමෝපාය දෙයාකාර වේ:

#### *1. තාප බලශක්ති කළමනාකරණය*

ගුවන්යානා ඉන්ධන සමඟ භූමි මෙහෙයුම් ඉන්ධන අඩු ප්‍රමාණයකින් සංයෝගකිරීම තුළ, පරිභෝජනය කරන මුළු බලශක්තියෙන් සියයට 99කට ආසන්න ප්‍රමාණයක් තාප බලශක්තියෙන් ලබාගනි. ගුවන්යානා මෙහෙයුම් ගුවන්යානා ඉන්ධන කළමනාකරණ අංශය විසින් ආරම්භ කළ අපගේ ඉන්ධන කළමනාකරණ කමිටුව මනාව ව්‍යුහගත සංරක්ෂණ ක්‍රමෝපායක් අනුගමනය කරන අතර, අභ්‍යන්තරව සකස් කළ සියලූ උපාංග සහිත ඉන්ධන කළමනාකරණ තොරතුරු ක්‍රමයක් භාවිතා කරමින් ප්‍රමාණනය කිරීම සිදු කෙරේ. මෙම ක්‍රමය ඉන්ධන පරිභෝජනය, විමෝචන හා අදාළ අංශ විසින් යොදාගත් සංරක්ෂණ ක්‍රියාමාර්ගවල කාර්යක්ෂමතාව පරීක්ෂාකර ඵලදායී ආකාරයෙන් නියාමනය කරනු ලබයි. 2017 වසරේ අවසන් කොටස තුළ ඉන්ධන පරිභෝජනය අපගේ නවතම ගමනාන්ත වන ඕස්ට්‍රේලියාවේ මෙල්බෝර්න් හඳුන්වාදීම හේතු කොට ගෙන වැඩි වී ඇත. පරිභෝජනය වැඩිවුවද, අපගේ ඉන්ධන කාර්යක්ෂමතාව ගුවන් යානා මෙහෙයුම් අංශය විසින් ක්‍රියාත්මක කළ දැඩි හා අවධානය යොමුකළ ක්‍රමෝපායන් හේතු කොට ගෙන කර්මාන්තයේ සාමාන්‍යය අගයට වඩා ඉහළින් පැවතුණි.

#### *2. විදුලිය කළමනාකරණය*

අපගේ 'මිහිතලයට හිතකාමි ශ්‍රී ලංකාවක්' යන වැඩසටහන යටතේ ප්‍රමුඛතාව දෙමින්, විදුලිය කළමනාකරණය දේපල හා පහසුකම් දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ පවතී. වීදි ලාම්පු සඳහා සූර්ය බලය භාවිතා කිරීම, වැඩකරන ප්‍රදේශවල එල්ඊඩී බල්බ යෙදීම, ටියුබ් බල්බ වෙනුවට සූර්ය බල්බ යෙදීම සහ සේවකයින් දැනුවත් කිරීමේ වැඩසටහන් කරගෙන යාම ඇතුළුව අවධානය යොමුකළ ක්‍රියාමාර්ග විදුලිය භාවිතය අවම කිරීම සඳහා ක්‍රියාවටනංවා ඇත.

ගුවන් යානා ඉන්ධන පරිභෝජනය



## කළමනාකරණ සාකච්ඡාව සහ විශ්ලේෂණය ඉතිරි කොටස.

### ගුවන් යානා ඉන්ධන කාර්යක්ෂමතාව




### විදුලිය පරිභෝජනය




flygreen
save our planet

QAS Quality Assurance Standard
Beyond doubt

QAS කාබන් උදාසීනතාව අත්කරගෙන ඇත

### කාබන් විමෝචන

අපගේ කාබන් පාසටහන අවම කිරීමේ අපගේ උත්සාහයන් හා කැපවීම වෙනුවෙන් අපිව පිළිගැනීමට ලක්ව ඇත. මේ සම්බන්ධයෙන්, අනිකුත් කරුණු අතර, අපගේ විමෝචනවලට සහය පිණිස ආයතනය පුරා කණ්ඩායම් බැඳීම සමඟ දැඩි නියාමන යාන්ත්‍රණයක්, බලශක්ති කාර්යක්ෂම ක්‍රියාමාර්ග සහ ක්‍රියාවලි, මාර්ග ප්‍රශස්ථකරන ක්‍රමෝපායන්, ගුවන්යානාවල සැහැල්ලු ද්‍රව්‍ය භාවිතා කිරීම වැනි ක්‍රියාමාර්ග ක්‍රියාවට නංවා ඇත.

අපගේ ස්වේච්ඡාමය කාබන් අඩුකිරීමේ වැඩසටහන වන, 'ෆලයිග්‍රීන්' තුළින් කාබන් වලින් තොරවීම කරා යාමේ අපගේ උත්සාහයන් තවදුරටත් එකතු කර සම්පූර්ණ කරයි. ජාත්‍යන්තර ගුවන්යානා ප්‍රවාහන සංගමය සමඟ සහයෝගයෙන්, මෙම වැඩසටහන තුළින් පරිසර ව්‍යාපෘතියකට ආයෝජනය කරමින් ඔවුන්ගේ ගමනට අදාළ කාබන් පාසටහන අවම කර ගැනීමට මගීන්ට හා කාර්ය මණ්ඩලයට හැකියාව ඇති කරයි. එමෙන්ම, මෙම වැඩසටහන කාබන් අවම කරගැනීම සඳහා වන ගෝලීය මනා පරිචයන් සමග අනුකූල වන අතර, කරුණු 40ක පිරික්සුම් ලැයිස්තුවක් සමඟ දැඩි හා ස්වාධීන තත්ත්ව සහතික ප්‍රමිති (QAS) විගණනයක් පවත්වමින් තත්ත්ව සහතික ප්‍රමිති මගින් පිළිගෙන ඇත.

අපි ප්‍රමුඛතාව ලබාදීම වැදගත්ය. මේ සම්බන්ධයෙන්, අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ ආර් 3 එනම් අඩුකිරීම, නැවත භාවිතය සහ ප්‍රතිචක්‍රීයකරණය යන ව්‍යවහාර අපි භාවිතා කරමු.

අපගේ ඝණ අපද්‍රව්‍ය ආහාර අපද්‍රව්‍ය, කඩදාසි, ලෝහ, ප්ලාස්ටික් සහ ඉලෙක්ට්‍රොනික් අපද්‍රව්‍ය ලෙස නිසි පරිදි වෙන් කිරීමෙන් පසු පමණක් බැහැර කරයි. අපගේ ප්‍රධාන කාර්ය මණ්ඩල ආපන ශාලාවේ ආහාර අපද්‍රව්‍ය බලශක්තිය බවට පරිවර්තනය කිරීම සඳහා ජීව වායු පිරියතක් අප විසින් ක්‍රියාත්මක කර ඇත. කඩදාසි භාවිතය අවම කිරීම සඳහා ප්‍රධාන වශයෙන් විද්‍යුත් ලේඛන හා සන්නිවේදනය මත විශ්වාසය තබමින් අපි ඵලදායි ආකාරයෙන් තාක්ෂණය භාවිතා කරමු. අපි පිළිගත් ප්‍රතිචක්‍රීයකරණ සමාගමක් හරහා කඩදාසි සහ ප්ලාස්ටික් අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීය කරමු. පිළිගත් ප්‍රතිමාන අනුගමනය කරමින් සහතික ලත් සමාගමක් තුළින් වගකීම්සහගත ආකාරයෙන් ඉලෙක්ට්‍රොනික් අපද්‍රව්‍ය බැහැර කරමු.

### ජල කළමනාකරණය

ගුවන් සේවයේ මූලික ජල අවශ්‍යතාවන්ගෙන් වැඩි කොටසක් අභ්‍යන්තර ජල මූලාශ්‍රවලින් ලබාගනී. මෙම ජලය දිනපතාම පිරිසිදු කරනු ලබන අතර, සුදුසු තත්ත්වය සඳහා කලින් කල පරීක්ෂාවට භාජනය කරනු ලබයි. අපගේ අප ජල ප්‍රතිකාර පිරියත පරිශ්‍රයෙන් මුදාහැරීමට පෙර ප්‍රධාන ගුවන්යානා අංගනය තුළ වැඩපොලවලින් බැහැරවන අපජලය

**කාබන් පාසටහන**




අපගේ කාබන් පාසටහන් ලුහුබැඳ යාමේ ක්‍රමය වන, මැතදී දියත් කළ OASIS මගින් විවිධ ක්‍රමවලින් සාරාංශ තොරතුරු හරහා ආයතනයේ කාබන් පාසටහන නියාමනය කිරීම ක්‍රමවත් කරයි. මෙම ක්‍රමයේ දෙවන අදියර තුළින් ඵලදායි තීරණ ගැනීම සඳහා උපකරණ පුවරු හා කළමනාකරණ වාර්තා තුළින් දත්ත බෙදාහැරීමට නියමිතය. 2017/2018 වාර්තාකරන වසර තුළ, අපගේ විමෝචන කාබන් ඩයොක්සයිඩ් මෙට්‍රික් ටොන් 1.4ක් විය

### අපද්‍රව්‍ය කළමනාකරණය

ගුවන් සේවාවක් ලෙස ඇතිවන සැලකියයුතු අපද්‍රව්‍ය ප්‍රමාණයක් සමඟ, අප සම්පත් භාවිතා කරන ආකාරය සහ අපගේ අපද්‍රව්‍ය අපි කළමනාකරණය කරන ආකාරය කාර්යක්ෂම කිරීම සඳහා

සඳහා පිළියම් යොදයි. මෙම ක්‍රියාවලියෙන් ඉතුරුවන රොන්බොර පිළිගත් ප්‍රතිමාන සහ රෙගුලාසිවලට අනුව පාලිත පරිසරයකට බලයලත් සමාගමක් හරහා බැහැර කෙරේ. නව A 320 ගුවන්යානා අංගනය සහ ආශ්‍රිත වැඩපොල සඳහා අපගේ දෙවන අපජල ප්‍රතිකාර පිරියත පිහිටුවීම සඳහා සැලසුම් සකස් කරමින් සිටී.

### පාරිසරිකමය වැඩසටහන්

'මිහිතලයට හිතකාමී ශ්‍රී ලංකාවක් වීමේ අපගේ මෙහෙවර අනුව යමින්, අපගේ කාර්ය මණ්ඩලය, පාසල් ළමුන් හා අවසානයේ දී සමාජය ද දැනුවත් කර සහභාගිකරවමින් අපගේ දැනුම නැංවීමේ වැඩසටහන් සහ හරිත වැඩසටහන් තුළින් අපි හරිත සමාජීය වගකීමට පක්ෂපාති වෙමු. මේ සම්බන්ධයෙන් ප්‍රධාන වැඩසටහන් පහත පරිදි වේ:

## කළමනාකරණ සාකච්ඡාව සහ විශ්ලේෂණය ඉතිරි කොටස.



Earth Hour (අර්ත් අවර්)
'කදුරු' වගා කිරීමේ ව්‍යාපාරය



පාසැල් හරිත සමාජය

### බ්ලූප්‍රින්ට් ව්‍යාපෘතිය

ශ්‍රී ලංකා ගුවන් සමාගම බ්ලූප්‍රින්ට් ව්‍යාපෘතිය පිළිබඳ ප්‍රමුඛ නාවික සත්ත්ව සංරක්ෂණ පුණ්‍යායතනයක් වන, එක්සත් රාජධානියේ තල්මස් හා ඩොල්පින් සංරක්ෂණය සමඟ සහයෝගයෙන් කටයුතු කරයි. මෙම වැඩසටහනට වගකීම් සහගතව තල්මසුන් නැරඹීම සහ විශේෂයෙන් වෙරළබඩ ප්‍රජාව අරමුණු කරමින් ආරක්ෂිත බෝට්ටු මෙහෙයුම් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදි

### පාසල් හරිත සමාජය

පාසල් ළමුන් අතර පාරිසරිකමය වගකීමේ වැදගත්කම පිළිබඳ දැනුවත් කරමින්, අපගේ පරිසර ඒකකය සමාජ සත්කාර ඒකකය වන, 'ශ්‍රී ලංකන් කෙයාර්ස් විසින් ආඬි අම්බලම මහ විද්‍යාලයේදී 'පාසල් හරිත සමාජයකී පිහිටුවීම ආරම්භ කරන ලදි. මෙම සමාජය පිහිටුවීම ලෝක පරිසර දිනයට සමාගාමීව සිදුවිය.

සමාජයේ සාමාජිකත්වය 50ට ලඟාවීමත් සමඟ,ශ්‍රී ලංකා ගුවන් සමාගම පරිසරය සුරැකීමේ වැදගත්කම, හරිත ව්‍යවහාර සහ නවීනතම වැඩසටහන් පිළිබඳ ළමුන් දැනුවත් කරන ලදි. මෙම සමාජය ඔවුන් ජීවත්වන පරිසරය ආරක්ෂා කිරීම සඳහා ඉගෙන ගැනීමට හා ඔවුන්ගේ අදහස් හුවමාරු කර ගැනීමට ළමුන්ට අවස්ථාව සලසයි. ශ්‍රී ලංකන් කණ්ඩායම සමාජයට සහය ලබාදෙන අතර, අවසාන වශයෙන් ප්‍රජාවට හා පාසලට මැනිය හැකි ප්‍රතිලාභ ලබාදෙන දිගුකාලීන හරිත ව්‍යාපෘති සඳහා කාර්ය සැලසුම් හා ඒවා ක්‍රියාත්මක කිරීඹට ළමුන් වෙත මාර්ගෙ ්පදේශ සලසා දෙයි. මේ සම්බන්ධයෙන්, ශ්‍රී ලංකන් කණ්ඩායම කඩදාසි ප්‍රතිචක්‍රීකරණය පිළිබඳ දැනුවත් කිරීමට සාමාජිකයින්ට සහය වූ අතර, නවතම කඩදාසි නිෂ්පාදන සමාගමක් වන, හොරණ නිත්‍යා ජේපර්ස් ඇන්ඩ් බෝඩ් පුද්ගලික සමාගම නැරඹීමට චාරිකාවක් ද සංවිධානය කරන ලදි.

### වනජීවී සඟරාව

වනජීවී සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කරමින්, ශ්‍රී ලංකන් විසින් වනජීවී දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශයට පත්කළ වනජීවී සඟරාවේ ඩිජිටල් පිටපතක් ගුවන්යානාවේ ප්‍රදර්ශනයට ඇතුළත් කරන ලදී. මේ තුළින් මෙරට වනජීවී සහ අන්තරායකාරී සහ ඒක දේශීය ජීවීන් හා වෘක්ෂලතාදිය පිළිබඳ දේශීය මෙන්ම විදේශීය මඟින් දැනුවත් කිරීමට හැකිවිය.

### අර්ත්අවර්

ලෝක වනජීවී අරමුදල (WWF) විසින් ආරම්භ කළ අර්ත්අවර් යනු කාලගුණ වෙනස්වීම පිළිබඳ ලෝකය පිළිගත් වැඩසටහනකි. මෙම දිනය සමරමින් සහ තවදුරටත් ඉදිරියට යමින්, පරිසර ඒකකය විසින් කාර්ය මණ්ඩලයේ සහභාගිත්වයෙන් රුක් රෝපන වැඩසටහනක් ආරම්භ කරන ලදී. මෙම වැඩසටහන යටතේ, අපි කදුරු ශාඛ 300ක් රෝපනය කළ අතර, ඒවා මාස දෙකක කාලසීමාවක් අපගේ කාර්ය මණ්ඩලය විසින් පෝෂණය කරනු ලැබේ. ඉහළ උද්යෝගයක් ඇතිව, කාර්ය මණ්ඩලයේ ස්වේච්ඡා සේවකයින් 15ක් දේශීය වෙරළ සංරක්ෂණ අධිකාරියේ නිලධාරීන්ගේ සහය ඇතිව මීගමුව කලපුව අසල ශාඛ රෝපනය සිදුකරන ලදී.

### වනජීවීන් සඳහා එකමුතුව

වනජීවීන් නීතිවිරෝධී ලෙස අලෙවිකිරීමට විරුද්ධව සහයෝගය පළකරමින්, ශ්‍රී ලංකන් පසුගිය වසර තුළ වනජීවී ව්‍යාපාරයක් වන වනජීවීන් සඳහා එකමුතුව හා හවුල් විය. එක්සත් රාජධානියේ රාජකීය පදනම් විසින් පෙරමුණු ගනිමින්, වනජීවීන් ආරක්ෂක සංවිධාන සමඟ ශ්‍රී ලංකන් විසින් මෙම වැඩසටහන යටතේ බකින්හැම් මාලිගා ප්‍රකාශනය තුළ දක්වා ඇති බැඳීම් එකොළහ අනුව තවදුරටත් කටයුතු කරයි.

### අනුකූලතාවය

පාරිසරික වගකීමට ලබාදෙන ලද ප්‍රමුඛතාව සමඟ, මධ්‍යම පරිසර අධිකාරිය විසින් නියම කරන ලද නීති, රීති හා රෙගුලාසිවලට සහ පාරිසරික විෂය සඳහා ගුවන්ගමන් සහතික කිරීමේ ප්‍රමිතිවලට අපි අනුකූල වෙමු. ශ්‍රී ලංකන් ගුවන් සමාගම සමාලෝචිත වසර තුළ අනුකූල නොවීම නිසා කිසිදු දඩයකට යටත් කර නොමැත.

# මූල්‍ය ප්‍රකාශ


| | |
|---|---|
| අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව | 45 |
| අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේ වාර්තාව | 50 |
| අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් පිළිබඳ ප්‍රකාශය | 51 |
| ස්වාධීන විගණකවරුන්ගේ වාර්තාව | 52 |
| මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය | 54 |
| ලාභ හෝ අලාභ ප්‍රකාශනය | 55 |
| විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය | 56 |
| ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය | 57 |
| මුදල් ප්‍රවාහ ප්‍රකාශනය | 58 |
| මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් | 59 |

# අධ්‍යක්‍ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව

සීමාසහිත ශ්‍රී ලංකන් එයාර්ලයින්ස් සමාගමෙහි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2018 මාර්තු 31 වැනි දිනෙන් අවසන් වූ වසර සඳහා වන වාර්ෂික වාර්තාව මෙසේ ඉදිරිපත් කරනුයේ ඉමහත් සතුටිනි.

### ප්‍රධාන ක්‍රියාකාරකම් සහ ව්‍යාපාරික කටයුතු සමාලෝචනය

සමාගමෙහි ප්‍රධාන ව්‍යාපාරික ක්‍රියාකාරකම් වනුයේ ශ්‍රී ලංකාවේ නිල ගුවන් සේවය වශයෙන් මගීන්, භාණ්ඩ හා තැපැල් ප්‍රවාහනය සඳහා ජාත්‍යන්තර නිල වශයෙන් සංවිධිත/අසංවිධිත ගුවන් සේවා සම්පාදනයයි. සමාගමෙහි සෙසු ප්‍රධාන ක්‍රියාකාරකම් බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපල (“BIA”) සහ මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපල (“MRIA”) වලදී ගුවන් පර්යන්ත සේවාවන් සැපයීම, ගුවන් මගීන් වෙත තීරු බදු රහිත භාණ්ඩ අලෙවි කිරීම, දේශීය හා ජාත්‍යන්තර නිවාඩු ගත කිරීමේ සැලසුම් අලෙවි කිරීම යනාදියෙන් සමන්විත වේ. සමාගමෙහි සහායක කාර්යයන් අතරට තෙවන පාර්ශ්වීය ගුවන් යානා නඩත්තු සේවා සම්පාදනය, ගුවන් යානා මෙහෙයුම් සේවා සැපයීම සහ ගුවන් සේවා ආශ්‍රිත පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම එක් වේ.

මූල්‍ය වර්ෂය තුළදී සමාගමෙහි ක්‍රියාකාරකම් වල කිසිදු කැපීපෙනෙන වෙනසක් සිදු නොවීය.

සමූහය, සීමාසහිත ශ්‍රී ලංකන් එයාර්ලයින්ස් සමාගම සහ එහි පූර්ණ හිමිකාරීත්වය සහිත අනුබද්ධ ආයතනය වන, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපල (“BIA”) සහ මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපල (“MRIA”) ඔස්සේ මෙහෙයුම් සිදුකරන්නා වූ ගුවන් සේවාවන් වෙත යානාස්ථ ආහාරපාන සේවාවන් සැපයීම ප්‍රමුඛ කාර්යභාරය කොටගත් සීමාසහිත ශ්‍රී ලංකන් කේටරින් සමාගම යන ආයතනයන්ගෙන් සමන්විත වේ. සෙසු සහායක සේවාවන් අතරට පොදු සහ මාර්ගස්ථ අවන්හල් මෙහෙයුම් කටයුතු, ලොන්ඩරි සේවාවන් සැපයීම සහ ගුවන් මගී මර්ගස්ථ හෝටලය කළමනාකරණය අයත් වේ.

### මූල්‍යමය ප්‍රකාශන සහ විගණකවරුන්ගේ වාර්තාව

2018 මාර්තු 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන, ප්‍රධාන මූල්‍ය කළමණාකරන නිලධාරීවරයා විසින් නිදි පරිදි අත්සන් තබන ලද මූල්‍යමය ප්‍රකාශනයන් සහ ඒ සඳහා වන විගණකවරුන්ගේ වාර්තාව මෙම වාර්තාවට අමුණා ඇත.

### ගිණුම්කරණ ප්‍රමිතීන්

මූල්‍යමය ප්‍රකාශනයන් සැකසීමේදී අනුගත කරන ලද ගිණුම්කරණ ප්‍රමිතීන් මෙම වාර්තාවේ 59 පිටුව සිට 69 පිටුව දක්වා සඳහන් වේ.

### සමූහයේ පිරිවැටුම

සමූහයේ පිරිවැටුම ශ්‍රී ලංකා රුපියල් මිලියන 164,859 ක් වශයෙන් දැක්විණි. (2016/2017 ෴ ශ්‍රී ලංකා රුපියල් මිලියන 138,591) සමූහ පිරිවැටුම පිළිබඳ විස්තරාත්මක විමර්ශනයක් මූල්‍යමය ප්‍රකාශයන් සඳහා වන සටහන 20 හි දක්වා ඇත.

සමාගම සහ එහි පූර්ණ හිමිකාරීත්වය සහිත අනුබද්ධ ආයතනය වන සීමාසහිත ශ්‍රී ලංකන් කේටරින් සමාගම අතර ගනුදෙනු සාධාරණ වෙළඳපොල මිළ ගණන් අනුව සිදුකරන ලදී.

### ප්‍රතිඵල

සමූහයෙහි වසර සඳහා බදු වලට පසු ශුද්ධ අලාභය රුපියල් මිලියන 18,585 කි (2016/2017 ෴ රුපියල් මිලියන 28,340). සමූහය විසින් රුපියල් මිලියන 06 ක (2016/2017 ෴ රුපියල් මිලියන 25) බදුකරණ වියදමක් දරන ලදී.

වසර සඳහා වන ලාභ අලාභ ප්‍රකාශනය පිටුව 55 හි දක්වා ඇත.

### සමූහයේ ආයෝජන

වසර සඳහා දේපළ පිරියත සහ උපකරණ මත සමූහයේ ප්‍රාග්ධන වියදම් රුපියල් මිලියන 1,676 ක් වශයෙන් දැක්විණි. (2016/2017 ෴ රුපියල් මිලියන 1,094)

### දේපළ පිරියත සහ උපකරණ

වාර්තා කරනු ලබන දින වන විට සමූහයේ දේපළ පිරියත සහ උපකරණ වල ශුද්ධ පොත් අගය රුපියල් මිලියන 10,348 ක් වශයෙන් දැක්විණි. (2016/2017 ෴ රුපියල් මිලියන 9,834) දේපළ පිරියත සහ උපකරණ සහ ඒවායේ සංචලනය සම්බන්ධ විස්තර මූල්‍යමය ප්‍රකාශනයන් සඳහා වන සටහන 4 හි දක්වා ඇත.

### ප්‍රකාශිත ප්‍රාග්ධනය

සමාගමෙහි ප්‍රකාශිත ප්‍රාග්ධනය රුපියල් මිලියන 51,617 ක් වශයෙන් දැක්විණි. (2016/2017 ෴ රුපියල් මිලියන 51,617)

### සංචිත

2018 මාර්තු 31 දින වන විට සමස්ත සමූහ සංචිත රුපියල් මිලියන 177,201 ක් වන සෘණාත්මක අගයක් වශයෙන් දැක්විණි. (2016/17 ෴ රුපියල් මිලියන 159,411 ක සෘණාත්මක අගයකි). මෙය රුපියල් මිලියන 181,821 ක සමුච්චිත අලාභයකින් (2016/17 ෴ රුපියල් මිලියන 163,620) රුපියල් මිලියන 4,620 ක ප්‍රාග්ධන සංචිත (2016/17 ෴ රුපියල් මිලියන 4,209 ) වලින් සමන්විත වේ. මෙම සංචිතයන්හි සංචලනය මූල්‍යමය ප්‍රකාශනයන්හි ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශනයෙහි දැක්වේ.

### ආයතනික ප්‍රදානයන්

සමූහය මගින් වසර තුළදී රුපියල් මිලියන 2.48 ක ප්‍රදානයන් සිදු කරන ලදී. (2016/17 ෴ රුපියල් මිලියන 2.49)

### බදුකරණය

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමග වූ ගිවිසුම ප්‍රකාර සමාගම වෙත 2013 මාර්තු 31 දින දක්වා බදු විරාමයක් හිමි විය. 2006 දේශීය ආදායම් පනත අංක 10 දේශීය අදායම් දෙපාර්තමේන්තුව විසින් සංශෝධනය කරනු ලැබීමෙන් අනතුරුව (සංශෝධිත) 2011 22 පනතෙහි විධිවිධාන අනුව සමාගම 2021 මාර්තු 31 වැනි දින තෙක් සිදුකරනු ලබන සියළුම ව්‍යාපාරික කටයුතු සම්බන්ධයෙන් සියළුම බදු වලින් නිදහස් කෙරිණි. කෙසේවුවද, 2017 අංක 14 දරණ දේශීය ආදායම් පනත ක්‍රියාත්මක වීමත් සමග සමාගම 2018 අප්‍රියෙල් 1 වැනි දින සිට සියළුම ස්වකීය ව්‍යාපාරික කටයුතු සම්බන්ධයෙන් සියළුම ආදායම් බදු ගෙවීමට බැඳී සිටී.

ද්විත්ව බදුකරණ ගිවිසුම් නොපවතින රටවල සිදුකරනු ලබන සිය විදේශගත මෙහෙයුම් සම්බන්ධයෙන් බදු මුදල් ගෙවීමට සමාගම බැඳී සිටී.

# අධ්‍යක්‍ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව ඉතිරි කොටස.

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමග වූ ගිවිසුම ප්‍රකාර අනුබද්ධ ආයතනය වන සීමාසහිත ශ්‍රී ලංකන් කේටරින් සමාගම වෙත 2021 මැයි 30 දින දක්වා බදු විරාමයක් හිමි විය. වර්තමානය වන විට යානාස්ථ මුලුතැන්ගෙවල් වලින්, මාර්ගස්ථ අවන්හල් වලින්, යානාස්ථ ලොන්ඩරි ආයතනය සහ EK පරිශ්‍රය ආශ්‍රිත මෙහෙයුම් මගින් උපයනු ලබන ශුද්ධ ලාභය 2021 මැයි 30 වැනි දින තෙක් සම්පූර්ණයෙන්ම ආදායම් බදු වලින් නිදහස් කොට ඇත. ඉන් අනතුරුව ශුද්ධ ලාභය 2029 මැයි 30 වැනි දින දක්වා තවදුරටත් වසර 8 සඳහා 15% ක සහන බදු අනුපාතයක් වෙනුවෙන් වගකීමෙන් බැඳේ. පොදු අවන්හල, වැනිලා පොඩ් ආහාර වෙළඳසැල්, සෙමොන්ඩු අවන්හල සහ වෙනත් ලොන්ඩරි සේවා හා වෙනත් ආදායම් දැනට පවතින බදු අනුපාතය වන 28% ක ආදායම් බද්දකට යටත් වේ.

### කොටස් පිළිබඳ විස්තර

2018 මාර්තු 31 දින වන විට කොටස් පිළිබඳ විස්තර පහත දැක්වෙන පරිදි වේ ෘ

| කොටස් හිමිකාරීත්වය | කොටස් සංඛ්‍යාව | හිමිකාරීත්ව % |
|---|---|---|
| ශ්‍රී ලංකා රජය | 511,574,169 | 99.11% |
| සේවක අර්ථසාධක අරමුදල | 1,863,676 | 0.36% |
| වෙනත් | 2,736,510 | 0.53% |

### නීතිරීති හා රෙගුලාසි කෙරෙහි අනුකූලතාවය

සමාගම සෑම කල්හිම අදාළ නීතිරීති හා රෙගුලාසි වලට අනුකූලව කටයුතු කරන බවට තහවුරු කොට ඇත. අනුකූලතාවය සම්බන්ධයෙන් වගකිව යුතු කළමනාකරණ නිලධාරීන් විසින් විගණන කමිටුවේ කාර්තුමය රැස්වීම් වලදී අනුකූලතාවය සම්බන්ධ වාර්තාවක් සභාගත කරනු ලබයි.

### සම්බන්ධිත පාර්ශ්වීය ගනුදෙනු

සම්බන්ධිත පාර්ශ්වීය ගනුදෙනු පිළිබඳ විස්තර මූල්‍යමය ප්‍රකාශනයන්හි සටහන 28 හි දක්වා ඇත.

### අනිශ්චිත බැරකම් සහ ප්‍රාග්ධන බැදීම්

2018 මාර්තු 31 වැනි දිනට අනිශ්චිත වගකීම් සහ එම දිනට ප්‍රාග්ධන වියදම් මත දරන ලද වගකීම් මූල්‍යමය ප්‍රකාශනයන්හි සටහන 25 හි දක්වා ඇත.

### වාර්තාකරණ දිනට පසු සිදුවීම්

මූල්‍යමය ප්‍රකාශනයන්හි සටහන 27 හි දක්වා ඇති කරුණු හැරුනු කොට ගැළපීමක් හෝ අනාවරනයක් සිදුකිරීම අවශ්‍ය වන ආකාරයේ කිසිදු තත්ත්වයක් වාර්තාකරණ දින සිට උද්ගතව නැත.

### මානව සම්පත්/සේවා නියුක්ති ප්‍රතිපත්ති

සමාගම මගින් අඛණ්ඩවම මානව සම්පත් සංවර්ධනය සඳහා ආයෝජන සිදුකරමින් සහ නව ව්‍යාපාරික ප්‍රමුඛතාවන්ට සරිලන පරිදි ඵලදායී ශ්‍රම බලකායක් සේවයේ යොදවමින්, ස්වකීය සේවකයින් සමාගමෙහි අනාගත සාර්ථකත්වය සඳහා අවශ්‍ය නිපුණතා සහ දැනුම වර්ධනය කරගනිමින් කටයුතු කරන බවට තහවුරු කරයි.

සමූහයේ සේවා නියුක්ති ප්‍රතිපත්තීන් මගින් පුද්ගලයින් වෙත නිසි ගරුත්වය ලබාදෙමින් ස්ත්‍රී පුරුෂභාවය, ජාතිය හෝ ආගම පිළිබඳව සළකාබැලීමකින් තොරව සියලුදෙනා හට සමාන රැකියා අවස්ථා පිරිනමයි. වෘත්තීයමය සෞඛ්‍ය සහ ආරක්ෂාව පිළිබඳ තත්ව සම්මතයන් කෙරෙහි කැපීපෙනෙන අවධානයක් යොමු කෙරේ.

වසර අවසානයේදී සමාගම මගින් සේවයේ යොදවනු ලැබ ඇති පුද්ගලයින් සංඛ්‍යාව 7,019 ක් (2016/17 ෘ 7,021) සහ පරිපාලිතයෙහි එම සංඛ්‍යාව 1,071 ක් (2016/2017 ෘ 1,022) විය.

### ව්‍යවස්ථාපිත ගෙවීම්

අධ්‍යක්ෂකවරුන් ඔවුන්ගේ උපරිම දැනුම සහ විශ්වාසය අනුව සේවකයින් සහ ශ්‍රී ලංකා රජය සම්බන්ධ සියලුම ව්‍යවස්ථාපිත ගෙවීම් නිසි කලට සිදුකොට ඇති බවට සෑහීමකට පත් වේ.

### පාරිසරික ආරක්ෂණය

සමූහයේ ව්‍යාපාරික කටයුතු මගින් පරිසරය වෙත සෘජු හා වක්‍ර බලපෑම් ඇති කළ හැකි වේ. එහිදී සමූහයේ ප්‍රතිපත්තිය වනුයේ පරිසරය කෙරෙහි ඇති වන අහිතකර බලපෑම් අවම මට්ටමක තබා ගනිමින්, අදාළ අධිකාරීන් හා රෙගුලාසි වෙත සහයෝගය දැක්වීම සහ අනුකූලතාවය ප්‍රවර්ධනය කිරීමයි.

### සාංගමික පාලනය සහ අභ්‍යන්තර පාලනය

මනා පාලන ක්‍රමවේදයන් යොදාගැනීම වර්තමාන ආයතනික ලෝකය තුළ අත්‍යාවශ්‍ය අංගයක් බවට පත්ව තිබේ.

සමූහයේ අභ්‍යන්තර පාලන පද්ධතිය සම්බන්ධව ස්වකීය වගකීම අධ්‍යක්ෂකවරුන් විසින් පිළිගනු ලැබේ. මෙම පද්ධතිය සකසනු ලැබ ඇත්තේ වත්කම් වල සුරක්ෂිතභාවය සම්බන්ධ විශ්වසනීයත්වය, අන්තර් සමෝධානය, නිසි ගිණුම්කරණ වාර්තා පවත්වාගෙන යාම සහ උත්පාදනය කරනු ලබන මූල්‍යමය තොරතුරු වල නිරවද්‍යතාවය තහවුරු කිරීම උදෙසාය. කෙසේවුවද ඕනෑම පද්ධතියක් මගින් පරිපූර්ණ වශයෙන් විශ්වසනීයභාවය තහවුරු නොකෙරෙන අතර, කිසියම් සාධාරණ මට්ටමක නිරවද්‍යතාවය සපයනු ලබන බැවින් දෝෂ සහ අක්‍රමිකතා වළකාලීම හෝ සාධාරණ කාලයක් තුළ හඳුනාගැනීම සිදු කෙරේ. අධ්‍යක්ෂක මණ්ඩල විගණන කමිටු වාර්තාව මගින් මෙම වාර්ෂික වාර්තාවේ කොටසක් නිර්මාණය වේ.

මූල්‍යමය ප්‍රකාශනයන් අත්සන් තබනු ලබන දින දක්වා වන කාලපරිච්ඡේදය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියෙහි බලාත්මකභාවය පිළිබඳව අධ්‍යක්ෂක මණ්ඩලය සෑහීමකට පත් වේ.

### අඛණ්ඩ පැවැත්ම

අධ්‍යක්ෂකවරුන්ගේ වගකීම් ප්‍රකාශනයෙහි දක්වා ඇති පරිදි අධ්‍යක්ෂකවරුන් විසින් මූල්‍යමය ප්‍රකාශනයන් සැකසීමේදී අඛණ්ඩ පැවැත්ම යන පදනම අනුගත කොට ගෙන ඇත.

### අධ්‍යක්ෂක මණ්ඩලය

සමාගමෙහි සාංගමික ලේඛණයන්හි 79 වගන්තිය අනුව සියළුම අධ්‍යක්ෂකවරුන් ශ්‍රී ලංකා රජය විසින් පත් කරනු ලැබේ. වර්ථමාන අධ්‍යක්‍ෂක මණ්ඩලයේ කෙටි හදුන්වාදීම වාර්ෂික වාර්තාව 07 පිටුවේ සිට 10 පිටුව දක්වා ඉදිරිපත් කෙරේ. 2018 දෙසැම්බර් 20 වන දින සිට බලපැවැත්වෙන පරිදි ජී. එස්. විතානගේ මහතා පූර්ණ කාලීන සභාපතිවරයා වන අතර අනෙකුත් අධ්‍යක්ෂකවරුන් විධායක නොවන අධ්‍යක්ෂකවරුන් වේ.

ජී. එස්. විතානගේ මයා (සභාපති) - 2018 නොවැම්බර් 13 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි පත් කරන ලදී.
එයාර් මාර්ෂල් කපිල ජයම්පති - 2018 මාර්තු 29 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි පත් කරන ලදී.
ආචාර්ය රෝෂන් පෙරේරා මිය - 2018 මාර්තු 29 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි පත් කරන ලදී.
සුසන්ත කටුගම්පළ මයා - 2018 මාර්තු 29 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි පත් කරන ලදී.
ජොහාන් විජේසිංහ මයා - 2018 මැයි 8 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි පත් කරන ලදී.
එස්. ජී. සේනාරත්න මයා - 2018 මැයි 21 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි පත් කරන ලදී.
ජ්‍යෙෂ්ඨ මහාචාර්ය අර්ජුන පී ද සිල්වා - 2018 මැයි 21 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි පත් කරන ලදී.
රංජිත් ප්‍රනාන්දු මයා - 2018 මාර්තු 29 වැනි දින පත් කරන ලද අතර 2018 නොවැම්බර් 12 වැනි දින සිට බලපැවැත්වෙන ඉල්ලා අස්වන ලදී.
මනෝප්‍රිය තිත්තවැල්ල මයා - 2018 මාර්තු 29 වැනි දින පත් කරන ලද අතර 2018 ඔක්තෝබර් 30 වැනි දින සිට බලපැවැත්වෙන ඉල්ලා අස්වන ලදී.

### හිටපු අධ්‍යක්ෂකවරුන්

පහත දැක්වෙන අධ්‍යක්ෂකවරුන් විසින් 2017 අප්‍රියෙල් 1 වැනි දින සිට පහත සදහන් දිනයන්හිදී ඉල්ලා අස්වන තෙක් ධූරය හොබවන ලදී.

අජිත් එන්. ඩයස් මයා (සභාපති) - 2018 මාර්තු 29 වැනි දින සිට බලපැවැත්වෙන ඉල්ලා අස්වන ලදී.
ජේ. එම්. එස්. බ්‍රිටෝ මයා - 2018 මාර්තු 31 වැනි දින සිට බලපැවැත්වෙන ඉල්ලා අස්වන ලදී.
ආර්. චානක ඩී. ද සිල්වා මයා - 2018 මාර්තු 30 වැනි දින සිට බලපැවැත්වෙන ඉල්ලා අස්වන ලදී.
මහින්ද පී. හරදාස මයා - 2018 මාර්තු 30 වැනි දින සිට බලපැවැත්වෙන ඉල්ලා අස්වන ලදී.
රඛිත එස්. ජයවර්ධන මයා - 2018 මාර්තු 29 වැනි දින සිට බලපැවැත්වෙන ඉල්ලා අස්වන ලදී.
ලුතිනන් කර්නල් සුනිල් ඩී. පීරිස් - 2017 අගෝස්තු 15 වැනි දින සිට බලපැවැත්වෙන ඉල්ලා අස්වන ලදී.
හරේන්ද්‍ර කේ. බාලපටබැදි මයා - 2018 අප්‍රියෙල් 2 දින සිට බලපැවැත්වෙන පරිදි ඉල්ලා අස්වන ලදී.
එන්. ද සිල්වා දේව ආදිත්‍ය මයා - 2018 මාර්තු 29 වැනි දින සිට බලපැවැත්වෙන ඉල්ලා අස්වන ලදී.

### මානව සම්පත් හා සේවක අර්ථලාභ කමිටුව

සේවක අර්ථලාභ කමිටුවේ මූලික අරමුණ නම්, වේතන ප්‍රතිපත්තියක් සැකසීම උදෙසා නිල හා විනිවිදභාවයෙන් යුතු ක්‍රියාපටිපාටියක් ස්ථාපනය කිරීම සදහා නියමු කාර්යභාරය ඉටු කිරීම සහ වේතන ව්‍යුහයක් ස්ථාපනය කිරීමයි.

වෙළදපොල හා ක්ෂේත්‍ර සාධක සහ සමූහයේ සියලු සමාගම් වල පුද්ගල කාර්යසාධනය මත පදනම්ව වේතන ප්‍රතිපත්තියක් සකසනු ලැබ ඇත.

මානව සම්පත් සහ සේවක අර්ථලාභ කමිටුව සෑම කාර්තුවකදීම රැස්වේ.

අධ්‍යක්ෂක මණ්ඩලයේ පහත සදහන් සාමාජිකයින් සමාගමෙහි මානව සම්පත් සහ සේවක අර්ථලාභ කමිටුව සදහා පත් කොට ඇත.

එයාර් මාර්ෂල් කපිල ජයම්පති (සභාපති)
සුසන්ත කටුගම්පළ මයා
ආචාර්ය රෝෂන් පෙරේරා මිය
ජ්‍යෙෂ්ඨ මහාචාර්ය අර්ජුන ද සිල්වා

පහත දැක්වෙන සාමාජිකයින් 2017 අප්‍රියෙල් 01 සිට ඔවුන්ගේ ඉල්ලා අස්වීමේ දින දක්වා මානව සම්පත් සහ වේතන කමිටුවට ඇතුළත් වූහ.

ලුතිනන් කර්නල් සුනිල් ඩී. පීරිස් (සභාපති) - 2017 අගෝස්තු 15 වැනි දින සිට බලපැවැත්වෙන ඉල්ලා අස්වන ලදී.
ජේ. එම්. එස්. බ්‍රිටෝ මයා - 2018 මාර්තු 31 වැනි දින සිට බලපැවැත්වෙන ඉල්ලා අස්වන ලදී.
ආර්. චානක ඩී. ද සිල්වා මයා - 2018 මාර්තු 30 වැනි දින සිට බලපැවැත්වෙන ඉල්ලා අස්වන ලදී.
මහින්ද පී. හරදාස මයා - 2018 මාර්තු 30 වැනි දින සිට බලපැවැත්වෙන ඉල්ලා අස්වන ලදී.
රඛිත එස්. ජයවර්ධන මයා - 2018 මාර්තු 29 වැනි දින සිට බලපැවැත්වෙන ඉල්ලා අස්වන ලදී.

### විගණන කමිටු සාමාජිකයින්

2018 අප්‍රියෙල් 24 වැනි දින අධ්‍යක්ෂක මණ්ඩල විගණන කමිටුව වෙත නව සාමාජිකයින් පත් කරන ලදී:
මනෝප්‍රිය තිත්තවැල්ල මයා (2018 ඔක්තෝබර් 30 වැනි දින දක්වා විගණන කමිටුවේ සභාපති)
එස්. ජී. සේනාරත්න මයා (2019 ජනවාරි 24 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි සභාපති)
එයාර් මාර්ෂල් කපිල ජයම්පති
ආචාර්ය රෝෂන් පෙරේරා
ජ්‍යෙෂ්ඨ මහාචාර්ය අර්ජුන පී ද සිල්වා - (2019 ජනවාරි 02 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි)
සුසන්ත කටුගම්පළ මයා - (2019 ජනවාරි 24 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි)

## අධ්‍යක්‍ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව ඉතිරි කොටස.

අධ්‍යක්ෂක මහා භාණ්ඩාගාර නියෝජිත එස්. ජී. සේනාරත්න මයා 2018 මැයි 28 වැනි දින අධ්‍යක්ෂක මණ්ඩල විගණන කමිටුවට පත් කරන ලද අතර අධ්‍යක්ෂක මණ්ඩල විගණන කමිටුවේ සභාපති ලෙස 2019 ජනවාරි 24 වන දින තෝරා ගන්නා ලදී.

පහත දැක්වෙන සාමාජිකයින් 2017 අප්‍රියෙල් 01 සිට ඔවුන්ගේ ඉල්ලා අස්වීමේ දින දක්වා විගණන කමිටුවට ඇතුළත් වූහ.

ජේ. එම්. එස්. බ්‍රිටෝ මයා (සභාපති) - 2018 මාර්තු 31 වැනි දින සිට බලපැවැත්වෙන ඉල්ලා අස්වන ලදී.
ආර්. චානක ඩී. ද සිල්වා මයා - 2018 මාර්තු 30 වැනි දින සිට බලපැවැත්වෙන ඉල්ලා අස්වන ලදී.
මහින්ද පී. හරදාස මයා - 2018 මාර්තු 30 වැනි දින සිට බලපැවැත්වෙන ඉල්ලා අස්වන ලදී.
රඹිත එස්. ජයවර්ධන මයා - 2018 මාර්තු 29 වැනි දින සිට බලපැවැත්වෙන ඉල්ලා අස්වන ලදී.
ලුතිනන් කර්නල් සුනිල් ඩී. පීරිස් - 2017 අගෝස්තු 15 වැනි දින සිට බලපැවැත්වෙන ඉල්ලා අස්වන ලදී.

විගණන කමිටු වාර්තාව මෙම වාර්ෂික වාර්තාවේ 50 පිටුවෙහි දැක්වේ.

### රැස්වීම් සඳහා අධ්‍යක්ෂකවරුන්ගේ සහභාගීත්වය

මූල්‍ය වර්ෂය තුළදී අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම් 12 ක් පැවැත්වුනු අතර ඒ සඳහා අධ්‍යක්ෂකවරුන්ගේ පැමණීම පහත දැක්වෙන පරිදි වේ:

| අධ්‍යක්‍ෂවරයා | පැමිණි රැස්වීම් ගණන (12 න්) |
|---|---|
| අජිත් එන්. ඩයස් මයා (සභාපති) | 12 |
| ජේ. එම්. එස්. බ්‍රිටෝ මයා | 12 |
| මහින්ද පී හරදාස මයා | 10 |
| ආර්. සී. ඩී. ද සිල්වා මයා | 09 |
| රඹිත එස්. ජයවර්ධන මයා | 12 |
| ලුතිනන් කර්නල් සුනිල් ඩී. පීරිස් (2017 අගෝස්තු 15 වැනි දින සිට බලපැවැත්වෙන ඉල්ලා අස්වන ලදී) | 02 |
| ජේ. ද සිල්වා දේව ආදිත්‍ය මයා | 07 |
| හරේන්ද්‍ර කේ. බාලපටබැඳි මයා | 12 |

### අධ්‍යක්ෂක මණ්ඩලය - සීමාසහිත ශ්‍රී ලංකන් කේටරින් සමාගම

සීමාසහිත ශ්‍රී ලංකන් කේටරින් සමාගමෙහි වර්තමාන අධ්‍යක්ෂක මණ්ඩලය පහත දැක්වෙන පරිදි වේ :

ජී. එස්. විතානගේ මයා - 2018 නොවැම්බර් 26 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි සභාපතිවරයා වශයෙන් පත් කරන ලදී.
එයාර් මාර්ෂල් කපිල ජයම්පති - 2018 මාර්තු 30 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි.
ආචාර්ය රෝෂන් පෙරේරා මිය - 2018 මාර්තු 30 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි.
සුසන්ත කටුගම්පළ මයා - 2018 මාර්තු 30 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි.
එස්. ජී. සේනාරත්න මයා - 2018 මැයි 30 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි.
ජ්‍යෙෂ්ඨ මහාචාර්ය අර්ජුන පී ද සිල්වා - 2019 ජනවාරි 24 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි පත් කරන ලදී.
ජොහාන් විජේසිංහ මයා - 2018 මැයි 30 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි.
රංජිත් ප්‍රනාන්දු මයා (සභාපති) - 2018 මාර්තු 30 දින සිට බලපැවැත්වෙන පරිදි පත්කරන ලද අතර 2018 නොවැම්බර් 13 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි ඉල්ලා අස්වන ලදී.
මනෝප්‍රිය තිත්තවැල්ල මයා - 2018 මාර්තු 30 දින සිට බලපැවැත්වෙන පරිදි පත්කරන ලද අතර 2018 ඔක්තෝබර් 30 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි ඉල්ලා අස්වන ලදී.

රංජිත් ප්‍රනාන්දු (2018 නොවැම්බර් 13 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි ඉල්ලා අස්වන ලදී), මනෝප්‍රිය තිත්තවැල්ල (2018 ඔක්තෝබර් 30 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි ඉල්ලා අස්වන ලදී), සුසන්ත කටුගම්පොළ, ආචාර්ය රෝෂන් පෙරේරා සහ එයාර් මාර්ෂල් කපිල ජයම්පති යන මහත්ම මහත්මීන් 2018 මාර්තු 30 වැනි දින අධ්‍යක්ෂකවරුන් වශයෙන් සීමාසහිත ශ්‍රී ලංකන් කේටරින් සමාගමෙහි අධ්‍යක්ෂක මණ්ඩලය වෙත පත් කරන ලදී.

2018 මැයි 30 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි ජොහාන් විජේසිංහ සහ එස්. ජී. සේනාරත්න යන මහත්වරුන් සීමාසහිත ශ්‍රී ලංකන් කේටරින් සමාගමෙහි අධ්‍යක්ෂක මණ්ඩලය වෙත පත් කරන ලදී.
ජ්‍යෙෂ්ඨ මහාචාර්ය අර්ජුන පී ද සිල්වා - 2019 ජනවාරි 24 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි ශ්‍රී ලංකන් කේටරින් සමාගමෙහි අධ්‍යක්ෂක මණ්ඩලයට පත් කරන ලදී.

පහත දැක්වෙන අධ්‍යක්ෂකවරුන් 2017 අප්‍රියෙල් 01 සිට පහත දැක්වෙන පරිදි ශ්‍රී ලංකන් කේටරින් සමාගමෙන් ඉල්ලා අස්වීමේ දින දක්වා සිය ධුරයන්හි කටයුතු කළහ.

අජිත් එන්. ඩයස් මයා (සභාපති) - 2018 මාර්තු 29 වැනි දින සිට බලපැවැත්වෙන ඉල්ලා අස්වන ලදී.

ජේ. එම්. එස්. බ්‍රිටෝ මයා - 2018 මාර්තු 31 වැනි දින සිට බලපැවැත්වෙන ඉල්ලා අස්වන ලදී.

ආර් චානක ඩී ද සිල්වා මයා - 2018 මාර්තු 30 වැනි දින සිට බලපැවැත්වෙන ඉල්ලා අස්වන ලදී.

මහින්ද පී. හරදාස මයා - 2018 මාර්තු 30 වැනි දින සිට බලපැවැත්වෙන ඉල්ලා අස්වන ලදී.

රඹිත එස්. ජයවර්ධන මයා - 2018 මාර්තු 29 වැනි දින සිට බලපැවැත්වෙන ඉල්ලා අස්වන ලදී.

ලුතිනන් කර්නල් සුනිල් ඩී. පීරිස් - 2017 අගෝස්තු 15 වැනි දින සිට බලපැවැත්වෙන ඉල්ලා අස්වන ලදී.

හරේන්ද්‍ර කේ. බාලපටබැඳි මයා - 2018 අප්‍රියෙල් 2 දින සිට බලපැවැත්වෙන පරිදි ඉල්ලා අස්වන ලදී.

### අධ්‍යක්ෂකවරුන්ගේ වේතන

2007 අංක 7 දරණ සමාගම් පනතෙහි 168 (1) (f) වගන්තිය ප්‍රකාරව සමාගමෙහි විධායක නොවන අධ්‍යක්ෂකවරුන් වෙත ගෙවන ලද සමුච්චිත වේතන මෙම වාර්තාවේ 92 පිටුවෙහි සටහන 28 යටතේ දැක්වේ.

2018 මාර්තු සහ 2018 මැයි මස පත් කරන ලද අධ්‍යක්ෂකවරුන් සමාගම ලාභ ලබන ආයතනයක තත්ත්වයට පත් වන තෙක් අධ්‍යක්ෂකවරුන්ගේ ගාස්තු පිළිගැනීමෙන් වැළකීමට ස්වේච්ඡාවෙන් තීරණය කොට ඇත.

### අධ්‍යක්ෂකවරුන්ගේ කොටස් හිමිකාරීත්වය

තමන් විසින් දරනු ලබන තනතුරෙහි නිල බලය අනුව ශ්‍රී ලංකා රජය මගින් යෝජනා කරන ලද නාමයෝජක අධ්‍යක්ෂකවරුන් දෙදෙනකු වන ජී එස් විතානගේ මහතා සහ එයාර් මාර්ෂල් කපිල ජයම්පති සමාගමෙහි සාමාන්‍ය කොටස් 3 ක හිමිකාරීත්වය දරති.

### සබඳතා ලේඛනය

2007 අංක 7 දරන සමාගම් පනතේ විධිවිධානය අනුව සමාගම මගින් සබඳතා ලේඛනයක් පවත්වාගෙන යනු ලබයි. සියලුම අධ්‍යක්ෂකවරුන් තමන් වෙනත් සමාගම් වල පවත්වාගෙන යන සබඳතා පිළිබඳව අධ්‍යක්ෂක මණ්ඩලය වෙත අනාවරනය කොට ඇත. 2007 අංක 7 දරන සමාගම් පනතෙහි අංක 191 (1) සහ 192 (2) යන වගන්ති වලට අනුව අදාළ සබඳතා පිළිබදව අධ්‍යක්ෂකවරුන්ගේ සබදතා ලේඛනයෙහි වාර්තා කොට ඇත.

2007 අංක 7 දරන සමාගම් පනත මගින් නියම කොට ඇති පරිදි එම සබඳතා ලේඛනය පරීක්ෂා කිරීම සඳහා ලබා ගත හැක.

### අධ්‍යක්ෂකවරුන්ගේ ගිවිසුම් සබඳතා

සමාගමෙහි ව්‍යාපාරික කටයුතු වලට අදාළ කිසිදු ගිවිසුමක් හෝ යෝජිත ගිවිසුමක් සම්බන්ධයෙන් අධ්‍යක්ෂකවරුන් සෘජු හෝ වක්‍ර සම්බන්ධතා කිසිවක් නොමැත.

### වාර්ෂික මහා සභා රැස්වීම

සමාගමෙහි 40 වැනි වාර්ෂික මහා සභා රැස්වීම ශ්‍රී ලංකාවේ, අංක 30 A මළලසේකර මාවත, කොළඹ 07, වරලත් ගණකාධිකාර ආයතන ශ්‍රවණාගාරයේදී 2019 අප්‍රේල් මස 30 වන දින පෙ ව 10.00 ට පවත්වනු ලැබේ.

මහා සභා රැස්වීම දැනුම්දීම වාර්ෂික වර්තාව 109 පිටුවෙහි දැක්වේ.

### විගණකවරු

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 19 වැනි සංශෝධනයේ 36 වැනි වගන්තිය ප්‍රකාරව සමාගමෙහි විගණකවරුන් වශයෙන් විගණකාධිපතිවරයා මෙයින් පත් කරනු ලැබේ.

විගණකවරුන්ගේ ගාස්තු පිළිබදව මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ සටහන 22 හි දක්වා ඇත සමාගම හෝ එහි අනුබද්ධ ආයතනය සමග (විගණකවරයකු වශයෙන් පවතින සමබන්ධය හැරුනු විට) විගණකවරුන්ගේ කිසිදු සබදතාවයක් නොමැත.

අධ්‍යක්ෂක මණ්ඩලයේ අණ පරිදි,

**ජී. එස්. විතානගේ මයා**
සභාපති

**එස්. ජී. සේනාරත්න**
අධ්‍යක්‍ෂ

**ඩෑල්රීන් තිරුකුමාර්**
*සමාගම් ලේකම්/ආයතනික ලේකම් සේවා ප්‍රධානි*

2019 පෙබරවාරි 28 වන දින
කොළඹ

# අධ්‍යක්‍ෂ මණ්ඩල විගණන කමිටුවේ වාර්තාව

### භූමිකාව හා වගකීම්

ශ්‍රී ලංකන් ගුවන් සමාගමේ අධ්‍යක්‍ෂ මණ්ඩල විගණන කමිටුවේ විෂය පථය හා වගකීම් අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අධ්‍යක්‍ෂ මණ්ඩල විගණන කමිටු ප්‍රඥප්තිය ප්‍රකාරව පාලනය කරයි. අධ්‍යක්‍ෂ මණ්ඩල විගණන කමිටුවේ ප්‍රධාන අරමුණ වනුයේ අභ්‍යන්තර පාලන පද්ධතිය, මූල්‍ය වාර්තාකරණ ක්‍රියාපටිපාටි, අවදානම් කළමණාකරන ක්‍රියාපටිපාටි, පාලන ක්‍රියාපටිපාටි, විගණන ක්‍රියාපටිපාටි, නීති හා රෙගුලාසි සමඟ අනුකූලතාවය නිරීක්‍ෂණය කිරීම සඳහා සමාගමේ ක්‍රියාපටිපාටි සහ පරිචය සංග්‍රහය වැනි ක්ෂේත්‍ර වලට අදාළ වගකීම් ඉෂ්ඨ කිරීමයි.

### අධ්‍යක්‍ෂ මණ්ඩල විගණන කමිටුවේ සංයුතිය

ජේ. එම්.එස්. බ්‍රිටෝ (සභාපති - 2018 මාර්තු 31 දින ඉල්ලා අස්විය), ආර්.සී.ඩී. ද සිල්වා (සාමාජික - 2018 මාර්තු 30 දින ඉල්ලා අස්විය), එම් හරදාස (සාමාජික - 2018 මාර්තු 30 දින ඉල්ලා අස්විය), ආර්. ජයවර්ධන (සාමාජික - 2018 මාර්තු 29 දින ඉල්ලා අස්විය) සහ ලුතිනන් කර්නල් සුනිල් පිරිස් (සාමාජික - 2017 අගෝස්තු 15 දින ඉල්ලා අස්විය) යන මහත්වරුන් 2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය තුළ අධ්‍යක්‍ෂ මණ්ඩල විගණන කමිටුවේ කටයුතු කල අධ්‍යක්‍ෂ මණ්ඩල සාමාජිකයින් වේ. මනෝ තිත්තවැල්ල මහතා (සභාපති), එස් ජී සේනාරත්න මහතා (සාමාජික), ආචාර්ය ආර් පෙරේරා (සාමාජික), සහ එයාර් මාෂල් කපිල ජයම්පති (සාමාජික) යන මහත්වරුන් 2018 අප්‍රේල් 24 වන දින අධ්‍යක්‍ෂ මණ්ඩල විගණන කමිටුවට පත්වූ නව සාමාජිකයින් වේ.

එස්. ජී. සේනාරත්න මහතා අධ්‍යක්‍ෂක මණ්ඩල විගණන කමිටුවේ සභාපති ලෙස 2019 ජනවාරි 24 දින පත්කරන ලදී. ජ්‍යෙෂ්ඨ මහාචාර්ය අර්ජුන ද සිල්වා මහතා (සාමාජික 2019 ජනවාරි 02 දින සිට බලපැවැත්වෙන පරිදි) සහ සුසන්ත කටුගම්පළ මහතා (සාමාජික 2019 ජනවාරි 24 දින සිට බලපැවැත්වෙන පරිදි) අධ්‍යක්‍ෂ මණ්ඩල විගණන කමිටුවේ නව සාමාජිකයින් ලෙස පත්කරන ලදී.

විගණකාධිපති දෙපාර්තමේන්තුවේ විගණන පාලක ඒ ඩී දිල්රුක්ෂි මිය (2017 දෙසැම්බර් 05 වන දින සිට බලපැවැත්වෙන පරිදි) සහ රාජ්‍ය ව්‍යවසාය අංශ අමාත්‍යංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණක කේ ඒ සී ෂමන්ත මහතා (2018 මාර්තු 14 වන දින සිට බලපැවැත්වෙන පරිදි) විගණන කමිටු රැස්වීම් සඳහා ස්වාධීන නිරීක්‍ෂකයින් ලෙස සහභාගී වී ඇත.

### රැස්වීම්

2018 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය තුළ අධ්‍යක්‍ෂ මණ්ඩල විගණන කමිටු රැස්වීම් හතරක් (04) පැවැත්විය. නිශ්චිත කරුණු පිළිබඳව අධ්‍යක්‍ෂ මණ්ඩල විගණන කමිටුවට පැහැදිලි කිරීම සඳහා සමාගමේ කළමනාකරණ සාමාජිකයින් ආරාධනා මත රැස්වීම්වලට සහභාගී විය.

### සමූහ සහතිකවීම් හා උපදේශක සේවා අංශය

ශ්‍රී ලංකන් ගුවන් සමාගමේ සමූහ සහතිකවීම් හා උපදේශක සේවා අංශය විසින් අභ්‍යන්තර විගණනයන් පවත්වන ලබන අතර අධ්‍යක්‍ෂ මණ්ඩල විගණන කමිටුව වෙත සෘජුවම වාර්තා කරයි. ව්‍යාපාර අවදානම් කළමනාකරණය රාමුව ස්ථාපිත කිරීම සඳහා පහසුකම් සැපයීම සහ කිරීමේලා තොරතුරු පද්ධති/ තොරතුරු තාක්ෂණ පාලන ඇතුළුව අභ්‍යන්තර පාලන පද්ධතිවල ප්‍රමාණවත්භාවය, කාර්යක්ෂමතාව හා ඵලදායිතාවය පිලිබඳ ස්වාධීන හා විෂය මූලික තක්සේරුවක් සමූහ සහතිකවීම් හා උපදේශක සේවා අංශය මඟින් සලසා දෙයි.

ව්‍යාපාර අඛණ්ඩතා කළමනාකරණය,පාලනය සහ අනුකූලතා පද්ධති මත කළමණාකරණය වෙත උපදේශක සේවා සැපයීම ද සහතිකවීම් හා උපදේශක සේවා අංශය සිදුකරයි.

### මූල්‍ය වර්ෂය තුල අධ්‍යක්‍ෂ මණ්ඩල විගණන කමිටුවේ ප්‍රධාන ක්‍රියාකාරකම්

- තොරතුරු පද්ධති/තොරතුරු තාක්ෂණ පාලනයන් සහ විගණන නිර්දේශවල තත්ත්වය ස්ථාපිත කිරීම ඇතුළුව අභ්‍යන්තර පාලන පද්ධති මත වාර්ෂික විගණන සැලැස්ම ස්ථාපිත කිරීම සහ ප්‍රධාන විගණන සොයාගැනීම් සමාලෝචනය කිරීම.
- ව්‍යාපාර අවදානම් කළමණාකරණ පද්ධතීන් සහ ව්‍යාපාර අවදානම් වල බලපෑම අවම කරගැනීම සඳහා කළමණාකරනය විසින් අනුගමනය කරන ලද ක්‍රියාපටිපාටිය සමාලෝචනය කිරීම.
- සියලුම අදාළ නීති හා රෙගුලාසි වලට අනුකූලව කටයුතු කර ඇති බවට සැලකිය යුතු සහතික වීමක් ලබාදී ඇති බවට නිශ්චය කිරීම සඳහා සමාගමේ අනුකූලතා රාමුව සමාලෝචනය කිරීම.
- භාණ්ඩ ප්‍රවාහන විකුණුම් සහ අලෙවිකරණය කාර්ය සංග්‍රහය, ශ්‍රී ලංකන් වත්කම් කළමණාකරන කාර්ය සංග්‍රහය, ඉංජිනේරු තුන්වන පාර්ශව නඩත්තු මෙහෙයුම් කාර්ය සංග්‍රහය, ණය කළමණාකරන සංශෝධන, මූල්‍ය සේවා, සාංගමික තොරතුරු ආරක්‍ෂණ කාර්ය සංග්‍රහය සහ සමූහ හැසුරුම් ක්‍රියාපටිපාටි සමාලෝචනය කිරීම සහ ඒවා පිළිබඳව අධ්‍යක්‍ෂ මණ්ඩලයට නිර්දේශයන් සිදුකිරීම.
- ව්‍යාපාර බාධාවීම්/අපදාවන් මත වූ අවදානම් වල බලපෑම් අවම කිරීම සඳහා ව්‍යාපාර අඛණ්ඩතා සැලසුම් ස්ථාපිත කිරීම පිළිබඳව සමාලෝචනය කිරීම.
- බාහිර විගණනයේ ස්වභාවය, විෂයපථය හා ප්‍රවේශය දැනගැනීම සඳහා බාහිර විගණකයින් මුණ ගැසීම, විගණනය කළ මූල්‍ය ප්‍රකාශන සහ කළමණාකරන ලිපිය සමාලෝචනය කිරීම.
- වර්ෂ අවසාන විගණනය කළ මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කර අනුමැතිය සඳහා අධ්‍යක්‍ෂ මණ්ඩලයට නිර්දේශ කිරීම.
- ස්වාධීනත්වය සහ වාර්තා කිරීමේ බැඳීම් සඳහා එහි අධිකාරිත්වය ඇතුළු අභ්‍යන්තර විගණන ශ්‍රිතය සමාලෝචනය කිරීම.

**එස්. ජී. සේනාරත්න**
*සභාපති*
අධ්‍යක්‍ෂ මණ්ඩල විගණන කමිටු

2019 පෙබරවාරි මස 28 වන දින

# අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් පිළිබඳ ප්‍රකාශය

සමාගමේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශනවලට අදාළව අධ්‍යක්ෂවරුන්ගේ වගකීම්, 52 වන පිටුවේ ඇති වාර්තාවේ අන්තර්ගත විගණකවරුන්ගේ වගකීම් වලින් වෙනස් වේ.

2007 අංක 07 දරන සමාගම් පනතේ අවශ්‍යතාවය පරිදි මූල්‍ය වර්ෂය අවසාන දිනට සමාගමේ සහ සමූහයේ කටයුතුවල තත්ත්වය පිළිබඳව හා අදාළ මූල්‍ය වර්ෂය තුළ සමාගමේ සහ සමූහයේ ලාභය හෝ අලාභය පිළිබඳව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් නිරූපනය වන පරිදි එක් එක් මූල්‍ය වර්ෂය වෙනුවෙන් මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂවරුන් විසින් පිළියෙල කළ යුතුය. මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමෙහිදී ගැලපෙන ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරාගැනීම හා ඒවා අනුගත අයුරින් යොදාගැනීම හා සාධාරණ සහ විචක්ෂණශීලි විනිශ්චයන් මත කටයුතු කිරීම සිදුකර ඇති අතර අදාළ වන්නා වූ ගිණුම්කරණ ප්‍රමිතීන් අනුගමනය කර ඇත.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්වලට අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඉදිරිපත් කර ඇති බවට සහ 2007 අංක 07 දරන සමාගම් පනතින් නියමකර ඇති තොරතුරු සම්පාදනය කරන බවට සහතික කිරීම සඳහා සමාගමේ සහ සමූහයේ මූල්‍ය තත්ත්වය සාධාරණ නිරවද්‍යතාවයකින් යුක්තව හෙළිදරව් කිරීමට සමාගම සහ එහි පරිපාලිත සමාගම ප්‍රමාණවත් ගිණුම් වාර්තා තබා ගැනීම සහතික කිරීම අධ්‍යක්ෂවරුන්ගේ වගකීම වේ. සමූහයේ වත්කම් ආරක්ෂා කරගැනීම සඳහා සාධාරණ ක්‍රියාමාර්ග ගැනීමේ වගකීමද ඔවුන් දරන අතර එම තත්ත්වය තුළ වංචා හා අක්‍රමිකතා සිදුවීම හඳුනාගැනීමට හා වැලැක්වීම සඳහා ගැලපෙන අභ්‍යන්තර පාලන ක්‍රම ස්ථාපිත කිරීම වෙනුවෙන් නිසි සැලකිල්ලක් දැක්විය යුතුය.

බැංකු ණය පහසුකම් ලබාගැනීම සඳහා සහන සැලසීමේ ලිපි/රජයේ සහතිකවීම මාර්ගයෙන් ශ්‍රී ලංකා රජය විසින් ලබාදෙන අඛණ්ඩ සහයෝගය සැලකීමෙන් අනතුරුව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමෙහිදී "අඛණ්ඩ පැවැත්ම" පදනම තවදුරටත් යොදාගැනීම අධ්‍යක්ෂවරු තවදුරටත් සිදුකර ඇත. එසේම සමාගමේ මෙහෙයුම් කටයුතු හා මූල්‍ය තත්ත්වය ශක්තිමත් කිරීමේ අරමුණින් සමාගම ප්‍රතිව්‍යුහගතකිරීම සඳහා වූ ශ්‍රී ලංකා රජයේ ප්‍රයත්නය පිළිබඳවද සලකා බලා ඇත. තවදුරටත් මූල්‍ය සටහන් වල 3 වන සටහන යටතේ විස්තර කර ඇති පරිදි යෝජිත ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය සම්පූර්ණ කරන තෙක් "අඛණ්ඩ පැවැත්ම" පදනම යටතේ මෙහෙයුම් කටයුතු අඛණ්ඩව සිදුකිරීමට අවශ්‍ය මූල්‍ය අනුග්‍රහය තවදුරටත් ශ්‍රී ලංකා රජය විසින් සපයනු ලබන බවට 2019 පෙබරවාරි 05 දිනැති කැබිනට් මණ්ඩල අනුමැතියක් හරහා ශ්‍රී ලංකා රජය විසින් තහවුරු කර ඇත.

මූල්‍ය ප්‍රකාශ පිළිබඳ ඔවුන්ගේ මතය ගොඩනගා ගැනීමට සුදුසු වේ යැයි සලකනු ලබන මොන යම් හෝ පරීක්ෂාවක් සිදුකිරීමට විගණකවරුන්ට සෑම අවස්ථාවක්ම සලසා බවට සහතික වීම සඳහා අධ්‍යක්ෂවරුන් විසින් අවශ්‍ය පියවර ගෙන තිබේ.

ගිණුම් වාර්තා කරනු ලබන දිනට සමාගමට සහ එහි පරිපාලිත සමාගමට අදාළ සියලු බදු, අයකිරීම් හා මූල්‍ය බැඳීම් ගෙවා හෝ ඊට අදාළ ප්‍රමාණවත් ප්‍රතිපාදනය මූල්‍ය ප්‍රකාශ තුළ සිදුකර ඇති බවට අධ්‍යක්ෂ මණ්ඩලය ඔවුන්ගේ උපරිම දැනුමට අනුව තහවුරු කරනු ලබයි.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

**ඩැල්රින් තිරුකුමාර්**
*සමාගම් ලේකම්*

2019 පෙබරවාරි 28 වන දින

# ස්වාධීන විගණකවරුන්ගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. AVA/C/SLAL/06/18/80 ඔබේ අංකය / உமது இல. / Your No. දිනය / திகதி / Date 18 March 2019

**සී/ස ශ්‍රී ලන්කන් එයාර්ලයින්ස් සමාගමේ කොටස් හිමියන් වෙත**

**සී/ස ශ්‍රී ලන්කන් එයාර්ලයින්ස් සමාගමේ හා එහි පරිපාලිතයේ 2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපති වාර්තාව**

## මූල්‍ය ප්‍රකාශන

### *මතය*

සී/ස ශ්‍රී ලන්කන් එයාර්ලයින්ස් සමාගමේ ("සමාගම") සහ සමාගම හා එහි පරිපාලිතයේ ("සමූහය") 2018 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ හෝ අලාභ හා විස්තීරණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. සමාගමේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රසිද්ධ කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මෙම විගණනය සඳහා ප්‍රසිද්ධ වෘත්තියෙහි යෙදී සිටින වරලත් ගණකාධිකාරී සමාගමක සහය මා ලබා ගන්නා ලදී.

මූල්‍ය ප්‍රකාශනවලින් 2018 මාර්තු 31 දිනට සමාගමේ හා සමූහයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### *මතය සඳහා පදනම*

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය මඟින් නිකුත් කර ඇති ආචාරධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ සමාගමෙන් ස්වාධීන වන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### *අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවය*

මා සමූහයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති සටහන් අංක 03 කෙරෙහි අවධානය යොමු කරන අතර, එමඟින් 2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමූහයේ හා සමාගමේ ශුද්ධ අලාභය පිළිවෙලින් රු. මිලියන 18,585.15 හා රු. මිලියන 17,213.57 ක් බවත්, එදිනට සමූහයේ හා සමාගමේ ජංගම බැරකම්, එහි ජංගම වත්කම් පිළිවෙලින් රු. මිලියන 94,205.97 කින් හා රු. මිලියන 100,268.11 කින් ඉක්මවා තිබූ බවත්, මුළු බැරකම්, මුළු වත්කම් ඉක්මවීම් පිළිවෙලින් රු. මිලියන 125,582.89 ක් හා රු. මිලියන 132,196.34 ක් වී තිබූ බවත් පෙන්නුම් කෙරුණි. තෙවෙනි සටහනෙහි දක්වා ඇති ආකාරයට මෙම සිද්ධීන් හා කොන්දේසි ද එම සටහනෙහි දක්වා ඇති අනෙකුත් කරුණු මඟින්ද ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවක් පවතින නිසා සමූහයේ අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව පිළිබඳ සැලකිය යුතු සැකයක් පෙන්නුම් කෙරුණි. සටහන් අංක 03 මඟින් දක්වා ඇති පරිදි 2019 පෙබරවාරි 13 දිනැති ජනාධිපති ලේකම්ගේ ලිපිය මඟින් දන්වා තිබූ 2019 පෙබරවාරි 05 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව සමාගමේ මෙහෙයුම් කටයුතු අඛණ්ඩ පැවැත්ම පදනම් කරගෙන පවත්වාගෙන යාම සඳහා 2019 පෙබරවාරි 28 දිනැති භාණ්ඩාගාර ලේකම්වරයාගේ ලිපිය පරිදි ශ්‍රී ලංකා රජයේ සහය දිගටම ලබාදෙන බවට වූ තහවුරු කිරීම සැලකිල්ලට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන අඛණ්ඩ පැවැත්ම පිළිබඳ උපකල්පනය යොදා ගනිමින් සකස් කර තිබුණි. මෙම කරුණ මත මාගේ මතය තත්ත්වාගණනය කරනු නොලැබේ.

### *මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්*

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ ("මණ්ඩලය") වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමූහය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම මණ්ඩලයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සමූහය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමූහයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද මණ්ඩලයේ වගකීමකි.

සමාගමේ සහ සමූහයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

### මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හදුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, කරුණු විකෘති ලෙස අර්ථ දැක්වීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, සමාගමේ සහ සමූහයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණභාවය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද ඇතුලත් වේ.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- හෙළිදරව් කිරීම් ඇතුළත් ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් වී ඇති බව,

- ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීම උදෙසා මා විසින් සමූහයේ මූල්‍ය තොරතුරු හා ව්‍යාපාර ක්‍රියාකාරකම් මත පදනම්ව ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි. සමූහයේ විගණනය සඳහා මඟපෙන්වීම, අධීක්ෂණය හා ක්‍රියාකිරීම සහ විගණන මතයක් ඉදිරිපත් කිරීම මාගේ වගකීම වේ.

මාගේ විගණනය තුළදී සැලැසුම්ගත විෂය පථය හා විගණන කාලරාමු සහ හදුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

### වෙනත් නෛතික හා නියාමන කරුණු පිළිබඳ වාර්තාව

2007 අංක 7 දරන සමාගම් පනතේ 163 (2) වගන්තිය මඟින් නියමකර ඇති පරිදි පහත සඳහන් කරුණු ගෙනහැර දක්වමි.

(අ) විගණන මතයේ පදනම, විෂය පථය හා විගණනයේ සීමා කිරීම් ඉහත සඳහන් පරිදි විය.

(ආ) මාගේ විගණන මතය අනුව,

- විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු හා කරුණු පැහැදිලි කිරීම් මවිසින් ලබාගෙන ඇත්තෙමි. මාගේ පරීක්ෂණය මඟින් පෙනීයන පරිදි සමාගම විසින් නිසි ගිණුම් වාර්තා පවත්වා තිබුණි.
- සමාගමේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශන 2007 අංක 7 දරන සමාගම් පනතේ 151 හා 153 වන වගන්තිවල නියමයන්ට අනුකූල වේ.

### පාර්ලිමේන්තුව වෙත වාර්තා කිරීම

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

**එච්.එම්. ගාමිණී විජේසිංහ**
*විගණකාධිපති*

# මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

| මාර්තු 31 දිනට | සටහන | සමූහය 2018 රු. මිලියන | සමූහය 2017 රු. මිලියන | සමාගම 2018 රු. මිලියන | සමාගම 2017 රු. මිලියන |
|---|---|---|---|---|---|
| **වත්කම්** | | | | | |
| **ජංගම නොවන වත්කම්** | | | | | |
| දේපළ, පිරියත හා උපකරණ | 4 | 10,348.22 | 9,834.07 | 8,154.98 | 7,712.19 |
| ගුවන්යානා ඇණවුම් කිරීමේ පූර්ව ගෙවීම් | 5 | 2,528.12 | 2,528.12 | 2,528.12 | 2,528.12 |
| ගුවන්යානා නඩත්තු සංචිත | 6 | 20,724.17 | 8,135.68 | 20,724.17 | 8,135.68 |
| ගුවන්යානා සහ අතිරේක එන්ජිම තැන්පතු | | 5,820.58 | 5,616.48 | 5,820.58 | 5,616.48 |
| අස්පෘෂ්‍ය වත්කම් | 7 | 248.30 | 653.36 | 206.17 | 625.65 |
| ආයෝජන | 8 | 0.40 | 0.40 | 42.44 | 42.44 |
| | | 39,669.79 | 26,768.11 | 37,476.46 | 24,660.56 |
| **ජංගම වත්කම්** | | | | | |
| තොග | 9 | 4,755.98 | 4,502.67 | 4,421.51 | 4,215.57 |
| වෙළෙඳ හා වෙනත් ලැබිය යුතු දෑ | 10 | 18,266.51 | 15,515.18 | 17,296.91 | 14,559.72 |
| ගුවන්යානා නඩත්තු සංචිත | 6 | 6,226.64 | 6,501.62 | 6,226.64 | 6,501.62 |
| ගුවන්යානා සහ අතිරේක එන්ජිම තැන්පතු | | 74.68 | 72.84 | 74.68 | 72.84 |
| ආයෝජන | 8.1 | 749.96 | 292.94 | 589.59 | 292.94 |
| මුදල් හා බැංකු ශේෂ | 11 | 1,841.58 | 1,760.41 | 1,481.17 | 1,330.38 |
| | | 31,915.35 | 28,645.66 | 30,090.50 | 26,973.07 |
| **මුළු වත්කම්** | | 71,585.14 | 55,413.77 | 67,566.96 | 51,633.63 |
| **හිමිකම හා වගකීම්** | | | | | |
| **ප්‍රාග්ධනය හා සංචිත** | | | | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | 12 | 51,617.44 | 51,617.44 | 51,617.44 | 51,617.44 |
| සංචිත | 13 | 4,620.38 | 4,209.36 | 2,782.72 | 2,371.38 |
| සමුච්චිත අලාභ | | (181,820.71) | (163,620.32) | (186,596.50) | (169,755.46) |
| මුළු හිමිකම | | (125,582.89) | (107,793.52) | (132,196.34) | (115,766.64) |
| **ජංගම නොවන වගකීම්** | | | | | |
| වරණීය කොටස් | 14 | 1,000.00 | 1,000.00 | - | - |
| පොළී හරිත වගකීම් | 15 | 44,556.66 | 27,914.74 | 44,497.74 | 27,914.74 |
| වෙනත් දිගුකාලීන වගකීම් | 16 | 25,490.05 | 13,742.57 | 24,906.95 | 13,182.98 |
| | | 71,046.71 | 42,657.31 | 69,404.69 | 41,097.72 |
| **ජංගම වගකීම්** | | | | | |
| ගුවන් ප්‍රවාහන පූර්ව විකුණුම් | 17 | 23,629.03 | 18,778.71 | 23,629.03 | 18,778.71 |
| වෙළෙඳ හා වෙනත් ගෙවිය යුතු දෑ | 18 | 34,561.86 | 39,136.89 | 38,924.42 | 44,925.29 |
| ගෙවිය යුතු ආදායම් බදු | | 191.68 | 211.28 | 175.45 | 175.45 |
| පොළී හරිත වගකීම් | 15 | 67,738.75 | 62,423.10 | 67,629.71 | 62,423.10 |
| | | 126,121.32 | 120,549.98 | 130,358.61 | 126,302.55 |
| **මුළු වගකීම්** | | 197,168.03 | 163,207.29 | 199,763.30 | 167,400.27 |
| **මුළු හිමිකම හා වගකීම්** | | 71,585.14 | 55,413.77 | 67,566.96 | 51,633.63 |

මෙම මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරන සමාගම් පනතෙහි අවශ්‍යතාවයන්ට අනුකූලව සකස් කර ඇත.

**යසන්ත දිසානායක**
මූල්‍ය කළමණාකරන ප්‍රධානී

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම හා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වගකීමෙන් බැඳේ.
අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අත්සන් තබන ලද්දේ;

**ජී. එස්. විතානගේ මයා**
සභාපති

**එස්. ජී. සේනාරත්න**
අධ්‍යක්ෂ

පිටු අංක 59 සිට 99 දක්වා ඇතුළත් ගිණුම්කරන ප්‍රතිපත්ති හා සටහන් මූල්‍ය ප්‍රකාශන වල වැදගත් කොටසක් වේ.

2019 පෙබවාරි මස 28 වන දින.
කොළඹ

# ලාභ හෝ අලාභ ප්‍රකාශනය

| මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | සටහන | සමූහය 2018 රු. මිලියන | සමූහය 2017 රු. මිලියන | සමාගම 2018 රු. මිලියන | සමාගම 2017 රු. මිලියන |
|---|---|---|---|---|---|
| **ආදායම** | 20 | 164,859.51 | 138,590.83 | 161,654.46 | 135,491.19 |
| **වියදම්** | | | | | |
| ගුවන්යානා ඉන්ධන පිරිවැය | | (47,037.86) | (33,129.60) | (47,037.86) | (33,129.60) |
| සේවක පිරිවැය | | (20,897.26) | (20,012.56) | (19,482.99) | (18,793.79) |
| ගුවන්තොටුපල, මාර්ගස්ත සහ ගුවන් මඟී වියදම් | | (25,248.56) | (21,302.32) | (28,667.79) | (23,788.17) |
| කල්බදු ගුවන්යානා මත වාරික | | (25,726.29) | (22,789.22) | (25,726.29) | (22,789.22) |
| ගුවන්යානා නඩත්තු හා පිරිවැඩියා පිරිවැය | | (22,829.07) | (17,644.09) | (22,829.07) | (17,644.09) |
| ක්ෂය කිරීම්/ක්‍රමක්ෂය කිරීම් | | (1,976.04) | (2,326.30) | (1,779.49) | (2,041.63) |
| විකුණුම්, අලෙවි සහ ප්‍රචාරණ වියදම් | | (15,814.59) | (12,737.28) | (15,814.59) | (12,684.88) |
| ගුවන් සේවක පිරිස් වියදම් | | (6,035.58) | (5,435.73) | (6,035.58) | (5,435.73) |
| වෙනත් මෙහෙයුම් වියදම් | | (9,689.48) | (10,703.55) | (8,730.78) | (10,453.70) |
| මෙහෙයුම් අලාභය | 22 | (10,395.22) | (7,489.82) | (14,449.98) | (11,269.62) |
| වෙනත් ආදායම් සහ ලාභ | 21 | 570.14 | 501.52 | 5,875.58 | 3,565.27 |
| මූල්‍ය ආදායම් | 23.1 | 200.62 | 89.95 | 180.99 | 60.09 |
| මූල්‍ය පිරිවැය | 23.2 | (8,954.77) | (7,053.10) | (8,820.16) | (6,922.92) |
| ගුවන්යානා කල්බදු ගිවිසුම් අවලංගු කිරීම සඳහා වන්දි | 18.1 | - | (14,362.81) | - | (14,362.81) |
| **බදුකරණයට පෙර අලාභ** | | (18,579.23) | (28,314.26) | (17,213.57) | (28,929.99) |
| **ආදායම් බදු වියදම්** | 24 | (5.92) | (25.25) | - | - |
| **වර්ෂය සඳහා අලාභ** | | (18,585.15) | (28,339.51) | (17,213.57) | (28,929.99) |

පිටු අංක 59 සිට 99 දක්වා ඇතුළත් ගිණුම්කරන ප්‍රතිපත්ති හා සටහන් මූල්‍ය ප්‍රකාශන වල වැදගත් කොටසක් වේ.

# විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය

| | | සමූහය | | සමාගම | |
|---|---|---|---|---|---|
| **මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා** | | 2018 | 2017 | 2018 | 2017 |
| | **සටහන** | **රු. මිලියන** | **රු. මිලියන** | **රු. මිලියන** | **රු. මිලියන** |
| **වර්ෂය සඳහා අලාභ** | | (18,585.15) | (28,339.51) | (17,213.57) | (28,929.99) |
| **වෙනත් විස්තීර්ණ ආදායම්/(අලාභ)** | | | | | |
| **පසු කාලසීමා වලදී ලාභය හෝ අලාභයට ප්‍රතිවර්ගීකරණය නොකරනු ලබන වෙනත් විස්තීර්ණ ආදායම්/(අලාභ) (බදු වලට ශුද්ධ වූ)** | | | | | |
| විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් මත ආයුගණක ලාභ/(අලාභ) | 16.2 | 384.44 | 302.69 | 372.53 | 254.20 |
| දේපළ, පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය | | 616.81 | - | 616.81 | - |
| | | 1,001.25 | 302.69 | 989.34 | 254.20 |
| **පසු කාලසීමා වලදී ලාභය හෝ අලාභයට ප්‍රතිවර්ගීකරණය කරනු ලබන වෙනත් විස්තීර්ණ ආදායම්/(අලාභ) (බදු වලට ශුද්ධ වූ)** | | | | | |
| මුදල් ප්‍රවාහ ආවරණ මත ශුද්ධ විතැන්වීම | | (205.47) | 690.41 | (205.47) | 690.41 |
| | | (205.47) | 690.41 | (205.47) | 690.41 |
| **බදු වලට ශුද්ධ වූ වර්ෂය සඳහා මුළු අනෙකුත් විස්තීර්ණ ආදායම් /(අලාභ)** | | 795.78 | 993.10 | 783.87 | 944.61 |
| **බදු වලට ශුද්ධ වූ වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම් /(අලාභ)** | | (17,789.37) | (27,346.41) | (16,429.70) | (27,985.38) |

පිටු අංක 59 සිට 99 දක්වා ඇතුළත් ගිණුම්කරන ප්‍රතිපත්ති හා සටහන් මූල්‍ය ප්‍රකාශන වල වැදගත් කොටසක් වේ.

# ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය

| **සමූහය**<br>**මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා** | **ප්‍රකාශිත ප්‍රාග්ධනය**<br>**රු. මිලියන** | **ප්‍රත්‍යාගණන සංචිතය**<br>**රු. මිලියන** | **මුදල් ප්‍රවාහ ආවරණ සංචිතය**<br>**රු. මිලියන** | **සමුච්චිත අලාභ**<br>**රු. මිලියන** | **එකතුව**<br>**රු. මිලියන** |
|---|---|---|---|---|---|
| **2016 මාර්තු 31 දිනට ශේෂය** | 51,617.44 | 4,338.90 | (818.04) | (135,585.41) | (80,447.11) |
| වර්ෂය සඳහා අලාභ | - | - | - | (28,339.51) | (28,339.51) |
| වෙනත් විස්තීර්ණ ආදායම් | - | - | 690.41 | 302.69 | 993.10 |
| සමස්ත විස්තීර්ණ ආදායම්/(අලාභ) | - | - | 690.41 | (28,036.82) | (27,346.41) |
| වර්ෂය තුල ඉවත් කිරීම් හේතුවෙන් ප්‍රත්‍යාගණනය මත අතිරික්තය හැරවීම | - | (1.91) | - | 1.91 | - |
| **2017 මාර්තු 31 දිනට ශේෂය** | 51,617.44 | 4,336.99 | (127.63) | (163,620.32) | (107,793.52) |
| වර්ෂය තුල ඉවත් කිරීම් හේතුවෙන් ප්‍රත්‍යාගණනය මත අතිරික්තය හැරවීම | - | (0.32) | - | 0.32 | - |
| වර්ෂය සඳහා අලාභ | - | - | - | (18,585.15) | (18,585.15) |
| වෙනත් විස්තීර්ණ ආදායම් | - | 616.81 | (205.47) | 384.44 | 795.78 |
| සමස්ත විස්තීර්ණ ආදායම්/(අලාභ) | - | 616.81 | (205.47) | (18,200.71) | (17,789.37) |
| **2018 මාර්තු 31 දිනට ශේෂය** | 51,617.44 | 4,953.48 | (333.10) | (181,820.71) | (125,582.89) |

| **සමාගම**<br>**මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා** | **ප්‍රකාශිත ප්‍රාග්ධනය**<br>**රු. මිලියන** | **ප්‍රත්‍යාගණන සංචිතය**<br>**රු. මිලියන** | **මුදල් ප්‍රවාහ ආවරණ සංචිතය**<br>**රු. මිලියන** | **සමුච්චිත අලාභ**<br>**රු. මිලියන** | **එකතුව**<br>**රු. මිලියන** |
|---|---|---|---|---|---|
| **2016 මාර්තු 31 දිනට ශේෂය** | 51,617.44 | 2,499.01 | (818.04) | (141,079.67) | (87,781.26) |
| වර්ෂය සඳහා අලාභ | - | - | - | (28,929.99) | (28,929.99) |
| වෙනත් විස්තීර්ණ ආදායම් | - | - | 690.41 | 254.20 | 944.61 |
| සමස්ත විස්තීර්ණ ආදායම්/(අලාභ) | - | - | 690.41 | (28,675.79) | (27,985.38) |
| **2017 මාර්තු 31 දිනට ශේෂය** | 51,617.44 | 2,499.01 | (127.63) | (169,755.46) | (115,766.64) |
| වර්ෂය සඳහා අලාභ | - | - | - | (17,213.57) | (17,213.57) |
| වෙනත් විස්තීර්ණ ආදායම් | - | 616.81 | (205.47) | 372.53 | 783.87 |
| සමස්ත විස්තීර්ණ ආදායම්/(අලාභ) | - | 616.81 | (205.47) | (16,841.04) | (16,429.70) |
| **2018 මාර්තු 31 දිනට ශේෂය** | 51,617.44 | 3,115.82 | (333.10) | (186,596.50) | (132,196.34) |

පිටු අංක 59 සිට 99 දක්වා ඇතුළත් ගිණුම්කරන ප්‍රතිපත්ති හා සටහන් මූල්‍ය ප්‍රකාශන වල වැදගත් කොටසක් වේ.

# මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

| මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | සටහන | සමූහය 2018 රු. මිලියන | සමූහය 2017 රු. මිලියන | සමාගම 2018 රු. මිලියන | සමාගම 2017 රු. මිලියන |
|---|---|---|---|---|---|
| **මෙහෙයුම් කටයුතු වලින් ලද/(භාවිතා කල) මුදල් ප්‍රවාහ** | | | | | |
| ආදායම් බදු වියදම් වලට පෙර අලාභය | | (18,579.23) | (28,314.26) | (17,213.57) | (28,929.99) |
| **ගැලපුම්** | | | | | |
| ක්ෂය වීම්/ක්‍රමක්ෂය කිරීම්/හානිකරණය | | 1,987.28 | 2,337.54 | 1,779.49 | 2,041.63 |
| මූල්‍ය පිරිවැය | 23.2 | 8,954.77 | 7,053.10 | 8,820.16 | 6,922.92 |
| දේපළ, පිරියත හා උපකරණ සහ අස්පෘෂ්‍ය වත්කම් ඉවත්කිරීම මත අලාභය/(ලාභ) | | 14.41 | (24.50) | 14.14 | (2.99) |
| මූල්‍ය ආදායම් | 23.1 | (200.62) | (89.95) | (180.99) | (60.09) |
| ලැබිය යුතු දෑ හානිකරණය සඳහා ප්‍රතිපාදන | | 172.92 | 781.36 | 172.92 | 728.96 |
| ගුවන්යානා කල්බදු ගිවිසුම් අවලංගු කිරීම මත අත්හැර ආරක්ෂණ තැන්පතු | | - | 1,095.30 | - | 1,095.30 |
| මන්දගාමීව චලනය වන තොග සඳහා ප්‍රතිපාදන | 9.1 | 251.60 | 797.40 | 251.60 | 797.40 |
| නඩත්තු සංචිත හානිකරණය සඳහා ප්‍රතිපාදන | 6.2 | 3,948.95 | 2,637.43 | 3,948.95 | 2,637.43 |
| උපලබ්ධි නොවූ විනිමය අලාභ මත බලපෑම | | 976.32 | 2,468.01 | 807.18 | 3,168.30 |
| පූර්ව විකුණුම් ආපසු ලිවීම | | (1,628.86) | (2,462.04) | (1,628.89) | (2,462.04) |
| පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන | 16.2 | 1,028.16 | 964.07 | 939.80 | 888.07 |
| **කාරක ප්‍රාග්ධන වෙනස්වීම් වලට පෙර මෙහෙයුම් අලාභය** | | (3,074.30) | (12,756.54) | (2,289.21) | (13,175.10) |
| තොග වල අඩුවීම/(වැඩිවීම) | | (504.91) | (369.55) | (457.54) | (319.63) |
| පූර්ව ප්‍රවාහන විකුණුම් වල වැඩිවීම | | 6,479.19 | 3,670.35 | 6,479.19 | 3,670.35 |
| වෙළෙඳ හා වෙනත් ලැබිය යුතු දෑ වල (වැඩිවීම)/ අඩුවීම | | (3,171.90) | (2,132.71) | (3,102.50) | (2,195.89) |
| වෙළෙඳ හා වෙනත් ගෙවිය යුතු දෑ වල වැඩිවීම/ (අඩුවීම) | | 5,982.62 | 5,084.04 | 4,692.92 | 4,972.35 |
| නඩත්තු සංචිත වල (වැඩිවීම)/ අඩුවීම | | (7,464.64) | (6,960.78) | (7,464.64) | (6,960.78) |
| ගුවන්යානා ආරක්ෂණ තැන්පතු වල වැඩිවීම | | (60.87) | (289.37) | (60.87) | (289.37) |
| මෙහෙයුම් වලින් ලද/(භාවිතා කල) මුදල් | | (1,814.81) | (13,754.56) | (2,202.65) | (14,298.07) |
| ගෙවූ මූල්‍ය පිරිවැය | | (8,891.94) | (7,092.71) | (8,757.33) | (6,962.53) |
| ගෙවූ පාරිතෝෂික | 16.2 | (502.10) | (414.66) | (449.16) | (390.98) |
| **මෙහෙයුම් කටයුතු භාවිතා කල ශුද්ධ මුදල් ප්‍රවාහ** | | (11,208.85) | (21,261.93) | (11,409.14) | (21,651.58) |
| **ආයෝජන කටයුතු වලින් ලද/(භාවිතා කල) මුදල් ප්‍රවාහ** | | | | | |
| ලද පොළී | | 176.52 | 89.95 | 165.26 | 60.09 |
| දේපළ, පිරියත හා උපකරණ අත්පත් කරගැනීම | | (1,566.90) | (1,131.77) | (1,295.98) | (921.14) |
| කෙටිකාලීන ආයෝජන (ආයෝජනය)/උපලබ්ධි කිරීම | | (419.78) | 2,219.63 | (267.78) | 2,219.63 |
| ගුවන්යානා ඇණවුම් කිරීමේ පර්ව ශුද්ධ (ගෙවීම්)/ලැබීම් | | - | (108.04) | - | (108.04) |
| අස්පෘෂ්‍ය වත්කම් අත්පත් කරගැනීම | | (106.96) | (146.28) | (84.00) | (121.01) |
| දේපළ, පිරියත හා උපකරණ බැහැර කිරීමෙන් ලද මුදල් | | 1.26 | 27.36 | 1.24 | 3.94 |
| **ආයෝජන කටයුතු භාවිතා කල/ලද ශුද්ධ මුදල් ප්‍රවාහ** | | (1,915.86) | 950.85 | (1,481.26) | 1,133.47 |
| **මූල්‍ය කටයුතු වෙනුවෙන් භාවිතා කල මුදල් ප්‍රවාහ** | | | | | |
| පොළී හරිත වගකීම් නැවත ගෙවීම | | (8,236.44) | (11,258.27) | (8,182.68) | (11,256.29) |
| පොළී හරිත ණය සහ ණයගැනීම් වලින් ලද මුදල් | | 27,226.48 | 26,172.36 | 27,008.03 | 26,172.36 |
| **මූල්‍ය කටයුතු වලින් ශුද්ධ මුදල් ප්‍රවාහ** | | 18,990.04 | 14,914.09 | 18,825.35 | 14,916.07 |
| **මුදල් හා මුදල් සමාන දෑ වල ශුද්ධ වැඩිවීම/(අඩුවීම)** | | 5,865.33 | (5,396.99) | 5,934.95 | (5,602.04) |
| **වර්ෂය ආරම්භයේ මුදල් හා මුදල් සමාන දෑ** | 11 | (5,780.89) | (383.90) | (6,210.92) | (608.88) |
| වර්ෂය අවසානයේ මුදල් හා මුදල් සමාන දෑ | 11 | 84.44 | (5,780.89) | (275.97) | (6,210.92) |

පිටු අංක 59 සිට 99 දක්වා ඇතුළත් ගිණුම්කරන ප්‍රතිපත්ති හා සටහන් මූල්‍ය ප්‍රකාශන වල වැදගත් කොටසක් වේ.

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

## 1. සාංගමික තොරතුරු

### 1.1 සාමාන්‍ය

**සමාගම**

ශ්‍රී ලංකන් ගුවන් සමාගම ("සමාගම") ශ්‍රී ලංකාව තුළ සංස්ථාපිත කළ වගකීම සීමාසහිත සමාගමකි. සමාගමේ ලියාපදිංචි කාර්යාලය හා ප්‍රධාන ව්‍යාපාර ස්ථානය ගුවන් මධ්‍යස්ථානය, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළ, කටුනායක, ශ්‍රී ලංකාව යන ලිපිනයෙහි පිහිටා ඇත.

ඒකාබද්ධ මූල්‍යමය ප්‍රකාශනයන් සමාගම සහ එහි අනුබද්ධ ආයතනයෙන් සමන්විත වේ. (එක්ව ගත් කල සමූහය වශයෙන් හැඳින්වේ.) එයටම අයත් වූ හඳුනාගත හැකි මව් සමාගමක් සමාගම සතු නොවේ. සමාගම යනු සමූහයේ පරම මව් සමාගම වේ.

### 1.2 මූලික ක්‍රියාකාරකම් හා මෙහෙයුම්වල ස්වභාවය

**සමාගම**

මගීන්, ගුවන් භාණ්ඩ හා ගුවන් තැපැල් ප්‍රවාහනය සඳහා ජාත්‍යන්තර වශයෙන් නිශ්චිත කාලසටහන් සහිතව සහ රහිතව ශ්‍රී ලංකාව තුළ ගුවන් ප්‍රවාහකයා වශයෙන් ගුවන් සේවා ක්‍රියාත්මක කිරීම සමාගමේ මූලික ක්‍රියාකාරකම් වේ. බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළේ සහ මත්තල රාජපක්ෂ ගුවන්තොටුපළේ ගුවන් පර්යන්ත සේවා සැපයීම, ගුවන් යානා තුළ තීරුබදු රහිත භාණ්ඩ විකිණීම, අභ්‍යන්තර හා බාහිර සංචාරක නිවාඩු පැකේජ අලෙවි කිරීම සමාගමේ අනෙකුත් ප්‍රධාන කටයුතු අතර වේ. සමාගමේ ද්විතීයික සේවා කටයුතු සමන්විත වනුයේ තෙවන පාර්ශවවලට නඩත්තු සේවා සැපයීමත්, ගුවන්යානා මෙහෙයුම් සේවා සලසා දීමත්, ගුවන් සේවා ආශ්‍රිත පුහුණු වැඩසටහන් මෙහෙයවීමත් යනාදියෙනි.

**පරිපාලිත සමාගම - ශ්‍රී ලංකන් කේටරින් ලිමිටඩ්**

ශ්‍රී ලංකන් කේටරින් ලිමිටඩ් ("පරිපාලිත සමාගම") සමාගමේ මූලික ක්‍රියාකාරකම වනුයේ බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ සහ මත්තල රාජපක්ෂ ගුවන් තොටුපළ ඔස්සේ ක්‍රියාත්මක වන ගුවන් සමාගම්වලට ගුවන් යානා තුළ ආහාරපාන සැපයුම් සේවා සලසා දීමය. සමාගමේ ද්විතීයික සේවා තුළ පොදු හා ගුවන් මගී මාර්ගස්ථ අවන්හල් ක්‍රියාත්මක කිරීම, ලොන්ඩරි සේවා සැපයීම හා ගුවන් ගමන් මගී මාර්ග ස්ථ හෝටලය කළමනාකරණය යනාදී කටයුතු ඇතුලත් වේ.

### 1.3 නිකුතුව සඳහා අධිකාරිය ලබාදුන් දිනය

2018 මාර්තු මස 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා 2019 පෙබරවාරි 28 වන දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අධිකාරිය ලබාදෙන ලදී.

## 2. පොදු ගිණුම්කරන ප්‍රතිපත්ති

### 2.1 පිළියෙළ කිරීමේ පදනම

සමාගමේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කරනු ලැබ ඇත්තේ උපචිත පදනම මත සහ සාධාරණ වටිනාකමක් මත මිනුම් කරනු ලබන ඉඩම් හා ගොඩනැගිලි සහ ගුවන්යානාස්ථ මුළුතැන්ගෙයි උපකරණ හැරුණු විට ඓතිහාසික පිරිවැය පදනම මතය.

වෙනත් අයුරකින් සඳහන් කර නොමැති විට හැර සියලුම අගයන් ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කරනු ලබන අතර ආසන්න මිලියනට වටයා ඇත.

#### 2.1.1 අනුකූලතා ප්‍රකාශය

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සමාගමේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත. මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම හා ඉදිරිපත් කිරීම 2007 අංක 07 දරන සමාගම් පනත හා අනුකූල වේ.

#### 2.1.2 සංසන්දනාත්මක තොරතුරු

සමූහය විසින් අනුගමනය කරන ලද ගිණුම් ප්‍රතිපත්ති හා ඇස්තමේන්තු ඉකුත් වර්ෂයේ ගිණුම් ප්‍රතිපත්ති හා ඇස්තමේන්තු සමඟ අනුකූල වේ.

ප්‍රවර්තන වර්ෂයේ ගිණුම් ඉදිරිපත් කිරීම හා අනුකූල වන පරිදි අවශ්‍ය අවස්ථාවලදී ඉකුත් වර්ෂයේ සංඛ්‍යා දත්ත හා වැකි බණ්ඩ නැවත සකසා ඇත. මූල්‍ය ප්‍රකාශන වලට සිදුකර ඇති ප්‍රතිවර්ගීකරණයන් 30 වන සටහනෙහි අනාවරණය කර ඇත.

### 2.2 ඒකාබද්ධ කිරීමේ පදනම

ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන වල සමාගමේ හා එහි පරිපාලිත සමාග මේ 2018 මාර්තු මස 31 වන දින දක්වා වූ මූල්‍ය ප්‍රකාශන අඩංගු වේ. අයෝජනලාභියා සමඟ සමූහයට විසින් පවත්වාගෙන යනු ලබන කටයුතු නිසා උද්ගතවන විචල්‍ය ප්‍රතිලාභ සඳහා සමූහය නිරාවරණය වීම හෝ ඒ සඳහා හිමිකමක් මත සහ එහි බලය මඟින් අදාළ අයෝජනලාභියා ඉක්මවා එකී ප්‍රතිලාභ කෙරෙහි බලපෑමට සමූහයට ඇති හැකියාව මත පාලනය අත්පත් කරගත හැක. ව්‍යාපාර සමාගම සතුව පහත සඳහන් දෑ ඇත්නම්, සහ ඇත්නම් පමණක් සමාගම විසින් ආයෝජනලාභියකු නිශ්චිතවම පාලනය කරනු ලබයි.

- ආයෝජනලාභියා කෙරෙහි වූ බලය / (එනම් ආයෝජනලාභියාගේ අදාළ කටයුතු මෙහෙයවීම සඳහා සමාගමට ප්‍රවර්තන හැකියාව ලබාදෙන දැනට පවතින හිමිකම්)
- ආයෝජනලාභියා සමඟ සිදුකරන ව්‍යාපාර කටයුතු නිසා උද්ගතවන විචල්‍ය ප්‍රතිලාභ කෙරෙහි නිරාවරණය හෝ හිමිකම
- එකී ප්‍රතිලාභ කෙරෙහි බලපෑම සඳහා ආයෝජනලාභියා සම්බන්ධයෙන් බලය භාවිතා කිරීමේ හැකියාව.

පාලනයේ මූලික අංග තුනෙන් එකකට හෝ ඊට වැඩි ගණනකට වෙනස්කම් සිදුව ඇති බව අදාළ සාධක හෝ අවස්ථානුගත තත්වයන් මඟින් හැඟවේ නම්, සමූහය විසින් ආයෝජනලාභියකු පාලනය කරන්නේද නොකරන්නේද යන්න තීරණය කිරීමට සමූහය ප්‍රති ඇගයුමක් සිදු කරයි. සමූහය පරිපාලිත සමාගමක පාලනය ලබාගත් කල්හි පරිපාලිත සමාගමේ ඒකාබද්ධ වීම ආරම්භ වන අතර සමාගමට පරිපාලිත සමාගම සම්බන්ධයෙන් පවත්නා පාලනය අහිමිවූ විට ඒකාබද්ධ වීම නතර කරයි.

ලාභය හෝ අලාභය සහ වෙනත් විස්තීර්ණ ආදායමට අයත් එක් එක් අංග සමාගමේ කොටස් හිමියන් වෙත ආරෝපණය කෙරේ. අවශ්‍ය අවස්ථාවන්හිදී, සමූහයේ ගිණුම් ප්‍රතිපත්ති හා පරිපාලිත සමාගමේ ගිණුම් ප්‍රතිපත්ති අනුරූප කිරීම සඳහා පරිපාලිත සමාගමේ මූල්‍ය ප්‍රකාශවලට ගැලපුම් සිදුකෙරේ. සියලු අන්තර් සමූහ වත්කම් හා

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් ඉතිරි කොටස.

වගකීම්, හිමිකම, ආදායම්, වියදම් හා සමූහයට අයත් සාමාජිකයින් අතර ගණුදෙනුවලට අදාළ මුදල් ප්‍රවාහ ඒකාබද්ධ කිරීමේ කාර්යයේදී සම්පූර්ණයෙන්ම ඉවත් කරනු ලබයි.

පරිපාලිත සමාගමක පාලනය අහිමිවී යාමකින් තොරව හිමිකාරීත්වය වෙනස් වේ නම් එය හිමිකම් ගණුදෙනුවක් ලෙස ගිණුම්ගත කරනු ලබයි.

පරිපාලිත සමාගමක පාලනය අහිමිවේ නම්, අදාළ වත්කම්, වගකීම් හා හිමිකමෙහි වෙනත් අංග හඳුනා නොගන්නා අතර ඒ නිසා උද්ගතවන යම් ලාභයක් හෝ අලාභයක් වෙතොත් ඒවා ලාභයෙහි හෝ අලාභයෙහි හදුනාගැනේ, රඳවා ගනු ලබන ආයෝජනයක් වෙතොත්, එය සාධාරණ අගයක් මත හඳුනාගනී.

## 2.3 වැදගත් ගිණුම්කරන ඇස්තමේන්තු, උපකල්පන සහ විනිශ්චයන්

ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී වත්කම්, වගකීම්, ආදායම් හා වියදම් පිලිබඳ වාර්තා වූ ගණන් ප්‍රමාණ කෙරෙහි හා අදාළ වාර්තා කරන දිනයට සිදුකරන හෙළිදරව් කිරීම් කෙරෙහි බලපෑම් කල හැකි විනිශ්චයන්ට, ඇස්තමේන්තුවලට හා උපකල්පනයන්ට එළඹීමට කළමනාකරණයට සිදුවේ. ප්‍රධාන විනිශ්චයන්, ඇස්තමේන්තු හා ඒ හා බැඳුණු උපකල්පනයන් නිරන්තරව ක්‍රියාත්මක වන පදනමක් මත ඇගයීමට ලක්වන අතර ඒවා ඓතිහාසික අත්දැකීම් මතද, අවස්ථානුගතව සාධාරණ යැයි විශ්වාස කරන අනාගත සිදුවීම්වල අපේක්ෂාවන් ද ඇතුළත් වෙනත් සාධක මතද පදනම් වේ.

විෂයානුබද්ධ මෙන්ම මූල්‍ය ප්‍රකාශන තුල හඳුනා ගැනෙන අගයන් මත වැදගත් බලපෑමක් ඇති කරන්නාවූ අනෙකුත් දෑ අතර පහත දැක්වෙන විනිශ්චයන්, ඇස්තමේන්තු හා උපකල්පන යොදා ගනු ලැබේ.

### (අ) විනිශ්චයන්

#### (1) අඛණ්ඩ පැවැත්ම

3 වන සටහනෙහි අනාවරණය කර ඇති පරිදි මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කර සහ ඉදිරිපත් කර ඇත්තේ අඛණ්ඩ පැවැත්ම පදනම මතය.

#### (2) අසම්භාව්‍ය වගකීම් - නඩු කටයුතු

25.3 වන සටහනෙහි අනාවරණය කර ඇති පරිදි ප්‍රවර්තන මූල්‍ය වර්ෂයේ අවසානය වන විට විවිධ පාර්ශවකරුවන් සමඟ සමූහය නඩු කටයුතු ගණනාවකට එළඹ ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය සමාග මේ නීතිඥයන්ගේ උපදෙස් විමසා බැලීමෙන් අනතුරුව එක් එක් නඩු කටයුතු වල තත්ත්වය ඇගයුමට ලක් කරන අතර අනාගතයේදී සම්පත් ගලායෑමක් පවතී යයි නිශ්චය කළහොත් ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සිදු කරනු ලබයි.

#### (3) මූල්‍ය හා මෙහෙයුම් කල්බදු

සියලු අවදානම් වල හා ප්‍රතිලාභවල හිමිකාරීත්වය සමූහය වෙත මාරු වන කිසියම් කල්බදු වර්ගීකරණය කෙරෙනුයේ මූල්‍ය කල්බද්දක් ලෙසය. අදාළ වර්ගීකරණය තීරණය කිරීමෙහිලා සලකා බැලෙනුයේ අදාළ ගනුදෙනුවෙහි වන ආකාරය නොව එහි හරයයි. පහත සඳහන් සාධක අන්තර්ගත වන නමුත් එම සාධක වලට පමණක් සීමාවී නැත. වත්කමෙහි අයිතිය කල්බදුකරය විසින් කල්බදු කාලසීමාව අවසානයේදී කල්බදු ලාභියා වෙත පවරා දී ඇත්ද යන වග, ක්‍රියාකාරීවන දිනයේදී සාධාරණ අගයට වඩා ප්‍රමාණවත් අඩු අපේක්ෂිත මිලකට වත්කම් මිලදී ගැනීම සඳහා කල්බදු ලාභියා වෙත විකල්පයක් ඇත්ද යන වග, වත්කමෙහි හිමිකම පවරා නොමැති වුවද එහි ආර්ථික ආයු කාලයෙහි වැඩි ප්‍රමාණයක් කල්බදු කාලසීමාව වීම සහ අවම කල්බදු ගෙවීමෙහි වර්තමාන වටිනාකම සියළුම කල්බදු වත්කම් වල සාධාරණ අගයෙහි වටිනාකම වත් වේද යන වග.

### (ආ) ඇස්තමේන්තු

#### (1) දේපළ, පිරියත හා උපකරණ සහ අස්පෘශ්‍ය වත්කම් ක්ෂය වීම/ක්‍රමක්ෂය වීම

දේපළ, පිරියත හා උපකරණ යන වත්කම්වල අපේක්ෂිත ප්‍රයෝජනය හා ආර්ථික ආයුකාලය පදනම් කර ගනිමින් ඒවාට යම් ඵලදායී ජීවකාලයක් හා අවශේෂ වටිනාකමක් කළමනාකරණය විසින් පවරනු ලබයි. දේපළ, පිරියත හා උපකරණ යනාදියට අයත් අවශේෂ අගය සහ ඵලදායී ජීවකාලයද එක් එක් වාර්තා කරන දිනට ඒවායේ ක්ෂයවීම්/ක්‍රමක්ෂය ක්‍රමයද කළමනාකරණය විසින් සමාලෝචනය කරන අතර, මෙම වත්කම් සඳහා පෙර සිදුකළ ඇස්තමේන්තු හා ඒවායේ අයිතමයන් තුළ අඩංගු ආර්ථික ප්‍රතිලාභවල පරිභෝජන රටාව සමඟ එය අනුගතවන බවටද සහතික කරනු ලබයි. මෙම වත්කම්වල ඵලදායී ජීවකාලය හා අවශේෂ වටිනාකම් වල වෙනස්කම් අනාගත ක්ෂය අයකිරීම්හි සංශෝධන වලට හේතුවිය හැකිය. (2.4.3 (ආ) සහ 2.4.4 ප්‍රතිපත්ති පරිශීලනය කරන්න)

#### (2) නිරන්තර පියාසර වැඩසටහන

ලබාදුන් ලකුණු ප්‍රදාන ආදායමෙහි වෙනමම හඳුනාගැනෙන අංගයක් ලෙස ගිණුම්ගත කෙරේ. ලබාදුන් ලකුණු ප්‍රදාන සඳහා වෙන්කළ අදාළ ප්‍රතිෂ්ඨාව ඒවායේ සාධාරණ අගය මත පදනම්ව වෙන්කරනු ලබන අතර ඒකාබද්ධ මූල්‍ය තත්ත්වය ප්‍රකාශනයෙහි වගකීමක් (විලම්භිත ආදායමක්) ලෙස ගිණුම්ගත කෙරේ.

සැතපුම් ලබාදුන් ලකුණු ප්‍රදාන වටිනාකමෙහි සාධාරණ අගය නිශ්චය කිරීම සඳහා ඇස්තමේන්තුකරණ ශිල්ප ක්‍රම භාවිතා කරන අතර අංශයක් සඳහා ගාස්තුව, ගුවන් ගමන් උසස් කිරීම් හා හවුල්කාර ප්‍රදාන වැනි සාධක ගණනාවක් සඳහා බර තැබූ සාමාන්‍යයක් නිරූපණය වේ. සාධාරණ අගය ගණනයට අදාළ පදනම වශයෙන් ඓතිහාසික ප්‍රවණතාවන් යොදා ගැනේ.

සාමාජික සාමාජිකාවන් විසින් නිදහස් කරගනු ලැබෙතැයි අපේක්ෂිත සැතපුම් සඳහා සහ කල් ඉකුත් සැතපුම් සඳහා, සැතපුම්වල සාධාරණ අගය වෙනුවෙන් ගැළපුම් සිදුකෙරේ.

සැතපුමෙහි සාධාරණ අගය නිශ්චය කිරීමෙහිලා යොදාගැනෙන යෙදවුම්වල විවිධත්වය නිසා එහි විනිශ්චය යම් මට්ටමකින් කළමනාකරණය විසින් ක්‍රියාවට නංවනු ලැබේ.

#### (3) නඩත්තු සංචිතය

නඩත්තු සම්බන්ධයෙන් වූ එකඟත්වයට පත් කොන්දේසි මත පදනම්ව, මෙහෙයුම් කල්බදු යටතේ පවත්නා ගුවන් යානා හා එන්ජින් කීපයක් වෙනුවෙන් අදාළ බදුකරුවන්ට සමාගම විසින් මාසික ගෙවීම් සිදු කරයි. මෙම මාසික ගෙවීම් පදනම් වනුයේ පියාසර කරන ලද පැය සහ චක්‍ර ගණන අනුවය. ආපසු අයකර හැකි වටිනාකම් වල වඩාත් යෝග්‍ය ඇස්තමේන්තු මත පදනම්ව එකී ගෙවීම් වල ආපසු අයකර ගැනීමේ හැකියාව පිලිබඳව කළමනාකරණය කලින් කල ඇගයීම් සිදු කරයි. කිසියම් වත්කමක ධාරණ අගය එහි ආපසු අයකර ගතහැකි මුදල

ඉක්මවන විට එම වත්කම හානිකරණය වූ වත්කමක් සේ සලකා එය ආපසු අයකර ගත හැකි වටිනාකම දක්වා ලියා පහත දමයි. (6 වන සටහන පරිශීලනය කරන්න)

(4) ගුවන් යානා නඩත්තු සහ පිරිවැඩියා වියදම් සඳහා ප්‍රතිපාදනය

නඩත්තු කටයුතු සඳහා එකඟත්වයට පත් කල්බදු ගිවිසුම් කොන්දේසිවලට අනුව ගුවන්යානා කඳ, ගුවන්යානා එන්ජින් හා ඒවායේ ගොඩබෑසුම් උපකරණ සම්බන්ධ විශාල නඩත්තු කටයුතු ඉටු කිරීමට සමාගම බැඳී සිටී. පිරික්සුමේ ස්වාභාවය මත කාලය යෙදවීම හා භාවිතය මත පදනම්ව මුල්‍ය ප්‍රකාශන තුළ විශාල නඩත්තු කටයුතු ආශ්‍රිත පිරිවැය සඳහා වන ප්‍රතිපාදන සිදුකරයි. මෙම ප්‍රතිපාදන තීරණය කිරීමෙහිදී, අදාළ පරීක්ෂා කිරීම සිදු කිරීමේ අවස්ථාවේදී පවත්නා වත්කම්වල ඇස්තමේන්තුගත තත්ත්වය මත, යෙදවිය යුතු අමුද්‍රව්‍ය හා දැරිය යුතු පොදුකාර්ය පිරිවැය මත සහ අදාළ පරීක්ෂා කිරීම් සිදු කළ යුතු වන්නාවූ අවස්ථාව මත සුදුසු උපකල්පනවලට එළඹේ. මෙම උපකල්පනවලට එළඹෙනුයේ අතීත අත්දැකීම් මත වන අතර ඒවා සත්‍ය මට්ටමට ආසන්න බව තහවුරු කරගැනීම සඳහා නිරන්තර සමාලෝචනයට ලක්කරනු ලැබේ. ප්‍රතිපාදන කෙරෙහි සැලකිය යුතු අයුරින් බලපෑම් ඇතිකරන උපකල්පන හා ඇස්තමේන්තු කිරීම් තුළ සිදුවන යම් සංශෝධන වෙනුවෙන් මුල්‍ය ප්‍රකාශන තුළ ගැලපීම් සිදුකරනු ලැබේ.

(5) ගුවන් ප්‍රවාහන සේවා ආශ්‍රිත සෘජු මෙහෙයුම් වියදම් සඳහා ප්‍රතිපාදන

ගුවන් ප්‍රවාහන සේවා මෙහෙයුම් කාර්ය වලදී ඉන්ධන ගාස්තු, යානා බිම් මෙහෙයුම් ගාස්තු, ගොඩබෑම් හා ගාල්කර තැබීමේ ගාස්තු, අහාර පාන/ ප්‍රවේශපත් වෙන්කරවා ගැනීමේ පද්ධති/ ගුවන් ගමන් වෙන්කරවා ගැනීමේ ගාස්තු සහ තොරතුරු තාක්ෂණය ආශ්‍රිත ගාස්තු වැනි සෘජු වියදම් සම්බන්ධයෙන්වූ විවිධ ප්‍රතිපාදන වෙන්කිරීමට අනිවාර්යයෙන්ම සිදුවේ. ඊට අදාළ ඇස්තමේන්තු හා ඒ ආශ්‍රිතව යොදා ගැනෙන උපකල්පන අතීත අත්දැකීම් මතත්, අවස්ථානෝචිත පරිදි සාධාරණ වේයැයි විශ්වාස කෙරෙන බොහෝ අනිකුත් සාධක මතද පදනම් වන අතර ඉන් උද්ගත වන ප්‍රතිඵල වාර්තා කරනු ලබන කාලපරිච්ඡේදයේ අවසානයේදී වගකීම්වල ධාරණ අගය මත ප්‍රතිපාදන වෙන් කිරීම මත පදනම වේ.

(6) තොග

නිත්‍ය තොග ගණනය කිරීමේ පදනමක පිහිටා තොග වල පැවැත්ම හා ප්‍රයෝජනවත්භාවය, සමාගම සමාලෝචනය කරයි. යල් පැන ගිය තොග සහ/හෝ තොගවල ආපසු අයකරගත හැකි වටිනාකමෙහි අඩුවීමක් සම්බන්ධයෙන් කළමනාකරණය තීරණය කල විට ඒ සඳහා ප්‍රතිපාදන සිදුකරයි.

(7) මුල්‍ය නොවන වත්කම් හානිකරණය

යම් වත්කමක් හානිකරණයට පත්වී ඇති බවට යම් සාක්ෂි තිබේදැයි සොයා බැලීමට එක් එක් වාර්තා කරන දිනට සමූහය විසින් තක්සේරු කරයි.

නෙගෙවා ඇති කාල සීමාව සහ ඒවා ආපසු අයකර ගැනීමට ඇති හැකියාවේ අවිනිශ්චිතභාවය සම්බන්ධයෙන් පවත්නා කළමනාකරණය දන්නා වෙනත් සාධක මත එම හානිකරණය ඇස්තමේන්තු කිරීමට තම විනිශ්චයන් කළමනාකරණය විසින් භාවිතා කරනු ලබයි.

(8) මුල්‍ය වත්කම් හානිකරණය

යම් මුල්‍ය වත්කමක් හෝ මුල්‍ය වත්කම් සමූහයක් හානිකරණයට පත්වී ඇති බවට වාස්තවික සාක්ෂි තිබේදැයි එක් එක් වාර්තා කරන දිනට සමූහය විසින් තක්සේරු කරයි. නෙගෙවා ඇති කාල සීමාව සහ ඒවා ආපසු අයකර ගැනීමට ඇති හැකියාවේ අවිනිශ්චිතභාවය සම්බන්ධයෙන් පවත්නා කළමනාකරණය දන්නා වෙනත් සාධක මත එම හානිකරණය ඇස්තමේන්තු කිරීමට තම විනිශ්චයන් කළමනාකරණය විසින් භාවිතා කරනු ලබයි.

(9) විලම්බිත බදු

වත්කම් හා වගකීම් වල බදු පදනමේ හා ගිණුම්කරන පදනමේ වෙනස්කම් වලින් හටගන්නා වූ සියළුම බදුවන හා අඩුකළ හැකි තාවකාලික වෙනස්කම් මත විලම්භිත බදු වත්කම් හා වගකීම් ගණනය කර සහ 24 වන සටහනෙහි අනාවරණය කර ඇත. විලම්භිත බදු තක්සේරු කිරීමේදී, මුල්‍ය ප්‍රකාශන වල හඳුනාගැනීම/අනාවරණය කිරීම සඳහා තාවකාලික වෙනස්කම් අනාගතයේදී බදුවන/අඩුකල හැකි දැයි තීරණය කිරීමට ප්‍රමාණාත්මක විනිශ්චයන් යොදාගෙන ඇත.

(ඇ) උපකල්පන

(1) නිර්ණය කරන ලද ප්‍රතිලාභ සැලැස්ම

ශ්‍රී ලංකාවේ සිට සේවය කරන කාර්ය මණ්ඩලවලට අයත් විශ්‍රාම ප්‍රතිලාභ සැලැස්මෙහි පිරිවැය තීරණය කරෙනුයේ ආයුගණක තක්සේරුවක් යොදා ගැනීමෙනි. එම ආයුගණක තක්සේරුව පදනම් වනුයේ පොළී අනුපාතය, වැටුප් වර්ධන අනුපාතය, විශේෂ වාරික, විශ්‍රාම ගැනීමේ වයස හා සමාගමේ අඛණ්ඩ පැවැත්ම යන කරුණුවලට අදාළ උපකල්පන මතය. සැලසුමෙහි පවත්නා දිගු කාලීන ස්වභාවය හේතුවෙන් එබඳු ඇස්තමේන්තු සැලකිය යුතු මට්ටමේ අවිනිශ්චිතතා වලට යටත් වේ. (2.4.16 සටහන පරිශීලනය කරන්න)

(2) දේපළ, පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය

ස්වාධීන සුදුසුකම් ලත් තක්සේරුකරුවෙකුගේ සේවය ලබා ගනිමින් ඉඩම් සහ ගොඩනැගිලිවල සහ ගුවන් යානා මුළුතැන්ගෙයි උපකරණ ප්‍රත්‍යාගණන අගය මත මනිනු ලැබේ. සාධාරණ අගය තීරණය කිරීම පිණිස එකී තක්සේරුකරු උපකල්පන සහ තක්සේරු ශිල්ප ක්‍රම භාවිතා කරයි. අදාළ තක්සේරු කිරීමේ පදනම 4 වන සටහනෙහි හෙළිදරව් කර ඇත.

## 2.4 වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශය

### 2.4.1 විදේශ ව්‍යවහාර මුදල් පරිවර්තනය

සමූහයේ ක්‍රියාත්මක වන හා ඉදිරිපත් කිරීමේ ව්‍යවහාර මුදල වන ශ්‍රී ලංකා රුපියල් වලින් මුල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර ඇත. විදේශ ව්‍යවහාර මුදලින් සිදුවන ගනුදෙනු ඒවා සිදුවන දිනයට වලංගු ක්‍රියාත්මක ව්‍යවහාර මුදල් අනුපාතයට අනුව මූලික වශයෙන් වාර්තා කරයි. විදේශ ව්‍යවහාර මුදලින් ඇති මුල්‍ය වත්කම් හා වගකීම් වාර්තා කරන දිනයට වලංගු ක්‍රියාත්මක ව්‍යවහාර මුදල් අනුපාතයට නැවත පරිවර්තනය කරනු ඇත. මෙහි ප්‍රතිඵලයක් ලෙස ඇතිවන ලාභ සහ අලාභ, ලාභ හෝ අලාභ ප්‍රකාශනය තුළ හඳුනා ගනු ලැබේ. විදේශ ව්‍යවහාර මුදලක ඓතිහාසික පිරිවැයට ගණනය කෙරෙන මුල්‍යමය නොවන අයිතම අදාළ මුල් ගනුදෙනුව සිදුවූ දිනයේ පැවති විනිමය අනුපාත භාවිතයට ගනිමින් පරිවර්තනය කරනු ලැබේ.

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් ඉතිරි කොටස.

2.4.2 බදුකරණය

(1) ප්‍රවර්තන ආදායම් බදු

සමාගම

*(අ) දේශීය බදුකරණය*

2011 අංක 22 දරන දේශීය ආදායම් (සංශෝධන) පනතින් සංශෝධිත 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ විධිවිධාන යටතේ 2011 අප්‍රේල් 01 දින සිට 2021 මාර්තු 31 දින දක්වා ක්‍රියාත්මක වන දස අවුරුදු බදු නිදහස් කාලයක් සඳහා සමාගම සුදුසුකම් ලැබීය. කෙසේ වෙතත් 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත බලාත්මක වීම සමඟ 2018 අප්‍රේල් 01 දින සිට බලපැවැත්වෙන පරිදි සියළුම ව්‍යාපාර කටයුතු සඳහා ආදායම් බදු ගෙවීමේ වගකීමක් සමාගමට ඇත.

*(ආ) විදෙර බදුකරණය*

ද්විත්ව බදු ගිවිසුම් ක්‍රියාත්මක නොවන රටවල් තුල තම මෙහෙයුම් කටයුතු මත බදු ගෙවීමට සමාගම වගකීමට යටත්වේ. කෙසේ වුවද, සමාගමට ඇති ඉදිරියට ගෙන ගිය බදු අලාභ හේතුවෙන් ප්‍රවර්තන වර්ෂය තුල සමාගම සම්බන්ධ කිසිදු වගකීමක් නොමැත.

පරිපාලිත සමාගම - ශ්‍රී ලංකන් කේටරින් ලිමිටඩ්

ආදායම් බදු වියදම් තුළ ප්‍රවර්තන හා විලම්භිත බදු අඩංගුවේ. හිමිකම තුළ හඳුනාගත යුතු හිමිකම තුළ සෘජුවම හඳුනා ගැනෙන අයිතමයන් හැර ආදායම් බදු වියදම ලාභය හෝ අලාභය තුල හඳුනා ගැනේ.

ආයෝජන මණ්ඩලය සමඟ ඇතිකර ගත් ගිවිසුම අනුව, ගුවන්යානා තුළ වූ මුළුතැන් ගෙවල්වලින් හා ගුවන් මඟී මාර්ගස්ථ අවන්හලෙන් උපයන ආදායම 2021 මැයි මස 31 දින දක්වා ආදායම් බද්දෙන් නිදහස් වේ. වෙනත් ප්‍රභවයන් වෙතින් උපයන ආදායම සාමාන්‍ය බදු අනුපාත යටතේ බද්දට වගකීමෙන් බැඳේ.

(2) විලම්භිත ආදායම් බදු

වත්කම් හා වගකීම් වල බදු පදනමේ හා ඒවායේ මූල්‍යමය වාර්තාකරණ කාර්යයන් සඳහා වූ ධාරණ අගයන් අතර වාර්තා කරන දිනට පවත්නා තාවකාලික වෙනස්කම් පිලිබඳ වගකීම් ක්‍රමවේද භාවිතා කරමින් විලම්භිත ආදායම් බදු සම්පාදනය කරයි.

2.4.3 දේපළ, පිරියත හා උපකරණ

*(අ) පිරිවැය හා තක්සේරු කිරීම*

දේපළ, පිරියත හා උපකරණ වල සියලුම අයිතම මූලික වශයෙන් පිරිවැයට වාර්තා කරනු ලබයි. අත්කර ගැනීම් හෝ ඉදිකිරීම සඳහා සෘජුව ආරෝපණය කල හැකි වියදම් පිරිවැයට ඇතුලත්වේ. ඉඩම් හා ගොඩනැගිලි සහ ගුවන්යානා මුළුතැන්ගෙයි උපකරණ යනාදිය පසුකාලීනව ප්‍රත්‍යාගණනය කරන අතර එම ප්‍රත්‍යාගණිත දේපළ, පිරියත හා උපකරණ යම් ක්ෂයවීම් හා හානිකරණයන් අඩුකළ ප්‍රත්‍යාගණිත අගයට ඉදිරියට ගෙන යනු ලැබේ. අනෙකුත් සියලු දේපළ, පිරියත හා උපකරණ ක්ෂයවීම් හා/හෝ සමුච්චිත හානිකරණ අලාභ වෙතොත් ඒවාද අඩුකළ ඓතිහාසික පිරිවැය මත වාර්තා කරයි.

සමාන වත්කමකට අයත් මීට පෙර ලාභ හෝ අලාභ ප්‍රකාශනයෙහි හඳුනාගෙන ඇති ප්‍රත්‍යාගණන අඩුවීමක් කරා එය ප්‍රතිවර්තනය වනතාක් දුරකට හැරුණුවිට, ඉඩම් හා ගොඩනැගිලි සහ ගුවන් යනාස්ථ මුළුතැන්ගෙහි උපකරණ ප්‍රත්‍යාගණන අගයට මිනුම්කරණය කරන අතර ඕනෑම ප්‍රත්‍යාගණන අතිරික්තයක් වෙනත් විස්තීරණ ආදායම් තුල හදුනාගන්නා අතර සහ හිමිකම තුළ වූ ප්‍රත්‍යාගණන සංචිතය තුළ සමුච්චිත කරනු ලැබේ. ප්‍රත්‍යාගණන ඌනතාවයක් ලාභ හෝ අලාභ ප්‍රකාශ තුළ හඳුනා ගැනෙනුයේ, වත්කම් ප්‍රත්‍යාගණන සංචිත තුල හඳුනා ගනු ලබා ඇති එම වත්කමට අදාළ දැනටමත් පවත්නා අතිරික්තයක් එය හිලව් කරන තාක් දුරකටය. ප්‍රත්‍යාගණිත වත්කමක සාධාරණ අගය එහි ධාරණ අගයට විශාල වෙනසක් සිදුනොකරන බවට සහතික වනු පිණිස වත්කම් තක්සේරු කටයුතු ප්‍රමාණවත් ලෙස සිදු කෙරේ. අදාළ අයිතමය ආශ්‍රිත අනාගත ආර්ථික ප්‍රතිලාභ සමාගම වෙත ගලා ඒ නම් හෝ අදාළ පිරිවැය විශ්වාසදායක අයුරින් මැනිය හැකි නම් පසුව ඇතිවන පිරිවැය අදාළ වත්කමෙහි ධාරණ අගය තුළ අන්තර්ගත කිරීම හෝ වෙනමම වත්කමක් ලෙස හඳුනා ගැනේ.

අලුත්වැඩියා හා නඩත්තු පිරිවැය ඒවා දරනු ලබන කාලපරිච්ඡේදය තුළ ලාභ හෝ අලාභ ප්‍රකාශනයට අය කෙරේ.

දේපළ, පිරියත හා උපකරණ තුළ පහත සඳහන් අනෙකුත් දෑ ඇතුලත් වේ.

*(1) ගුවන්යානා භ්‍රමණමය අමතර කොටස්*

ස්පෘශ්‍ය වත්කම් ලෙස සැලකෙන ගුවන්යානා භ්‍රමණමය අමතර කොටස් මූලික වශයෙන් පිරිවැය මත වාර්තා කර එහි ඇස්තමේන්තුගත ඵලදායී ජීවකාලය පුරා ක්ෂය කරනු ලබයි. මෙම අයිතමය "ගුවන්යානා ආශ්‍රිත උපකරණ" යටතේ වර්ග කර ඇත.

*(2) ප්‍රාග්ධන නොනිම්*

ප්‍රාග්ධන නොනිම් ඒවා අත්කරගත් දිනයේ සිට වැඩ ස්ථාපන දිනය දක්වා දරන ලද සියලු වියදම් ඇතුළත් පිරිවැයට වාර්තා කරයි. වැඩ ස්ථාපනය කළ විට ප්‍රාග්ධන නොනිම් දේපළ, පිරියත හා උපකරණ යටතේ සුදුසු කාණ්ඩය වෙත මාරු කර එහි ඇස්තමේන්තු ගත ඵලදායී ජීවකාලය පුරා ක්ෂය කරනු ලබයි.

(ආ) ක්ෂයවීම

සින්නක්කර ඉඩම් හැරුණු විට සියලුම දේපළ, පිරියත හා උපකරණ යනාදියෙහි පිරිවැය හෝ තක්සේරුව මත සරල මාර්ග ක්‍රමය යොදා ගනිමින් පහත දැක්වෙන ඇස්තමේන්තුගත ඵලදායී ජීවකාලය පුරා සමාන වාරිකවලින් කපා හැරීම සඳහා ක්ෂයවීම් සඳහා වූ ප්‍රතිපාදන ගණනය කරනු ලැබේ.

| | | |
|---|---|---|
| ගුවන් යානා ආශ්‍රිත උපකරණ | - | වසර 08 ක් හෝ කල්බදු කාල සීමාව යන කාල දෙකෙන් අඩු කාල සීමාව පුරා |
| පිරියත හා උපකරණ | - | උපකරණයේ වර්ග මත පදනම්ව වසර 3-10 දක්වා කාලපරිච්ඡේද පුරා |
| ගොඩනැගිලි | - | වසර 15 සිට 50 දක්වා අපේක්ෂිත ඵලදායී ජීවකාලය පුරා |

මෙහෙයුම් කල්බදු මත වූ ගුවන්යානා වැඩිදියුණු කිරීම් - වසර 10 ක් හෝ කල්බදු කාල සීමාව යන කාල දෙකෙන් අඩු කාල සීමාව පුරා

සුන්බුන් අගය, ඵලදායී ජීවකාලය හා ක්ෂය කිරීමේ ක්‍රමය එක් එක් වාර්තාකරණ දිනට සමාලෝචනය කරන අතර සුදුසු පරිදි අදාළ ගැලපීම් සිදුකරයි.

ඉහත සඳහන් ක්ෂය කිරීම් අනුපාත ඉදිරිපත් කළ සියලු කාලපරිච්ඡේදවලට අදාළ වේ.

(ඇ) හඳුනා නොගැනීම

කිසියම් දේපළ,පිරියත හා උපකරණ අයිතමයක් එහි භාවිතයෙන් හෝ ඉවත් කිරීමෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභ ඇති නොවන විට හෝ එය ඉවත් කිරීම මත හඳුනාගනු නොලැබේ. යම් වත්කමක් එසේ හඳුනා නොගැනීමෙන් ඇතිවන ඕනෑම ලාභයක් හෝ අලාභයක් (ඉවත් කිරීමෙන් ලද ශුද්ධ මුදල සහ වත්කමේ ධාරණ අගය අතර වෙනස ලෙස ගණනය කළ) අදාළ වත්කම හඳුනා නොගන්නා වර්ෂයේ ලාභ හෝ අලාභ ප්‍රකාශනයෙහි අන්තර්ගත කරයි.

### 2.4.4 අස්පෘශ්‍ය වත්කම්

කිසියම් වත්කමක් නිසා ඇතිවන අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනය වෙත ගලාඒම සහ එවැනි වත්කම්වල පිරිවැය විශ්වාසදායක ලෙස ගණනය කල හැකි නම් අස්පෘශ්‍ය වත්කම් හඳුනා ගනු ලැබේ. ඒ අනුව සමුච්චිත ක්‍රමක්ෂය හා සමුච්චිත හානිකරණ අලාභ අඩුකළ පිරිවැය මත මෙම වත්කම් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයෙහි වාර්තා කරයි.

අදාළ දෘඩාංග අයිතමයකින් වෙන්කරගත හැකි පරිගණක මෘදුකාංග යක් අත්කර ගැනීමේ හෝ වැඩිදියුණු කිරීමේ පිරිවැය වෙන් වෙන් වශයෙන් ප්‍රාග්ධනිත කරනු ලබන අතර එය සරල මාර්ග පදනම මත වසර 05 ක් නොඉක්මවන කාලයක් පුරා ක්‍රමක්ෂය කරනු ලැබේ. ක්‍රමක්ෂය කාලච්ඡේදය හා ක්‍රමක්ෂය කිරීමේ ක්‍රමය එක් එක් වාර්තා කරන දිනට සමාලෝචනය කරනු ලබයි. මෙම වත්කමේ ධාරණ අගය ආපසු අයකර ගත නොහැකි බව යම් අවස්ථාගත සිදුවීම් හා වෙනස්කම් අනුව පෙනී යන්නේ නම් හානිකරණය සඳහා එම වත්කමේ ධාරණ අගය සෑම වාර්තාකරණ දිනයකදීම සමාලෝචනය කරනු ලබයි.

### 2.4.5 කල්බදු

(අ) මෙහෙයුම් කල්බදු

කල්බදු කාලසීමාව තුළ සියලුම අවදානම් හා ප්‍රතිලාභ වල හිමිකාරීත්වය ප්‍රමාණවත්ව කල්බදු දීමනාකරු විසින් ක්‍රියාකාරීව රඳවා ගන්නා කල්බදු, මෙහෙයුම් කල්බදු ලෙස සැලකේ. වෙනත් ක්‍රමවත් පදනමක් තුලින් භාවිතා කරන්නන්ගේ ප්‍රතිලාභ කාල රටාව සම්බන්ධයෙන් වැඩි නියෝජනයක් නොකරන්නනේ නම් හැර මෙහෙයුම් කල්බදු ගෙවීම්, කල්බදු කාල සීමාව පුරා සරල මාර්ග පදනමක් මත ලාභ හෝ අලාභ ප්‍රකාශනය තුළ මෙහෙයුම් වියදමක් ලෙස හඳුනාගනී.

මෙහෙයුම් කල්බදු යටතේ වත්කම් නැවත සකස් කිරීමේ පිරිවැයන් ප්‍රාග 'ධනිත කරනු ලබන අතර ඵලදායී ජීවකාලය හෝ ඉතිරි කල්බදු කාලය යන දෙකෙන් අඩු කාලසීමාව පුරා ක්ෂය කරනු ලැබේ. 2.4.3 දරන ගිණුම්කරන ප්‍රතිපත්තිය පරිශීලනය කරන්න

(ආ) මූල්‍ය කල්බදු

කල්බදු දුන් අයිතමයේ සියලුම අවදානම් හා ප්‍රතිලාභ හිමිකාරීත්වය සමූහයට පවරනු ලබන කල්බදු දේපළෙහි සාධාරණ අගය හෝ ඊට වඩා අඩු අගයක් ගන්නේ නම් අවම කල්බදු ගෙවීම් වල සාධාරණ අගය කල්බද්දේ ආරම්භක අවස්ථාවේදීම ප්‍රාග්ධනිත කෙරේ. වගකීම් ඉතිරි ශේෂය මත ස්ථාවර පොළී අනුපාතයක් අත්කර ගැනීමට මූල්‍ය ගාස්තු සහ කල්බදු වගකීමේ අඩුවීම අතර කල්බදු ගෙවීම් විභජනය කරයි. මූල්‍ය ගාස්තු ලාභ හෝ අලාභ ප්‍රකාශනයෙහි මූල්‍ය පිරිවැය තුල හඳුනාගනී.

ප්‍රාග්ධනිත කල්බදු වත්කම් දේපළ ,පිරියත හා උපකරණ ලෙස හෙළිදරව් කරන අතර කල්බදු වත්කම භාවිතා කිරීමෙන් සමූහය ප්‍රතිලාභ අපේක්ෂා කරන කාලසීමාව පුරා ක්ෂය කරනු ලබයි. 2.4.3 දරන ගිණුම්කරන ප්‍රතිපත්තිය පරිශීලනය කරන්න

(ඇ) විකිණීම හා ආපසු බදුදීම

මෙහෙයුම් කල්බද්දක ප්‍රතිඵලයක් ලෙස විකුණුම් හා ආපසු බදුදීම් සම්බන්ධ ගණුදෙනු නිසා ඇතිවන ලාභ, විකුණුම් වලින් ලැබෙන මුදල් ප්‍රමාණය අදාළ වත්කම් වල සාධාරණ අගය නොඉක්මවන තෙක් එසැනින් ලාභ හෝ අලාභ ප්‍රකාශනය තුළ හඳුනා ගනු ලැබේ.

### 2.4.6 තොග

ගුවන් යානා හා ගොඩබිම් සේවා ආශ්‍රිත තොග අමුද්‍රව්‍ය සහ පාරිභෝජන ද්‍රව්‍ය යනාදියෙන් තොග සමන්විත වේ.

තොග වාර්තා කරනුයේ පිරිවැය අගය හා ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගය මතය. තොග වල පිරිවැය යනු සියලු ගැනුම් පිරිවැය, පරිවර්තන පිරිවැය හා එම තොග වර්තමාන තත්ත්වයට ගෙන ඒම සඳහා දරන ලද අනෙකුත් වියදම්ය.

තොග වල පිරිවැය ගණනය කිරීම සඳහා බර තැබූ සාමාන්‍ය පිරිවැය ක්‍රමය යොදා ගැනේ. සියලුම ඇස්තමේන්තුගත සම්පූර්ණ කිරීමේ පිරිවැය හා විකුණුමක් සිදුකිරීම සඳහා අවශ්‍යවන්නා වූ පිරිවැය අඩුකරන ලද ඇස්තමේන්තුගත විකුණුම් මිල ශුද්ධ උපලබ්ධි අගය නියෝජනය කරයි.

### 2.4.7 මූල්‍යමය නොවන වත්කම් හානිකරණය

කිසියම් වත්කමක් හානිකරණය වූ බවට හැඟවීමක් ඇත්දැයි පරීක්ෂා කිරීමට සමූහය විසින් එක් එක් වාර්තා කරන දිනට තක්සේරුවක් සිදුකරයි. එබඳු යම් හැඟවීමක් වෙතොත් හෝ යම් වත්කමක් සඳහා වාර්ෂික හානිකරණය පරීක්ෂණයක් අවශ්‍ය වන විට හෝ වත්කමෙහි ආපසු අයකරගත මුදල පිළිබඳව සමූහය විසින් තක්සේරුවක් සිදුකරයි. වත්කමක ධාරණ අගය එහි ආපසු අයකරගත හැකි අගයෙහි ප්‍රමාණය ඉක්මවන්නේ නම් වත්කම හානිකරණයට පත්ව ඇතැයි සලකන අතර එය ආපසු අයකරගත හැකි අගය දක්වා කපා හැරේ. දේපළ, පිරියත සහ උපකරණ යටතේ ඇති රෝටබල් සහ ගුවනයානා මත උසස්කිරීම් වැනි ගුවන්යානා ආශ්‍රිත වත්කම් සම්බන්ධයෙන් කළමනාකරණය විසින් හානිවීම තක්සේරු කරනු ලබන්නේ වත්කමින් වත්කම පදනම මත භෞතික හානි, ගුවන්යානා නැවත භාරදීම මත වෙනත් ගුවන් යානා සඳහා භාවිත කළ නොහැකි කල් ඉකුත් වීම වැනි ඉංජිනේරුවන් විසින් හඳුනාගනු ලබන දර්ශකයන් ආශ්‍රයෙනි.

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් ඉතිරි කොටස.

### 2.4.8 සාධාරණ අගය මිනුම්කරණය

සමූහය විසින් ඉඩම් හා ගොඩනැගිලි සහ ගුවන්යානා මුළුතැන්ගෙයි උපකරණ සාධාරණ අගය අනුව මිනුම්කරණය කරයි. සාධාරණ අගය ආශ්‍රිත අනාවරණය කිරීම් 4 වන සටහනෙහි අනාවරණය කර ඇත.

සාධාරණ අගය යනු එය මනිනු ලබන දිනකදී වෙළෙඳපොළේ සහභාගිවන්නන් අතර නිසි ගණුදෙනුවක් තුළින් වත්කමක් විකිණීම සඳහා ලැබිය හැකි හෝ වගකීමක් පැවරීම සඳහා ගෙවනු ලබන මිලයි. සාධාරණ අගය මැනීමේ පදනම වනුයේ යම් වත්කමක් විකිණීම හෝ යම් වගකීමක් පැවරීම

- වත්කම් හෝ වගකීම් සඳහා මූලික වෙළෙඳපොළකදී හෝ
- මූලික වෙළෙඳපොළක් නොමැති විට අදාළ වත්කම හෝ වගකීම සඳහා වන වඩාත් වාසි සහගතම වෙළෙඳපොළකදී සිදුවේ යැයි යන පූර්ව නිගමනය මතය.

සමූහයට මූලික වෙළෙඳපොළ හෝ වඩාත් වාසි සහගතව වෙළෙඳපොළ වෙත ප්‍රවේශය සලසා ගත හැකි විය යුතුය.

එබඳු වත්කම්වල සාධාරණ අගය මිනුම්කරණය කරනුයේ වෙළෙඳපොළ සහභාගිවන්නන් තම හොඳම ආර්ථික අභිලාෂයන් තුළ ක්‍රියා කරනු ඇතැයි සිතමින් අදාළ වත්කම හෝ වගකීම මිල කිරීමේදී වෙළෙඳපොළ සහභාගිවන්නන් භාවිතා කරනු ඇතැයි යන උපකල්පන භාවිතා කරමිනි.

මූල්‍ය නොවන වත්කමක සාධාරණ අගය මිනුම්කරණයේදී වත්කමක එහි ඉහළම සහ හොඳම භාවිතය සිදුකළ හැකි වෙළෙඳපොළ සහභාගිවන්නකුට විකිණීමෙන් හෝ ඉහළම සහ හොඳම භාවිතය සිදුකළ හැකි පරිදි භාවිතයෙන් ආර්ථික ප්‍රතිලාභ උත්පාදනය කිරීමෙහිලා වෙළෙඳපොළ සහභාගිවන්නකුට ඇති හැකියාව පිළිබඳ සැලකිල්ල යොමු කරයි.

සාධාරණ අගය මැනීමට, අදාළ පරිදි නිරීක්ෂණය කල හැකි යෙදවුම්වල භාවිතය උපරිම තත්ත්වයට ගෙන ඒමට සහ නිරීක්ෂණය කල නොහැකි යෙදවුම්වල භාවිතය අවම තත්ත්වයට ගෙන ඒමට අවශ්‍ය ප්‍රමාණවත් දත්ත පවතින අතර අවස්ථානුකූලව ගැලපෙන මිනුම්කරණ ශිල්ප ක්‍රම සමූහය විසින් යොදා ගනු ලබයි.

සමස්තයක් වශයෙන් සාධාරණ අගයමිනුම්කරණයේදී වැදගත්වන අඩුම මට්ටමේ යෙදවුම් මත පදනම්ව සාධාරණ අගය මනිනු ලබන සියලු වත්කම් සාධාරණ අගය ධූරාවලිය තුළ පහත විස්තර කර ඇති පරිදි වර්ගීකරණය කරයි.

- 01 වන මට්ටම - අනන්‍ය වත්කම් හෝ වගකීම් සඳහා සක්‍රීය වෙළෙඳපොලවල් තුළ වූ ලැයිස්තුගත (නොගැලපූ) වෙළෙඳපොළ මිල ගණන්
- 02 වන මට්ටම - සෘජුව හෝ වක්‍රව නිරීක්ෂණය කළ හැකි සාධාරණ අගය මැනීම සඳහා වැදගත් වන අඩුම මට්ටමේ යෙදවුම් සඳහා තක්සේරු ශිල්ප ක්‍රම
- 03 වන මට්ටම - නිරීක්ෂණය කළ නොහැකි සාධාරණ අගය මැනීම සඳහා වැදගත් වන අඩුම මට්ටමේ යෙදවුම් සඳහා තක්සේරු ශිල්ප ක්‍රම

පුනරාවර්තන පදනමක් මත මූල්‍ය ප්‍රකාශනවල හඳුනා ගැනෙන වත්කම් හා වගකීම් සඳහා එක් එක් වාර්තා කිරීමේ කාලපරිච්ඡේදයන් අවසානයේ වර්ගීකරණය නැවත තක්සේරුවක් (සමස්තයක් වශයෙන් සාධාරණ අගය මැනීම සඳහා වැදගත් වන අඩුම මට්ටමේ යෙදවුම් මත පදනම්ව) මගින් ධූරාවලියෙහි මට්ටම අතර පැවරීම සිදුවී ඇත්ද යන්න සමූහය තීරණය කරනු ලබයි.

දේපළ, පිරියත හා උපකරණ වැනි වැදගත් වත්කම් තක්සේරු කිරීම සඳහා බාහිර තක්සේරුකරුවන් සම්බන්ධ වේ. බාහිර තක්සේරුකරුවන් තෝරාගැනීමේ නිර්ණායකවල වෙළෙඳපොළ දැනුම, කීර්තිමත්භාවය, ස්වාධීනත්වය සහ වෘත්තීය ප්‍රමිතීන්ට අනුව කටයුතු ඉටු කරන්නේද යන දෑ ඇතුලත් වේ. බාහිර තක්සේරුකරුවන් සමඟ සාකච්ඡා කිරීමෙන් පසුව එක් එක් කාරණය සම්බන්ධයෙන් කුමන ශිල්ප ක්‍රමය සහ යෙදවුම භාවිතයට ගන්නේද යන්න පිළිබඳව සමූහය තීරණය කරයි.

සාධාරණ අගය හෙළිදරව් කිරීමේ අරමුණ සඳහා වත්කමට හෝ වගකීමට අදාළ ස්වභාවය, ගති ලක්ෂණ හා අවදානම් මෙන්ම ඉහත විස්තර කර ඇති පරිදි සාධාරණ අගය ධූරවලියේ මට්ටම යන කරුණු මත පදනම්ව සමූහය විසින් වත්කම් හා වගකීම් වල කාණ්ඩය නිශ්චය කරනු ලැබේ.

### 2.4.9 මූල්‍ය උපකරණ - මූලික හඳුනාගැනීම හා පසුකාලීන මිනුම්කරණය

#### 2.4.9.1 මූල්‍ය වත්කම්

මූල්‍ය උපකරණයෙහි ගිවිසුම්ගත ප්‍රතිපාදන සදහා සමූහය පාර්ශවකරුවකු වන විට පමණක් මූල්‍ය තත්ත්වය ප්‍රකාශනයෙහි මූල්‍ය වත්කම් හඳුනාගනී. ලාභ හෝ අලාභ හරහා සාධාරණ අගය ලෙසත්, ණය හා ලැබිය යුතු දෑ ලෙසත්, පරිණතවීම තෙක් රඳවා ගන්නා ආයෝජන ලෙසත්, අලෙවිය සඳහා පවතින ලෙසත් සුදුසු පරිදි මූල්‍ය වත්කම් වර්ගීකරණය කරයි. කළමණාකරණය විසින් මූල්‍ය වත්කම් වර්ගීකරණය එහි මූලික හඳුනාගැනීමේදී නිශ්චය කරන අතර එම වර්ගීකරණය රඳා පවතිනුයේ වත්කමෙහි ස්වභාවයත් වත්කම් අත්පත් කරගනු ලැබූ අරමුණත් මතය.

සියලුම මූල්‍ය වත්කම් මූලික වශයෙන් හඳුනාගනු ලබන්නේ සාධාරණ අගයටය.

ණය හා ලැබිය යුතු දෑ වලින් සමූහයේ මූල්‍ය වත්කම් අන්තර්ගත වේ. එම අයිතම වල පසුකාලීන මිනුම්කරණය, හානිකරණය සහ හඳුනානොගැනීම පිළිබඳ සමූහයේ ප්‍රතිපත්තිය පහත දැක්වේ.

*(අ) ණය සහ ලැබිය යුතු දෑ*

ණය සහ ලැබිය යුතු දෑ යනු සක්‍රීය වෙළෙඳපොලක් තුළ ලැයිස්තුගත නොකළ ස්ථිර හෝ නිශ්චය කළ හැකි ගෙවීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම්ය. එවැනි වත්කම් මූලික මිනුම් කිරීමෙන් පසුව සඵල පොළී අනුපාත ක්‍රමය යොදාගනිමින් ක්‍රමක්ෂය පිරිවැයට පසුකාලීන මිනුම්කරනය කරයි.

*(ආ) හඳුනානොගැනීම*

පහත දැක්වෙන අවස්ථා වලදී මූල්‍ය වත්කම් හඳුනාගනු නොලැබේ.

- වත්කම් වලින් මුදල් ප්‍රවාහ ලබාගැනීමේ අයිතිවාසිකම් අවසන් වී ඇති විට.
- වත්කම් වලින් මුදල් ප්‍රවාහ ලබාගැනීමේ තම අයිතිවාසිකම් සමූහය විසින් පවරා දෙනු ලැබ ඇති හෝ ලැබූ මුදල් ප්‍රවාහ යම් පැවරුම් වැඩපිළිවෙලක් යටතේ සැලකිය යුතු ප්‍රමාදයකින් තොරව තෙවන පාර්ශවයකට සම්පූර්ණයෙන් ගෙවීම සඳහා යම් බැඳියාවකින් බැඳී ඇති විට සහ (අ) වත්කම නිසා උද්ගතවන සියලු අවදානම් හා ප්‍රතිලාභ සමූහය විසින් සැලකිය යුතු අයුරින් පවරා දෙනු ලැබ ඇති විට හෝ (ආ) වත්කමේ සියලු අවදානම් හා ප්‍රතිලාභ සමූහය විසින් සැලකිය යුතු අයුරින් පවරා දෙනු ලැබ හෝ රඳවා ගනු ලැබ නොමැති මුත් අදාල වත්කමේ පාලනය පවරා දෙනු ලැබ ඇති විට.

*(ඇ) මූල්‍ය වත්කම් හානිකරණය*

යම් මූල්‍ය වත්කමක් හෝ වත්කම් සමූහයක් හානිකරණයට පත්වන වාස්තවික සාක්ෂි කිසියක් පවතීදැයි එක් එක් වාර්තා කරන දිනයට ව්‍යාපාර සමූහය තක්සේරුවක් සිදුකරනු ලබයි. වත්කමෙහි මූලික හඳුනාගැනීමෙන් අනතුරුව හටගත් සිදුවීම් එකක් හෝ කිහිපයක් (දරන ලද පාඩු සිදුවීමක්) හෝ එකී පාඩු සිදුවීම මඟින් මූල්‍ය වත්කමක හෝ මූල්‍ය වත්කම් සමූහයේ ඇස්තමේන්තුගත අරමුදල් ගලනය කෙරෙහි විශ්වාසදායක ලෙස ඇස්තමේන්තු කළ හැකි බලපෑමක් හේතුවෙන් වත්කමක් හානිකරණය වී ඇතැයි කිසියම් වාස්තවික සාක්ෂි ඇති විට පමණක් එම මූල්‍ය වත්කම හෝ මූල්‍ය වත්කම් සමූහය හානිකරණයට පත්ව ඇතැයි සලකනු ලැබේ.

සැලකිය යුතු මූල්‍ය අපහසුතාවලටත්, ගෙවීම් ප්‍රමාද කිරීම්වලටත්, බංකොලොත්භාවය හෝ වෙනත් මූල්‍ය ප්‍රතිසංවිධාන වෙත නැඹුරුවීමේ සම්භාවිතාවලටත් ණයගැතියන් හා ණයගැති පිරිස් මුහුණ දී ඇති බව හැඟවෙන ලක්ෂණ නිරූපනය වීම හා අනාගත ඇස්තමේන්තුගත මුදල් ගලනයන්හි සැලකිය යුතු අඩුවීමක් ඇති බවට නිරීක්ෂණය කල හැකි දත්ත නිරූපනය වීම යන කරුණු වත්කම් හානිකරණය වීමේ සාක්ෂි තුළ ඇතුලත් විය හැකිය

*(ඈ) ක්‍රමක්ෂය පිරිවැය මත ඉදිරියට ගෙනා මූල්‍ය වත්කම්*

කිසියම් හානිකරණ අලාභයක් සිදුව ඇති බවට වාස්තවික සාක්ෂි පවතී නම් එම අලාභයට අදාළ අගය මනිනු ලබන්නේ වත්කමෙහි ධාරණ අගය හා අනාගත ඇස්මේන්තු ගත මුදල් ප්‍රවාහයන්හි වර්තමාන අගය අතර වෙනස මතය. අනාගත ඇස්තමේන්තු ගත මුදල් ප්‍රවාහයන්හි වර්තමාන අගය, මූල්‍ය වත්කමේ මුල් සඵල පොළී අනුපාතය මත වට්ටම් කරනු ලැබේ.

වත්කමෙහි ධාරණ අගය දීමනා ගිණුමක් යොදා ගැනීම මඟින් අඩු කරනු ලබන අතර අලාභයේ අගය ලාභ හෝ අලාභ ප්‍රකාශනය තුළ හඳුනාග ැනේ.

හානිකරණය හඳුනාගනු ලැබීමෙන් අනතුරුව හටගත් සිදුවීමක් හේතුවෙන් පසුව එළෙඹෙන වර්ෂයකදී ඇස්තමේන්තුගත හානිකරණ අලාභයේ අගය වැඩි හෝ අඩු වේ නම් දීමනා ගිණුම ගැලපීම මගින් කලින් හඳුනාගත් හානිකරණ අලාභය වැඩි හෝ අඩු කිරීම සිදුකෙරේ. පසුව යම් කපා හැරීමක් ආපසු පියවා ගැනීමක් සිදු කළ හොත් එකී ආපසු ගැනීම ලාභ හෝ අලාභ ප්‍රකාශනයට බැර කරයි.

2.4.9.2 මූල්‍ය වගකීම්

ශ්‍රී .ලං.ගි. ප්‍ර 39 යටතේ වන විෂය පථය තුළ මූල්‍ය වගකීම් වර්ගීකරණය කරනුයේ ලාභ හෝ අලාභ හරහා සාධාරණ අගය ලෙසත්, ණය හෝ ණය ගැනුම් ,වෙනත් මූල්‍ය වගකීම් හෝ ගැලපෙන පරිදි ඵලදායී ආරක්ෂණ ඇතුලත් ආරක්ෂණ උපකරණ ලෙස නම් කල ව්‍යුත්පන්න ලෙසය. සමූහය මූලික හඳුනාගැනීමේදී ඒවායේ මූල්‍ය වගකීම් වර්ගීකරණය තීරණය කරයි.

සියලුම මූල්‍ය වගකීම් මූලික අවස්ථාවේදී හඳුනාගැනෙනුයේ සාධාරණ අගයට වන අතර ණය හා ණය ගැනුම් සම්බන්ධයෙන් වන විට ඒවා හඳුනාගැනෙනුයේ ගණුදෙනු වලට සෘජුවම ඇතුලත් කල හැකි වියදම් මත ශුද්ධ අගයටය.

සමූහයේ මූල්‍ය වගකීම්වලට වෙළෙඳ හා වෙනත් ගෙවිය යුතු දෑ, බැංකු අයිරා , ණය හා ණය ගැනුම් සහ මූල්‍ය ඇපකර ගිවිසුම් යනාදිය ඇතුළත් වේ.

මූල්‍ය වගකීම් වල පසුකාලීන මිනුම්කිරීම රඳා පවතිනුයේ පහත විස්තර කර ඇති පරිදි ඒවායේ වර්ගීකරණය මතය.

*(අ) පසුකාලීන මිනුම්කරණය*

මූලික හඳුනාගැනීමෙන් අනතුරුව පොළී දරන ණය හා ණය ගැනුම් පසුකාලීන මිනුම්කරනයට ලක් කරනුයේ සඵල පොළී අනුපාත ක්‍රමය යොදා ගනිමින් ක්‍රමක්ෂය පිරිවැයටය.

*(ආ) හඳුනා නොගැනීම*

යම් වගකීමක බැඳියාව නිදහස් කරන හෝ අවලංගු කරන හෝ යල්පැන ගිය විට මූල්‍ය වගකීමක් හඳුනා නොගනී.

දැනටමත් පවත්නා මූල්‍ය වගකීමක් වෙනුවට සැලකිය යුතු වෙනස් කම් සහිත කොන්දේසි මත එකම ණය සැපයුම්කරුවකුගෙන් වෙනත් මූල්‍ය වගකීමකින් ප්‍රතිස්ථාපනය වේ නම් හෝ දැනටමත් පවත්නා වගකීමක කොන්දේසි සැලකිය යුතු ලෙස ප්‍රතිශෝධනය වේ නම් එබඳු හුවමාරුවක් හෝ ප්‍රතිශෝධනය කිරීමක් මුල් වගකීම හඳුනා නොග ැනීමක් ලෙසත් නව වගකීමක් හඳුනාගැනීමක් ලෙසත් සලකනු ලැබේ. අදාළ ධාරණ අගයන්හි වෙනස ලාභ හෝ අලාභ ප්‍රකාශනයෙහි හඳුනා ගනු ලැබේ.

*(ඇ) මූල්‍ය උපකරණ හිලව් කිරීම*

මූල්‍ය වත්කම් හෝ වගකීම් හිලව් කර සහ ශුද්ධ අගය මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි වාර්තා කරනුයේ

- හඳුනාගත් මුදල් ප්‍රමාණ හිලව් කිරීම සඳහා දැනට බලාත්මක කළ හැකි යම් නෛතික අයිතිවාසිකමක් හා
- ශුද්ධ පදනමක් මත පියවීමට හෝ වත්කම් උපලබ්ධි කිරීමට හෝ වගකීම් පියවීමට යම් අභිප්‍රායක් තිබේ නම් පමණි.

## මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් ඉතිරි කොටස.

### 2.4.9.3 මුදල් ප්‍රවාහ සුරක්ෂාකරන සංචිතය

හඳුනාගන්නා ලද ස්වකීය විදේශ ව්‍යවහාර මුදල් ණය ප්‍රමාණයන්, ඉහළ සම්භාවිතාවක් සහිතව විශේෂයෙන් හඳුනාගත් ස්වකීය විදේශ ව්‍යවහාර මුදල් ආශ්‍රිතව ඉපැයෙන් අනාගත ආදායම් වලට එරෙහිව සුරක්ෂාකරණ උපකරණයක් ලෙස සමාගම විසින් නම්කර ඇත. විදේශ විනිමය අනුපාත තුළ සිදුවන උච්චාවචන හේතුවෙන් හඳුනාගත් විදේශ ව්‍යවහාර මුදල් ණය අගයන් වෙනස්වීමෙහි අවදානම හරහා සමාගම සුරක්ෂාකරණය කරන ලදී.

සුරක්ෂාකරණ උපකරණය මත සිදුවන ලාභය හෝ අලාභයේ ඵලදායී කොටස් අයත් වෙනත් විස්තීර්ණ ආදායමෙහි මුදල් ප්‍රවාහ සුරක්ෂාකරණ සංචිතයෙහි සෘජුවම හඳුනා ගැනෙන අතර යම් ඵලදායී නොවන කොටසක් වේතොත් එය වෙනත් මෙහෙයුම් ලෙස ලාභ අලාභ ප්‍රකාශනය තුල වහා හඳුනාගැනේ. වෙනත් විස්තීර්ණ ආදායම ලෙස හඳුනාගත් අගයන් මුදල් ප්‍රවාහ සුරක්ෂාකරණ ගණුදෙනුව සිදුවන විට (පුරෝකථනය කරන ලද ආදායම ලැබෙන උපලබ්ධි වන විට) ලාභ අලාභ ප්‍රකාශනය වෙත මාරු කරනු ලැබේ. පුරෝකථනය කරන ලද ගණුදෙනුව සිදුවනු ඇතැයි තවදුරටත් අපේක්ෂා නොකරන්නේ නම් වෙනත් විස්තීර්ණ ආදායම තුළ කලින් හඳුනා ගත් සමුච්චිත ලාභය හෝ අලාභය ලාභ අලාභ ප්‍රකාශනය වෙත මාරු කරයි. සුරක්ෂාකරණ උපකරණ කල් ඉකුත් වුවහොත් හෝ විකුණනු ලැබුවහොත් හෝ අවසන් කර දමන ලද හොත් හෝ ප්‍රතිසම්පාදනයකින් හෝ පෙරළටනයකින් තොරව ක්‍රියාත්මක කරනු ලැබුවහොත් හෝ අවලංගු කල සුරක්ෂාකරණයක් වශයෙන් නම්කරයි නම් වෙනත් විස්තීර්ණ ආදායම තුළ කලින් හඳුනා ගත් යම් සමුච්චිත ලාභ හෝ අලාභ අදාළ සුරක්ෂාකරණ ගිවිසුමට අනුව පුරෝකථනය කරන ලද ගනුදෙනුව සිදුවන තෙක් හිමිකම තුළ රඳවා ගනී.

### 2.4.10 ගුවන්යානා නඩත්තු සංචිතය

මෙහෙයුම් කල්බදු ගිවිසුම් අනුව ගුවන් යානා එන්ජින්, ගුවන්යානා සැකිලි සහ ගුවන්යානා අංගෝපාංග යනාදියෙහි පිරිවැඩියා සඳහා මාසික පදනමක් මත කල්බදුකරුවන් වෙත කරන ගෙවීම් වලින් ගුවන් යානා නඩත්තු සංචිතය සමන්විත වේ. ගුවන්යානා එන්ජින්, ගුවන්යානා සැකිලි සහ ගුවන්යානා අංගෝපාංග පිරිවැඩියා සඳහා දරන ලද වියදම(මෙතෙක් සංචිතයට ගෙවූ ප්‍රමාණයන් දක්වා) අදාළ නඩත්තු කටයුතු නිමවීමෙන් පසුව එකී සංචිත හරහා කල්බදුකරුවන් වෙතින් සමාගම ආපසු අය කර ගනී.

ගුවන්යානා නඩත්තු සංචිතය එහි අදාල ස්වභාවය මත පදනම්ව ණය සහ ලැබිය යුතු දෑ යටතේ වර්ගීකරණය කර ඇති අතර මෙම මූල්‍ය වත්කම් කාණ්ඩය සඳහා අදාළ වන්නා වූ ගිණුම් ප්‍රතිපත්තිය ඉහත 2.4.9.1 (අ) සටහනෙහි සඳහන් කර ඇත.

### 2.4.11 වෙළෙඳ හා වෙනත් ලැබිය යුතු දෑ

තැන්පතු සහ වෙනත් ණය ගැතියන් ඇතුලත් වෙළෙඳ ණයගැතියන් (පිරිවැයට මැන ඇති තැන්පතු හා වෙනත් ලැබිය යුතු දෑ යටතේ වර්ගීකරණය කරන ලද මූල්‍ය නොවන වත්කම් හැර) වර්ගීකරණය කර ගිණුම්ගත කෙරෙනුයේ ණය සහ ලැබිය යුතු දෑ වශයෙනි. අදාළ ස්වභාවය මත පදනම්ව මෙම කාණ්ඩයට අයත් මූල්‍ය වත්කම් සඳහා අදාළ වන ගිණුම් ප්‍රතිපත්තිය ඉහත 2.4.9.1 (අ) සටහනෙහි සඳහන් කර ඇත.

### 2.4.12 ආයෝජන

**පරිපාලිත සමාගමේ ආයෝජනය**

සමාගමේ මූල්‍ය ප්‍රකාශ තුළ පරිපාලිත සමාගම ආශ්‍රිතව සිදුකෙරෙනු ආයෝජන තාවකාලිකව අගය හීන වීම් නොවන හානිකරණයන්ට ශුද්ධ පිරිවැයට ගිණුම් ගත කර ඇත.

### 2.4.13 කෙටි කාලීන ආයෝජන

මාස 03 ට වැඩි පරිණතභාවයක් සහිත බැංකු වල ඇති ස්ථාවර වත්කම් කෙටි කාලීන ආයෝජන වේ. ඒවායේ ක්‍රමක්ෂය පිරිවැය මත කෙටි කාලීන ආයෝජන මිනුම්කරණය කරනු ලැබේ.

### 2.4.14 මුදල් හා මුදල් සමාන දෑ

බැංකුවේ ඇති මුදල්, අතැති මුදල් හා ඉල්ලුම් තැන්පතු සහ දන්නා මුදල් ප්‍රමාණ වලට වහා පරිවර්තනය කළ හැකි හා අගය වෙනස්වීමේ අඩු අවදානමක් ඇති කෙටිකාලීන අධි ද්‍රවශීල ආයෝජන වශයෙන්ද ගෙන හැර දැක්වේ. මුදල් හා මුදල් සමාන දෑ ලෙස අර්ථ නිරූපනය කරයි.

මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි මුදල් හා මුදල් සමාන දෑ වලට හිඟහිටි බැංකු අයිරා සහ අවහිරකල මුදල් වලට ශුද්ධ වූ බැංකුවේ හා අතැති මුදල් ද ඉල්ලුම් තැන්පතු ද ඇතුලත් වේ. කෙටි කල් පිරීමේ කාලයක් සහිත අයෝජනද (එනම් අත්කර ගැනීමේ දිනයේ සිට තෙමසක් කාලයක් හෝ ඊට අඩු) මුදල් සමාන දෑ ලෙස සැලකේ. බැංකු අයිරා අනාවරණය කරනු ලබන්නේ මූල්‍ය තත්ත්වය ප්‍රකාශනය තුල පොළී හරිත වගකීම් යටතේය.

### 2.4.15 ප්‍රතිපාදන

#### I. සාමාන්‍ය

ප්‍රතිපාදන හඳුනාගැනෙනුයේ කිසියම් අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස සමූහය සතුව කිසියම් ප්‍රවර්තන බැඳීමක් (නෛතික හෝ සම්ප්‍රයුක්ත) පවතින අවස්ථාවකදී එය බේරුම් කිරීම සඳහා ආර්ථික ප්‍රතිලාභ වල අන්තර්ගත යම් සම්පත් ගලායෑමක් අවශ්‍ය වන සහ එකී බැඳීමේ වටිනාකම විශ්වාසදායක ඇස්තමේන්තුවක් සිදුකල හැකි විටය. ප්‍රතිපාදන සමහරක් හෝ සියල්ලම ප්‍රතිපූර්ණය කල යුතු යැයි සමූහය අපේක්ෂා කරන්නේ නම් වෙනමම වත්කමක් ලෙස එකී ප්‍රතිපූර්ණය හඳුනා ගැනෙන මුත් එය එසේ කෙරෙනුයේ අදාළ ප්‍රතිපූර්ණය සැබවින්ම නිශ්චිත වූ විට පමණි. ප්‍රතිපූරණයන්ට ශුද්ධව මොනයම් හෝ ප්‍රතිපාදනයකට අදාළ වියදම් ලාභ හෝ අලාභ ප්‍රකාශනය ඉදිරිපත් කරයි.

#### II. ගුවන්යානා නඩත්තු හා පිරිස්සුම් වියදම්

ගුවන්යානා නඩත්තු හා පිරිස්සුම් වියදම් (ගුවන්යානා වල විශාල නඩත්තු කිරීම්, ගුවන්යානා එන්ජින් සහ ගොඩබෑසුම් උපකරණවලට කෙරෙන පිරිවැඩියා කිරීම් හැර) සමූහය විසින් හඳුනාගැනෙනුයේ ඒ සඳහා වියදම් දැරූ පදනමක් මතය. ගුවන්යානා වල විශාල නඩත්තු කිරීම්, ගුවන්යානා එන්ජින් සහ ගොඩබෑසුම් උපකරණවලට කෙරෙන පිරිවැඩියා කිරීම් 2.3(ආ)(iv) වන සටහනෙහි සඳහන් කර ඇති පරිදි ගිණුම්ගත කර ඇත. ,"පැය ගණනට අනුව බලශක්තිය" නෙවන පාර්ශව නඩත්තු ගිවිසුම් මඟින් ආවරණය කල එන්ජින් පිරිවැඩියා පිරිවැයන්

සඳහා අදාළ ගිවිසුම් කාලසීමාව මුළුල්ලේ පැය ගණනට අනුව ගණනය කර එකඟත්වයට පත් ස්ථිර මිල ප්‍රමාණයක් අනුව පිරිවැය වියදම් කරනු ලබයි.

### 2.4.16 විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්

#### (අ) නිර්ණය කරන ලද ප්‍රතිලාභ සැලැස්ම - පාරිතෝෂික

පාරිතෝෂිකය අදාළ අණපනත් ප්‍රකාරව සමාගම සහ පරිපාලිත සමාගම විසින් ගෙවිය යුතු නිශ්චිත ප්‍රතිලාභ සැලැස්මකි. අදාළ නීතීන් යටතේ ඇස්තමේන්තු කරනු ලබන විදේශීය මධ්‍යස්ථාන සඳහා හැර නිර්ණය කරන ලද ප්‍රතිලාභ සැලසුම්වල වර්තමාන අගය සෑම වසරකම ආයුගණකඥයෙකුගේ උපදෙස් සහිතව අනුමානකල ඒකක ණය ක්‍රමය යොදාගනිමින් සමූහය විසින් ගණනය කරනු ලබයි.

සමූහය විසින් නිර්ණය කරන ලද ප්‍රතිලාභ සැලසුම් වලින් ඇතිවන ආයුගණක ලාභ/අලාභ වෙනත් විස්තීර්ණ ආදායම තුළ හඳුනාගන්නා අතර නිර්ණය කරන ලද ප්‍රතිලාභ සැලසුම් වලට අදාළ වියදම් ලාභ හෝ අලාභ ප්‍රකාශනය තුළ හඳුනාගනී.

පාරිතෝෂික වගකීම් බාහිර ලෙසින් අරමුදල් ලබා නොගනී. මෙම අයිතම මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි වෙනත් දිගුකාලීන වගකීම් යටතේ වර්ග කර ඇත. එතෙර ස්ථානගතව රැකියාවේ නිරත සේවක සේවිකාවන් ආවරණය වනුයේ ඔවුන් පදිංචි සත්කාරක රටවලට අදාළ සමාජ ආරක්‍ෂණ යෝජනාක්‍රම යටතේය.

#### (ආ) නිර්ණය කරන ලද දායකත්ව සැලසුම් - සේවක අර්ථසාධක අරමුදල සහ සේවා නියුක්තිභාර අරමුදල

ශ්‍රී ලංකාව තුළ සේවයේ නියුතු සේවා නියුක්තිකයන් අදාළ අණපනත් හා රෙගුලාසි ප්‍රකාරව සේවක අර්ථසාධක අරමුදලේ දායකත්වයන්ට සහ සේවා නියුක්තිභාර අරමුදලේ දායකත්වයන්ට සුදුසුකම් ලබා සිටී. සේවක දළ පාරිශ්‍රමික ප්‍රමාණයෙන් 15% ක් හා 3% ක ප්‍රමාණයක් පිළිවෙලින් සේවක අර්ථසාධක අරමුදලට සහ සේවා නියුක්තිභාර අරමුදලට සමාගම විසින්ද 12% ක් හා 3% ක් වූ ප්‍රමාණය පරිපාලිත සමාගම විසින්ද දායක කරයි.

### 2.4.17 නිරන්තර පියාසර වැඩසටහන

"FlySmiles" යනුවෙන් හඳුන්වනු ලබන නිරන්තර පියාසර වැඩසටහනක් සමාගම විසින් ක්‍රියාත්මක කරනු ලබන අතර එමගින් වැඩසටහනේ සාමාජිකයින්ට සමුච්චිත සැතපුම් ප්‍රමාණය පදනම් කරගනිමින් සංචාරක සම්මාන ප්‍රදානය කරයි. මෙම "FlySmiles" වැඩසටහනේ ප්‍රතිලාභවලට අදාළ මඟී ආදායමෙන් කොටසක් ඒවා උපයෝජනයට ගනු ලබන තෙක් විලම්භනය කර තැබේ. ආදායම් කල් දැමීම ඇස්තමේන්තු කරනුයේ නිදහස් කරගැනීමේ ඓතිහාසික ප්‍රවනතාවය මත පිහිටා වන අතර එය එකී ප්‍රතිලාභවලට අදාළ අපේක්ෂිත උපයෝජනය පුරෝකතනය කිරීම පිණිස යොදා ගෙන ඇත. ප්‍රදානය කරනු ලබන බැරෙහි සාධාරණ වටිනාකම ඇස්තමේන්තු කෙරෙනුයේ ප්‍රදානය කරනු ලබන බැර නිදහස් කරගත හැකි සේවාවල බර තැබූ සාමාන්‍ය අගය සලකමිනි. මෙම ඇස්තමේන්තු එක් එක් වාර්තා කරන දිනට සමාලෝචනය කරනු ලබන අතර අදාළ වගකීම් ඒ අනුව ගලපනු ලැබේ. වැඩසටහන් හවුල්කරුවන්ගේ සේවා භාවිතය හරහා උපචිත වන්නා වූ සහ සහභාගී හවුල්කරුවන් විසින් ගෙවනු ලබන්නා වූ සැතපුම් ප්‍රමාණද ඒවා භාවිතා කරන තෙක් විලම්භිත ආදායම ලෙස ගණනය කරයි. කල් ඉකුත්වීම අපේක්ෂිත සැතපුම් ප්‍රමාණ සඳහා වූ වගකීම හඳුනා නොගැනේ.

### 2.4.18 ආදායම් හඳුනාගැනීම

අදාළ ගෙවීම් සිදුකරන්නේ කෙදිනක ද යන්න නොසලකා සමූහය වෙත ආර්ථික ප්‍රතිලාභ ගලා ඒම තෙක් හා ආදායම විශ්වාසදායක ලෙස මැනීමට හැකිවීම මත, ආදායම හඳුනාගැනේ. ලද හෝ ලැබිය යුතු ප්‍රතිශ්ධාවේ සාධාරණ අගය අනුව ආදායම මනිනු ලැබේ.

#### (අ) ගුවන් සමාගමේ ආදායම

ප්‍රධාන වශයෙන් ආදායම ජනනය කරනුයේ මඟී ප්‍රවාහනය, ගුවන් බඩු, අතිරේක ගමන් මළු හා තැපැල් ප්‍රවාහන, ගුවන්තොටුපල පර්යන්ත සේවා සැපයීම, ඉංජිනේරු සේවා සැපයීම, ගුවන්යානා කුලී පදනම මත සැපයීම හා ආශ්‍රිත සේවා යනාදියෙනි.

1. ගුවන් මඟී, ගුවන් බඩු හා අතිරේක ගමන් මළු විකුණුම් සහ අනෙකුත් අදාළ ගාස්තු හඳුනාගැනෙනුයේ ප්‍රවාහනය/පහසුකම් සපයාදෙන අවස්ථාවේදී උත්ගත වන මෙහෙයුම් ආදායම වශයෙනි. හඳුනා ගැනෙනුයේ ආදාළ ප්‍රවාහනය සපයන අවස්ථාවේදී මෙහෙයුම් ආදායම් වශයෙනි.
2. භාවිතයට නොගත් ගුවන් ප්‍රවේශ පත්‍ර හා ගුවන් මාර්ග බිල්පත්වල අගය ප්‍රවාහන පූර්ව විකුණුම් ලෙස ජංගම වගකීම් වල ඇතුලත් කෙරේ. භාවිතයට නොගත් ගුවන් ප්‍රවේශ පත්‍ර හා ගුවන් මාර්ග බිල්පත් එක් වසරකට පසුව කල් ඉකුත් වී සහ භාවිතයට නොගෙන පවතින්නේ නම් ආදායම වශයෙන් හඳුනාගනී.
3. ගුවන්තොටුපළ පර්යන්ත සේවා මත ආදායම හඳුනාගැනෙනුයේ අදාල සේවා සැපයීමෙන් පසුවය.
4. තෙවන පාර්ශව නඩත්තු සේවා මත ආදායම හඳුනාගැනෙනුයේ එකී කටයුතු නිමවීමෙන් අනතුරුවය.
5. ගුවන් ගමන් මෙහෙයුම් සේවා මත උපයන ආදායම හඳුනාගැනෙනුයේ අදාල සේවා සැපයීමෙන් පසුවය.

#### (ආ) ගුවන් සේවා ආහාරපාන සේවා වලින් ආදායම

**භාණ්ඩ විකිණීම**

හිමිකාරීත්වයට අදාළ සැලකිය යුතු අවදානම් හා ප්‍රතිලාභ ගැණුම්කරු වෙත පැවරෙන විට ආදායම හඳුනාගැනේ. අගය එකතු කල විකුණුම් බදු ආදායමට අන්තර්ගත නොවන අතර ආදායම වෙළෙඳ වට්ටම් අඩු කිරීමෙන් පසු අගයට තීරණය වේ. හිඟ මුදල් ආපසු අයකර ගැනීම සම්බන්ධයෙන්, අදාළ වියදම් හෝ සිදුවිය හැකි භාණ්ඩ හැරවුම් සහ භාණ්ඩ පිළිබඳ අඛණ්ඩ කළමණාකරන සම්බන්ධයෙන් සැලකිය යුතු අවිනිශ්චිතතාවයක් ඇත්නම් ආදායම් කිසිවක් හඳුනා නොගැනේ.

#### (ඇ) ලාභාංශ ආදායම

කොටස් හිමියන්ට අදාළ ගෙවීම් ලැබීමට ඇති අයිතිය තහවුරු කරනු ලැබූ විට ලාභාංශ ආදායම ගිණුම්ගත කරයි.

#### (ඈ) කුළී ආදායම

කුළී ආදායම හඳුනා ගනු ලබන්නේ උපචිත පදනම මතය.

## මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් ඉතිරි කොටස.

(ඉ) පොළී ආදායම

ක්‍රමක්ෂය පිරිවැයට මිනුම් කළ සියළුම මූල්‍ය උපකරණ සඳහා, පොළී ආදායම හෝ වියදම වාර්තා කරනුයේ සඵල පොළි අනුපාතය යොදා ගනිමිනි.

(ඊ) වෙනත් ආදායම්

වෙනත් ආදායම් හඳුනා ගනු ලබන්නේ උපචිත පදනම මතය.

### 2.4.19 වියදම් හඳුනාගැනීම

නිශ්චිත ආදායම් අයිතම වල ඉපැයුම් සහ දරන ලද පිරිවැය අතර පවත්නා සෘජු සම්බන්ධතාවක පදනම මත ලාභ හෝ අලාභ පිළිබඳ ප්‍රකාශනය තුළ වියදම් හඳුනාගනු ලබයි. ව්‍යාපාරය පවත්වාගැනීම යාම සහ දේපළ, පිරියත හා උපකරන කාර්යක්‍ෂම මට්ටමකින් පවත්වාගැනීම සඳහා දරන ලද සියළුම වියදම් ලාභ හෝ අලාභ පිළිබඳ ප්‍රකාශනයට අය කරයි. ලාභ හෝ අලාභ පිළිබඳ ප්‍රකාශනය ඉදිරිපත් කිරීමේ කාර්යය සඳහා " වියදම් හි ස්වභාවය" නැමැති ක්‍රමය අනුගමනය කර ඇති අතර එය අනුගමනය කර ඇත්තේ සමූහයේ කාර්යය සාධනය පිළිබඳව අංග සාධාරණ අයුරින් ඉදිරිපත් කිරීමේ පදනම මතය.

### 2.4.20 ණය ගැනුම් පිරිවැය

අපේක්ෂිත භාවිතයට හා විකිණීම සඳහා සැලකිය යුතු කාලසීමාවක් වැයවන කිසියම් වත්කමක් අත්කර ගැනීමක්, ඉදිකිරීමක් හෝ නිපදවීමක් සඳහා සෘජුවම වෙන්කළ හැකි ණය ගැනුම් පිරිවැය සහ වත්කමේ කොටසක් ලෙස ප්‍රාග්ධනිත කරනු ලබන ඒවා හැර අනෙක් ණය ගැනුම් පිරිවැය ඒවා දරන ලබන කාලසීමාව තුළ වියදමක් ලෙස හඳුනාගනී.

### 2.4.21 ආංශික වාර්තාකරණය

අංශයක් යනු සමූහය සම්බන්ධයෙන් හඳුනාගනු ලැබිය හැකි එක්තර අංශයක් වන අතර අනෙකුත් අංශවලට වඩා වෙනස් ස්වරූපයක් ගත් අවදානම් හා ප්‍රතිලාභ වලට යටත් විශේෂිත ආර්ථික පරිසරයක් තුළ සේවා සැපයීමේ නිරත වේ.

සමාගමේ අවදානම හා ප්‍රතිලාභ අනුපාත අනුපාතය කෙරෙහි සමාගම විවිධ රටවල් තුළ ස්වකීය ක්‍රියාකාරකම් ඉටුකිරීම යන සාධකය බලපෑම් ඇතිකරන බැවින් එකී මෙහෙයුම් කටයුතු වල භූගෝලීය පැතිරයාම මත පදනම්ව අදාළ මූලික අංශයන් තීරණය කරනු ලැබේ. විකුණුම් මඟින් සැකසෙන පිරිවැටුමෙහි විශ්ලේෂණය ලබා ගැනෙනුයේ විකුණුම් සිදුකළ කලාපය වෙත ආදායම වෙන්කිරීම මඟිනි. කිසියම් විශේෂ අංශයකට සෘජුවම හඳුනාගත නොහැකි වියදම් වෙන්කර දැක්වීමක් හෝ හෙළිදරව් කිරීමක් සිදු නොවේ.

භූගෝලීය අංශ වෙත වත්කම් හා අදාළ වගකීම් වෙන්කිරීම සඳහා යෝග්‍ය පදනමක් මත පවතී යයි කළමණාකරණය නොසිතයි. ඒ අනුව අංශමය වත්කම්, අංශමය වගකීම් සහ ගෝලීය අංශ ආශ්‍රිත තොරතුරු යනාදිය සම්බන්ධයෙන් හෙළිදරව් නොකෙරේ.

ව්‍යාපාරික අංශය අනුව ද්විතීයික වාර්තාකරණය පදනම් වනුයේ සමූහය විසින් සලසනු ලබන සේවාවන්හි ස්වභාවය මතය. සමූහය ප්‍රධාන ව්‍යාපාර අංශ දෙකක නිරතව අතර ඒවා නම් ගුවන් ප්‍රවාහන කටයුතු වල සහ සිය පරිපාලිත සමාගම ඔස්සේ ගුවන්යානාස්ථ ආහාරපාන සේවා සැපයීමේ කටයුතු වලයි.

### *2.5 නිකුත් කළ නමුත් මේ දක්වා ක්‍රියාත්මක නොවන ගිණුම්කරන ප්‍රමිති.*

2018 මාර්තු මස 31 වන දිනෙන් අවසන් වාර්තාකරණ කාලපරිච්ඡේදය සඳහා බල නොපාන නව ගිණුම්කරන ප්‍රමිත හා සංශෝධන/දැනට පවත්නා ගිණුම් ප්‍රමිතවලට වැඩිදියුණු කිරීම් කිහිපයක් ප්‍රසිද්ධ කර ඇත. සමූහය/සමාගම විසින් මින් කිසිවක් මීට පෙර අනුගමනය කර නැත.

#### ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 09 - මූල්‍ය උපකරණ

දැනට පවත්නා ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිත 39 මූල්‍ය උපකරණ: හඳුනාගැනීම සහ මිනුම්කිරීම සම්බන්ධ උපදෙස් මාලා වෙනුවට ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 09 ප්‍රතිස්ථාපනය වේ. ක්‍රමක්ෂය කළ පිරිවැයට මිනුම් කල, වෙනත් විස්තීර්ණ ආදායම හරහා සාධාරණ අගය සහ ලාභ හෝ අලාභ හරහා සාධාරණ අගය යනුවෙන් වූ මූල්‍ය වත්කම් සඳහා වන ප්‍රධාන වර්ගීකරණ කාණ්ඩ 03 ක් ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 09 තුල අන්තර්ගත වේ. ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිත 39 හි ඇතුලත් පරිණත වීම තෙක්, ණය සහ ලැබිය යුතු දෑ සහ අලෙවිය සඳහා පවතින යන කාණ්ඩ ඉවත් කර ඇත.

පෙර අනුගමනයට අවසරය ද සහිතව 2018 ජනවාරි මස 01 වන දිනට හෝ ඉන්පසුව ආරම්භ වන වාර්ෂික ගිණුම්කරණ කාලපරිච්ඡේද සඳහා ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 09 බලපැවැත්වේ.

#### ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 15 - පාරිභෝගිකයන් සමඟ ගිවිසුම් වලින් ආදායම

කොපමණ ප්‍රමාණයකින් කවර අවස්ථාවකදී ආදායම හඳුනාගනු ලැබිය යුතුද යන්න නිශ්චය කිරීම පිණිස පරිපූර්ණ ආකෘතියක් ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 15 මඟින් ස්ථාපනය කරයි. මේ තුළින් ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිත 18 - ආදායම, ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිත 11 - ඉදිකිරීම් කොන්ත්‍රාත් සහ ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ අර්ථ නිරූපන කමිටු ප්‍රමිත 13- පාරිභෝගික පක්ෂපාතීත්ව වැඩසටහන් යන දෑ ඇතුළුව දැනට පවත්නා ආදායම් හඳුනාගැනීම් මාර්ගෝපදේශ ප්‍රතිස්ථාපනය වේ.

පෙර අනුගමනයට අවසරය ද සහිතව 2018 ජනවාරි මස 01 වන දිනට හෝ ඉන්පසුව ආරම්භ වන වාර්ෂික ගිණුම්කරණ කාලපරිච්ඡේද සඳහා ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 15 බලපැවැත්වේ.

### ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 16 - කල්බදු

ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 16 මඟින් කල්බදු සඳහා ශේෂ මත කල්බදු පත්‍ර ඒකළ ගිණුම්කරන ආකෘතියක් හඳුන්වා දී ඇත. යටත් කල වත්කම් පරිහරණය කිරීමට ඇති අයිතිය නියෝජනය කරන වත්කම් භාවිතායට ගැනීමේ අයිතිවාසිකම සහ කල්බදු ගෙවීම් කිරීමට ඇති බැඳියාව නියෝජනය කෙරෙන බදුකර වගකීමක්ද බදුලාභියා පිළිග නියි. කෙටිකාලීන කල්බදු සහ අඩු වටිනාකමක් සහිත අයිතම සඳහා වන කල්බදු සම්බන්ධයෙන් විකල්බ ව්‍යාතිරේක පවතී. කල්බදුදීමනාකරු පාදක ගිණුම්කරණය දැනට පවත්නා ගිණුම් ප්‍රමිතියට සමානව එනම් කල්බදුකරු විසින් මූල්‍ය හෝ මෙහෙයුම් කල්බදු ලෙස කල්බදු වර්ගීකරණය කිරීම.

ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 16 තුළින් ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිත 17 - කල්බදු, ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ අර්ථ නිරූපන කමිටු ප්‍රමිත 04 - පහසුකමක් තුල කල්බද්දක් ඇතුලත් වේද යන්න තීරණය කිරීම, ප්‍රමිත අර්ථ නිරූපන කමිටු ප්‍රමිත 15 - මෙහෙයුම් කල්බදු - දීමනා සහ ප්‍රමිත අර්ථ නිරූපන කමිටු ප්‍රමිත 27- කල්බද්දක නෛතික ආකෘතියකට අදාළ වන ගණුදෙනුවක හරය ඇගයීම යන දෑ ඇතුළුව දැනට පවත්නා කල්බදු මාර්ගෝපදේශ ප්‍රතිස්ථාපනය වේ. 2019 ජනවාරි මස 01 වන දිනට හෝ ඉන්පසුව ආරම්භ වන වාර්ෂික ගිණුම්කරණ කාලපරිච්ඡේද සඳහා මෙම ප්‍රමිතිය බලපැවැත්වේ. ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 16 මූලික හඳුනාගැනීමේ දිනයට පෙර ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 15 - පාරිභෝගිකයන් සමඟ ගිවිසුම් වලින් ආදායම ප්‍රමිතිය යොදාගන්නා ආයතන සඳහා පෙර අනුගමනයට අවසර ලැබේ.

සවිස්තරාත්මක බලපෑම් විශ්ලේෂණය සම්පූර්ණ කිරීම සිදුවෙමින් පවතින බැවින් ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 09, ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 15, ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 16 න් සිදුවිය හැකි බලපෑම වාර්තාකරන දිනට ප්‍රමාණවත්ව ඇස්තමේන්තු කල නොහැක.

### (3) අඛණ්ඩ පැවැත්ම

ප්‍රවර්තන වර්ෂය තුළදී සමාගම රු. මිලියන 17,213.57 ක අලාභයක් (2017 - රු. මිලියන 28,929.99) වාර්තා කර ඇති අතර සමුච්චිත අලාභය රු. මිලියන 186,596.50 කි (2017 - රු. මිලියන 169,755.46 ). තවද, සමාගමේ ජංගම වගකීම් රු. මිලියන 100,268.11 කින් (2017 - රු. මිලියන 99,329.48 ) එහි ජංගම වත්කම් ඉක්මවා ඇති අතර වාර්තා කිරීමේ දිනයට සමාගමේ මුළු හිමිකම රු. මිලියන 132,196.34 ක සෘණ අගයක් (2017 - රු. මිලියන 115,766.64 සෘණ අගයක්) දක්වා පහත වැටී ඇත.  සමාගමේ ශුද්ධ වත්කම් එහි ප්‍රකාශිත ප්‍රාග්ධයෙන් අඩකට වඩා අඩු වන අතර තදබල ප්‍රාග්ධන පාඩුවකට මුහුණු දී ඇත. එම නිසා සමාගම විසින් 2015 ජුනි මස 16 වන දින අති විශේෂ මහ සභා රැස්වීමක් පැවැත්වූ අතර 2017 අංක 07 සමාගම් පනතේ 220 වගන්ති ප්‍රකාරව ප්‍රතිව්‍යුහගතකරණ සැලැස්මක් සම්බන්ධයෙන් සාකච්ඡා කරන ලදී.

ගුවන් ගමන් ජාලය, ගුවන් යානා බලඇණිය, පොදුකාර්ය වියදම්, ණය සහ සංවිධාන ව්‍යුහය වැනි අංශ ප්‍රතිව්‍යුහගත කිරීම යන ප්‍රමුඛ අංශ වලින් ශ්‍රී ලංකන් ගුවන් සමාගමේ ප්‍රතිව්‍යුහගතකිරීමේ ක්‍රියාවලිය සමන්විත වේ. මුදල් අමාත්‍යංශයේ රාජ්‍ය පෞද්ගලික සහයෝගීතාවය සදහා ජාතික ආයතනය විසින් අධ්‍යක්ෂ මණ්ඩලය සමඟ ප්‍රතිව්‍යුහගතකිරීමේ වෑයම සඳහා සම්බන්ධ වී කටයුතු කරන අතර ප්‍රතිව්‍යුහගතකරණ සැලසුමේ තොරතුරු අවසන් කිරීම සදහා කළමණාකරනය හා අධ්‍යක්ෂ මණ්ඩලය සමඟ එක්ව කටයුතු කිරීමට 2017 අවසාන කාර්තුවේදී අන්තර්ජාතික උපදේශකයකු පත්කරන ලදී. වර්තමාන අධ්‍යක්ෂ මණ්ඩලය, උපදේශකයින් විසින් නිර්දේශ කර ඇති ප්‍රධාන නිර්දේශයන් ක්‍රියාත්මක කර ඇති අතර මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 05 හි විස්තර කර ඇති A 350- 900 වර්ගයේ ගුවන් යානා 04 ට අදාළව භාරදීමට පෙර ගෙවීම් සම්බන්ධයෙන් එයාර් බස් සමාගම සමඟ නැවත එකඟතාවයකට පැමිණීම ඇතුළුව වර්ෂ 05 ක් සඳහා පුළුල් වූ ප්‍රතිව්‍යුහගතකරණ/ව්‍යාපාර සැලැස්මක් සකස් කිරීම සඳහා කළමණාකරනය සමඟ සම්බන්ධ වී කටයුතු කරයි. අනෙකුත් ප්‍රධාන පාර්ශවකරුවන්ගේ සහයෝගය ඇතිව රජය විසින් සිදුකරමින් සිටින ප්‍රතිව්‍යුහගතකරණ සැලැස්මේ සඳහන් ක්‍රියාමාර්ග වලට යටත්ව ඉදිරි වර්ෂ 03 තුළදී සමාගම ලාභ අලාභ නොලබන මට්ටම දක්වා ලඟාවීමට අපේක්ෂා කරයි.

සමාගමට කෙටි කාලීන ණය පහසුකම් ලබාගැනීම සදහා ඇමෙරිකානු ඩොලර් මිලියන 50 ක වටිනාකමක් වෙනුවෙන් නව පහසුකම් සැපයීමේ ලිපි රජයේ බැංකු වලට නිකුත් කිරීමට අනුමත කිරීම තුළින් සමාලෝචනයට ලක්වන වර්ෂය තුළදී ද ශ්‍රී ලංකා රජය විසින් සහයෝගය ලබාදීම අඛණ්ඩව සිදුකර ඇත. යෝජිත ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය ස්ථපිත කිරීම සම්පූර්ණ කරන තෙක් "අඛණ්ඩ පැවැත්ම" පදනම යටතේ මෙහෙයුම් කටයුතු අඛණ්ඩව සිදුකිරීමට අවශ්‍ය මූල්‍ය අනුග්‍රහය තවදුරටත් ශ්‍රී ලංකා රජය විසින් සපයනු ලබන බවට 2019 පෙබරවාරි 05 දිනැති කැබිනට් මණ්ඩල අනුමැතියක් හරහා ශ්‍රී ලංකා රජය විසින් තහවුරු කර ඇත.

ශ්‍රී ලංකන් ගුවන් සමාගම ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා 2019 ජනවාරි මාසයේදී අතිගරු ජනාධිපතිතුමන් විසින් පත්කරන ලද විශේෂඥ කමිටුව විසින් ඉදිරිපත් කළ නිර්දේශ වලට අනුව, සමාගම විසින් දැනට සම්බන්ධ වී කටයුතු කරන ලාභ ලබන ව්‍යාපාර වල සුළුතර අයිතීන් විකිණීම මඟින් අනාගතයේදී අරමුදල් රැස්කිරීමට සමාගම අපේක්ෂා කරයි. තවද සමාගමේ  සෘණාත්මක ශුද්ධ වත්කම් යහපත් තත්ත්වයකට ගෙන ඒම සඳහා ප්‍රාග්ධන අන්තර්ගහනයක් සිදු කිරීමේ අරමුණින් රාජ්‍ය පෞද්ගලික සහයෝගීතාවයක් ස්ථාපනය කිරීමට නව ආයෝජකයකු/බද්ධ ව්‍යාපාර හවුල්කරුවකු ආකර්ශණය කරගැනීමේ රජයේ උත්සාහයේ තවදුරටත් නියලී සිටීමට රජය අපේක්ෂා කරයි.

## මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් ඉතිරි කොටස.

### 4. දේපළ, පිරියත හා උපකරණ

#### 4.1 සමූහය

| | ඉඩම් හා ගොඩනැගිලි රු. මිලියන | පිරියත සහ උපකරණ රු. මිලියන | මෙහෙයුම්, කල්බදු මත වූ ගුවන්යානා උසස් කිරීම් රු. මිලියන | ගුවන්යානා ආශ්‍රිත උපකරණ රු. මිලියන | කල්බදු පදනම මත වූ පිරියත හා උපකරණ රු. මිලියන | අත්තිකාරම්/ ප්‍රාග්ධන නොනිමි රු. මිලියන | එකතුව රු. මිලියන |
|---|---|---|---|---|---|---|---|
| **පිරිවැය/ප්‍රත්‍යාගණන අගය** | | | | | | | |
| 2017 අප්‍රේල් 01 දිනට ශේෂය | 3,999.24 | 7,690.90 | 2,296.24 | 8,596.35 | 3,183.31 | 27.35 | 25,793.39 |
| අත්පත් කරගැනීම්/නවීකරණයන්/ උසස් කිරීම් | 19.17 | 912.74 | - | 413.24 | - | 330.60 | 1,675.75 |
| ප්‍රත්‍යාගණනය | 311.60 | - | - | - | - | - | 311.60 |
| නොනිමි වලින් මාරු කිරීම් | 126.10 | 19.52 | - | - | - | (145.62) | - |
| ගැලපුම් | (11.68) | 1.85 | (4.32) | (3.15) | 0.70 | (0.53) | (17.13) |
| ප්‍රතිවර්ගීකරණය කිරීම් | 0.32 | 85.47 | - | - | (85.79) | - | - |
| බැහැර කිරීම්/විශ්‍රාම ගැන්වීම් | - | (83.38) | - | (34.34) | - | - | (117.72) |
| **2018 මාර්තු 31 දිනට ශේෂය** | 4,444.75 | 8,627.10 | 2,291.92 | 8,972.10 | 3,098.22 | 211.80 | 27,645.89 |
| **සමුච්චිත ක්ෂය** | | | | | | | |
| 2017 අප්‍රේල් 01 දිනට ශේෂය | 379.70 | 5,631.24 | 1,811.53 | 6,571.94 | 1,564.91 | - | 15,959.32 |
| වර්ෂය සඳහා අයකිරීම් | 138.77 | 588.80 | 161.53 | 493.05 | 396.50 | - | 1,778.65 |
| ප්‍රත්‍යාගණනය | (305.21) | - | - | - | - | - | (305.21) |
| ප්‍රතිවර්ගීකරණය කිරීම් | - | 85.41 | - | - | (85.41) | - | - |
| ගැලපුම් | - | (19.70) | - | - | - | - | (19.70) |
| බැහැර කිරීම්/විශ්‍රාම ගැන්වීම් | - | (81.48) | - | (33.91) | - | - | (115.39) |
| **2018 මාර්තු 31 දිනට ශේෂය** | 213.26 | 6,204.27 | 1,973.06 | 7,031.08 | 1,876.00 | - | 17,297.67 |
| **2018 මාර්තු 31 දිනට ශුද්ධ පොත් අගය** | 4,231.49 | 2,422.83 | 318.86 | 1,941.02 | 1,222.22 | 211.80 | 10,348.22 |
| **2017 මාර්තු 31 දිනට ශුද්ධ පොත් අගය** | 3,619.54 | 2,059.66 | 484.71 | 2,024.41 | 1,618.40 | 27.35 | 9,834.07 |

**4.2** **(අ)** 2018 මාර්තු 31 දිනෙන් අවසන් මූල්‍ය වර්ෂය තුළදී රන්ජන් ජේ සමරකෝන් මහතා (ඒ අයි වී ශ්‍රී ලංකා - සාංගමික තක්සේරුකරු) සහ 2015 මාර්තු මස 31 දිනෙන් අවසන් මූල්‍ය වර්ෂය තුළදී පී බී කළුගල්ගෙදර මහතා (වරලත් තක්සේරු මිනුම්කරු විසින් සිදුකළ ප්‍රත්‍යාගණනය මඟින් පිළිවෙලින් සමාගමේ ඉඩම් හා ගොඩනැගිලි වල සාධාරණ අගය සහ පරිපාලිත සමාගමෙහි ඉඩම් හා ගොඩනැගිලි මෙන්ම ගුවන්යානා මුළුතැන්ගෙයි උපකරණ වල සාධාරණ අගය තීරණය කරන ලදී.

තක්සේරුවේදී වාර්තා කල සමූහයේ ඉඩම්, ගොඩනැගිලි සහ වෙනත් පිරියත හා උපකරණ පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| වත්කම | තක්සේරු ක්‍රමය | තක්සේරුව බලපැවැත්වෙන දිනය | වැදගත් නිරීක්ෂණය කළ නොහැකි යෙදවුම් | නිරීක්ෂණය කළ නොහැකි යෙදවුම්වලට සාධාරණ අගයෙහි සංවේදීතාවය | සාධාරණ අගය ධුරාවලියෙහි මට්ටම |
|---|---|---|---|---|---|
| ඉඩම - කොළඹ | විවෘත වෙළෙඳපොළ අගය ක්‍රමය | 2018 මාර්තු 31 | පර්චසයක ඇස්තමේන්තුගත මිල රු.මිලියන 18 කි | ධනාත්මක සහසම්බන්ධතා සංවේදීතාවය | මට්ටම 03 |
| ගොඩනැගිලි - කොළඹ/කටුනායක | ක්ෂය කළ ප්‍රතිස්ථාපන පිරිවැය | 2018 මාර්තු 31 | වර්ග අඩියක ඇස්තමේන්තුගත මිල රු.643.47 - රු.11,000 කි | | |
| පිරියත හා උපකරණ යටතේ ඇතුලත් ගුවන්යානා මුළුතැන්ගෙයි උපකරණ - කටුනායක | විවෘත වෙළෙඳපොළ අගය ක්‍රමය | 2015 මාර්තු 31 | එකිනෙක උපකරණය සඳහා විවෘත වෙළෙඳපොළ අගය ප්‍රවේශය භාවිතා කරමින් සාධාරණ අගය ලබාගෙන ඇත | | |

## 4. දේපළ, පිරියත හා උපකරණ (ඉතිරි කොටස)

පිරිවැයෙන් ක්ෂය අඩුකර වත්කම් වල අගය පවත්වාගන්නේ නම් මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත් කළ යුතු ප්‍රත්‍යාගණනය කළ වත්කම් වල ධාරණ අගය පහත පරිදි වේ.

(ආ) කල්බදු ගුවන්යානා සඳහා සුරැකුම් තැන්පතු ලෙස 2018 මාර්තු මස 31 දිනට සමාගම විසින් රු.මිලියන 1,361.67 (ඇ.ඩො මිලියන 8.97) (2017 - රු.මිලියන 1,050.89 (ඇ.ඩො මිලියන 6.93) ක් වටිනා ණයවර ලිපි නිකුත් කර ඇත.

## 25. බැඳීම් සහ අසම්භාව්‍යයන් (ඉතිරිය)

### *25.2 මූල්‍ය බැඳීම් (ඉතිරිය)*

(ඇ) සමූහය සහ සමාගම විසින් කල්බදුකරණය කළ ඉඩම් සහ ගොඩනැගිලි සඳහා ඉතිරි කල්බදු වාරික බැඳීම පහත පරිදි වේ:

| | සමූහය | | සමාගම | |
|---|---|---|---|---|
| | 2018 රු. මිලියන | 2017 රු. මිලියන | 2018 රු. මිලියන | 2017 රු. මිලියන |
| **ගෙවිය යුතු වාරික:** | | | | |
| එක් වර්ෂයක් තුළ | 768.74 | 780.00 | 623.40 | 648.77 |
| වර්ෂ 05 කට නොවැඩි  නමුත් එක් වසරකට පසු | 1,791.38 | 2,000.09 | 1,466.43 | 1,600.40 |
| වර්ෂ 05 කට පසු | 2,001.87 | 2,303.98 | 1,592.73 | 1,897.79 |

### *25.3 අසම්භාව්‍යයන්*

**සමාගම**

අසම්භාව්‍ය වගකීම් පදනම් වන්නේ 2018 මාර්තු 31 දිනට සිදුකළ රු.මිලියන 15,085.72 ක (2017 - රු.මිලියන 3,315.53) හිමිකම් පෑම් මතය. මෙම රු. මිලියන 15,085.72 ක අසම්භාව්‍ය වගකීම්, ගුවන්යානා කල්බදු ගිවිසුම් අවලංගු කිරීම නිසා ගුවන්යානා අමතර කොටස් සැපයුම් කරුවන් කිහිපදෙනෙකු සිදුකළ රු.මිලියන 12,240.89 ක (ඇ.ඩො මිලියන 77.56 සහ යුරෝ මිලියන 0.91) හිමිකම් පෑම් වලින්ද, ගුවන්තොටුපල බදු ගෙවීමකට අදාළව විදේශීය බදු අධිකාරියක් විසින් පැනවූ රු.මිලියන 576.74 (ඇ.ඩො මිලියන 3.71) ක දඩ මුදලකින්ද,  ගිවිසුමක් පවත්වා නොගැනීම නිසා සැපයුම්කරුවකු විසින් සිදුකළ රු.මිලියන 631.93 (ඇ.ඩො මිලියන 4.06) හිමිකම් පෑමකින් සහ විදේශීය බදු අධිකාරියක් සමඟ වූ රු.මිලියන 1,239.13 ක සේවා බදු ආරවුලකින්ද සමන්විත වේ.

සමාගමට එරෙහිව සේවකයින්, සැපයුම්කරුවන් සහ පාරිභෝගිකයින් විසින් සිදුකරන නීති කෘත්‍ය, වෙනත් හිමිකම් පෑම් සහ විය හැකි හිමිකම් පෑම් වලට අදාළව සමාගමේ සාමාන්‍ය ව්‍යාපාර කටයුතු තුළින් ඇතිවන ඕනෑම අසම්භාව්‍ය වගකීමකට අදාළව ඕනෑම සැලකිය යුතු වගකීමක් අධ්‍යක්ෂවරු අපේක්ෂා නොකරන නිසා මෙම මූල්‍ය ප්‍රකාශන වල කිසිදු ප්‍රතිපාදනයක් සිදුකර නැත.

**පරිපාලිත සමාගම**

සමාගමේ නීතිඥවරුන්ට අනුව, සමාගමේ අනාගත මෙහෙයුම්වලට සහ වාර්තාකළ මූල්‍ය ප්‍රතිඵල වලට බලපෑමක් සිදුවිය හැකි පහත නඩු විභාගය හැර සමාගමට එරෙහිව පවතින වෙනත් කිසිදු නඩු කටයුත්තක් හෝ වන්දි ඉල්ලුම් කිරීමක් නොමැත.

දැනටමත් විභාග වෙමින් පවතින කම්කරු විනිශ්චය සභා නඩු විභාගය (LT Case No. 21/337/2015 ) තවදුරටත් වාර්තා කරන දිනට සමාගම විසින් අභියාචනා ඉදිරිපත් කළ නඩු විභාග 04 ක් ඇත. එම අභියාචනා ඉදිරිපත් කළ නඩු විභාග සඳහා රු.මිලියන 20ක තැන්පතු සිදුකර ඇත.

## 26. උකස්කල වත්කම්

**සමාගම/සමූහය**

ලබාගත් පහසුකම් වෙනුවෙන් උකස්කළ වත්කම් පිළිබඳ තොරතුරු සඳහා 15.2 සටහන පරිශීලනය කරන්න.

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් ඉතිරි කොටස.

## 27. වාර්තාකරන දිනට පසුව හටගත් සිදුවීම්

### 27.1 සමාගම

- සලකා බලනු ලබන වර්ෂයේ උප කල්බදු පදනම මත ලබාදුන් A330-200 වර්ගයේ ගුවන්යානා උප කල්බදු ගිවිසුම අවසන් වීම මත 2018 සැප්තැම්බර් මස නැවත භාරදෙන ලදී.
- සටහන අංක 03 අඛණ්ඩ පැවැත්ම යටතේ සාකච්ඡා කරනු ලබන ක්‍රියාත්මක වෙමින් පවතින ප්‍රතිව්‍යුහගත කිරීමේ සැලසුම සලකාබලා සමාගම විසින් A320 වර්ගයේ ගුවන්යානාවක් සඳහා වූ කල්බදු ගිවිසුම 2019 මාර්තු මස අවසන් වන පරිදි මස 04 දක්වා දිගුකරන ලද අතර, සහ A321 වර්ගයේ ගුවන්යානා කල්බදු ගිවිසුම 2019 පෙබරවාරි මස අවන් වන පරිදි මාස 06 ක් සඳහා තවදුරටත් දිගුකරන ලද අතර එම ගුවන්යානය දිගුකරන ලද කල්බදු කාලය අවසන් වීම සමග කල්බදු සමාගමට භාරදෙන ලදී.

ඉහත සඳහන් සිදුවීම් හැර මූල්‍ය ප්‍රකාශන වල හෙලිදරව් කිරීම හෝ ගැලපීම් කිරීම අවශ්‍ය වන කිසිදු සිදුවීමක් වාර්තා කරන දිනට පසුව හටගෙන නැත.

### 27.2 පරිපාලිත සමාගම

මූල්‍ය ප්‍රකාශන වල හෙලිදරව් කිරීම හෝ ගැලපීම් කිරීම අවශ්‍ය වන කිසිදු සිදුවීමක් වාර්තා කරන දිනට පසුව හටගෙන නැත.

## 28. සම්බන්ධිත පාර්ශව අනාවරණයන්

### 28.1 සමූහය සහ සමාගම

#### 28.1.1 ප්‍රධාන කළමණාකරණ පාර්ශව (KMP) සමඟ ගණුදෙනු

සමාගමෙහි සහ පරිපාලිත සමාගමෙහි කටයුතු සැලසුම් කිරීම, මෙහෙයවීම හා ක්‍රියාත්මක කිරීම යන කාර්යයන්හි අධිකාරීත්වය හා වගකීම දරන පුද්ගලයින් ලෙස අර්ථ ගැන්වූ ප්‍රධාන කළමනාකරණ පිරිස් සම්බන්ධිත පාර්ශව වලට ඇතුලත් වේ. එම ප්‍රධාන කළමනාකරණ පිරිස් වලට අධ්‍යක්‍ෂ මණ්ඩලය, ප්‍රධාන විධායක නිලධාරී සහ ඉහත නිර්ණායක සපුරාලන සමූහයේ වෙනත් ජ්‍යේෂ්ඨ කළමණාකරන විධායක නිලධාරීන් ඇතුලත් වේ.

සමාගම සහ සම්බන්ධිත පාර්ශව ( සමාගමට අනුබද්ධ වූවන්, අධ්‍යක්‍ෂවරුන්, සේවකයින් සහ ඇල්මක් ඇති ඔවුන්ගේ සමීප පවුලේ සාමාජිකයින්) සමඟ සිදුවන ඕනෑම ගණුදෙනු අනාවරණය කල යුතුයැයි සඳහන් සමූහයේ / සමාගමේ ප්‍රතිපත්තියට සමගාමීව  ප්‍රධාන කළමනාකරණ පිරිස් විසින් සිදුකළ ආශ්‍රිත ප්‍රකාශ සැලකිල්ලට ගෙන ඇත.

වාර්තාකරණ කාලසීමාව තුළ සාමාන්‍ය ව්‍යාපාර කටයුතු වලදී ප්‍රධාන කළමණාකරන පිරිස් විසින් සිදුකල වැදගත් ගණුදෙනු පහත පරිදි වේ:

| | 2018<br>රු. මිලියන | 2017<br>රු. මිලියන |
|---|---|---|
| කෙටිකාලීන ප්‍රතිලාභ | 304.17 | 323.21 |
| පශ්චාත් සේවා නියුක්ත ප්‍රතිලාභ | 46.09 | 39.40 |
| සේවා අවසන්කිරීමේ ප්‍රතිලාභ | 12.43 | - |

ඉහත අගයන් තුල වර්ෂය තුල ගෙවූ අධ්‍යක්‍ෂවරුන්ගේ ගාස්තු රු.මිලියන 6.01 (2017 - රු.මිලියන 9.86) සහ ස්වකීය ධූර කාලය තුල අධ්‍යක්‍ෂවරුන්, ඔවුන්ගේ කලත්‍රයන් හා යැපෙන දූ දරුවන් විසින් ශ්‍රී ලංකන් ගුවන් සමාගමෙන් ගාස්තු අයකිරීමකින් තොරව ව්‍යාපාර පන්තියේ ගමන් ගැනීම ඇතුලත් වරප්‍රසාද සහ වෙනත් ගුවන් ටිකට් වෙනුවෙන් වූ  රු.මිලියන 18.65 (2017 - රු.මිලියන 19.55) ක වටිනාකම ඇතුලත් වේ. ඊට අමතරව ප්‍රධාන කළමනාකරන පිරිස්, ඔවුන්ගේ කලත්‍රයන් හා යැපෙන දූ දරුවන්ද ගාස්තු අයකිරීමකින් තොර ගුවන් ගමන් ටිකට්පත් සඳහා හිමිකම් ලබයි.

## 28. සම්බන්ධිත පාර්ශව අනාවරණයන් (ඉතිරිය)

### 28.2 සමූහය

සමාගමේ ප්‍රධාන කොටස් හිමියා වන ශ්‍රී ලංකා රජයට සමූහය සම්බන්ධයෙන් පාලන බලය හිමිවේ.

සාමාන්‍ය ව්‍යාපාර කටයුතු වලදී ශ්‍රී ලංකා රජය පාලනය කරන ආයතන සමඟ පහත වැදගත් ගණුදෙනු සිදුකර ඇත.

| සමාගමේ නම | සබඳතාවය | ගණුදෙනුවේ ස්වභාවය | ගණුදෙනුවේ වටිනාකම | | ලැබිය යුතු/(ගෙවිය යුතු) ශේෂය | |
|---|---|---|---|---|---|---|
| | | | 2018<br>රු. මිලියන | 2017<br>රු. මිලියන | 2018<br>රු. මිලියන | 2017<br>රු. මිලියන |
| ශ්‍රී ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව | රජයේ හිමිකාරීත්වය ඇති | ඉන්ධන | (25,959.20) | (19,921.07) | (4,907.32) | (10,327.05) |
| | | විලම්භිත සැපයුම්කාර ගෙවීම් | - | - | (7,985.05) | - |
| | | ප්‍රමාද වූ ගෙවීම් මත මූල්‍ය පිරිවැය | (490.61) | (368.64) | (83.96) | (445.21) |
| ගුවන් තොටුපල හා ගුවන් සේවා සමාගම | රජයේ හිමිකාරීත්වය ඇති | ගොඩබෑම්, ගාල් කිරීම්, ගුවන් පාලම්, මඟී නිකේතන, කුලී වරලත් ගාස්තු, කසල නාශක ගාස්තු | (3,489.83) | (3,415.30) | (1,214.16) | (1,210.65) |
| සිවිල් ගුවන් සේවා අධිකාරිය | රජය පාලනය කරනු ලබන | බලපත්‍ර, අවසර පත්‍ර සහ බදු | (9,779.95) | (6,484.09) | (0.84) | (0.21) |
| මිහින් ලංකා (පුද්ගලික) සමාගම | රජයේ හිමිකාරීත්වය ඇති | විකුණුම් | 74.48 | 6,123.54 | 745.43 | 744.54 |
| | | ගැනුම් | (20.88) | (5,560.40) | - | - |
| ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව | රජයේ හිමිකාරීත්වය ඇති | රක්ෂණ සේවා | (477.53) | (407.88) | - | - |
| ලංකා බැංකුව | රජයේ හිමිකාරීත්වය ඇති | ණය ආපසු ගෙවීම් | - | (43.35) | (28,457.50) | (24,281.25) |
| | | ලද ණය | 4,107.83 | 11,381.25 | - | - |
| | | කෙටි කාලීන තැන්පතු | - | - | 679.57 | 216.04 |
| | | පොළී | (2,770.01) | (2,175.33) | - | - |
| | | බැංකු අයිරා | - | - | (1,757.14) | (6,805.31) |
| මහජන බැංකුව | රජයේ හිමිකාරීත්වය ඇති | ලද ණය | 3,889.38 | 11,381.25 | (28,907.50) | (24,731.25) |
| | | පොළී | (2,343.83) | (2,137.39) | - | - |
| සේවක අර්ථසාධක අරමුදල | පාරිපාලිත සමාග මේ කොටස් හිමි | වරණීය කොටස් ලාභාංශ | (130.10) | (130.10) | (64.87) | (64.87) |

## මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් ඉතිරි කොටස.

| සමාගමේ නම | සබඳතාවය | ගණුදෙනුවේ ස්වභාවය | ගණුදෙනුවේ වටිනාකම | | ලැබිය යුතු/(ගෙවිය යුතු) ශේෂය | |
|---|---|---|---|---|---|---|
| | | | 2018 රු. මිලියන | 2017 රු. මිලියන | 2018 රු. මිලියන | 2017 රු. මිලියන |
| | | 13.01% නිෂ්ජන්ද නිදහස් කළ හැකි සමුච්චිත (වර්ෂ 05) වරණීය කොටස් | - | - | (1,000.00) | (1,000.00) |

### 28. සම්බන්ධිත පාර්ශව අනාවරණයන් (ඉතිරි කොටස)

#### *28.2 සමූහය (ඉතිරි කොටස)*

වාර්තාකරණ දිනට සමාගම විසින් ලංකා බැංකුවෙන් රු.මිලියන 1,926.42 (2017 - රු.මිලියන 1,159.94) ක බැංකු අණකර පහසුකමක් භාවිතා කර ඇත.

ශ්‍රී ලංකා රජය පාලනය කරන ආයතන වලට /වලින් වූ ශේෂ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි වෙළෙඳ හා වෙනත් ලැබිය යුතු දෑ/ ගෙවිය යුතු දෑ සහ පොළී හරිත වගකීම් යටතේ ඇතුලත් කර ඇත.

වර්ෂය තුළදී සම්බන්ධිත පාර්ශවයන්ට අදාළ රු.මිලියන 56.6 (2017 - රු.මිලියන 744.54) වෙළෙඳ ලැබියු යුතු දෑ සමූහය විසින් හානිකරණය කර ඇත. වාර්තාකරණ දිනට සම්බන්ධිත පාර්ශවයන්ට අදාළ රු.මිලියන 928.9 (2017 - රු.මිලියන 872.85) ක හානිකරණ ප්‍රතිපාදන සිදුකර ඇත.

සියළුම රජය විසින් පාලනය කරන/ ආශ්‍රිත ආයතන සමඟ සිදුකළ සියළුම ගණුදෙනු ආවරණය කිරීමේ හා අනාවරණය කරගැනීමේ ප්‍රායෝගික නොවන බව සහ ගණුදෙනුවල ප්‍රමාණය නිසා තනි තනි වශයෙන් වැදගත් ගණුදෙනු සඳහා ලංකා ගිණුම්කරණ ප්‍රමිත 24 "සම්බන්ධිත පාර්ශව අනාවරණයන්" ට  අනුකූලව සීමිත අනාවරණයන් සිදුකර ඇත.
වර්ෂය තුළදී සමූහය විසින් ගණුදෙනු සිදුකළ රජය විසින් පාලනය කරන/ ආශ්‍රිත ආයතන කිහිපයක් පහත දැක්වේ:

- ලංකා විදුලිබල මණ්ඩලය
- දේශීය ආදායම් දෙපාර්තමේන්තුව
- රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව
- විදේශ කටයුතු අමාත්‍යංශය
- ලංකා සංචාරක මණ්ඩලය
- ශ්‍රී ලංකා තැපැල් අධිකාරිය
- ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යංශය
- ජනාධිපති ලේකම් කාර්යාලය

සේවක විශ්‍රාම ප්‍රතිලාභ සඳහා දායකවීම් වලට අදාළ වැඩිදුර ගණුදෙනු සේවක අර්ථසාධක අරමුදලේ සහ සේවා නියුක්ති භාර අරමුදලේ ව්‍යවස්ථාවන්ට සහ නියාමනයන්ට අනුකූලව සිදුකර ඇත.

සම්බන්ධිත පාර්ශව සමඟ ගණුදෙනු වාණිජමය කොන්දේසි මත සිදුවිය.

## 28. සම්බන්ධිත පාර්ශව අනාවරණයන් (ඉතිරි කොටස)

### 28.3 සමාගම

සාමාන්‍ය ව්‍යාපාර කටයුතු වලදී ශ්‍රී ලංකා රජය පාලනය කරන ආයතන සහ පරිපාලිත සමාගම් සමඟ පහත වැදගත් ගණුදෙනු සිදුකර ඇත.

| සමාගමේ නම | සබඳතාවය | ගණුදෙනුවේ ස්වභාවය | ගණුදෙනුවේ වටිනාකම | | ලැබිය යුතු/(ගෙවිය යුතු) ශේෂය | |
|---|---|---|---|---|---|---|
| | | | 2018 රු. මිලියන | 2017 රු. මිලියන | 2018 රු. මිලියන | 2017 රු. මිලියන |
| ශ්‍රී ලංකා කේටරින් ලිමිටඩ් | පරිපාලිත සමාගම | ගුවන්යානාව තුළ සේවා | 13.99 | 20.03 | - | - |
| | | ගුවන්යානාව තුළ ආහාරපාන හා වෙනත් සේවා | (5,378.46) | (4,096.48) | (5,352.44) | (6,707.47) |
| | | ලාභාංශ | 5,314.10 | 3,093.48 | - | - |
| ශ්‍රී ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව | රජයේ හිමිකාරීත්වය ඇති | ඉන්ධන | (25,852.36) | (19,813.14) | (4,907.32) | (10,327.05) |
| | | විලම්භිත සැපයුම්කාර ගෙවීම් | - | - | (7,985.05) | - |
| | | ප්‍රමාද වූ ගෙවීම් මත මූල්‍ය පිරිවැය | (490.61) | (368.64) | (83.96) | (445.21) |
| ගුවන් තොටුපල හා ගුවන් සේවා සමාගම | රජයේ හිමිකාරීත්වය ඇති | ගොඩබෑම්, ගාල් කිරීම්, ගුවන් පාලම්, මඟී නිකේතන, කුලී වරලත් ගාස්තු, කසල නාශක ගාස්තු | (2,912.51) | (2,940.50) | (1,236.06) | (1,294.15) |
| සිවිල් ගුවන් සේවා අධිකාරිය | රජය පාලනය කරනු ලබන | බලපත්‍ර, අවසර පත්‍ර සහ බදු | (9,779.95) | (6,484.09) | (0.84) | (0.21) |
| මිහින් ලංකා (පුද්ගලික) සමාගම | රජයේ හිමිකාරීත්වය ඇති | විකුණුම් | 74.48 | 5,869.73 | 745.43 | 692.14 |
| | | ගැනුම් | (20.88) | (5,560.40) | - | - |
| ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව | රජයේ හිමිකාරීත්වය ඇති | රක්ෂණ සේවා | (477.53) | (407.88) | - | - |
| ලංකා බැංකුව | රජයේ හිමිකාරීත්වය ඇති | ණය ආපසු ගෙවීම් | - | (43.35) | (28,457.50) | (24,281.25) |
| | | ලද ණය | 3,889.38 | 11,381.25 | - | - |
| | | කෙටි කාලීන තැන්පතු | - | - | 679.57 | 216.04 |
| | | පොළී | (2,770.01) | (2,175.33) | - | - |
| | | බැංකු අයිරා | - | - | (1,757.14) | (6,805.31) |
| මහජන බැංකුව | රජයේ හිමිකාරීත්වය ඇති | ලද ණය | 3,889.38 | 11,381.25 | (28,907.50) | (24,731.25) |
| | | පොළී | (2,343.83) | (2,137.39) | - | - |

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් ඉතිරි කොටස.

## 28. සම්බන්ධිත පාර්ශව අනාවරණයන් (ඉතිරිය)

### *28.3 සමාගම (ඉතිරි කොටස)*

වාර්තාකරණ දිනට සමාගම විසින් ලංකා බැංකුවෙන් රු.මිලියන 1,906.88 (2017 - රු.මිලියන 1,159.94) ක බැංකු අණකර පහසුකමක් භාවිතා කර ඇත.

ශ්‍රී ලංකා රජය පාලනය කරන ආයතන වලට /වලින් වූ ශේෂ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි වෙළෙඳ හා වෙනත් ලැබිය යුතු දෑ/ ගෙවිය යුතු දෑ සහ පොළී හරිත වගකීම් යටතේ ඇතුලත් කර ඇත.

වර්ෂය තුළදී සම්බන්ධිත පාර්ශවයන්ට අදාළ රු.මිලියන 56.6 (2017 - රු.මිලියන 692.14) වෙළෙඳ ලැබියු යුතු දෑ සමාගම විසින් හානිකරණය කර ඇත. වාර්තාකරණ දිනට සම්බන්ධිත පාර්ශවයන්ට අදාළ රු.මිලියන 875.73 (2017 - රු.මිලියන 820.45) ක හානිකරණ ප්‍රතිපාදන සිදුකර ඇත.

සියළුම රජය විසින් පාලනය කරන/ ආශ්‍රිත ආයතන සමඟ සිදුකළ සියළුම ගණුදෙනු ආවරණය කිරීමේ හා අනාවරණය කරගැනීමේ ප්‍රායෝගික නොවන බව සහ ගණුදෙනුවල ප්‍රමාණය නිසා තනි තනි වශයෙන් වැදගත් ගණුදෙනු සඳහා ලංකා ගිණුම්කරණ ප්‍රමිත 24 " සම්බන්ධිත පාර්ශව අනාවරණයන් " ට අනුකූලව සීමිත අනාවරණයන් සිදුකර ඇත.
වර්ෂය තුළදී සමාගම විසින් ගණුදෙනු සිදුකළ රජය විසින් පාලනය කරන/ ආශ්‍රිත ආයතන කිහිපයක් පහත දැක්වේ :

- ලංකා විදුලිබල මණ්ඩලය
- දේශීය ආදායම් දෙපාර්තමේන්තුව
- රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව
- විදේශ කටයුතු අමාත්‍යංශය
- ලංකා සංචාරක මණ්ඩලය
- ශ්‍රී ලංකා තැපැල් අධිකාරිය
- ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යංශය
- ජනාධිපති ලේකම් කාර්යාලය

සේවක විශ්‍රාම ප්‍රතිලාභ සඳහා දායකවීම් වලට අදාළ වැඩිදුර ගණුදෙනු සේවක අර්ථසාධක අරමුදලේ සහ සේවා නියුක්ති භාර අරමුදලේ ව්‍යවස්ථාවන්ට සහ නියාමනයන්ට අනුකූලව සිදුකර ඇත.

සම්බන්ධිත පාර්ශව සමඟ ගණුදෙනු වාණිජමය කොන්දේසි මත සිදුවිය.

## 29. මූල්‍ය අවදානම් කළමණාකරන අරමුණු සහ ප්‍රතිපත්ති

සමූහයේ ප්‍රධාන මූල්‍ය වගකීම් සමන්විත වනුයේ ණය හා ණය ගැනීම්, වෙළෙඳ හා වෙනත් ගෙවිය යුතු දෑ සහ වෙනත් මූල්‍ය වගකීම් වලිනි. මෙම මූල්‍ය වගකීම් වල ප්‍රධාන අරමුණ වනුයේ සමූහයේ මෙහෙයුම් කටයුතු වලට මූල්‍ය සම්පාදනයයි. ස්වකීය මෙහෙයුම් කටයුතු තුළින් සෘජුවම උත්පාදනය වන වෙළෙඳ හා වෙනත් ලැබිය යුතු දෑ සහ මුදල් හා කෙටි කාලීන තැන්පතු වලින් සමූහයේ මූල්‍ය වත්කම් සමන්විත වේ.

සාංගමික කළමණාකරනය විසින් විස්තීර්ණ අවදානම් කළමණාකරන න්‍යාසය කලින් කලට සමාලෝචනය කිරීම හා යාවත්කාලීන කිරීම කරනු ලබන අතර සැලකිය යුතු බලපෑමක් ඇති කළ හැකි පහත දැක්වෙන මූල්‍ය අවදානම් හඳුනාගෙන ඇත.

(i) වෙළෙඳපොළ අවදානම
- පොළී අනුපාත අවදානම
- විනිමය අනුපාත අවදානම

(ii) ද්‍රවශීලතා අවදානම

(iii) ණය අවදානම

වෙළෙඳපොළෙහි සහ අනෙකුත් මූල්‍යමය අවදානම් සහිත කටයුතුවල වෙනස්කම් නිරූපනය වන පරිදි සමූහය විසින් නිතිපතා සිය අවදානම් කළමණාකරන ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි සමාලෝචනයට ලක් කරන අතර ඒවා පිහිටුවා ඇති ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටිවලට අනුකූලව අවදානම් හඳුනාගැනීම, මිනුම්කරණය හා කළමණාකරනය වන බවට සහතික කිරීම සඳහා ගැලපෙන ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි මගින් පාලනය කරනු ඇත.

(i) වෙළෙඳපොළ අවදානම

**පොළී අනුපාත අවදානම**

පොලී අනුපාත අවදානම යනු මූල්‍ය උපකරණයක අනාගත මුදල් ප්‍රවාහවල සාධාරණ අගය වෙළෙඳපොළ පොළී අනුපාත වල වෙනස්කම් මත උච්චාවචනයවීමේ අවදානමයි. මූලික වශයෙන් විචල්‍ය පොළි අනුපාත සහිත සමූහයේ දිගුකාලීන ණය බැඳීම් වලට අදාළව වෙළෙඳපොළ පොළී අනුපාත වෙනස් වීමේ අවදානමට සමූහය මුහුණ දේ.

සමූහයේ ප්‍රතිපත්තිය වනුයේ පොළී අනුපාත උච්චාවචනවල බලපෑම අවම කිරීම සඳහා ගුවන්යානා කල්බදු ඇතුළුව ස්ථාවර හා විචල්‍ය අනුපාත ණය ගැනුම් අතර ප්‍රශස්ථ සමබරතාවයක් පවත්වා ගැනීමයි.

ණය හා ණය ගැනීම් මත පොළී අනුපාතවල සාධාරණ ලෙස සිදුවිය හැකි වෙනස්කම් මත සංවේදීතාව පහත දැක්වෙන වගුවෙන් නිරූපනය වේ. අනෙකුත් සියලුම විචල්‍යයන් නොවෙනස්ව පවතින විට, විචල්‍ය අනුපාත මත ණය ගැනුම්වල බලපෑම නිසා සමූහයේ/සමාගමේ බදු පෙර අලාභය කෙරෙහි පහත දැක්වෙන පරිදි බලපෑම් කරනු ලබයි.

| | 2018 | | 2017 | |
|---|---|---|---|---|
| | බදු පෙර අලාභය මත බලපෑම | | බදු පෙර අලාභය මත බලපෑම | |
| | සමූහය රු. මිලියන | සමාගම රු. මිලියන | සමූහය රු. මිලියන | සමාගම රු. මිලියන |
| **පොළී අනුපාත වල ඉහළ යෑම/(පහළ යෑම)** | | | | |
| +1% | 732.47 | 730.44 | 462.72 | 462.72 |
| -1% | (732.47) | (730.44) | (462.72) | (462.72) |

* පොළී අනුපාත වල ඉහළ යෑමේ ප්‍රතිඵලයක් ලෙස අලාභයන් ඉහළ යයි

**විදේශ විනිමය අනුපාත අවදානම**

විදේශ ව්‍යවහාර මුදල් අවදානම යනු මූල්‍ය උපකරණයක අනාගත මුදල් ප්‍රවාහ වල සාධාරණ අගය විදේශ විනිමය අනුපාත වල වෙනස්කම් හේතුවෙන් උච්චාවචනයවීමේ අවදානමයි. විදේශ ව්‍යවහාර මුදලින් ගණනය වන ස්වකීය ආදායම්, වියදම්, ණයගැනීම් හා වෙනත් මූල්‍ය උපකරණ නිසා විදේශ විනිමය අනුපාත උච්චාවචනවල බලපෑම් කෙරෙහි සමූහය නිරාවරණය වේ.

ලැබීම් හා ගෙවීම් යන එක් එක් කරුණට අදාළ වන්නා වූ වැදගත් ව්‍යවහාර මුදල් ඒකක ගැලපීමේ සහ උපරිම වශයෙන් හඳුනාගත් විදේශ ව්‍යවහාර මුදල් ණය , විශේෂයෙන් හඳුනාගත් විදේශ ව්‍යවහාර මුදලින් වන අනාගත ආදායම් සුරක්‍ෂා ගිවිසුම් වලට යටත් කිරීමේ ප්‍රතිපත්තියකින් සමූහය එහි විදේශ විනිමය අවදානම කළමණාකරනය කරගෙන ඇත.

ඇ.ඩොලරයට එරෙහිව ශ්‍රී ලංකා රුපියල සාධාරණ ලෙස වෙනස්වන තත්ත්වයක අනෙකුත් සියලුම විචල්‍යයන් නෙවෙනස්ව පවතින විට සමූහයේ /සමාගමේ බදු පෙර අලාභය ( වාර්තාකරන දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි සටහන් කර ඇති ඉතිරි මූල්‍ය වත්කම් වල හා වගකීම් වල සාධාරණ අගයෙහි සිදුවන වෙනස්කම් හේතුවෙන් ) මත වූ සංවේදීතාවය පහත දැක්වෙන වගුවෙන් නිරූපනය වේ. අනෙකුත් ව්‍යවහාර මුදල් සම්බන්ධයෙන් සිදුවූ විදේශ ව්‍යවහාර මුදල් විනිමය වෙනස්කම් මත සමූහයේ නිරාවරණය වැදගත් නොවන සේ සලකා ඇත.

| | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | වෙනත් විස්තීර්ණ ආදායම මත බලපෑම | | බදු පෙර අලාභය මත බලපෑම | | වෙනත් විස්තීර්ණ ආදායම මත බලපෑම | | බදු පෙර අලාභය මත බලපෑම | |
| | සමූහය රු. මිලියන | සමාගම රු. මිලියන | සමූහය රු. මිලියන | සමූහය රු. මිලියන | සමූහය රු. මිලියන | සමූහය රු. මිලියන | සමූහය රු. මිලියන | සමූහය රු. මිලියන |
| **ශ්‍රී ලංකා රුපියලට එරෙහිව ඇමෙරිකානු ඩොලරය අධිප්‍රමාණය වීම/(අවප්‍රමාණය වීම)** | | | | | | | | |
| +3% | 500.16 | 500.16 | 1,227.33 | 1,247.02 | 11.07 | 11.07 | 1,330.14 | 1,644.65 |
| -3% | (500.16) | (500.16) | (1,227.33) | (1,247.02) | (11.07) | (11.07) | (1,330.14) | (1,644.65) |

* ඇමෙරිකානු ඩොලරය අධිප්‍රමාණය වීමේ ප්‍රතිඵලයක් ලෙස අලාභයන් ඉහළ යයි.

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් ඉතිරි කොටස.

## 29. මූල්‍ය අවදානම් කළමණාකරන අරමුණු සහ ප්‍රතිපත්ති (ඉතිරි කොටස)

### (ii) ද්‍රවශීලතා අවදානම

ද්‍රවශීලතා අවදානම යනු සිය ප්‍රවර්තන හා අනාගත මුදල් බැඳියාවන්, ඒවා ගෙවීමට නියමිත අවස්ථාව වන විට සමූහයට එය සපුරාලීමට නොහැකි වීමේ අවදානමයි. දෛනිකව/සතිපතා/ මාසිකව හා වාර්ෂිකව සිදු කෙරෙන මුදල් කළමණාකරනය හා අයවැය ක්‍රියාවලියක් උපයෝගී කරගනිමින් සමූහය සිය අරමුදල් ඌනතාවයේ අවදානම නිරීක්ෂණය කරනු ලබයි. එම අවදානම අවම කිරීම සඳහා සමූහය විසින් දිගු හා කෙටි කාලීන ණය, බැංකු අයිරා පහසුකම් සහ මූල්‍ය /මෙහෙයුම් කල්බදු ඇතුලත් විවිධ මූලාශ්‍ර තුළින් අරමුදල් සම්පාදනය මූල්‍ය ආයතනයන්ගෙන් සිදුකරයි.

ගිවිසුම්ගත වට්ටම් නොකළ ගෙවීම් මත පදනම් වූ සමූහයේ /සමාගමේ මූල්‍ය වගකීම්වල පරිණතභාවයේ තත්ත්වය පහත දැක්වෙන වගුවෙන් සාරාංශ කර පෙන්වා ඇත.

| | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|
| සමූහය | ඉල්ලීම මත | මාස 03 ට වඩා අඩු | මාස 03 සිට 12 දක්වා | වර්ෂ 01 සිට 05 දක්වා | වර්ෂ 05 ට වඩා වැඩි | එකතුව |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| පොලී භරිත වගකීම් | 1,757.14 | 2,145.17 | 60,855.24 | 29,302.27 | 29.82 | 94,089.64 |
| ගුවන්යානා නඩත්තු හා පිරිවැඩියා පිරිවැය | 2,946.37 | 1,505.50 | 217.43 | 19,016.36 | 3,522.74 | 27,208.40 |
| වෙළෙඳ හා වෙනත් ගෙවිය යුතු දෑ | - | 26,998.76 | - | - | - | 26,998.76 |
| වරණීය කොටස් | - | 65.05 | 65.05 | 1,195.15 | - | 1,325.25 |
| | 4,703.51 | 30,714.48 | 61,137.72 | 49,513.78 | 3,552.56 | 149,622.05 |
| **සමාගම** | | | | | | |
| පොලී භරිත වගකීම් | 1,757.14 | 2,115.84 | 60,769.38 | 29,242.38 | 29.82 | 93,914.56 |
| ගුවන්යානා නඩත්තු හා පිරිවැඩියා පිරිවැය | 2,946.37 | 1,505.50 | 217.43 | 19,016.36 | 3,522.74 | 27,208.40 |
| වෙළෙඳ හා වෙනත් ගෙවිය යුතු දෑ | - | 26,009.10 | - | - | - | 26,009.10 |
| | 4,703.51 | 29,630.44 | 60,986.81 | 48,258.74 | 3,552.56 | 147,132.06 |

| | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|
| සමූහය | ඉල්ලීම මත | මාස 03 ට වඩා අඩු | මාස 03 සිට 12 දක්වා | වර්ෂ 01 සිට 05 දක්වා | වර්ෂ 05 ට වඩා වැඩි | එකතුව |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| පොලී භරිත වගකීම් | 7,541.30 | 1,218.78 | 55,323.39 | 30,202.57 | 176.49 | 94,462.53 |
| ගුවන්යානා නඩත්තු හා පිරිවැඩියා පිරිවැය | 1,409.25 | 689.74 | 2,724.68 | 5,561.65 | 2,534.07 | 12,919.39 |
| වෙළෙඳ හා වෙනත් ගෙවිය යුතු දෑ | - | 36,697.06 | - | - | - | 36,697.06 |
| වරණීය කොටස් | - | 65.05 | 65.05 | 1,276.46 | - | 1,406.56 |
| | 8,950.55 | 38,670.63 | 58,113.12 | 37,040.68 | 2,710.56 | 145,485.54 |
| **සමාගම** | | | | | | |
| පොලී භරිත වගකීම් | 7,541.30 | 1,218.27 | 55,321.87 | 30,202.57 | 176.49 | 94,460.50 |
| ගුවන්යානා නඩත්තු හා පිරිවැඩියා පිරිවැය | 1,409.25 | 689.74 | 2,724.68 | 5,561.65 | 2,534.07 | 12,919.39 |
| වෙළෙඳ හා වෙනත් ගෙවිය යුතු දෑ | - | 35,956.39 | - | - | - | 35,956.39 |
| | 8,950.55 | 37,864.40 | 58,046.55 | 35,764.22 | 2,710.56 | 143,336.28 |

(iii) ණය අවදානම

ණය අවදානම යනු මූල්‍ය අලාභයකට හේතුවන අයුරින් මූල්‍ය උපකරණයක් හෝ සේවාදායක ගිවිසුමක් යටතේ ප්‍රතිපාර්ශවයක් විසින් තමන්ගේ බැඳීම් ඉෂ්ඨ නොකිරීමේ අවදානමයි. ප්‍රධාන වශයෙන් සිය මෙහෙයුම් කටයුතු තුළින් (මූලික වශයෙන් වෙළෙඳ ලැබිය යුතු දෑ සඳහා) සමූහය ණය අවදානමට නිරාවරණය වේ.

ගුවන් මගී විකුණුම් හා ගුවන් බඩු ප්‍රවාහනය මූලික වශයෙන් අන්තර්ජාතික ගුවන් ප්‍රවාහන සංගමයේ බලයලත් අලෙවි නියෝජිතයින් හරහා සිදුවේ. පුළුල් විවිධාංගීකරණය ආධාරයෙන් එවැනි විකුණුම් වල ණය අවදානම සාපේක්ෂව සුළු අවදානමක් වී ඇත. මෙම නියෝජිතයින්ගේ පියවීම්, අන්තර්ජාතික ගුවන් ප්‍රවාහන සංගමය විසින් සිය ගුවන් මගී හා ගුවන් භාණ්ඩ බේරුම් කිරීමේ යෝජනා ක්‍රමය හරහා එකතු කර ගනී. එම එක්රැස් කළ අරමුදල් අන්තර්ජාතික ගුවන් ප්‍රවාහන සංගමය විසින් සෘජුවම ගුවන් සමාගමට පියවන අතර එමගින් එකී නියෝජිතවරුන්ගේ ණය ගෙවීමේ හැකියාව පිළිබඳව වැඩි සහතික කිරීමක් ලබා දේ.

ප්‍රධාන ගුවන් සමාගම් අතර ලැබිය යුතු දෑ හා ගෙවිය යුතු දෑ මූලික වශයෙන් පියවනු ලබන්නේ අන්තර්ජාතික ගුවන් ප්‍රවාහන සංගමයේ නිශ්කාෂණ මධ්‍යස්ථානයෙනි. සාමාන්‍යයෙන් ලැබිය යුතු දෑ හා ගෙවිය යුතු දෑ ශුද්ධ කර පියවනු ලබන්නේ සතියක විරාමයක් සහිතව වන අතර එමඟින් ගෙවීම් කඩ කිරීමේ අවදානමෙහි පැහැදිලි අඩුවීමක් සිදුවේ.

ඉටු කරනු ලබන සේවාවන්හි ස්වභාවය හා විෂය පථය අනුව වෙනත් සේවා සබඳතා සඳහා ඇප සුරැකුමක් අවශ්‍ය වේ. ණය ගැතියන්ගෙන් ලැබෙන එවැනි ඇප සුරැකුම් තුළ බැංකු ඇපකර සහ සුරැකුම් තැන්පතු ඇතුළත් වේ.

අවදානම් හඳුනාගත් විට අඩමාණ ලැබිය යුතු දෑ ගිණුම් සඳහා හානිකරණ ප්‍රතිපාදන සිදුකරයි.

**ප්‍රාග්ධන කළමණාකරනය**

මෙම මූල්‍ය ප්‍රකාශන වල 3 වන සටහනෙහි වැඩි වශයෙන් විස්තර කර ඇති ව්‍යාපාර සැලැස්ම මත පිහිටා අවශ්‍ය අරමුදල් සැපයීම සඳහා වන ශ්‍රී ලංකා රජයේ වගකීම, ණය මූල්‍ය අරමුදල් සපයා ගැනීම සඳහා සහන ලිපි නිකුත් කිරීම, ප්‍රාග්ධන අන්තර්ග්‍රහනයන් සහ රාජ්‍ය ඇපකර වැනි මාර්ග හරහා ඉෂ්ඨ කර ඇත.

සමූහයේ කළමණාකරනය විසින් ප්‍රාග්ධන ව්‍යුහය අඛණ්ඩව සමාලෝචනය හා නිරීක්ෂණය කරනු ලබන අතර ප්‍රවර්තන වෙළෙඳපොළ තත්ත්වයන් හා සමූහයේ මෙහෙයුම් කටයුතු නිරූපනය වන පරිදි ගැලපුම් සිදුකිරීම සඳහා අවශ්‍ය පියවර ගනු ඇත,

## 30. සංසන්දනාත්මක තොරතුරු

ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ සහ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ පහත දැක්වෙන අයිතම වඩා හොඳ ඉදිරිපත් කිරීමක් සඳහා ප්‍රතිවර්ගීකරණය කර ඇත.

| | සමූහය | | | සමාගම | | |
|---|---|---|---|---|---|---|
| | 2017 | | 2017 | 2017 | | 2017 |
| | | ප්‍රතිවර්ගීකරණය | ප්‍රතිවර්ගිත | | ප්‍රතිවර්ගීකරණය | ප්‍රතිවර්ගිත |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| **මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය** | | | | | | |
| ආයෝජන | - | 292.94 | 292.94 | - | 292.94 | 292.94 |
| මුදල් හා බැංකු ශේෂ | 2,053.35 | (292.94) | 1,760.41 | 1,623.32 | (292.94) | 1,330.38 |
| **ලාභ හෝ අලාභ ප්‍රකාශනය** | | | | | | |
| අදායම | 138,563.23 | 27.60 | 138,590.83 | 135,463.59 | 27.60 | 135,491.19 |
| විකුණුම් අලෙවි සහ ප්‍රචාරණ වියදම් | (12,709.68) | (27.60) | (12,737.28) | (12,657.28) | (27.60) | (12,684.88) |
| සේවක පිරිවැය | (20,015.81) | 3.25 | (20,012.56) | 18,797.04) | 3.25 | (18,793.79) |
| වෙනත් මෙහෙයුම් පිරිවැය | (10,700.30) | (3.25) | (10,703.55) | (10,450.45) | (3.25) | (10,453.70) |
| ශුද්ධ වත්කම් මත බලපෑම | | - | | | - | |

# ඇමුණුම්


| | |
|---|---|
| දස අවුරුදු සමාලෝචනය | 102 |
| ගුවන් මාර්ග සිතියම | 104 |
| විශේෂ කඩඉම් | 106 |
| පාරිභාෂික පද විවරණය | 108 |
| වාර්ෂික මහ සභා රැස්වීම් නිවේදනය | 109 |
| පෙරකලාසි පත්‍රය | 111 |

# දස අවුරුදු සමාලෝචනය

| | | 2018 | 2017 | 2016 | 2015 |
|---|---|---|---|---|---|
| **ලාබ හෝ අලාභ ප්‍රකාශනය** | | | | | |
| ආදායම | රු. මිලියන | 161,654.46 | 135,491.19 | 129,480.41 | 131,922.13 |
| මෙහෙයුම් වියදම් | රු. මිලියන | 176,104.44 | 146,760.81 | 137,311.44 | 145,983.35 |
| ශුද්ධ ලාභය/(අලාභය) | රු. මිලියන | (17,213.57) | (28,929.99) | (12,621.69) | (16,494.66) |
| **මූල්‍යතත්ව ප්‍රකාශනය** | | | | | |
| කොටස් ප්‍රාග්ධනය/ප්‍රකාශිත ප්‍රාග්ධනය | රු. මිලියන | 51,617.44 | 51,617.44 | 51,617.44 | 51,617.44 |
| ජංගම නොවන වත්කම් | රු. මිලියන | 37,476.46 | 24,660.56 | 23,548.01 | 22,836.77 |
| ජංගම වත්කම් | රු. මිලියන | 30,090.50 | 26,973.07 | 26,901.02 | 49,721.49 |
| මුළු වත්කම් | රු. මිලියන | 67,566.96 | 51,633.63 | 50,449.03 | 72,558.26 |
| ජංගම වගකීම් | රු. මිලියන | 130,358.61 | 126,302.55 | 100,334.44 | 103,414.31 |
| **එලදාව/ඒකක පිරිවැය** | | | | | |
| සමස්ථ එලදාව | රු. ටී කේ එම් | 84.37 | 80.08 | 79.06 | 80.32 |
| ඒකක පිරිවැය | රු. ටී කේ එම් | 69.10 | 64.79 | 61.39 | 61.88 |
| සමච්ඡේදක පැටවුම් සාධකය | % | 81.90 | 80.91 | 77.65 | 77.03 |
| ආදායම් මගී කිලෝමීටරයක ආදායම | රු./ආර් පී කේ | 8.60 | 8.40 | 8.20 | 8.20 |
| **නිෂ්පාදනය** | | | | | |
| මගී ධාරිතාවය | ඒ එස් කේ මිලියන | 18,487.54 | 15,608.10 | 15,790.28 | 16,180.27 |
| සමස්ත ධාරිතාවය | ඒ ටී කේ මිලියන | 2,549.88 | 2,167.92 | 2,165.21 | 2,224.87 |
| **ප්‍රවාහනය** | | | | | |
| ප්‍රවාහනය කළ මගී සංඛ්‍යාව | සංඛ්‍යාව - දහස් | 5,839 | 4,446 | 4,328 | 4,348 |
| ප්‍රවාහනය කළ මගී සංඛ්‍යාව | ආර් පී කේ මිලියන | 15,280.78 | 12,455.05 | 12,727.66 | 12,963.71 |
| මගී පැටවුම් සාධකය | % | 82.65 | 79.80 | 80.60 | 80.12 |
| **ප්‍රවාහනය කළ භාණ්ඩ ප්‍රමාණය** | ටොන් | 132,958 | 116,221 | 102,082 | 101,878 |
| ප්‍රවාහනය කළ මගී සංඛ්‍යාව | ආර් ටී කේ මිලියන | 401.66 | 374.46 | 356.76 | 373.32 |
| ප්‍රවාහනය කළ සමස්ථ පැටවුම | ආර් ටී කේ මිලියන | 1,749.14 | 1,475.29 | 1,484.77 | 1,519.93 |
| සමස්ත පැටවුම් සාධකය | % | 68.60 | 68.05 | 68.57 | 68.32 |
| **කාර්ය මණ්ඩලය** | | | | | |
| පිරිස් බලයේ සාමාන්‍ය | සංඛ්‍යාව | 7,019 | 7,021 | 6,959 | 6,987 |
| එක් සේවකයකුගේ ආදායම | රු. | 23,030,982 | 19,294,059 | 18,606,181 | 18,881,084 |
| සේවකයකුගේ ධාරිතාව | ටොන් - කිලෝමීටර | 363,283 | 308,776 | 311,139 | 318,430 |
| සේවකයකු සඳහා ප්‍රවාහනය කළ පැටවුම් | ටොන් - කිලෝමීටර | 249,201 | 210,126 | 213,359 | 217,537 |
| **ගුවන්යානා බලඇණිය** | | | | | |
| A320-200 | සංඛ්‍යාව | 5 | 6 | 6 | 6 |
| A321-200 | සංඛ්‍යාව | 3 | 3 | 2 | 2 |
| A320neo | සංඛ්‍යාව | 2 | 2 | - | - |
| A321neo | සංඛ්‍යාව | 3 | - | - | - |
| A330-200 | සංඛ්‍යාව | 6 | 6 | 6 | 7 |
| A330-300 | සංඛ්‍යාව | 7 | 7 | 7 | 2 |
| A340-300 | සංඛ්‍යාව | - | - | - | 4 |
| ටර්බො ඔටර් | සංඛ්‍යාව | - | - | - | - |
| වර්ෂය අවසානයේ සේවයේ යෙදවූ ගුවන්යානා | සංඛ්‍යාව | 26 | 24 | 21 | 21 |
| **ගුවන්යානා භාවිතය** | | | | | |
| A320-200 | දිනකට අවහිර පැය ගණන | 13.12 | 11.70 | 12.43 | 12.86 |
| A320-Neo | දිනකට අවහිර පැය ගණන | 12.25 | 9.31 | - | - |
| A321-200 | දිනකට අවහිර පැය ගණන | 12.42 | 12.08 | 12.65 | 13.10 |
| A321-Neo | දිනකට අවහිර පැය ගණන | 13.14 | - | - | - |
| A330-200 | දිනකට අවහිර පැය ගණන | 11.94 | 11.67 | 12.59 | 14.11 |
| A330-300 | දිනකට අවහිර පැය ගණන | 15.02 | 14.03 | 14.66 | 13.43 |
| A340-300 | දිනකට අවහිර පැය ගණන | - | - | - | 11.42 |
| බලඇණිය | දිනකට අවහිර පැය ගණන | 13.25 | 12.44 | 12.02 | 12.90 |

| 2014 | 2013 | 2012 | 2011 | 2010 | 2009 |
|---|---|---|---|---|---|
| 121,585.83 | 119,570.90 | 92,867.93 | 77,125.45 | 62,363.58 | 73,307.77 |
| 150,389.46 | 146,700.24 | 111,775.88 | 81,334.34 | 69,026.74 | 84,794.86 |
| (32,408.34) | (26,088.57) | (19,778.03) | (381.61) | (2,698.20) | (9,305.94) |
| 51,617.44 | 32,032.75 | 19,432.67 | 5,146.35 | 5,146.35 | 5,146.35 |
| 25,212.47 | 23,338.28 | 37,591.58 | 19,862.87 | 28,531.75 | 19,333.18 |
| 37,154.23 | 54,905.22 | 22,072.71 | 18,276.59 | 15,910.82 | 15,008.38 |
| 62,366.70 | 78,243.50 | 59,664.29 | 38,139.46 | 44,442.57 | 34,341.56 |
| 88,609.07 | 71,346.64 | 64,235.43 | 28,017.97 | 28,399.92 | 25,012.31 |
| 77.26 | 74.31 | 64.47 | 60.27 | 54.94 | 64.85 |
| 64.96 | 64.68 | 57.28 | 45.92 | 43.37 | 50.71 |
| 84.07 | 87.03 | 88.84 | 76.19 | 78.94 | 78.19 |
| 7.80 | 7.60 | 6.60 | 6.30 | 5.80 | 6.80 |
| 15,780.54 | 15,944.31 | 14,248.94 | 12,481.41 | 10,724.83 | 11,731.56 |
| 2,187.18 | 2,186.96 | 1,978.33 | 1,755.23 | 1,541.03 | 1,635.62 |
| 4,175 | 4,255 | 3,459 | 2,867 | 2,558 | 2,735 |
| 12,810.95 | 12,968.74 | 11,270.23 | 9,584.02 | 8,357.89 | 8,546.44 |
| 81.18 | 81.34 | 79.10 | 76.79 | 77.93 | 72.85 |
| 94,410 | 101,100 | 87,750 | 86,053 | 72,058 | 73,106 |
| 355.59 | 377.75 | 345.67 | 332.98 | 283.83 | 302.36 |
| 1,466.74 | 1,513.70 | 1,338.30 | 1,184.13 | 1,028.11 | 1,065.15 |
| 67.06 | 69.22 | 67.65 | 67.46 | 66.72 | 65.12 |
| 6,578 | 6,359 | 5,594 | 4,998 | 4,614 | 4,837 |
| 18,483,708 | 18,803,412 | 16,601,346 | 15,431,263 | 13,516,164 | 15,155,627 |
| 332,499 | 343,916 | 353,652 | 351,186 | 333,991 | 338,148 |
| 222,976 | 238,041 | 239,238 | 236,922 | 222,825 | 220,210 |
| 8 | 8 | 7 | 4 | 3 | 3 |
| - | - | - | - | - | - |
| - | - | - | - | - | - |
| - | - | - | - | - | - |
| 7 | 7 | 7 | 5 | 4 | 4 |
| - | - | - | - | - | - |
| 6 | 6 | 6 | 5 | 5 | 5 |
| - | 1 | 2 | 2 | - | - |
| 21 | 22 | 22 | 16 | 12 | 12 |
| 12.11 | 11.79 | 11.21 | 11.77 | 11.23 | 10.76 |
| - | - | - | - | - | - |
| 9.54 | - | - | - | - | - |
| - | - | - | - | - | - |
| 14.68 | 13.82 | 14.30 | 14.56 | 12.86 | 13.45 |
| - | - | - | - | - | - |
| 11.44 | 13.10 | 15.22 | 15.16 | 14.31 | 15.04 |
| 12.76 | 12.82 | 13.48 | 14.05 | 13.05 | 13.15 |

# ගුවන් මාර්ග සිතියම




| 2200 | 2300 | 2400 | 0100 | 0200 | 0230 | 0600 | 0700 | 0800 | 0900 | 1000 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| ලොස් ඇන්ජලීස්<br>සැන් ෆ්‍රැන්සිස්කෝ<br>වැන්කුවර් | කැලගරි | චිකාගෝ<br>ඩලාස් | මොන්ට්‍රියල්<br>මයාමි<br>නිව්යෝක්<br>ඔටාවා<br>ටොරොන්ටෝ<br>වොෂිංටන් | හැලිෆැක්ස් | සෙන්ට්<br>ජෝන්ස් | ඩබ්ලින්<br>එඩිංග්බර්ග්<br>ලන්ඩන්<br>මැන්චෙස්ටර් | ඈම්ස්ටර්ඩෑම්<br>බාසිලෝනා<br>බෙල්ග්‍රේඩ්<br>බ්‍රසල්ස්<br>කැටානියා<br>කොපන්හේගන්<br>ෆ්‍රැන්ක්ෆර්ට්<br>ජිනීවා<br>මැඩ්රිඩ්<br>මිලාන්<br>මියුන්ච්<br>ඔස්ලෝ<br>පැලර්මෝ<br>පැරිස්<br>රෝමය<br>ස්ටොක්හෝම්<br>ටියුරින්<br>වැනීසිය<br>වියානා<br>සූරිච් | අම්මාන්<br>ඇතන්ස්<br>කේප් ටවුන්<br>හෙල්සින්කි<br>ඉස්තාන්බුල්<br>ජොහැනස්බර්ග්<br>සොෆියා | බහරේන්<br>දම්මාම්<br>ඩෝහා<br>ජෙඩා<br>කුවේට්<br>මොස්කව්<br>නයිරෝබි<br>රියාද් | අබුදාබි<br>ඩුබායි<br>මස්කට්<br>සීෂෙල්ස් |

කාල කලාපයන් කොළඹ වේලාව 11.30 වන විට සියළුම වේලාවන් ග්‍රිනිච් මධ්‍ය වේලාවෙනි.

www.srilankan.com/serendib

## මාර්ග ජාලය

දැනට ශ්‍රී ලංකන් ගුවන් සමාගම යුරෝපය, මැද පෙර දිග, දකුණු ආසියාව, අග්නිදිග ආසියාව, ඈත පෙරදිග උතුරු ඇමෙරිකාව වැනි කලාප වල රටවල් 48 ක් පුරා ගමනාන්ත 111 ක් සඳහා සේවා සපයයි.




SriLankan Airlines

oneworld

**1100**
ගැන්
අයිලන්ඩ්
කරච්චි
ලාහෝර්
මාලේ

**1130**
ඉන්දියාව
අම්රිත්සාර්
බැංගලෝර්
බුහ්බනේෂ්වර්
බුද්ධගයා
චෙන්නායි
කොච්ං
කොයිංබතෝර්
ගෝආ
ගුවහටී
ශයිද්‍රාබාද්
ජයපූර්
කත්මන්ඩු
කොල්කටා
ලක්නව්
මදුරෙයි
මුම්බායි
නව දිල්ලිය
පද්න
තිරිච්රප්පලෙ
ත්‍රිවැන්ද්‍රම්
වරනාසි

**1130**
කොළඹ

**1300**
බැංකොක්
හැනොයි
හො චි මින් සිටි
ජකර්තා
පුකට්
නොම් පෙං
යැංගොන්

**1400**
බීජිං
කැන්ටන්
ක්වාලාලම්පූර්
ලැංකවි
පෙනෑං
පර්ත්
ෂැංහයි
සිංගප්පූරුව

**1500**
ෆුකොවුකා
හැනෙඩා
ඉටමි
කංසායි
නගෝයා
නරිටා
සපොරෝ

**1530**
ඇඩිලේඩ්
ඩාවිං

**1600**
බ්‍රිස්බේන්
මෙල්බර්
සිඩ්නි

**1800**
ඕක්ලන්ඩ්

# විශේෂ කඩඉම්

### 2008 / 2009

- සමාගම විසින් මෙහෙයුම් කල්බදු ගිවිසුමක් යටතේ A320 වර්ගයේ එයාර් බස් ගුවන් යානයක් භාරගන්නා ලදී.
- එමිරේට්ස් ගුවන් සමාගම විසින් වර්ෂ 10 කාල සීමාවක් සඳහා සමාග මේ කළමනාකාරිත්වය පාලනය දරන ලද අතර එය 2008 මාර්තු මාසයේදී අවසන් විය. ඉන් අනතුරුව, සමාගමේ කළමණාකරණය 2008 අප්‍රේල් මස 01 වන දින සිට බලපැවැත්වෙන පරිදි ශ්‍රී ලංකා රජය වෙත පවරා දෙනු ලැබිණි.
- සමාගම විසින් ක්‍රියාත්මක කරනු ලබන “FlySmiLes” යන නිරන්තර ගුවන් පියාසර වැඩසටහන හඳුන්වා දීම

### 2009 / 2010

- සමාගම විසින් මෙහෙයුම් කල්බදු ගිවිසුමක් යටතේ A320 වර්ගයේ එයාර් බස් ගුවන් යානා 02 ක් භාරගන්නා ලදී.

### 2010 / 2011

- සමාගම විසින් මෙහෙයුම් කල්බදු ගිවිසුමක් යටතේ A320 වර්ගයේ එයාර් බස් ගුවන් යානාවක් සහ '330 වර්ගයේ පුළුල් බඳ එයාර් බස් ගුවන් යානා 02 භාරගන්නා ලදී.
- එමිරේට්ස් ගුවන් සමාගම විසින් දරන ලද 43.63% ක සමාගමේ කොටස් හිමිකාරිත්වයේ මිලදී ගැනීම සඳහා ශ්‍රී ලංකා රජය 2010 ජුලි මාසයේදී පහසුකම් සලසන ලදී.

### 2014 / 2015

- සමාගම 2014 මයි මාසයේදී oneworld ගුවන් සමාගම් සන්ධානයට ඇතුලත් විය.
- සමාගම 2014 ජුනි මාසයේදී ප්‍රථම වරට පස් අවුරුදු ජාත්‍යන්තර බැඳුම්කරයක් නිකුත් කරන ලදී.
- සමාගම විසින් පුළුල් බඳ ගුවන්යානා නැවත බලඇණිගත කිරීමේ වැඩසටහනේ කොටසක් ලෙස පිලිවෙලින් 2014 ඔක්තෝම්බර් මාසයේදී සහ 2015 මාර්තු මාසයේදී A 330-300 වර්ගයේ නව ගුවන්යානා තුනක් භාරගන්නා ලදී.

### 2015 / 2016

- 2015 එපෙක්ස් ගුවන් මඟීන්ගේ හොඳම තෝරා ගැනීම් සම්මාන උළෙලේදී ශ්‍රී ලංකන් ගුවන් සමාගම “ආසියාව සහ ඕස්ට්‍රේලේෂියා කලාපයේ විශිෂ්ටතමයා”, “හොඳම ගුවන්යානාස්ථ ප්‍රකාශන පළකිරීම්”, “හොඳම ගුවන්යානාස්ථ වීඩියෝ ප්‍රදර්ශනය” සහ “හොඳම ගොඩබිම් සේවා අත්දැකීම්” යන මහඟු සම්මාන හතරක් සඳහා ලැයිස්තුගත කෙරුණි. ගුවන් සමාගම සම්මාන කාණ්ඩ හතරක් සඳහා නාමයෝජනා කෙරුණු ප්‍රථම අවස්ථාව මෙය විය. 2015 සැප්තැම්බර් මස ගුවන් එපෙක්ස් පෝට්ලන්ඩ් ඔරිගන් සම්මාන උළෙලේදී ආසියාව සහ ඕස්ට්‍රේලේෂියා කලාපයේ මගී අත්දැකීම් සඳහා ඉහළම අත්කරගැනීමේ සම්මානයෙන් සහ සිංගප්පූරු 2015 විශිෂ්ටතම ඉදිරි ගුවන් ගමන් අත්දැකීම් සම්මාන උළෙලේදී මධ්‍යම හා දකුණු ආසියාවේ පූර්ණ ගුවන් මගී අත්දැකීම් පිලිබඳ සම්මානයෙන් ගුවන් සමාගම පිදුම් ලැබීය.
- සමාගම විසින් පුළුල් බඳ ගුවන්යානා නැවත බලඇණිගත කිරීමේ වැඩසටහනේ කොටසක් ලෙස පිලිවෙලින් 2014 අගෝස්තු, නොවැම්බර් සහ දෙසැම්බර් මාස වලදී A 330-300 වර්ගයේ නව ගුවන්යානා හතරක් භාරගන්නා ලදී.

### 2016 / 2017

- 2017 පෙබරවාරි මාසයේදී හා 2017 මාර්තු මාසයේදී A320neo වර්ගයේ ගුවන් යානා දෙකක් හඳුන්වා දීම - ප්‍රථම A320 -A321 වර්ගයේ නව එන්ජිම සහිත විකල්ප ගුවන්යානා දෙක ගුවන්යානා බලඇණියට සම්බන්ධ විය.
- ලාහෝර්, ජකර්තා, ඩකා, කල්කටා, මදුරෙයි, වරනාසි, බුද්ධගයා, මස්කට්, බහරේන්, සීෂෙල්ස් හා ගාන් දූපත් යන ආකර්ෂණීය නව ගමනාන්ත 11 ක් වෙත ශ්‍රී ලංකන් ගුවන් සමාගම සිය සේවා ආරම්භ කරන ලදී.
- දකුණු ආසියාවේ විශිෂ්ටතම ගුවන් සමාගම යන ප්‍රධාන සංචාරක සම්මානය, “2016 ආසියාවේ අනාගත ගමන් අත්දැකීම නමැති සම්මාන උළෙලේදී මධ්‍ය හා දකුණු ආසියාවේ හොඳම පූර්ණ සේවා ගුවන් සමාගම සම්මානය නොකඩවා දෙවන වරටද ශ්‍රී ලංකන් ගුවන් සමාගම වෙත ප්‍රදානය කෙරිණි. 07 වන ආසියානු සේවා යෝජක සන්නාම සම්මාන උළෙලේදී සමාගම “පුහුණු විශිෂ්ටතා සම්මානයෙන්” හා “ව්‍යාපාරයට සමගාමීව හොඳම මානව සම්පත් උපාය මාර්ගය “ යන සම්මානයෙන් පිදුම් ලැබීය.

## 2011 2012

- සමාගම විසින් මෙහෙයුම් කල්බදු ගිවිසුමක් යටතේ A320 වර්ගයේ එයාර් බස් ගුවන් යානා 04ක්, A330 වර්ගයේ පුළුල් බඳ එයාර් බස් ගුවන් යානා 02 ක් සහ A340 වර්ගයේ පුළුල් බඳ එයාර් බස් ගුවන් යානාවක් භාරගන්නා ලදී.
- ගුවන් සමාගමේ ප්‍රතිප්‍රාග්ධනිත කටයුතු සඳහා ශ්‍රී ලංකා රජය විසින් ඇමරිකානු ඩොලර් මිලියන 500 ක කොටස් ආයෝජනයක් කිරීමට කැබිනට් අනුමැතිය ලැබීම.

## 2012 2013

- ලොව ප්‍රමුඛම ගුවන් සමාගම් සන්ධානයක් වන oneworld සන්ධානයේ සම්බන්ධවීමට ආරාධනයක් ලැබීම.
- A320 වර්ගයේ ගුවන්යානාවල නියමුවන් පුහුණු කිරීම සඳහා ශ්‍රී ලංකාව තුළ ප්‍රථම වරට A320 සිමියුලේටරයක් ස්ථාපනය කිරීම.
- සමාගම විසින් මෙහෙයුම් කල්බදු ගිවිසුමක් යටතේ A320 වර්ගයේ එයාර් බස් ගුවන් යානයක් භාරගන්නා ලදී.
- මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපළේ සිට ජාත්‍යන්තර ගුවන්යානා වල ගමන් ඇරඹීම.
- ඇමරිකානු ඩොලර් මිලියන 175 ක්වූ මූල්‍ය පහසුකම් ලබා ගැනීම සඳහා 2012 මැයි මාසයේදී සමාගම විදේශ බැංකු සමූහයක් සමඟ මූල්‍ය සම්පාදන ගිවිසුමකට එළඹීම.

## 2013 2014

- A330 වර්ගයේ ගුවන්යානාවල නියමුවන් පුහුණු කිරීම සඳහා ගුවන්යානා සිමියුලේටරයක් ස්ථාපනය කිරීම.
- පුළුල් බඳ ගුවන්යානා බලඇණිය වෙනුවට A330-300 වර්ගයේ ගුවන්යානා හයක් සහ A350-900 වර්ගයේ ගුවන්යානා හතරක් 2014 සිට 2021 දක්වා කාලපරිච්ඡේදය තුළ භාරදීම සඳහා සමාගම, එයාර් බස් ආයතනය සමඟ මිලදීගැනුම් ගිවිසුමකට එළඹී අතර 2016 දී A 350-900 වර්ගයේ තවත් නව ගුවන් යානා තුනක් භාරදීම සඳහා කල්බදු ගිවිසුම්වලට එළඹෙන ලදී.
- 2013 දෙසැම්බර් මාසයේදී සමාගම ස්වකීය ගුවන් මඟී සේවා පද්ධතිය, ඇමඩියස් අල්ටියා පද්ධතියට පරිවර්තනය කිරීම.
- ඇමරිකානු ඩොලර් මිලියන 150 ක් වූ මධ්‍ය කාලීන මූල්‍ය පහසුකම් ලබා ගැනීම සඳහා 2014 මාර්තු මාසයේදී සමාගම බැංකු සමූහයක් සමඟ මූල්‍ය සම්පාදන ගිවිසුමකට එළඹීම.

## 2017 2018

- 2017 ජුනි, ඔක්තෝබර් සහ දෙසැම්බර් මාස වලදී A321neo වර්ගයේ ගුවන් යානා තුනක් සමාගම භාරගන්නා ලදී.
- මෙල්බර්න්, හයිද්‍රාබාද්, කොයිම්බැටෝර් සහ විසකාපත්නම් යන නව ගමනාන්ත 04 ක් වෙත ශ්‍රී ලංකන් ගුවන් සමාගම සිය සේවා ආරම්භ කරන ලදී.
- ගුවන් මඟී අත්දැකීම් සංවිධානය (එපෙක්ස්) විශිෂ්ඨ තරු හතර ශ්‍රේණිය සමාගම ලද අතර සිංගප්පූරුවේ - 2017 ආසියාවේ අනාගත ගමන් අත්දැකීම නමැති සම්මාන උළෙලේදී නොකඩවා තෙවන වරට අතිවිශිෂ්ඨ සේවාවන් සඳහා සම්මානය ශ්‍රී ලංකන් ගුවන් සමාගම වෙත ප්‍රදානය කෙරිණි. සිංගප්පූරුවේ - 2017 ගුවන්යානාස්ථ ආසියා පැසිපික් සම්මාන උළෙලේදී "වාණිජ ගුවන් යානා තුල නව්‍යකරණයන් " සඳහා සම්මානයෙන්ද පිදුම් ලැබීය.

# පාරිභාෂික පද විවරණය

**ලබාගත හැකි ආසන කිලෝමීටර් ප්‍රමාණය** (ASK)
අලෙවිය සඳහා පවතින ආසන නිෂ්පාදනය සහ ඒවා ප්‍රවාහනය කරන දුර ප්‍රමාණය

**ලබාගත හැකි ටොන් කිලෝමීටර් ප්‍රමාණය** (ATK)
මෙය ප්‍රවාහන නිෂ්පාදනයෙහි මිණුම වේ.
ගුවන් යානාවක් විසින් නිපදවන ලබාගත හැකි ටොන් කිලෝමීටර ප්‍රමාණය වනුයේ, පියාසර කළ දුර ප්‍රමාණය, ටොන් ප්‍රමාණයෙන් ගුණ වීමෙන් ගණනය වන ගුවන් යානාවේ බර සඳහා ධාරිතාවයි.

**ආදායම් මගී කිලෝමීටර් ප්‍රමාණය** (RPK)
ප්‍රවාහනය කළ මගීන් සහ ඔවුන් ප්‍රවාහනය කළ දුර ප්‍රමානය

**ආදායම් ටොන් කිලෝමීටර ප්‍රමාණ** (RTK)
ටොන් වලින් ප්‍රවාහනය කල මගී සහ භාණ්ඩ නිෂ්පාදනය සහ ඒවා ප්‍රවාහනය කෙරෙන දුර ප්‍රමාණය.

**පැටවුම් සාධකය**
සැපයන ලද ධාරිතාවයට ආදායම් පැටවුමේ සබඳතාවය අනුව ප්‍රතිශතය.

මගී පැටවුම් සාධකය, ආදායම් මගී කිලෝමීටර් ප්‍රමාණයට ලබාගත හැකි ආසන කිලෝමීටර් ප්‍රමාණය හා අදාළ වන අතර සමස්ත පැටවුම් සාධකය, ආදායම් ටොන් කිලෝමීටර් ප්‍රමාණයට ලබාගත හැකි ටොන් කිලෝමීටර් ප්‍රමාණය හා අදාළ වේ.

**ආදායම් මගී කිලෝමීටර් ප්‍රමාණයට ආදායම**
ආදායම් මගී කිලෝමීටර් ප්‍රමාණයට ආදායම, ආදායම් මගී කිලෝමීටර් ප්‍රමාණයට මගී ආදායම හා අදාළ වේ.

**ඒකක පිරිවැය**
ලබාගත හැකි ටොන් කිලෝමීටර් ප්‍රමාණයට මුළු මෙහෙයුම් පිරිවැය හා ඒකක පිරිවැය අදාළ වේ.

**සමස්ත එලදාව**
ආදායම් ටොන් කිලෝමීටර් ප්‍රමාණයට ශුද්ධ ප්‍රවාහන ආදායම හා සමස්ත එලදාව අදාළ වේ.

ශුද්ධ ප්‍රවාහන ආදායම වනුයේ මගී, අතිරේක ගුවන් බඩු, ගුවන් බඩු හා තැපැල් ආදායමයි

**සමච්ඡේදක පැටවුම් සාධකය**
කාල නිශ්චිත ගුවන් සමාගමේ මෙහෙයුම්වලින් ලබන ආදායම මෙහෙයුම් පිරිවැය සාම්‍ය වීමට පැටවුම් සාධකයට අවශ්‍ය වේ.

# වාර්ෂික මහ සභා රැස්වීම් නිවේදනය

සීමාසහිත ශ්‍රී ලංකන් ගුවන් සමාගමේ කොටස් හිමියන්ගේ හතලිස් වන වාර්ෂික මහා සභා රැස්වීම 2019 අප්‍රේල් මස 30 වන අඟහරුවාදා දින පෙ ව 10.00 ට කොළඹ 07, මලලසේකර මාවතේ, 30 වී දරන ලිපිනයේ පිහිටි ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතන ශ්‍රවණාගාරයේදී පහත සඳහන් අරමුණු සඳහා පැවැත්වීමට නියමිත බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

01. 2018 මාර්තු මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සහ මූල්‍යප්‍රකාශ, ඒ පිළිබඳ විගණකවරුන්ගේ වාර්තාව පිළිගැනීම සහ සලකා බැලීම.

02. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 19 වෙනි සංශෝධනයේ 36 වන වගන්ති ප්‍රකාරව විගණකාධිපතිවරයා සමාගමේ විගණනය සිදුකළ යුතු අතර ඔවුන්ගේ පාර්ශ්‍රමික තීරණය කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලයට මෙයින් බලය පවරනු ලැබේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝගය පරිදි

**ඩෑල්රින් තිරුකුමාර්**
*සමාගම් ලේකම්*

2019 පෙබරවාරි 28 වන දින
කොළඹදී

**සටහන**

01. සාමාජිකයකුට තමන් වෙනුවෙන් රැස්වීමට සහභාගිවීමට සහ ඡන්දය භාවිතා කිරීමට පෙරකලාසිකරුවකු පත්කිරීමට හිමිකම ලැබේ. පෙරකලාසිකරු සමාගමේ සාමාජිකයකු වීම අවශ්‍ය නොවේ. මෙම නිවේදනය සමඟ පෙරකලාසි පත්‍රයක් අමුණා ඇත.
02. සම්පූර්ණ කරන ලද පෙරකලාසි පත්‍රය වාර්ෂික මහ සභා රැස්වීම පැවැත්වීමට නියමිත වේලාවට පැය 48 කට පෙර එනම් 2019 අප්‍රේල් මස 28 වන දින පෙ.ව 10.00 පෙර කටුනායක, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළේ, ගුවන් සමාගම් මධ්‍යස්ථානයේ පිහිටි ලියාපදිංචි කාර්යාලයේ තැන්පත් කළ යුතුය.
03. සමාගමක් නියෝජනය කරන තැනැත්තකු නම් ඔහුට හෝ ඇයට එම සමාගම නියෝජනය කරමින් ක්‍රියාකිරීමට අධිකාරිය සැපයූ යෝජනාවේ සහතික කළ පිටපතක් රැගෙන ආ යුතුය. නියෝජිතයකු සාමාජිකයකු වීම අවශ්‍ය නොවේ.

# සටහන්

# පෙරකලාසි පත්‍රය

**සීමාසහිත ශ්‍රී ලංකන් ගුවන් සමාගමේ**

සීමාසහිත ශ්‍රී ලංකන් ගුවන් සමාගමේ සාමාජිකයකු/ සාමාජිකයින් වන .......................................................................................................... ............................................................ හි පදිංචි...................................................................................................................................... වන මම/අපි, 2019 අප්‍රේල් මස 30 දින පෙ.ව. 10.00 ට කොළඹ 07, මලලසේකර මාවතේ, 30 වී දරන ලිපිනයේ පිහිටි ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතන ශ්‍රවණාගාරයේදී පවත්වනු ලබන සීමාසහිත ශ්‍රී ලංකන් ගුවන් සමාගමේ කොටස් හිමියන්ගේ හතලිස් වන වාර්ෂික මහා සභා රැස්වීමේදී හෝ එහි කිසියම් කල්තැබීමකදී මාගේ/අපගේ පෙරකලාසිකරු වශයෙන් මා/අප නියෝජනය කරමින් මා/අප වෙනුවෙන් ඡන්දය භාවිතා කිරීමට ................................................................................................................................................................ හි පදිංචි .................................. ............................................................................................................................................ හෝ ඔහු/ඇය අපොහොසත් වන්නේ නම් පහත දැක්වෙන අධ්‍යක්ෂවරුන්ගෙන් එක් අයකු මෙයින් පත්කරමි/පත්කරමු.

ගනේගම සේන විතානගේ මහතා
එයාර් මාර්ෂල් කපිල ජයම්පති
ආචාර්ය රෝෂන් පෙරේරා මහත්මිය
සුසන්ත කටුගම්පළ මහතා
එස්.ජී සේනාරත්න මහතා
ජොහාන් විජේසිංහ මහතා
ජ්‍යෙෂ්ඨ මහාචාර්ය අර්ජුන ද සිල්වා

| | පක්ෂව | විපක්ෂව |
|---|---|---|
| 01. 2018 මාර්තු මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයෙ වාර්ෂික වාර්තාව සහ එහි විගණකවරුන්ගේ වාර්තාව පිළිගැනීම සහ සලකා බැලීම. | | |
| 02. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 19 වෙනි සංශෝධනයේ 36 වන වගන්ති ප්‍රකාරව විගණකාධිපතිවරයා සමාගමේ විගණනය සිදුකළ යුතු අතර ඔවුන්ගේ පාරිශ්‍රමික තීරණය කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලයට මෙයින් බලය පවරනු ලැබේ. | | |

දෙදහස් දහ නවයේ .................................. මස ............................දින දී අත්සන් කරන ලදී.

.......................................
අත්සන/අත්සන්

**සටහන**

(අ) * අනවශ්‍ය වචන කපා හරින්න

වචන කිසිවක් ඉවත් කර නොමැති නම් හෝ පෙරකලාසිකරු ඡන්දය භාවිතා කළයුතු ආකාරය පිළිබඳ එකී පෙරකලාසිකරු සැලකිල්ලට ගැනීමේදී (පෙරකලාසි පත්‍රය සම්පූර්ණ කිරීමේදී උපදෙස් ඇතුලත් කර ඇති ආකාරය සම්බන්ධව) යම් සැකයක් පවතී නම් පෙරකලාසිකරු යෝග්‍ය යැයි සිතන පරිදි ඡන්දය භාවිතා කරනු ඇත.

**පෙරකලාසි පත්‍රය සම්පූර්ණ කිරීම සඳහා උපදෙස්:**

01. ඔබගේ සම්පූර්ණ නම සහ ලිපිනය පැහැදිලිව සටහන් කිරීමෙන් පසු සපයා ඇති ඉඩෙහි අත්සන් කර, අත්සන් කරන දිනයද සටහන් කර නිවැරැදිව පෙරකලාසි පත්‍රය සම්පූර්ණ කරන්න.
02. නේවාසික/ අනේවාසික කොටස් හිමියන් සම්බන්ධයෙන් වන විට, සම්පූර්ණ කරන ලද පෙරකලාසි පත්‍රය සමාගමට නැවත ලැබුණු පසු මුද්‍රා කටයුතු සිදුකරනු ලබයි.

# සාංගමික තොරතුරු

**සමාගමේ නම**
සීමාසහිත ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමාගම

**සමාගමේ ලියාපදිංචි අංක**
පී බී 67

**නෛතිකභාවය**
සීමාසහිත පොදු සමාගමකි.

**අධ්‍යක්ෂ මණ්ඩලය**
ජී එස් විතානගේ මහතා (සභාපති)
එයාර් මාෂල් කපිල ජයම්පති
ආචාර්ය රෝෂන් පෙරේරා මහත්මිය
සුසන්ත කටුගම්පල මහතා
එස් ජී සේනාරත්න මහතා
ජොහාන් විජේසිංහ මහතා
ජ්‍යෙෂ්ඨ මහාචාර්ය අර්ජුන පී ද සිල්වා

**අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව**
එස් ජී සේනාරත්න මහතා - මහාභාණ්ඩාගාර නියෝජිත (සභාපති)
ආචාර්ය රෝෂන් පෙරේරා මහත්මිය
එයාර් මාෂල් කපිල ජයම්පති
සුසන්ත කටුගම්පල මහතා
ජ්‍යෙෂ්ඨ මහාචාර්ය අර්ජුන පී ද සිල්වා

**අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් සහ පාරිශ්‍රමික කමිටුව**
එයාර් මාෂල් කපිල ජයම්පති (සභාපති)
ආචාර්ය රෝෂන් පෙරේරා මහත්මිය
සුසන්ත කටුගම්පල මහතා
ජ්‍යෙෂ්ඨ මහාචාර්ය අර්ජුන පී ද සිල්වා

**සමාගම් ලේකම්/ සාංගමික ලේකම් සේවා ප්‍රධානී**
ඩැල්රීන් තිරුකුමාර් මහත්මිය (ACIS)

**බැංකුකරුවන්**
ලංකා බැංකු
මහජන බැංකුව
ජාතික සංවර්ධන බැංකුව
ස්ටෑන්ඩඩ් චාටර්ඩ් බැංකුව
සිටි බෑන්ක් එන් ඒ
සම්පත් බැංකුව
නේෂන්ස් ට්‍රස්ට් බැංකුව
හැටන් නැෂනල් බැංංකුව
කොමර්ෂල් බැංකුව
අමානා බැංකුව

**විගණක**
විගණකාධිපති
විගණකාධිපති දෙපාර්තමේන්තුව
306/72
පොල්දූව පාර
බත්තරමුල්ල
ලියාපදිංචි ප්‍රධාන කාර්යාලය

**ගුවන්සේවා මධ්‍යස්ථානය**
බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපල
කටුනායක
ශ්‍රී ලංකාව

**සාංගමික වෙබ් අඩවිය**
www.srilankan.com

optima
Designing Your Year!
Designed & Produced by
Optima Designs (Pvt) Ltd.
A full service design and print company.
www.optimadesigns.lk

SriLankan
Airlines

ගුවන් සමාගම් මධ්‍යස්ථානය, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළ, කටුනායක, ශ්‍රී ලංකාව.
www.srilankan.com